# සිංහල

## 13 ශ්‍රේණිය

## ගුරු මාර්ගෝපදේශය

(2018 සිට ක්‍රියාත්මක වේ.)



සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව.
www.nie.lk

මුද්‍රණය සහ බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# සිංහල

## ගුරු මාර්ගෝපදේශය

# 13 ශ්‍රේණිය

(2018 සිට ක්‍රියාත්මක වේ.)

**සිංහල භාෂා දෙපාර්තමේන්තුව**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**ශ්‍රී ලංකාව.**

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info@nie.lk

මුද්‍රණය සහ බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**සිංහල**

13 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය


ප්‍රථම මුද්‍රණය - **2018**



© ජාතික අධ්‍යාපන ආයතනය



සිංහල භාෂා දෙපාර්තමේන්තුව,

ජාතික අධ්‍යාපන ආයතනය,

ශ්‍රී ලංකාව.

වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් තැපැල : info@nie.lk



මුද්‍රණය :

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
පිටකෝට්ටේ, පාගොඩ පාර, නො. 110,
සිසාරා ප්‍රින්ට්වේ ප්‍රයිවට් ලිමිටඩ්හි
මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලදි.



## ගුරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවුඩය

ශ්‍රී ලාංකේය ළමා පරපුරට ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම අරමුණු කර ගත් අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීමට ගුරුවරුන්ගෙන් ලැබෙන දයකත්වය ප්‍රබල ය. ශීඝ්‍රයෙන් වෙනස් වන සමාජයක නූතන ප්‍රවණතාවන්ට හා අභියෝගවලට මුහුණ දිය හැකි පුරවැසියන් නිර්මාණය කිරීම සඳහා ගුරුවරයාගේ වගකීම සුවිශේෂ වූවකි.

කාලීන අවශ්‍යතා මත පදනම් ව යාවත්කාලීන වන විෂය නිර්දේශ පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ සුසාධ්‍යකරණය සඳහා ගුරුවරයාට පිටුබල සපයන ගුරු මාර්ගෝපදේශ, අධ්‍යාපනයේ වැදගත් මෙවලමකි. ගෝලීය අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා රජය ගෙන යන වැඩ පිළිවෙළ සාර්ථක වන්නේ පන්ති කාමරය තුළ ගොඩ නැගෙන ප්‍රබෝධය ඔස්සේ ය. ඒ සඳහා ගුරුවරයා ශක්තිමත් කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය නිබඳව කටයුතු කරයි.

දැනුම පුපුරා යන සමාජයක නව දැනුම ගවේෂණයට පෙලඹවීමක් ඇති කරමින් සාම්ප්‍රදායික ඥානයේ හර පද්ධතිවල පදනම මත, පිරිපුන් සමබර පෞරුෂයකින් යුක්ත අනාගත පරපුරක් ගොඩනැගීමට ඉටු කරන මෙහෙවර උදෙසා ගුරුවරුන්ට හිස නමා ආචාර කරමි. අපේ මවුබිම ලොව ප්‍රබල රාජ්‍යයන් සමග තරග කළ හැකි දරුවන්ට කෙම් බිමක් කිරීමට ගුරුවරුන්ගේ සහාය නිරන්තරයෙන් අපේක්ෂා කරමි.

මේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සම්පාදනයට කැපවීමෙන් කටයුතු කළ බාහිර විද්වත් මණ්ඩලවලට ද ජාතික අධ්‍යාපන ආයතනයට ද, මගේ ප්‍රණාමය පිරිනමන අතර මෙය මුද්‍රණය සහ බෙදහැරීම සඳහා දයක වූ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට ද මාගේ ප්‍රශංසාව හිමි වේ.



**අකිල විරාජ් කාරියවසම**
**අධ්‍යාපන අමාත්‍ය**

# අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දිෂ්ට ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවක පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු වැනි අදියර වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්වයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තර්කීකරණ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැඟීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකි තාක් අවම කිරීම විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍යප්‍රිය විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමඟින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දිෂ්ට පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නො වේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමඟ සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තර්කීකරණය කරන ලද විෂය නිර්දේශ නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මඟින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීම යි. නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයන් හා වෙනත් පාර්ශ්වයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

# පෙරවදන

සමාජ ප්‍රගමනයෙහි ලා මහගු මෙහෙවරක නියැලෙන්නන් අතර ගුරුවරු ප්‍රමුඛ වෙති. ස්වකීය ජීවිතය සකස් කර ගැනීම සඳහා දරුවන්ට මග පෙන්වන්නෝ ගුරුවරු ය.

2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක කෙරෙන නව විෂය නිර්දේශයට අදාළ උසස්පෙළ ඉගැන්වීම් කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ගුරුවරුන්ට පහසුකම් සැපයීමේ අරමුණින් මෙම ගුරු මාර්ගෝපදේශය මුද්‍රණය කර බෙදහැරීමට අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව කටයුතු කරයි. ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදිත මෙම ගුරු මාර්ගෝපදේශය, දරුවන්ට මනා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර දීමට අවශ්‍ය මග පෙන්වීම ගුරුවරුන් වන ඔබ වෙත ලබා දෙනු ඇතැයි යන්න මාගේ විශ්වාසය යි.

මේ ප්‍රයත්නය යථාර්ථයක් වන්නේ මෙම ගුරු මාර්ගෝපදේශය පරිශීලනයෙන් ලබන පරිචය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා යොද ගැනීමට දරන උත්සාහය මත ය. ඒ සද් කාර්යය සඳහා කැප වී සිටින ඔබට මාගේ ගෞරවය පිරිනමමි.

**ඩබ්. ඩී. පද්මිණී නාලිකා**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,
ඉසුරුපාය,
බත්තරමුල්ල.
2018.03.28

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

ඉගැනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගැනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගන්නා ලද අසම්මත බැහැර කිරීමට ද සුභාවිතයන් මඟින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගැනුම යි.

ඉගැනුම සඳහා වටිනා යමක් ද, ඉගැනුම් ක්‍රමවේද හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ හා සුසාධ්‍යකාරකයන් ඉගැනුම් ක්ෂේත්‍රයට එක් වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතා මෙන් ම පුරාතන උරුමය ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කර ගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණ මඟින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගැනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශය නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශවල ඉගැනුම් ක්‍රමවේද, අකුරක්වත් වෙනස් නො කොට පිළිපැදිය යුත්තක් නම් නො වේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම් සාධනය වීම සඳහා අන්තර්ගතය මඟින් ඉගැනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකාරකයන්ට පැහැදිලි ව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදවු වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැකි ය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් පෙළපොත හා ගුරු මාර්ගෝපදේශ යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයකු වුව ද අපේක්ෂා කරන සාධන, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකාරකයන් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමඟ ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනඟා ගැනීමට ගුරු මාර්ගෝපදේශය යාත්‍රාවක් කර ගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**ආචාර්ය මාඹුල්ගොඩ සුමනරතන හිමි,**
පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
භාෂා, මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය,
ජාතික අධ්‍යාපන ආයතනය.

## විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමැතිය** : ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය,
ජාතික අධ්‍යාපන ආයතනය.

**විෂය සම්බන්ධීකරණය** : රුවනි සිසිජා ජයකොඩි,
සහකාර කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව.

**විෂය විශේෂඥ උපදේශ** : සේවාර්ජිත මහාචාර්ය ජේ. බී. දිසානායක,
කොළඹ විශ්වවිද්‍යාලය.

මහාචාර්ය රත්නසිරි අරංගල,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

මහාචාර්ය ජයන්ත අමරසිංහ,
රුහුණ විශ්වවිද්‍යාලය.

**අධීක්ෂණය :** එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම,
අධ්‍යක්ෂ, සිංහල භාෂා දෙපාර්තමේන්තුව.

**අභ්‍යන්තර ලේඛක මණ්ඩලය :** ඊ. ආර්. නිමල් ප්‍රේමකුමාර,
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව.

පූජ්‍ය කුකුරම්පොල ඤාණවිමල හිමි,
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව.

එම්. ජී. මුණසිංහ,
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව.

ඩබ්ලිව්. පී. මංගල ගුණරත්න,
කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව.

රුවනි සිසිජා ජයකොඩි,
සහකාර කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව.

ආචාර්ය පූජ්‍ය වාවින්නේ පඤ්ඤානන්ද හිමි,
සහකාර කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව.

**බාහිර ලේඛක මණ්ඩලය :** එස්. ඕ. ප්‍රනාන්දු,
විශ්‍රාමික අධ්‍යක්ෂ, ජාතික අධ්‍යාපන ආයතනය.

එච්. එල්. ශ්‍රියානි අබේවික්‍රම,
විශ්‍රාමික නියෝජ්‍ය අධ්‍යක්ෂ, අධ්‍යාපන අමාත්‍යාංශය,

එච්. පී. සුසිල් සිරිසේන,
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, හාපිටිගම් ජාතික අධ්‍යාපන
විද්‍යාපීඨය, මීරිගම.

ඩබ්ලිව්. කරුණාරත්න,
ගුරු මධ්‍යස්ථාන කළමනාකරු, ගුරු මධ්‍යස්ථානය, ගිරාගම.

අජිත් ක්‍රිෂාන්ත ද සේරම්,
හිටපු කථිකාචාර්ය, වයඹ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය,
බිංගිරිය.

ජේ. සෙනවිරත්න,
විශ්‍රාමික විදුහල්පති, ශ්‍රී සීලානන්ද ම. වි., කිරිමැටියාන.

ඩබ්ලිව්. එම්. නිශ්ශංක බණ්ඩාර,
ගුරු සේවය I, බප/ගම්/ දොම්පේ මහා විද්‍යාලය, දොම්පේ.

**භාෂා සංස්කරණය :** ආචාර්ය පූජ්‍ය මොරකන්දේගොඩ අරියවංස හිමි
රුහුණ විශ්වවිද්‍යාලය.

ක. ක. ගනුෂ්ක රන්දුල,
තාවකාලික කථිකාචාර්ය, කැලණිය විශ්වවිද්‍යාලය.

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

2017 වර්ෂයේ දී පාසල් පද්ධතියට හඳුන්වා දුන් අ. පො. ස. (උසස් පෙළ) සිංහල නව විෂය නිර්දේශයට අනුකූල ව 13 ශ්‍රේණිය සිංහල මෙම නව ගුරු මාර්ගෝපදේශය සකස් කර ඇත.

පාසල් අධ්‍යාපනයේ තීරණාත්මක කඩඉමක් පසු කරමින් සිටින යොවුන් වියේ පසු වන ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ට උචිත ඉගැනුම්-ඉගැන්වීම් පරිසරයක් නිර්මාණය කර දීම එක්තරා අභියෝගයකි. මෙම ගුරු මාර්ගෝපදේශය ගුරුවරයාට එම අභියෝගය වඩා සාර්ථක ලෙස හා පහසුවෙන් ජය ගැනීමට උපකාර වනු ඇත.

නිපුණතා පාදක විෂය මාලාවට අනුරූප ලෙස සකස් කර ඇති මෙම ගුරු මාර්ගෝපදේශයෙහි අ. පො. ස. (උසස් පෙළ) සිංහල විෂය නිර්දේශයේ 13 ශ්‍රේණියට අයත් නිපුණතා හා නිපුණතා මට්ටම්වලට ගැළපෙන ලෙස ක්‍රියාකාරකම් සැලසුම් කර ඇත. විෂය නිර්දේශයෙහි විෂය අන්තර්ගතය වාර තුනකට බෙදා කාලච්ඡේද අනුව වෙන් කොට දැක්වෙන සටහනක් මේ සමඟ ඉදිරිපත් කර ඇත්තේ ගුරුවරයාගේ පහසුව සඳහා ය.

පාඩම් සැලසුම සඳහා ලබා දී ඇති උපදෙස් ක්‍රියාත්මක කිරීමේ දී ශිෂ්‍යයාගේ බුද්ධි මට්ටම රුචි අරුචිකම්, හැකියා මෙන් ම පන්ති කාමරයේ භෞතික පරිසරයේ පවත්නා පහසුකම් ආදිය ද සැලකිල්ලට ගෙන වඩාත් ඵලදායී ඉගැනුම්-ඉගැන්වීම් පරිසරයක් නිර්මාණය කර ගැනීමට ගුරුවරයා විචාරශීලී විය යුතු ය. එහි දී විෂය නිර්දේශයට හෝ ගුරු මාර්ගෝපදේශයට පමණක් සීමා නො වී ගුරුවරයා සතු නිර්මාණශීලි කුසලතා ද ඉවහල් කර ගැනීම අපේක්ෂා කෙරේ. මනා පෙර සූදානමක් සහිත ව පන්ති කාමරයට පිවිසෙන ගුරුවරයාට මෙම කාර්යය අභියෝගයක් නොවනු ඇත. ගුරු මාර්ගෝපදේශයේ 'පෙර සූදානම' යටතේ දක්වා ඇති උපදෙස් කෙරෙහි අවධානය යොමු කිරීම මෙහි දී වැදගත් වනු ඇත.

ඉගැනුම් - ඉගැන්වීම් කාර්යය වඩා ඵලදායී, අර්ථවත් හා විචිත්‍රවත් කර ගැනීම සඳහා මෙම ගුරු මාර්ගෝපදේශය මඟින් යෝජනා කර ඇති දේශන, සාකච්ඡා, වාද - විවාද, භූමිකා රංගන, ගවේෂණ, ස්වයං අධ්‍යයන වැනි විවිධ ක්‍රමවේද ඉවහල් වනු ඇත. ශිෂ්‍යයන්ගේ නිර්මාණශීලී කුසලතා වර්ධනය කර ගනිමින් පෞරුෂ සංවර්ධනයට පිටිවහලක් සැපයීමට මෙම ඉගැනුම් අද්දැකීම් ඉවහල් වනු ඇතැයි අපේක්ෂා කරමු. හුදෙක් විභාග ඉලක්කගත ඉගැනීමක සීමා නො වූ පෘථුල වූත් විචාරශීලී වූත් භාෂා අධ්‍යයනයක හා සාහිත්‍ය රසවින්දනයක නිරත ශිෂ්‍ය පිරිසක් බිහිවනු දැකීම අපගේ ප්‍රාර්ථනය යි.

**ව්‍යාපෘති නායක**

# 13 ශ්‍රේණිය - ගුරු මාර්ගෝපදේශය
## ක්‍රියාකාරකම් අනුක්‍රමය

| වාරය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|---|---|
| 1 | 01 | 2.0 | 2.3 | ගුත්තිල කාව්‍යය (148 - 193 කවි) | 10 |
| | 02 | 6.0 | 6.2 | නූතන කාව්‍ය - රස වින්දනය හා විචාරය (හෙළ හවුල් කවිය සහ නිදහස් කවියේ ප්‍රථම තරංගය) | 16 |
| | 03 | 5.0 | 5.3 | පේමතෝ ජායතී සෝකෝ නාට්‍යය - රස වින්දනය හා විචාරය (පළමු සහ දෙවන අංක) | 08 |
| | 04 | 1.0 | 1.2 | පුරාතන ගද්‍ය අර්ථාවබෝධය හා රස වින්දනය (චුල්ලධනුද්ධර ජාතකය හා නන්දිවාණිජ වස්තුව) | 12 |
| | 05 | 3.0 | 3.3 | බැද්දේගම (නවකතාව) - රස වින්දනය හා විචාරය (1-5 පරිච්ඡේද) | 08 |
| | 06 | 4.0 | 4.3 | කෙටිකතා රස වින්දනය හා විචාරය<br>● කපිතන්ගේ පුත්තු - දයාසේන ගුණසිංහ<br>● මිනිස් වටය - එරික් ඉලයප්ආරච්චි<br>● කරත්තය - සෝමරත්න බාලසූරිය<br>● කළු සපත්තු - ජයතිලක කම්මැල්ලවීර | 15 |
| | 07 | 8.0 | 8.2 | උක්ත-ආඛ්‍යාත පද සම්බන්ධ රීති | 12 |
| | 08 | 9.0 | 9.1 | වාක්‍ය රචනය | 05 |
| | 09 | 9.0 | 9.5 | විශේෂාංග ලිපි රචනය | 08 |
| | 10 | 9.0 | 9.4 | අවබෝධය (අනිර්දිෂ්ට ගද්‍ය පාඨ) | 06 |
| 2 | 11 | 2.0 | 2.3 | ගුත්තිල කාව්‍යය (194 - 259 කවි) | 10 |
| | 12 | 6.0 | 6.2 | නූතන පද්‍ය - රස වින්දනය හා විචාරය (නිදහස් කවියේ ද්විතීය තරංගය) | 16 |
| | 13 | 5.0 | 5.3 | පේමතෝ ජායතී සෝකෝ නාට්‍යය - රස වින්දනය හා විචාරය (තෙවන අංකය) | 08 |
| | 14 | 1.0 | 1.2 | පුරාතන ගද්‍ය අර්ථාවබෝධය හා රස වින්දනය (කුණ්ඩලකේසීගේ වස්තුව හා ජීවක වෛද්‍යවරයාගේ කතාව) | 12 |
| | 15 | 3.0 | 3.3 | බැද්දේගම (නවකතාව) - රස වින්දනය හා විචාරය (6-10 පරිච්ඡේද) | 08 |

## 13 ශ්‍රේණිය - ගුරු මාර්ගෝපදේශය
## ක්‍රියාකාරකම් අනුක්‍රමය

| වාරය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|---|---|
| | 16 | 4.0 | 4.3 | කෙටිකතා - රස වින්දනය හා විචාරය<br>● කවියෙකුට අත්දැකීමක් - රංජිත් ධර්මකීර්ති<br>● ගස් - නිශ්ශංක විජේමාන්න<br>● හැත්තෑ ලක්ෂයෙන් එකෙක් - ලියනගේ අමරකීර්ති<br>● නිදහස් උදෑසන - කීර්ති වැලිසරගේ | 14 |
| | 17 | 8.0 | 8.2 | ● කාරක භේදය<br>(ක්‍රියාකාරක පද සම්බන්ධය)<br>- කර්තෘ කාරක<br>- කර්ම කාරක<br>- භාව කාරක | 18 |
| | 18 | 9.0 | 9.2 | සාරාංශකරණය | 05 |
| | 19 | 9.0 | 9.5 | තීරු ලිපි රචනය | 05 |
| | 20 | 9.0 | 9.3 | භාෂණ ව්‍යවහාරය ලේඛන ව්‍යවහාරයට හැරවීම | 04 |
| 3 | 21 | 2.0 | 2.3 | ගුත්තිල කාව්‍යය (260 - 317 කවි) | 15 |
| | 22 | 6.0 | 6.3 | නූතන කාව්‍ය අභ්‍යාසකරණය | 05 |
| | 23 | 5.0 | 5.4 | නාට්‍ය අභ්‍යාසකරණය | 08 |
| | 24 | 1.0 | 1.3 | පුරාතන ගද්‍ය සාහිත්‍යයෙන් ප්‍රකට වන මානව ගුණධර්ම | 15 |
| | 25 | 3.0 | 3.3 | බැද්දේගම (නවකතාව) - සමාලෝචනය | 12 |
| | 26 | 4.0 | 4.4 | කෙටිකතා අභ්‍යාසකරණය | 05 |
| | 27 | 8.0 | 8.2 | ප්‍රකෘති කථනය, විකෘති කථනය හා වාක්‍ය රීති පිළිබඳ අභ්‍යාස | 20 |
| | 28 | 9.0 | 9.1 | වාක්‍ය රචනය | 06 |
| | 29 | 9.0 | 9.5 | ශාස්ත්‍රීය ලිපි සම්පාදනය | 08 |
| | 30 | 9.0 | 9.2 | සාරාංශකරණය (අභ්‍යාස) | 06 |

# පටුන

පිටුව

| | |
|---|---|
| අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවුඩය | III |
| අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය | IV |
| පෙරවදන | V |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය | VI |
| විෂයමාලා කමිටුව | VII |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | VIII |
| ගුරු මාර්ගෝපදේශය ක්‍රියාකාරකම් අනුක්‍රමය | IX - X |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | XIII- LVIII |
| ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1 |
| - ගුත්තිල කාව්‍යය (148 - 193 කවි) | 2-3 |
| - නූතන කාව්‍ය - රස වින්දනය හා විචාරය | 4-8 |
| - පේමතෝ ජායතී සෝකෝ නාට්‍යය - රස වින්දනය හා විචාරය | 9-15 |
| - පුරාතන ගද්‍ය අර්ථාවබෝධය හා රස වින්දනය | 16-19 |
| - බැද්දේගම (නවකතාව) - රස වින්දනය හා විචාරය | 20-22 |
| - කෙටිකතා රස වින්දනය හා විචාරය | 23-24 |
| - උක්ත-ආඛ්‍යාත පද සම්බන්ධ රීති | 25-30 |
| - වාක්‍ය රචනය | 31-34 |
| - විශේෂාංග ලිපි රචනය | 35-37 |
| - අවබෝධය (අනිර්දිෂ්ට ගද්‍ය පාඨ) | 38-40 |
| - ගුත්තිල කාව්‍යය (194 - 259 කවි) | 41-43 |
| - නූතන කාව්‍ය - රස වින්දනය හා විචාරය | 44-47 |
| - පේමතෝ ජායතී සෝකෝ නාට්‍යය - රස වින්දනය හා විචාරය | 48-50 |
| - පුරාතන ගද්‍ය අර්ථාවබෝධය හා රස වින්දනය | 51-60 |
| - බැද්දේගම (නවකතාව) - රස වින්දනය හා විචාරය | 61-63 |

- කෙටිකතා - රස වින්දනය හා විචාරය 64-65

- කාරක භේදය (ක්‍රියාකාරක පද සම්බන්ධය) 66-69

- සාරාංශකරණය 70-71

- තීරු ලිපි රචනය 72-75

- භාෂණ ව්‍යවහාරය, ලේඛන ව්‍යවහාරයට හැරවීම 76-77

- ගුත්තිල කාව්‍යය (260 - 317 කවි) 78-87

- නූතන කාව්‍ය අභ්‍යාසකරණය 88-98

- නාට්‍ය අභ්‍යාසකරණය 99-101

- පුරාතන ගද්‍ය සාහිත්‍යයෙන් ප්‍රකට වන මානව චර්යා 102-103

- බැද්දේගම (නවකතාව) සමාලෝචනය 104-105

- කෙටිකතා අභ්‍යාසකරණය 106-108

- ප්‍රකෘති කථනය, විකෘති කථනය හා වාක්‍ය රීති පිළිබඳ අභ්‍යාස 109-110

- වාක්‍ය රචනය 111-112

- ශාස්ත්‍රීය ලිපි සම්පාදනය 113-123

# සිංහල

## විෂය නිර්දේශය

## 12 -13 ශ්‍රේණි

**(2017 සිට ක්‍රියාත්මක වේ)**

**සිංහල භාෂා දෙපාර්තමේන්තුව**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**ශ්‍රී ලංකාව**
www.nie.lk

## පෙරවදන

ශ්‍රී ලංකාවේ පාසල් විෂය මාලාවෙහි අ. පො. ස. (උ.පෙළ) සිංහල විෂය සඳහා මෙම විෂය නිර්දේශය සම්පාදිත ය. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ මෙම විෂය නිර්දේශය පාසල් පද්ධතියෙහි ක්‍රියාත්මක වීමට නියමිත ව ඇත්තේ 2017 වර්ෂයේ සිට ය.

මෙම නව විෂය නිර්දේශය සම්පාදනයේ දී දේශීය මෙන් ම විදේශීය භාෂා විෂයයන් සඳහා වූ විෂය නිර්දේශ අප විසින් අධ්‍යයනය කරන ලද අතර කාලීන සමාජීය හා දේශපාලනික ප්‍රවණතා හේතුවෙන් පැන නැඟෙන ආධ්‍යාපනික අවශ්‍යතා කෙරෙහි ද අවධානය යොමු කරන ලදි. එහි දී අ.පො.ස. (උ.පෙළ) විභාගය සමත් වීම සඳහා ශිෂ්‍යයා සූදානම් කිරීම මෙම විෂය නිර්දේශයේ එක ම අරමුණ ලෙස නො සැලකිණි. ගැඹුරු භාෂා ඥානයක් ශිෂ්‍යයාට ලබා දෙන අතර රසවින්දනාත්මක හා විචාරාත්මක කුසලතා ශිෂ්‍යයා තුළ වර්ධනය කිරීමත් භාෂා භාවිතයේ ප්‍රායෝගික පරිචය අත් පත් කර දීමත් එමගින් නිර්මාණකරණයට යොමු කිරීමත් මෙම විෂය නිර්දේශයේ අරමුණු අතර වෙයි.

මෙම විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම් ඇතුළත් ගුරු මාර්ගෝපදේශ දෙකක් 12 සහ 13 ශ්‍රේණි සඳහා ඉදිරියේ දී හඳුන්වා දීමට නියමිත ය. විභාග කඩඉම ජය ගන්නා අතර ම භාෂා ඥානයෙන් හා පරිචයෙන් පිරිපුන් වීමට මෙම විෂය නිර්දේශය විද්‍යාර්ථීන්ට අත්වැලක් වේවා! යනු අපගේ පැතුම යි.

**විෂය නිර්දේශ සම්පාදක මණ්ඩලය**

## හැඳින්වීම

සිංහල භාෂාව ලෝකයේ ඇති සුබනම්‍ය ජීව භාෂාවලින් එකකි . වසර දහස් ගණනක් තිස්සේ ඉතිහාසයේ විවිධ කඩඉම් පසු කරමින් විකාසනය වූ සිංහල භාෂාව සාරගර්භ සාහිත්‍යයකට ද හිමිකම් කියයි. සිංහල භාෂාව වහරනුයේ ලෝක ජනගහනයට සාපේක්ෂ ව කුඩා පිරිසක් වුව ද සාරවත් බවින් හෙළ බස ලෝකයේ සෙසු කවර බසකට වුව දෙවැනි වෙති යි සිතිය නොහේ. වර්තමාන ශ්‍රී ලාංකේය පාසල් අධ්‍යාපනයේ ප්‍රධාන මාධ්‍ය භාෂාව වන්නේ ද සිංහල භාෂාව යි. පාසල් අධ්‍යාපනයට පිවිසෙන ශිෂ්‍යයා සිංහල භාෂාව විධිමත් ලෙස හැදෑරීම ආරම්භ කරනුයේ පාසලේ පළමු වැනි ශ්‍රේණියේ පටන් ම ය. පාසලේ කනිෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය සම්පූර්ණ කරන අවස්ථාව වන විට ශිෂ්‍යයා ස්වකීය මවු බස පිළිබඳ යම් පරිචයක් අත් පත් කරගෙන සිටී.

මෙම මූලික භාෂා පරිචය සහිත ව කලා විෂය ධාරාවෙන් අ.පො.ස. (උසස් පෙළ) හැදෑරීම සඳහා පිවිසෙන ශිෂ්‍යයා තමාට තෝරාගැනීමට ඇති විෂය රාශියක් අතුරෙන් 'සිංහල' විෂයය තෝරාගැනීම කෙරෙහි හේතු කිහිපයක් බලපෑ හැකි ය. සිංහල භාෂාව හා සාහිත්‍යය පිළිබඳ ස්වකීය දැනුම සහ අවබෝධය තව දුරටත් පුළුල් කරගැනීම එක් අරමුණක් විය හැකි ය. අනාගත රැකියා ලෝකය ජය ගැනීම තවත් අරමුණක් වනු ඇත. හුදෙක් භාෂාව හා සාහිත්‍යයට ඇති ඇල්ම නිසා ම මෙම විෂය තෝරා ගන්නා ශිෂ්‍ය පිරිස් ද සිටීමට ඉඩ ඇත.

එනයින් නව විෂය නිර්දේශය සකස් කිරීමේ දී ඉහත කී සෑම අරමුණක් කෙරෙහි ම අවධානය යොමු කරන ලද බව කිව යුතු ය. සිංහල භාෂාවේ ගැඹුර මෙන් ම මිහිර ද අත්විඳීමේ අවස්ථාව විද්‍යාර්ථීන්ට අත් පත් කර දෙන අතර ම භාෂාව නිවැරදි ව හා මැනවින් හැසිරවීමේ පරිචය ශිෂ්‍යයාට ලබා දීම අපගේ අපේක්ෂාව යි.

නිපුණතා පාදක වූ මෙම විෂය නිර්දේශය පුරාතන හා නූතන ගද්‍ය, පද්‍ය සාහිත්‍යය, නාට්‍ය, ව්‍යාකරණ හා ප්‍රායෝගික භාෂා කුසලතා යන විෂය ක්ෂේත්‍ර ආවරණය කෙරෙන පරිදි සකස් කර ඇත. එකී නිපුණතා සාක්ෂාත් වන පරිදි හා විෂය සන්ධාරය ආවරණය වන අයුරින් සුදුසු ඉගැනුම් - ඉගැන්වීම් අද්දැකීම් සංවිධානය කරගැනීමේ නිදහස ගුරුවරයා සතු ව පවතී. සිංහල භාෂාව හා සාහිත්‍යය කෙරෙහි මනා ඇල්මකින් යුත්, භාෂා පරිචයෙන් පිරිපුන් ශිෂ්‍යයකු බිහි කරලීමට මෙම නව විෂය නිර්දේශය පිටුබලයක් වනු ඇතැයි අපේක්ෂිත ය.

# ජාතික පොදු අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මඟින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලියෙහි දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනයෙන් ළඟා කරගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරාගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිශන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොටගනු ලැබ ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කරගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීමෙන් ජාතිය ගොඩ නැඟීම සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වාගෙන යාමට සහාය වීම

IV පුද්ගලයන්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය මඟින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවාන්විත ස්ථානයක් හිමි කරගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

(උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිශන් වාර්තාව, 2003)

# මූලික නිපුණතා

අධ්‍යාපනය මඟින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා, ඉහත සඳහන් ජාතික අරමුණු ඉටු කරගැනීමට දායක වනු ඇත.

## (I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් කරගනී

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කරගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව : පරිගණක දැනුම සහ ඉගැනීමේ දී ද සේවා පරිශ්‍රයක දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගි කරගැනීම

## (II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගය
- චිත්තවේගී බුද්ධිය

## (III) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමය පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීව ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු ජලය, වාතය සහ ජීවය, ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍යය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව

ඉගැනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම, තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනාගැනීම, හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම යන හැකියා උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(V) ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහාගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාව මඟින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අද්දැකීම්

(VII) "ඉගැනීමට ඉගැනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවාගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත්, ස්වාධීන ව ඉගෙනගැනීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

(උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිශන් වාර්තාව, 2003)

## විෂය අරමුණු

01. භාෂාවේ අනන්‍යතාව, සුවිශේෂ බව හා භාෂා රීති හඳුනාගෙන තොරතුරු ව්‍යක්ත ව, නිරවුල් ව හා නිර්මාණාත්මක ව ප්‍රකාශ කිරීමේ ශක්‍යතා වර්ධනය කරගැනීම

02. ශාස්ත්‍රීය හා නිර්මාණාත්මක ලේඛනවල ශිල්පීය මූලධර්ම, ආකෘතික ලක්ෂණ, රචනා රීති හා භාෂා ව්‍යවහාර පිළිබඳ පරිචය ලබාගැනීම

03. පුරාතන හා නූතන සාහිත්‍ය කෘති පරිශීලනයෙන් සමාජ, සංස්කෘතික අගයන් අවබෝධ කරගැනීම, අත්පත් කරගැනීම හා ජීවිත පරිඥානය පුළුල් කරගැනීම

04. වින්දනාත්මක, විචාරාත්මක හා නිර්මාණාත්මක කුසලතා වර්ධනය කරගනිමින් සාහිත්‍ය කෘති රස වින්දනයට මෙන් ම නිර්මාණකරණයට පෙලඹීම

05. වර්ධනය වන්නා වූත්, ව්‍යාප්ත වන්නා වූත්, සාහිත්‍යික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික ඥානය උකහාගත හැකි වන පරිදි භාෂා කුසලතා වර්ධනය කරගනිමින් ජීවිත අභියෝග ජය ගැනීම

06. භාෂාව හා සාහිත්‍යය පරිශීලනය මඟින් ස්වීයත්වය, භාෂා මාමකත්වය, ජාතික අනන්‍යතාව හා සාමකාමී සහජීවනය වර්ධනය කරගැනීම

## ජාතික පොදු අරමුණු සහ විෂය අරමුණු අතර සම්බන්ධතාව .

| විෂය අරමුණු | ජාතික පොදු අරමුණු | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | i | ii | iii | iv | v | vi | vii | viii |
| 01. භාෂාවේ අනන්‍යතාව, සුවිශේෂ බව හා භාෂා රීති හඳුනාගෙන තොරතුරු ව්‍යක්ත ව, නිරවුල් ව හා නිර්මාණාත්මක ව ප්‍රකාශ කිරීමේ ශක්‍යතා වර්ධනය කරගැනීම | | | | | √ | √ | √ | |
| 02. ශාස්ත්‍රීය හා නිර්මාණාත්මක ලේඛනවල ශිල්පීය මූලධර්ම, ආකෘතික ලක්ෂණ, රචනා රීති හා භාෂා ව්‍යවහාර පිළිබඳ පරිචය ලබාගැනිම | | | | | √ | | | |
| 03. පුරාතන හා නූතන සාහිත්‍ය කෘති පරිශීලනයෙන් සමාජ, සංස්කෘතික අගයන් අවබෝධ කරගැනීම, අත්පත් කරගැනීම හා ජීවිත පරිඥානය පුළුල් කරගැනීම | √ | | √ | √ | √ | | | √ |
| 04. වින්දනාත්මක, විචාරාත්මක හා නිර්මාණාත්මක කුසලතා වර්ධනය කරගනිමින් සාහිත්‍ය කෘති රස වින්දනයට මෙන් ම නිර්මාණකරණයට පෙලඹීම | | | √ | | √ | | | |
| 05. වර්ධනය වන්නා වූත්, ව්‍යාප්ත වන්නා වූත්, සාහිත්‍යික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික ඥානය උකහා ගත හැකි වන පරිදි භාෂා කුසලතා වර්ධනය කරගනිමින් ජීවිත අභියෝග ජය ගැනීම | | √ | | √ | √ | √ | √ | √ |
| 06. භාෂාව හා සාහිත්‍යය පරිශීලනය මඟින් ස්වීයත්වය, භාෂා මාමකත්වය, ජාතික අනන්‍යතාව හා සාමකාමී සහජීවනය වර්ධනය කරගැනීම | √ | √ | √ | | | | | |

**12 ශ්‍රේණිය**

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 පුරාතන ගද්‍ය සාහිත්‍යය පරිශීලනයෙන් ලබා ගත් මානව ගුණධර්ම හා සංස්කෘතිකාංග මඟින් ජීවිත පරිඥානය පුළුල් කරගනිමින් රස වින්දනයේ හා විචාරයේ යෙදෙයි. | 1.1 පුරාතන ගද්‍ය සාහිත්‍යයේ විකාසනය පැහැදිලි කරයි. | ● පුරාතන ගද්‍ය සාහිත්‍යයේ ආරම්භය හා විකාසනය.<br>● ඒ ඒ අවධිවල පුරෝගාමී ගද්‍ය කර්තෘවරුන් හා ඔවුන්ගේ සාහිත්‍ය සේවය අගය කිරීම | ● පුරාතන ගද්‍ය සාහිත්‍යයේ විවිධ අවධි පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>● සිංහල ගද්‍ය සාහිත්‍යයේ වර්ගීකරණය හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>● පුරාතන ගද්‍ය කෘති හා කර්තෘවරුන් නම් කරයි.<br>● පුරාතන ගද්‍ය සාහිත්‍යයේ ලක්ෂණ ඉදිරිපත් කරයි.<br>● පුරාතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ ඇගයීමට ලක් කරයි. | 10 |
| | 1.2 නිර්දිෂ්ට කෘතිවල විශේෂතා, අන්තර්ගතය, භාෂා ලක්ෂණ හා රචනා රීති හඳුනා ගෙන රස විඳිමින් විමසුමට ලක් කරයි. | ● නිර්දිෂ්ට පුරාතන ගද්‍ය කෘතිවල කතුවරුන්, කාලය, සාහිත්‍ය පසුබිම හා සමාජ සංස්කෘතික පසුබිම හඳුනා ගැනීම<br>● නිර්දිෂ්ට පුරාතන ගද්‍ය කෘතිවල සුවිශේෂ ලක්ෂණ හඳුනා ගැනීම<br>● නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පාඨවල තේමාව හා අන්තර්ගතය හඳුනා ගැනීම<br>● නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පාඨවල අර්ථාවබෝධය හා ඒවා ලිහිල් බසින් ලිවීම<br>● නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පාඨවල රචනා රීතිය, සාහිත්‍යික අගය හඳුනා ගැනීම හා රස වින්දනය<br>නිර්දිෂ්ට පුරාතන ගද්‍ය -<br>● **සද්ධර්මරත්නාවලිය**<br>**- මට්ටකුණ්ඩලී වස්තුව**<br>● **පූජාවලිය**<br>**- අනුරුද්ධ කුමාර කථාව**<br>● **ජාතක කතා**<br>**- චන්දකින්නර ජාතකය**<br>● **සද්ධර්මාලංකාරය**<br>**- ස්වර්ණතිලකා වස්තුව** | ● නිර්දිෂ්ට කෘතිවල පසුබිම පිළිබඳ තොරතුරු වගු ගත කරයි.<br>● නිර්දිෂ්ට ගද්‍ය නිර්මාණ අර්ථාව-බෝධයෙන් කියවයි.<br>● නිර්දිෂ්ට ගද්‍ය නිර්මාණවල තේමාව හා අන්තර්ගතය විස්තර කරයි.<br>● නිර්දිෂ්ට කෘතිවල සුවිශේෂතා හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>● නිර්දිෂ්ට කෘතිවල භාෂා ලක්ෂණ හා රචනා රීති හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>● නිර්දිෂ්ට ගද්‍ය පාඨ ලිහිල් බසින් ලියයි.<br>● නිර්දිෂ්ට පුරාතන ගද්‍ය රස විඳිමින් විචාරය කරයි. | 25 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2.0 පුරාතන පද්‍ය සාහිත්‍යයේ විකාසනය, ආකෘතික ලක්ෂණ හා ස්වභාවය අධ්‍යයනය කරමින් රස වින්දනයේ හා විචාරයේ යෙදෙයි. | 2.1 පුරාතන පද්‍ය සාහිත්‍යයේ විකාසනය විස්තර කරයි. | • පුරාතන පද්‍ය සාහිත්‍යයේ ආරම්භය හා විකාසනය<br>• ඒ ඒ අවධිවල පුරෝගාමී කවීන් හා ඔවුන්ගේ සාහිත්‍ය සේවය | • පුරාතන පද්‍ය සාහිත්‍යයේ විවිධ අවධි වෙන් කොට දක්වයි.<br>• පුරාතන පද්‍ය කෘති හා කතුවරුන් නම් කරයි.<br>• පුරාතන පද්‍ය සාහිත්‍යයේ ලක්ෂණ ඉදිරිපත් කරයි.<br>• පුරාතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ ඇගයීමට ලක් කරයි. | 10 |
| | 2.2 නිර්දිෂ්ට පුරාතන පද්‍ය කෘතිය අර්ථාවබෝධයෙන් යුතු ව කියවා එහි ආකෘතිය, ස්වභාවය හා සමාජ සංස්කෘතික පසුබිම පැහැදිලි කරයි. | • නිර්දිෂ්ට පුරාතන පද්‍ය කෘතියේ සාහිත්‍ය පසුබිම හඳුනා ගැනීම<br>• ගුත්තිල කාව්‍යයේ තේමාව හා අන්තර්ගතය හඳුනා ගැනීම<br>• නිර්දිෂ්ට පුරාතන පද්‍ය කෘතියේ විශේෂ ලක්ෂණ හඳුනා ගැනීම<br>• පුරාතන පද්‍ය කෘතියේ රචනා රීතිය හා සාහිත්‍යික අගය හඳුනා ගැනීම<br>• ගුත්තිල කාව්‍යයේ නිර්දිෂ්ට පද්‍යවල අර්ථාවබෝධය හා ඒවා ලිහිල් බසින් ලිවීම<br>**නිර්දිෂ්ට පුරාතන පද්‍ය -**<br>• **ගුත්තිල කාව්‍යය - වෑත්තෑවේ හිමි (91 - 147 කවි)** | • ගුත්තිල කාව්‍යයෙහි කර්තෘවරයා, කාලය හා සමකාලීන සාහිත්‍ය පසුබිම විස්තර කරයි.<br>• ගුත්තිල කාව්‍යයෙහි තේමාව හා අන්තර්ගතය විස්තර කරයි.<br>• ගුත්තිල කාව්‍යයෙහි සුවිශේෂ ලක්ෂණ පැහැදිලි කරයි.<br>• ගුත්තිල කාව්‍යයෙහි නිර්දිෂ්ට කවිවල අර්ථ පැහැදිලි කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.3 කාව්‍ය විචාර සංකල්ප හඳුනා ගෙන නිර්දිෂ්ට පද්‍ය නිර්මාණ රස විඳිමින් විචාරයට ලක් කරයි. | • පෙරදිග කාව්‍ය විචාර සංකල්ප හඳුනා ගැනීම<br>• සාහිත්‍ය නිර්මාණයක් රස වින්දනයේ දී පාදක කර ගත යුතු මූලික කරුණු හඳුනා ගැනීම<br>• කාව්‍ය විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට පුරාතන පද්‍ය නිර්මාණ රස වින්දනය හා විචාරය<br><br>**නිර්දිෂ්ට පුරාතන පද්‍ය -**<br>• **ගුත්තිල කාව්‍යය** - වෑත්තෑවේ හිමි<br>**(91 - 147 කවි)** | • පෙරදිග කාව්‍ය විචාර සංකල්ප හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• නිර්දිෂ්ට පුරාතන පද්‍ය කෘතියේ සාහිත්‍යික අගය හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• පෙරදිග කාව්‍ය විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට පුරාතන පද්‍ය රස විඳිමින් විචාරය කරයි. | 12 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 නවකතා සාහිත්‍යාංගයේ ලක්ෂණ හා මූලිකාංග පිළිබඳ අවබෝධයෙන් යුක්ත ව නවකතා රස විඳිමින් විචාරයට ලක් කරයි. | 3.1 නවකතාව නම් සාහිත්‍යාංගයේ ලක්ෂණ හා නවකතාංග විස්තර කරයි. | • නවකතාව යනු කුමක් දැයි නිර්වචන ඇසුරින් පැහැදිලි කිරීම<br>• නවකතාව නම් වූ සාහිත්‍යාංගයේ ලක්ෂණ හා නවකතාංග හඳුනාගැනීම<br>• නවකතාංග<br>  • තේමාව<br>  • කතාව හා කතා වින්‍යාසය<br>  • දෘෂ්ටි කෝණය<br>  • චරිත නිරූපණය<br>  • චෛතසික නිරූපණය<br>  • අවස්ථා හා සිද්ධි නිරූපණය<br>  • පසුබිම් නිරූපණය<br>  • සංකේත නිරූපණය<br>  • භාෂා ලක්ෂණ<br>  • ජීවන දෘෂ්ටිය | • නිර්වචන ඇසුරින් නවකතාව යනු කුමක් දැයි පැහැදිලි කරයි.<br>• නවකතාව නම් වූ සාහිත්‍යාංගයේ ලක්ෂණ විස්තර කරයි.<br>• පරිශීලනය කළ නවකතා ඇසුරින් නවකථාංග සඳහා උදාහරණ ඉදිරිපත් කරයි.<br>• සාහිත්‍යික වටිනාකමක් සහිත නවකතා තෝරාගෙන කියවීමට පෙලඹෙයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.2 සිංහල නවකතාවේ ආරම්භය හා විකාසනය පැහැදිලි කරයි. | • දේශීය නවකතාවෙහි ආරම්භය හා විකාසනය (දහනව වන සියවසේ සිට වර්තමානය දක්වා)<br>- ප්‍රබන්ධ සාහිත්‍යයට මග පෑදීම<br>- ප්‍රථම සිංහල නවකතාව<br>- සිංහල නවකතාවේ පුරෝගාමී කර්තෘවරු<br>- සිංහල නවකතාවේ විවිධ තේමා සහ ව්‍යූහාත්මක ලක්ෂණ<br>- සිංහල නවකතාවේ ප්‍රවණතා | • සිංහල ප්‍රබන්ධ සාහිත්‍යයට මග පෑදුණු ආකාරය විස්තර කරයි.<br>• සිංහල නවකතාවේ පුරෝගාමී කතුවරුන් හා ඔවුන්ගේ නිර්මාණ නම් කරයි.<br>• පුරෝගාමී කර්තෘවරුන්ගෙන් සිංහල නවකතාවට සිදු වූ සේවය අගය කරයි.<br>• සිංහල නවකතාවේ විවිධ තේමා හා ව්‍යූහාත්මක ලක්ෂණ පැහැදිලි කරයි.<br>• සිංහල නවකතාවේ ප්‍රවණතා පිළිබඳ විස්තර කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.3 නවකතාංග කෙරෙහි අවධානයෙන් යුතු ව නිර්දිෂ්ට නවකතාව රස විඳිමින් විචාරයට ලක් කරයි. | ● නිර්දිෂ්ට නවකතාවේ කතුවරයා හා සාහිත්‍ය පසුබිම හඳුනා ගැනීම<br>● නිර්දිෂ්ට නවකතාවේ තේමාව හා අන්තර්ගතය හඳුනා ගැනීම<br><br>**නිර්දිෂ්ට නවකතාව -**<br>● **බැද්දේගම - ලෙනාඩ් වුල්ෆ් (ඒ. පී. ගුණරත්න පරිවර්තනය)** | ● නිර්දිෂ්ට නවකතාවේ කතුවරයා හා සාහිත්‍ය පසුබිම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>● නිර්දිෂ්ට නවකතාවේ තේමාව හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>● නිර්දිෂ්ට නවකතාවෙන් හෙළි වන සමාජ පසුබිම පැහැදිලි කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 4.0 කෙටිකතා කලාවේ විකාසනය, මූලිකාංග හා විශේෂ ලක්ෂණ හඳුනා ගෙන කෙටිකතා රස විඳිමින් විචාරයේ යෙදෙයි. | 4.1 කෙටිකතා සාහිත්‍යාංගයේ ලක්ෂණ හා කෙටිකතා මූලිකාංග පැහැදිලි කරයි. | ● කෙටිකතා සාහිත්‍යාංගය හඳුනා ගැනීම.<br>● කෙටිකතාව නිර්වචනය කිරීම<br>● කෙටිකතා මූලිකාංග හා කෙටිකතා ලක්ෂණ හඳුනාගැනීම<br>- කථා ප්‍රවෘත්තිය<br>- කථා වින්‍යාසය<br>- චරිතාංග නිරූපණය<br>- චෛතසික නිරූපණය<br>- පසුබිම් නිරූපණය / පරිසර වර්ණනා<br>- යථාර්ථ නිරූපණය<br>- සංකේත භාවිතය<br>- දෘෂ්ටි කෝණය<br>- ජීවන දෘෂ්ටිය<br>- නිර්මාණාත්මක භාෂා ලක්ෂණ<br>- ඒකාබද්ධතාව | ● කෙටිකතාව යනු කුමක් දැයි හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>● පරිශීලනය කළ කෙටිකතා ඇසුරින් කෙටිකතා ලක්ෂණ ඉදිරිපත් කරයි.<br>● කෙටිකතා විචාර සංකල්ප හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>● කෙටිකතා ලක්ෂණ පිළිබඳ අවබෝධයෙන් යුතු ව කෙටිකතා කියවයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 4.2 සිංහල කෙටිකතාවේ ප්‍රභවය හා විකාසනය පැහැදිලි කරයි. | • සිංහල කෙටිකතාවේ ආරම්භය හා විකාසනය (දහනව වන සියවසේ සිට වර්තමානය දක්වා) හඳුනා ගැනීම<br>• සිංහල කෙටිකතාවේ පුරෝගාමී කතුවරුන් හා ඔවුන්ගේ නිර්මාණ හඳුනා ගැනීම<br>• දේශීය කෙටිකතාවේ විවිධ තේමා, ආකෘති සහ ප්‍රවණතා හඳුනා ගැනීම | • සිංහල කෙටිකතාවේ ආරම්භය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• සිංහල කෙටිකතාවේ පුරෝගාමී කර්තෘවරුන්ගේ නිර්මාණ අගය කරයි.<br>• දේශීය කෙටිකතාවේ විවිධ තේමා, ආකෘති සහ ප්‍රවණතා පිළිබඳ පැහැදිලි කරයි.<br>• විවිධ තේමා සහ ආකෘති සහිත කෙටිකතා කියවීමට පෙලඹෙයි. | 08 |
| | 4.3 කෙටිකතා ලක්ෂණ කෙරෙහි අවධානයෙන් යුතු ව නිර්දිෂ්ට කෙටිකතා රස විඳිමින් විචාරයට ලක් කරයි. | • නිර්දිෂ්ට කෙටිකතාවල කතුවරුන්, කාලය හා සාහිත්‍ය පසුබිම හඳුනා ගැනීම<br>• නිර්දිෂ්ට කෙටිකතාවල තේමාව හා අන්තර්ගතය හඳුනා ගැනීම<br>• නිර්දිෂ්ට කෙටිකතාවල ඇතුළත් කෙටිකතා ලක්ෂණ හඳුනා ගැනීම<br>• නිර්දිෂ්ට කෙටිකතා රස වින්දනය හා විචාරය<br>**නිර්දිෂ්ට කෙටිකතා -**<br>• **වහල්ලු - මාර්ටින් වික්‍රමසිංහ**<br>• **වෙසක් පහන - ජී. බී සේනානායක**<br>• **දිසොන්චිනාහාමි - ගුණදාස අමරසේකර**<br>• **නොනිමි සිත්තම - කේ. ජයතිලක**<br>• **නංගී - ඇරැව්වල නන්දිමිත්‍ර**<br>• **අකුරට යන වෙලාවේ - ඒ. වී. සුරවීර**<br>• **ස්නේහය - සයිමන් නවගත්තේගම** | • නිර්දිෂ්ට කෙටිකතාවල කතුවරුන්, කාලය හා සාහිත්‍ය පසුබිම හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• නිර්දිෂ්ට කෙටිකතා කියවා තේමාව හා අන්තර්ගතය විස්තර කරයි.<br>• නිර්දිෂ්ට කෙටිකතාවල කලාත්මක ලක්ෂණ හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• කෙටිකතා රස විඳිමින් විචාරයට ලක් කරයි. | 17 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 5.0 නාට්‍ය සාහිත්‍යයේ විශේෂතා හා විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව නාට්‍ය පෙළ රස විඳිමින් විචාරය කරයි. | 5.1 නාට්‍යය යනු කුමක් දැයි හඳුනා ගෙන එහි ලක්ෂණ පැහැදිලි කරයි | • නාට්‍යය යනු කුමක් දැයි නිර්වචනය කිරීම<br>• නාට්‍ය ප්‍රභේද හා විශේෂ ලක්ෂණ හඳුනා ගැනීම<br>• ශෛලිගත නාට්‍යයක මූලික ලක්ෂණ හඳුනා ගැනීම<br>• නාට්‍යය හා නාට්‍ය පෙළ අතර වෙනස හඳුනා ගැනීම<br>• නාට්‍ය නිර්මාණයක පෙළෙහි සාහිත්‍යික අගය හඳුනා ගැනීම | • නිර්වචන ඇසුරින් නාට්‍ය යනු කුමක් දැයි විස්තර කරයි.<br>• නාට්‍ය ප්‍රභේද පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• ශෛලිගත නාට්‍යයක මූලික ලක්ෂණ හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• නාට්‍යය හා නාට්‍ය පෙළ වෙන් වෙන් ව රස විඳිය හැකි අයුරු පැහැදිලි කරයි. | 10 |
| | 5.2 සිංහල නාට්‍ය සාහිත්‍යයේ ආරම්භය හා විකාසනය පැහැදිලි කරයි. | • සිංහල නාට්‍ය සාහිත්‍යයේ ආරම්භය හා විකාසනය හඳුනා ගැනීම | • සිංහල නාට්‍ය සාහිත්‍යයේ ආරම්භය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• පුරෝගාමී සිංහල නාට්‍යකරුවන්ගේ නිර්මාණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• පුරෝගාමී නාට්‍යකරුවන්ගෙන් දේශීය නාට්‍යයට සිදු වූ සේවය අගය කරයි.<br>• විවිධ නාට්‍ය පෙළ කියවීමට පෙලඹෙයි. | 06 |
| | 5.3 නාට්‍ය විචාර සංකල්ප හඳුනා ගෙන නිර්දිෂ්ට නාට්‍ය පෙළ රස විඳිමින් විචාරයට ලක් කරයි. | • නාට්‍ය විචාර සංකල්ප හඳුනා ගැනීම<br>- පෙරදිග<br>- අපරදිග<br>• නිර්දිෂ්ට නාට්‍යයේ කර්තෘවරයා හා ඔහුගේ නිර්මාණ පසුබිම හඳුනාගැනීම<br>• නිර්දිෂ්ට නාට්‍යයේ තේමාව හා කතා වස්තුව හඳුනා ගැනීම<br>**නිර්දිෂ්ට නාට්‍යය -**<br>**• පේමතෝ ජායතී සෝකෝ - එදිරිවීර සරච්චන්ද්‍ර** | • පෙර අපර දෙදිග නාට්‍ය විචාර සංකල්ප හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• නිර්දිෂ්ට නාට්‍යයේ කතුවරයා හා ඔහුගේ නිර්මාණ පිළිබඳ තොරතුරු රැස් කරයි.<br>• නිර්දිෂ්ට නාට්‍යයේ සුවිශේෂතා හඳුනා ගෙන පැහැදිලි කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6.0 නූතන කාව්‍ය සාහිත්‍යයේ විකාසනය හා සුවිශේෂතා හඳුනා ගෙන කාව්‍ය විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට කාව්‍ය රස විඳිමින් විචාරයෙහි යෙදෙයි. | 6.1 කවිය නම් සාහිත්‍යාංගයේ ලක්ෂණ හඳුනා ගෙන පැහැදිලි කරයි. | • කවිය යනු කුමක් දැයි නිර්වචනය කිරීම<br>• කවියෙහි මූලිකාංග හඳුනා ගැනීම<br>• නූතන කාව්‍යයේ ලක්ෂණ හා විශේෂතා හඳුනා ගැනීම | • නිර්වචන ඇසුරෙන් කවිය යනු කුමක් දැයි පැහැදිලි කරයි.<br>• නූතන කාව්‍යයේ මූලිකාංග විස්තර කරයි.<br>• නූතන කාව්‍යයේ ලක්ෂණ හා විශේෂතා හඳුනා ගෙන පැහැදිලි කරයි. | 05 |
| | 6.2 නූතන කාව්‍ය සාහිත්‍යයේ ප්‍රභවය හා විකාසනය පැහැදිලි කරයි. | • නූතන සිංහල කාව්‍ය සාහිත්‍යයෙහි ආරම්භය හා විකාසනය හඳුනා ගැනීම<br>• නූතන සිංහල කාව්‍යයේ විවිධ අවධි හා ප්‍රවණතා හඳුනා ගැනීම<br>• නූතන සිංහල කාව්‍ය සාහිත්‍යයේ විවිධ තේමා, ආකෘති හා භාෂා ලක්ෂණ හඳුනා ගැනීම<br>• නූතන සිංහල කවීන්ගේ නිර්මාණ පිළිබඳ අවබෝධය ලබා ගැනීම | • නූතන සිංහල කාව්‍ය සාහිත්‍යයේ සමාරම්භය හා විකාශනය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• නූතන සිංහල කාව්‍යයේ විවිධ අවධි හා ප්‍රවණතා හඳුනා ගෙන විස්තර කරයි.<br>• නූතන සිංහල කාව්‍ය සාහිත්‍යයේ විවිධ තේමා, ආකෘති හා භාෂා ලක්ෂණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• නූතන සිංහල කවීන්ගේ නිර්මාණ පිළිබඳ තොරතුරු රැස් කරයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 6.3 කාව්‍ය විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට කාව්‍ය රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි. | • කාව්‍ය විචාර සංකල්ප හඳුනා ගැනීම<br>• නිර්දිෂ්ට නූතන කාව්‍ය නිර්මාණවල කර්තෘවරුන් කාලය හා සාහිත්‍ය පසුබිම හඳුනා ගැනීම<br>• නිර්දිෂ්ට නූතන කාව්‍ය නිර්මාණවල තේමාව, අරමුණ හා අන්තර්ගතය හඳුනා ගැනීම<br>• නිර්දිෂ්ට නූතන කාව්‍යවල විශේෂ ලක්ෂණ හා සාහිත්‍යික අගය හඳුනා ගැනීම<br>• කාව්‍ය විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට නූතන කාව්‍ය රස වින්දනය හා විචාරය<br>නිර්දිෂ්ට නූතන කාව්‍ය නිර්මාණ -<br>• කොළඹ කවියේ ප්‍රථම තරංගය<br>• ආනන්ද රාජකරුණා - සමනලයා<br>• ඇස්. මහින්ද හිමි - ලක් මවුනි මගේ<br><br>• කොළඹ කවියේ ද්විතීය තරංගය<br>• පී. බී. අල්විස් පෙරේරා - පැසුණු පැණ<br>• සාගර පලන්සූරිය - ඉගිලෙන සිහින<br>• මීමන ප්‍රේමතිලක - අඩසඳ<br>• විමලරත්න කුමාරගම - වන්නියේ හැන්දෑව<br>• එච්. එම්. කුඩලිගම - තවමත් ඔබ මගේ ය<br>• ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ - ළඳරු හැඟුම් | • නූතන කාව්‍ය විචාර සංකල්ප හඳුනා ගෙන විස්තර කරයි.<br>• නිර්දිෂ්ට නූතන කාව්‍ය නිර්මාණවල කර්තෘවරුන්, කාලය හා සාහිත්‍ය පසුබිම හඳුනා ගෙන විස්තර කරයි.<br>• නිර්දිෂ්ට නූතන කාව්‍ය නිර්මාණවල සුවිශේෂතා පැහැදිලි කරයි.<br>• නිර්දිෂ්ට නූතන කාව්‍ය නිර්මාණවල කලාත්මක අගය විමසමින් රස විඳියි. | 22 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 7.0 භාෂාවේ ස්වරූපය පිළිබඳ අවබෝධයෙන් යුතු ව භාෂාව ව්‍යවහාර කරයි. | 7.1 භාෂාවේ සම්මත ව්‍යවහාරය හඳුනා ගෙන භාෂාව භාවිත කරයි. | • භාෂාව දෙයාකාරයකින් භාවිත වන බව හඳුනා ගැනීම<br>- භාෂණය (ශ්‍රව්‍ය ගෝචර සංකේත)<br>- ලේඛනය (දෘශ්‍ය ගෝචර සංකේත) | • භාෂා භාවිතයේ ස්වරූප දෙක හඳුනා ගෙන විස්තර කරයි.<br>• භාෂණ ව්‍යවහාරයේ ස්වභාවය පැහැදිලි කරයි.<br>• ලේඛන ව්‍යවහාරයේ ස්වභාවය පැහැදිලි කරයි.<br>• භාෂණය හා ලේඛනය අතර වෙනස්කම් විස්තර කරයි.<br>• ලේඛන ව්‍යවහාරය හා භාෂණ ව්‍යවහාරය වෙන් වෙන් ව භාවිත කළ යුතු බව ප්‍රකාශ කරයි. | 05 |
| | 7.2 සිංහල අක්ෂර මාලාව පිළිබඳ දැනුම පාදක කර ගෙන අක්ෂර විචාරය කරයි. | • සිංහල අක්ෂර මාලාව හැඳින්වීම හා අක්ෂර වර්ගීකරණය<br>• අක්ෂර මාලාවේ අන්තර්ගත, ලේඛන ව්‍යවහාරයේ බහුල භාවිතයට පැමිණි හා නොපැමිණි අක්ෂර<br>• ලේඛන ව්‍යවහාරයේ බහුල භාවිතයට නොපැමිණි අකුරු, අක්ෂරමාලාවට ඇතුළත් කිරීමට හේතු<br>• සිංහල 'අ'කාරයේ සංවෘත-විවෘත භේදය<br>• විදේශීය වචන උච්චාරණය හා සිංහල අකුරෙන් ලියන ආකාරය<br>• රූප භේදයක් ඇතත් උච්චාරණයේ වෙනසක් නොමැති අක්ෂර<br>• යංශය, රකාරාංශය හා රේඵය භාවිතය | • සිංහල අක්ෂර විවිධ ප්‍රභේද යටතේ වර්ග කර දක්වයි.<br>• සිංහල අක්ෂර නිවැරදි ව නම් කරයි.<br>• ලේඛන ව්‍යවහාරයේ බහුල භාවිතයට නොපැමිණි අකුරු, අක්ෂර මාලාවට ඇතුළත් කිරීමට හේතු පැහැදිලි කරයි.<br>• සිංහල 'අ'කාරයේ සංවෘත-විවෘත භේදය හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• විදේශීය වචන සිංහල අකුරෙන් නිවැරදි ව ලියා දක්වයි.<br>• රූප භේදයක් ඇතත් උච්චාරණයේ වෙනසක් නොමැති අක්ෂර මොනවා දැයි පැහැදිලි කරයි.<br>• යංශය, රකාරාංශය හා රේඵය නිවැරදි ව භාවිත කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 7.3 නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු ව ලියයි. | • අක්ෂර වින්‍යාස රීති හඳුනා ගැනීම සහ භාවිතය | • අක්ෂර වින්‍යාස රීති හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• නිවැරදි අක්ෂර වින්‍යාසය භාවිත කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• නිවැරදි අක්ෂර වින්‍යාසය භාවිත කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි. | 08 |
| | 7.4 අනුරූප පද සංයෝගය, නිවැරදි භාෂා ව්‍යවහාරය සඳහා යොදා ගනියි. | • නිෂ්පන්න, තත්සම, තද්භව පද හඳුනා ගැනීම<br>• අනුරූප ලෙස පද සංයෝග කිරීම | • අනුරූප පද සංයෝගය යනු කුමක් දැයි පැහැදිලි කරයි.<br>• නිෂ්පන්න, තත්සම, තද්භව පද වෙන් වෙන් ව හඳුනා ගෙන විස්තර කරයි.<br>• නිෂ්පන්න, තත්සම හා තද්භව පද අනුරූප ලෙස සංයෝග කිරීමේ වැදගත්කම විස්තර කරයි.<br>• අනුරූප පද නිවැරදි ලෙස සංයෝග කරමින් භාවිත කරයි. | 08 |
| | 7.5සන්ධි විධි භාවිත කරමින් භාෂාව සුඛනම්‍ය ලෙස හසුරුවයි. | • සන්ධි විධි<br>i. ලෝපය<br>ii. ආදේශය<br>iii. ආගමය<br><br>(ප්‍රායෝගික උදාහරණ ඇසුරෙන්) | • 'සන්ධි' යනු කුමක් දැයි නිර්වචනය කරයි.<br>• උදාහරණ දක්වමින් සන්ධි විධි පැහැදිලි කරයි.<br>• සුඛනම්‍ය භාෂා භාවිතය සඳහා සන්ධිවල වැදගත්කම පැහැදිලි කරයි.<br>• සන්ධි අර්ථාන්විත ව භාවිත කරමින් භාෂා කාර්යයේ යෙදෙයි. | 15 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | • සන්ධි ප්‍රභේද<br>- පූර්ව ස්වර ලෝප සන්ධි<br>- පර ස්වර ලෝප සන්ධි<br>- ස්වර සන්ධි<br>- ස්වරාදේශ සන්ධි<br>- ගාත්‍රාදේශ සන්ධි<br>- පූර්ව රූප සන්ධි<br>- පර රූප සන්ධි<br>- ගාත්‍රාක්ෂර ලෝප සන්ධි<br>- ආගම සන්ධි<br>- ද්විත්ව රූප සන්ධි<br><br>• මිශ්‍ර සිංහල සන්ධි<br>- සමාන ස්වර දීර්ඝ සන්ධි<br><br>- | | |

# අ.පො.ස. (උසස් පෙළ) සිංහල විෂය නිර්දේශය - 2017
## 12 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 8.0 ව්‍යාකරණ රීති හා භාෂා සම්ප්‍රදාය නිවැරදි ව හඳුනා ගෙන භාවිත කරයි. | 8.1 පද සාධනය, පද භාවිතය පිළිබඳ ප්‍රායෝගික හැකියාව ප්‍රදර්ශනය කරයි. | ● නාම<br>★ නාම ප්‍රකෘති<br>★ නාමයකින් ප්‍රකෘතිය වෙන් කරගැනීමේ ක්‍රම<br>★ නාම පදයක මූලික ලක්ෂණ<br>★ වචන භේදය (ඒක, බහු)<br>★ ලිංග භේදය (පුල්ලිංග, ස්ත්‍රී ලිංග, නපුංසක ලිංග)<br>★ සචේතන - අචේතන භේදය<br>★ නියත - අනියත භේදය<br>● නාම ප්‍රභේද (නාම නාම, සර්ව නාම, සංඛ්‍යා නාම, ප්‍රත්‍යයාර්ථ නාම, සමාස නාම)<br>★ නාම නාම (ජාති, ද්‍රව්‍ය, ගුණ, ක්‍රියා, සංඥා)<br>★ සර්ව නාම (පුරුෂ භේදය, ලිංග භේදය, වචන භේදය)<br>★ සංඛ්‍යා නාම<br>● නාම වරනැඟීම<br>★ විභක්ති<br>- ප්‍රථමා<br>- කර්ම<br>- කර්තෘ<br>- කරණ<br>- සම්ප්‍රදාන<br>- අවධි<br>- සම්බන්ධ<br>- ආධාර<br>- ආලපන | ● නාම ප්‍රකෘතියක් යනු කුමක් දැයි හඳුනා ගෙන විස්තර කරයි.<br>● නාම පදයකින් ප්‍රකෘතිය වෙන් කොට දක්වයි.<br>● නාම පදයක මූලික ලක්ෂණ විස්තර කරයි.<br>● නාම ප්‍රභේද හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>● නාම ප්‍රකෘතියක් විවිධ ස්වරූපවලට නගමින් නාම විභක්තිවල වරනඟයි. | 48 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | ● ක්‍රියා<br>★ ධාතු ප්‍රකෘති<br>★ ක්‍රියාවකින් ප්‍රකෘතිය වෙන් කරගැනීමේ ක්‍රම<br>★ ක්‍රියා පදයක මූලික ලක්ෂණ<br>- වචන භේදය<br>- පුරුෂ භේදය<br>- කාල භේදය (අතීත, අනතීත)<br>★ ක්‍රියා වර නැඟීම<br>★ ක්‍රියා ප්‍රභේද<br>★ අවසාන ක්‍රියා<br>- ආඛ්‍යාත, කෘදන්ත ක්‍රියා, නාම ක්‍රියා, ආශීර්වාද ක්‍රියා, (ප්‍රාර්ථනා ක්‍රියා)<br>- විධි ක්‍රියා<br>- ප්‍රයෝජ්‍ය ක්‍රියා<br>★ අනවසාන ක්‍රියා<br>- පූර්ව ක්‍රියා<br>- අපර ක්‍රියා<br>- මිශ්‍ර ක්‍රියා<br>- අසම්භාව්‍ය ක්‍රියා | ● ක්‍රියා ප්‍රකෘතියක් යනු කුමක් දැයි හඳුනා ගෙන විස්තර කරයි.<br>● ක්‍රියා පදයකින් ප්‍රකෘතිය වෙන් කොට දක්වයි.<br>● ක්‍රියා පදයක මූලික ලක්ෂණ විස්තර කරයි.<br>● ක්‍රියා ප්‍රභේද හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>● ක්‍රියා ප්‍රකෘතියක් විවිධ ස්වරූපවලට නගමින් ක්‍රියා පද වරනඟයි.<br>● අවසාන ක්‍රියා සහ අනවසාන ක්‍රියා යන්න පැහැදිලි කරයි. | |

අ.පො.ස. (උසස් පෙළ) සිංහල විෂය නිර්දේශය - 2017
12 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | ● විශේෂණ<br>- නාම විශේෂණ<br>- ක්‍රියා විශේෂණ | ● නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ යනු මොනවා දැයි පැහැදිලි කරයි.<br>● නාම විශේෂණ සඳහා නිදසුන් දක්වයි.<br>● ක්‍රියා විශේෂණ සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.<br>● විශේෂණ උචිත පරිදි භාෂාවේ භාවිත කරයි. | |
| | | ● සමාස<br>- අව්‍යය සමාස<br>- විභක්ති සමාස<br>- විශේෂණ සමාස<br>- අන්‍යාර්ථ සමාස<br>- ද්වන්ද්ව / ද කාරාර්ථ සමාස | ● සමාස යනු කුමක් දැයි විස්තර කරයි.<br>● සමාස ප්‍රභේද සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.<br>● සමාස භාවිතයේ ප්‍රයෝජන විස්තර කරයි. | |
| | | ● ප්‍රත්‍යයාර්ථ නාම<br>- තද්ධිත නාම<br>- කෘදන්ත නාම | ● ප්‍රත්‍යයාර්ථ නාම යනු මොනවා දැයි විස්තර කරයි.<br>● තද්ධිත නාම සෑදෙන ආකාරය නිදසුන් සහිත ව විස්තර කරයි.<br>● තද්ධිත නාමයක ප්‍රකෘතිය සහ ප්‍රත්‍යය වෙන් කොට දක්වයි.<br>● විවිධ අර්ථ ගෙන දෙන තද්ධිත ප්‍රත්‍යය සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.<br>● කෘදන්ත නාම සෑදෙන ආකාරය නිදසුන් සහිත ව විස්තර කරයි.<br>● කෘදන්ත ප්‍රභේද හඳුනාගෙන උදාහරණ දක්වයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | • නිපාත | • නිපාත හඳුනා ගෙන විස්තර කරයි.<br>• නිපාත විවිධ ප්‍රභේද යටතේ වර්ග කර දක්වයි.<br>• නිපාත වෙන් කොට ලිවිය යුතු බව පැහැදිලි කරයි.<br>• භාෂා භාවිතයේ දී නිපාත උචිත පරිදි යොදා ගනියි. | |
| | | • උපසර්ග | • උපසර්ග හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• උපසර්ගවලින් ඉටු වන විවිධ කාර්යයන් සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.<br>• භාෂා භාවිතයේ දී උපසර්ග අර්ථවත් ලෙස යොදා ගනියි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 8.2 උක්ත - ආඛ්‍යාත යෝගය පිළිබඳ රීති නිවැරදි ව භාවිත කරමින් වාක්‍ය ලියයි. | • උක්ත, ආඛ්‍යාත පද සම්බන්ධය<br>- උක්ත - අනුක්ත භේදය<br>- උක්ත - අනුක්ත භේදය පිළිබඳ වාක්‍ය රීති | • උක්ත - අනුක්ත භේදය පිළිබඳ රීති හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• වාක්‍ය වින්‍යාස රීති නිවැරදි ව භාවිතයේ වැදගත්කම විස්තර කරයි.<br>• උක්ත - අනුක්ත භේදය පිළිබඳ රීති නිවැරදි ව අනුගමනය කරමින් වාක්‍ය ලියයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 9.0 සංශ්ලේෂණ හා විශ්ලේෂණ පරිචය ප්‍රදර්ශනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි. | 9.1 සංශ්ලේෂණ හා විශ්ලේෂණ ශක්‍යතා ප්‍රදර්ශනය කරමින් විචාරශීලී ව කරුණු සංවිධානය කරමින් ශාස්ත්‍රීය, විචාරාත්මක හා නිර්මාණාත්මක රචනා ලියයි. | • ශාස්ත්‍රීය ලිපි ලේඛන පරිශීලනය හා වාක්‍ය රචනය<br>- සාම්ප්‍රදායික/ නූතන කලා ශිල්ප, සංස්කෘතිකාංග, කාලීන, ජාතික හා ජාත්‍යන්තර සමාජ, ආර්ථික දේශපාලනික හා ආධ්‍යාපනික ප්‍රවණතා<br>- විද්‍යාව, තාක්ෂණය, තොරතුරු තාක්ෂණය හා සන්නිවේදනය වැනි විෂය අලළා සම්පාදිත ශාස්ත්‍රීය ලේඛන හා නිර්මාණාත්මක ලේඛන පරිශීලනය<br>- නිර්මාණාත්මක රචනා සම්පාදනය | • මාතෘකානුකූල රචනා ලිවීම සඳහා අවශ්‍ය තොරතුරු රැස් කරයි.<br>• මාතෘකාවට අදාළ ව රචනාවේ සැලැස්ම ගොඩනගයි.<br>• රචනා ලිවීමේ දී තර්කානුකූල ව කරුණු සංවිධානය කරයි.<br>• සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියා ප්‍රදර්ශනය කරමින් රචනා ලියයි. | 05 |
| | 9.2 සංශ්ලේෂණ ශක්‍යතා දක්වමින් සාරාංශකරණයේ යෙදෙයි. | • අනිර්දිෂ්ට ගද්‍ය පාඨයක් සාරාංශ කිරීම | • සාරාංශකරණයේ වැදගත්කම විස්තර කරයි.<br>• සාරාංශකරණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු පැහැදිලි කරයි.<br>• ශිල්පීය කුසලතා ප්‍රදර්ශනය කරමින් සාරාංශ ලියයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 9.4 අනිර්දිෂ්ට ගද්‍ය පාඨවල අන්තර්ගතය අවබෝධ කර ගැනීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | අනිර්දිෂ්ට ගද්‍ය පාඨවල අන්තර්ගතය අවබෝධ කර ගැනීම<br>- (ශාස්ත්‍රීය ලිපි, ලේඛන, සංවාද ඇසුරෙන්) | • අනිර්දිෂ්ට ගද්‍ය පාඨ කියවා දුරවබෝධ වචනවල අර්ථ පැහැදිලි කරයි.<br>• ගද්‍ය පාඨයක අන්තර්ගතය වටහා ගැනීම සඳහා අවබෝධයෙන් කියවීමේ වැදගත්කම විස්තර කරයි.<br>• අනිර්දිෂ්ට ගද්‍ය පාඨ කියවා මූලික අදහස ඉදිරිපත් කරයි.<br>• අනිර්දිෂ්ට ගද්‍ය පාඨවල අන්තර්ගත අදහස ලිහිල් බසින් ලියයි. | 05 |
| | 9.5 නිර්දිෂ්ට ගද්‍ය පාඨ ඇසුරෙන් විවිධ ලේඛන ශෛලි හඳුනා ගෙන භාෂා කාර්යයේ යෙදෙයි. | • විවිධ ලේඛකයන්ගේ ලේඛන ඇසුරෙන්<br>- ලේඛන ආකෘතිය<br>- භාෂා ශෛලිය<br>- ලේඛන රීතිය<br>- ලක්ෂ්‍යගත පාඨකයා හඳුනා ගැනීම<br>• **නිර්දිෂ්ට ලේඛන**<br>- **හෙළ හවුලේ ලේඛන**<br>- **විද්‍යා ලේඛන**<br>- **ශාස්ත්‍රීය ලේඛන**<br>- **ජන මාධ්‍ය ලේඛන**<br>- **භාෂණ ව්‍යවහාරය පදනම් කර ගත් ලේඛන**<br>• උචිත ආකෘතිය හා ශෛලිය භාවිත කරමින් ලේඛනයේ යෙදීම<br>- පුවත්පත් වාර්තා රචනය | • විවිධ ලේඛනවල ආකෘති හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• විවිධ ලේඛකයන්ගේ භාෂා රටා හඳුනා ගෙන විස්තර කරයි.<br>• විවිධ ලේඛන සඳහා උචිත භාෂා ශෛලි පවතින බව විස්තර කරයි.<br>• ලේඛනයේ ස්වභාවය අනුව උචිත ආකෘතිය හා භාෂා ශෛලිය තෝරා ගනියි.<br>• පුවත්පත් වාර්තාවක ස්වරූපය විස්තර කරයි.<br>• උචිත ආකෘතියට අනුව නිවැරදි ව භාෂාව හසුරුවමින් පුවත්පත් වාර්තා රචනා කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 පුරාතන ගද්‍ය සාහිත්‍යය පරිශීලනයෙන් ලබාගත් මානව ගුණධර්ම හා සංස්කෘතිකාංග මඟින් ජීවිත පරිඥානය පුළුල් කරගනිමින් රස වින්දනයේ හා විචාරයේ යෙදෙයි. | 1.2 නිර්දිෂ්ට කෘතිවල සුවිශේෂතා, අන්තර්ගතය, භාෂා ලක්ෂණ හා රචනා රීති හඳුනා ගෙන රස විඳිමින් විමසුමට ලක් කරයි. | • නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පාඨවල තේමාව හා අන්තර්ගතය හඳුනා ගැනීම<br>• නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පාඨවල අර්ථාවබෝධය හා ඒවා ලිහිල් බසින් ලිවීම<br>• නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පාඨවල රචනා රීතිය හා සාහිත්‍යමය අගය හඳුනා ගැනීම හා රස වින්දනය<br><br>නිර්දිෂ්ට පුරාතන ගද්‍ය -<br><br>• සද්ධර්ම රත්නාවලිය<br>- **කුණ්ඩලකේසීගේ වස්තුව**<br><br>• පූජාවලිය<br>- **ජීවක වෛද්‍යවරයාගේ කථාව**<br><br>• ජාතක කතා<br>- **චුල්ලධනුද්ධර ජාතකය**<br><br>• සද්ධර්මාලංකාරය<br>- **නන්දිවාණිජ වස්තුව** | • නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පාඨවල තේමාව, සන්දර්භය හා භාෂාවේ සුවිශේෂතා හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පාඨ අර්ථාවබෝධයෙන් යුක්ත ව ලිහිල් බසින් ලියයි.<br>• නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පාඨවල සාහිත්‍යික අගය හඳුනා ගෙන රස විඳිමින් විචාරය කරයි. | 24 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.3 නිර්දිෂ්ට කථා වින්දනාත්මක ව පරිශීලනයෙන් හඳුනා ගත් මානව ගුණධර්ම හා සමාජ හර පද්ධතීන් භාවිතයට ගනියි. | ● නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පාඨ පරිශීලනය කොට පුරාතන ගද්‍ය සාහිත්‍යය මඟින් ප්‍රකට වන මානව ගුණධර්ම, හර පද්ධති හඳුනා ගැනීම හා ප්‍රායෝගික භාවිතය<br>● සාහිත්‍ය නිර්මාණකරණයට යොමු වීම | ● පුරාතන ගද්‍ය සාහිත්‍යය පරිශීලනයෙන් හඳුනා ගත් මානව ගුණධර්ම විස්තර කරයි.<br>● මානව ගුණධර්ම හා හර පද්ධති ඇසුරෙන් චරිත සංවර්ධනය ගොඩනඟා ගත යුතු බව පැහැදිලි කරයි.<br>● අත්පත් කරගත් මානව ගුණධර්ම සුරකිමින් සාහිත්‍ය නිර්මාණකරණයේ යෙදෙයි. | 15 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2.0 පුරාතන පද්‍ය සාහිත්‍යයේ විකාසනය, ආකෘතික ලක්ෂණ හා ස්වභාවය අධ්‍යයනය කරමින් රස වින්දනයේ හා විචාරයේ යෙදෙයි. | 2.3 කාව්‍ය විචාර සංකල්ප හඳුනා ගෙන, නිර්දිෂ්ට පද්‍ය නිර්මාණ රස විඳිමින් විචාරයට ලක් කරයි. | ● කාව්‍ය විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට පුරාතන පද්‍ය නිර්මාණ රස වින්දනය හා විචාරය<br><br>නිර්දිෂ්ට පුරාතන පද්‍ය -<br>● ගුත්තිල කාව්‍යය - වැත්තෑවේ හිමි (148 - 317 කවි) | ● පෙරදිග කාව්‍ය විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට පුරාතන පද්‍ය රස විඳිමින් විචාරය කරයි.<br>● නිර්දිෂ්ට පුරාතන පද්‍ය රස වින්දනයෙන් ලත් පරිචය ඇසුරෙන් වෙනත් කාව්‍ය නිර්මාණ රසවින්දනයට පෙලඹෙයි. | 35 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0.නවකතා සාහිත්‍යාංගයේ ලක්ෂණ හා මූලිකාංග පිළිබඳ අවබෝධයෙන් යුක්ත ව නවකතා රස විඳිමින් විචාරයට ලක් කරයි. | 3.3 නවකථාංග කෙරෙහි අවධානයෙන් යුතු ව නිර්දිෂ්ට නවකතාව රස විඳිමින් විචාරයට ලක් කරයි. | ● නවකථාංග පිළිබඳ අවධානයෙන් යුතු ව නිර්දිෂ්ට නවකතාව රස වින්දනය හා විචාරයට ලක් කිරීම<br><br>**නිර්දිෂ්ට නවකතාව -**<br>● **බැද්දේගම - ලෙනාඩ් වුල්ෆ් (ඒ. පී. ගුණරත්න පරිවර්තනය)** | ● නිර්දිෂ්ට නවකතාවේ ඇතුළත් නවකථාංග හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>● නිර්දිෂ්ට නවකතාවේ කලාත්මක ලක්ෂණ පැහැදිලි කරයි.<br>● නිර්දිෂ්ට නවකතාවෙන් හෙළි වන සමාජ පසුබිම පැහැදිලි කරයි.<br>● නිර්දිෂ්ට නවකතාව රස විඳිමින් විචාරයට ලක් කරයි. | 28 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
| --- | --- | --- | --- | --- |
| 4.0. කෙටිකතා කලාවේ විකාසනය, මූලිකාංග හා විශේෂ ලක්ෂණ හඳුනා ගෙන කෙටිකතා රස විඳිමින් විචාරයේ යෙදෙයි. | 4.3 කෙටිකතා ලක්ෂණ කෙරෙහි අවධානයෙන් යුතු ව නිර්දිෂ්ට කෙටිකතා රස විඳිමින් විචාරයට ලක් කරයි. | • නිර්දිෂ්ට කෙටිකතාවල කතුවරුන්, කාලය හා සාහිත්‍ය පසුබිම හඳුනා ගැනීම<br>• නිර්දිෂ්ට කෙටිකතාවල තේමාව හා අන්තර්ගතය හඳුනා ගැනීම<br>• නිර්දිෂ්ට කෙටිකතාවල ඇතුළත් කෙටිකතා ලක්ෂණ හඳුනා ගැනීම<br>• නිර්දිෂ්ට කෙටිකතා රස වින්දනය හා විචාරය<br>**නිර්දිෂ්ට කෙටිකතා -**<br>• **කපිතන්ගේ පුත්තු - දයාසේන ගුණසිංහ**<br>• **මිනිස් වටය - එරික් ඉලයප්ආරච්චි**<br>• **කරත්තය - සෝමරත්න බාලසූරිය**<br>• **කළු සපත්තු- ජයතිලක කම්මැල්ලවීර**<br>• **කවියෙකුට අත්දැකීමක් - රංජිත් ධර්මකීර්ති**<br>• **ගස් - නිශ්ශංක විජේමාන්න**<br>• **හැත්තෑ ලක්ෂයෙන් එකෙක් - ලියනගේ අමරකීර්ති**<br>• **නිදහස් උදෑසන - කීර්ති වැලිසරගේ** | • නිර්දිෂ්ට කෙටිකතාවල කතුවරුන්, කාලය හා සාහිත්‍ය පසුබිම හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• නිර්දිෂ්ට කෙටිකතා කියවා තේමාව හා අන්තර්ගතය විස්තර කරයි.<br>• නිර්දිෂ්ට කෙටිකතාවල කලාත්මක ලක්ෂණ හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• කෙටිකතා රස විඳිමින් විචාරයට ලක් කරයි. | 29 |
| | 4.4 කෙටිකතා ලක්ෂණ කෙරෙහි අවබෝධයෙන් යුතු ව කෙටිකතා නිර්මාණකරණයේ යෙදෙයි. | • විවිධ කෙටිකතා පරිශීලනය කිරීම<br>• කෙටිකතාවලට පාදක වූ අද්දැකීම් හඳුනා ගැනීම<br>• විවිධ අද්දැකීම් පාදක කර ගෙන කෙටිකතා නිර්මාණය කිරීම | • කෙටිකතාවලට පාදක වූ විවිධ අද්දැකීම් හඳුනා ගෙන විස්තර කරයි.<br>• කෙටිකතා නිර්මාණය සඳහා සුදුසු අද්දැකීම් තෝරා ගනියි.<br>• සාර්ථක කෙටිකතාවක මූලික ලක්ෂණ සහ අද්දැකීම් පදනම් කොට ගෙන කෙටිකතා නිර්මාණයේ යෙදෙයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 5.0 නාට්‍ය සාහිත්‍යයේ සුවිශේෂතා හා විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව නාට්‍ය පෙළ රස විඳිමින් විචාරය කරයි. | 5.3 නාට්‍ය විචාර සංකල්ප හඳුනා ගෙන නිර්දිෂ්ට නාට්‍ය පෙළ රස විඳිමින් විචාරයට ලක් කරයි. | • නාට්‍ය විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට නාට්‍ය පෙළ රස විඳීම හා විචාරය<br><br>**නිර්දිෂ්ට නාට්‍යය -**<br>• **පේමතෝ ජායතී සෝකෝ - එදිරිවීර සරච්චන්ද්‍ර** | • නිර්දිෂ්ට නාට්‍යයේ සුවිශේෂතා හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• නිර්දිෂ්ට නාට්‍ය පෙළ රස විඳිමින් විචාරය කරයි. | 16 |
| | 5.4 නාට්‍යයක මූලික ලක්ෂණ හඳුනා ගෙන නාට්‍ය පිටපත් රචනා කරයි. | • විවිධ නාට්‍ය පිටපත් පරිශීලනය කිරීම<br>• නාට්‍යෝචිත අවස්ථා හඳුනා ගැනීම<br>• නාට්‍ය පිටපත් රචනා කිරීම | • නාට්‍ය නිර්මාණය සඳහා සුදුසු තේමා හා නාට්‍යෝචිත අවස්ථා හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• විවිධ නාට්‍ය පෙළවල ඇතුළත් කලාත්මක ලක්ෂණ හඳුනා ගෙන විස්තර කරයි.<br>• විවිධ නාට්‍ය පෙළ කියවීමට පෙලඹෙයි.<br>• සාර්ථක නාට්‍ය පෙළෙක මූලික ලක්ෂණ හා නටෝ‍යෝචිත අවස්ථා පාදක කර ගෙන නාට්‍ය පිටපත් රචනා කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6.0 නූතන කාව්‍ය සාහිත්‍යයේ විකාසනය හා සුවිශේෂතා හඳුනා ගෙන කාව්‍ය විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට කාව්‍ය රස විඳිමින් විචාරයෙහි යෙදෙයි. | 6.3 කාව්‍ය විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට කාව්‍ය රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි. | • නිර්දිෂ්ට නූතන කාව්‍ය නිර්මාණවල කර්තෘවරුන්, කාලය හා සාහිත්‍ය පසුබිම<br>• නිර්දිෂ්ට නූතන කාව්‍යවල තේමාව, අරමුණ හා අන්තර්ගතය හඳුනා ගැනීම<br>• නිර්දිෂ්ට නූතන කාව්‍යවල විශේෂ ලක්ෂණ හා සාහිත්‍යික අගය හඳුනා ගැනීම<br>• කාව්‍ය විචාර සංකල්ප අනුව නිර්දිෂ්ට නූතන කාව්‍ය රස වින්දනය හා විචාරය<br><br>නිර්දිෂ්ට නූතන කාව්‍ය නිර්මාණ -<br><br>• හෙළ හවුල් කවිය<br>• කුමාරතුංග මුනිදාස -නැළැවිල්ල<br>• රැ. තෙන්නකෝන් - හැවිල්ල<br>• අරීසෙන් අහුබුදු - මඟුල් ගීය<br><br>• නිදහස් කවියේ ප්‍රථම තරංගය<br>• ජී. බී. සේනානායක - දෙවියන් මැරීම<br>• සිරි ගුනසිංහ - අබිනික්මන<br>• ගුණදාස අමරසේකර - අඳුර අපේ දුක නිවාවි<br>• මහගම සේකර - මාර යුද්ධය<br>• විමල් දිසානායක - නාගල කන්ද | • නිර්දිෂ්ට කාව්‍ය නිර්මාණවල කතුවරුන්, කාලය හා සාහිත්‍ය පසුබිම හඳුනා ගෙන විස්තර කරයි.<br>• නිර්දිෂ්ට නූතන කාව්‍ය නිර්මාණවල සුවිශේෂතා පැහැදිලි කරයි.<br>• නිර්දිෂ්ට නූතන කාව්‍යවල කලාත්මක අගය විමසමින් රස විඳියි. | 32 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | • නිදහස් කවියේ ද්විතීය තරංගය<br><br>• පරාක්‍රම කොඩිතුවක්කු - දේදුන්න පායාවි හෙටත් පාලම උඩින්<br>• මොනිකා රුවන්පතිරණ - පොඩි දුව<br>• දයාසේන ගුණසිංහ - රන්තැටියක කඳුළු<br>• බුද්ධදාස ගලප්පත්ති - දුරු රට ගිය පුතු<br>• රත්න ශ්‍රී විජේසිංහ - පරමල්<br>• නන්දන වීරසිංහ - ආදරණීය පාසල<br>• ආරියවංශ රණවීර - තුරු සෙනග හා තණ පඳුර<br>• ධර්මසිරි රාජපක්ෂ - නංගීගේ රහසිගත සෙනෙහෙ වීණාව<br>• ලාල් හෑගොඩ - සතුට | | |
| | 6.4 නූතන කාව්‍ය නිර්මාණවල විශේෂ ලක්ෂණ හඳුනා ගනිමින් නිර්මාණකරණයේ යෙදෙයි. | • කාව්‍ය නිර්මාණ පරිශීලනය කිරීම<br>• කාව්‍ය නිර්මාණයට උචිත අද්දැකීම් ගොනු කර ගැනීම<br>• විවිධ තේමා හා ආකෘති ඔස්සේ කාව්‍ය නිර්මාණකරණයේ යෙදීම | • කාව්‍ය නිර්මාණ පරිශීලනය කර විශේෂ ලක්ෂණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• විවිධ කාව්‍ය නිර්මාණවලට පාදක වූ අද්දැකීම් විස්තර කරයි.<br>• කාව්‍ය නිර්මාණයට උචිත තේමා හා අද්දැකීම් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• විවිධ ආකෘතීන්ට අනුව කාව්‍ය නිර්මාණකරණයේ යෙදෙයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 8.0 ව්‍යාකරණ රීති හා භාෂා සම්ප්‍රදාය නිවැරදි ව භාවිත කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි. | 8.2 උක්ත - ආඛ්‍යාත යෝගය පිළිබඳ රීති නිවැරදි ව භාවිත කරමින් වාක්‍ය ලියයි. | ● උක්ත, ආඛ්‍යාත පද සම්බන්ධය<br>- වාක්‍ය රීති<br><br>● කාරක භේදය<br>- කර්තෘ කාරක වාක්‍ය<br>- කර්ම කාරක වාක්‍ය<br><br>● ප්‍රකෘති කථනය, විකෘති කථනය | ● උක්ත ආඛ්‍යාත පද සම්බන්ධ රීති හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>● කාරක භේදය පිළිබඳ රීති පැහැදිලි කරයි.<br>● කාරක භේදය නිවැරදි ව හඳුනා ගෙන භාවිත කරයි.<br>● වාක්‍ය රීති නිවැරදි ව භාවිත කිරීමේ වැදගත්කම ප්‍රකාශ කරයි.<br>● ලේඛනයේ දී උක්ත ආඛ්‍යාත පද සම්බන්ධ රීති නිවැරදි ව භාවිත කරයි.<br>● ප්‍රකෘති කථනය හා විකෘති කථනය හඳුනා ගෙන නිවැරදි ව විස්තර කරයි.<br>● ප්‍රකෘති කථනය හා විකෘති කථනය නිවැරදි ව යොදමින් වාක්‍ය ලියයි. | 50 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 9.0 සංශ්ලේෂණ හා විශ්ලේෂණ පරිචය ප්‍රදර්ශනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි. | 9.1 සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියා ප්‍රදර්ශනය කරමින් විචාරශීලී ව කරුණු සංවිධානය කර ශාස්ත්‍රීය, විචාරාත්මක හා නිර්මාණාත්මක රචනා ලියයි. | ● ශාස්ත්‍රිය ලිපි ලේඛන පරිශීලනය හා වාක්‍ය රචනය<br>- සාම්ප්‍රදායික/ නූතන කලා ශිල්ප, සංස්කෘතිකාංග, කාලීන, ජාතික හා ජාත්‍යන්තර සමාජ, ආර්ථික දේශපාලනික හා ආධ්‍යාපනික ප්‍රවණතා<br>- විද්‍යාව, තාක්ෂණය, තොරතුරු තාක්ෂණය හා සන්නිවේදනය යන විෂය අලළා සම්පාදිත ශාස්ත්‍රීය ලේඛන හා නිර්මාණාත්මක ලේඛන පරිශීලනය<br>- නිර්මාණාත්මක රචනා සම්පාදනය | ● මාතෘකානුකූල රචනා ලිවීම සඳහා අවශ්‍ය තොරතුරු රැස් කරයි.<br>● මාතෘකාවට අදාළ ව රචනාවේ සැලැස්ම ගොඩ නගයි.<br>● රචනා ලිවීමේ දී තර්කානුකූල ව කරුණු සංවිධානය කරයි.<br>● සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියා ප්‍රදර්ශනය කරමින් රචනා ලියයි. | 11 |
| | 9.2 සංශ්ලේෂණ ශක්‍යතා දක්වමින් සාරාංශකරණයේ යෙදෙයි. | ● අනිර්දිෂ්ට ගද්‍ය පාඨයක් සාරාංශ කිරීම | ● සාරාංශකරණයේ වැදගත්කම විස්තර කරයි.<br>● සාරාංශකරණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු පැහැදිලි කරයි.<br>● ශිල්පීය කුසලතා ප්‍රදර්ශනය කරමින් සාරාංශ ලියයි. | 11 |
| | 9.3 භාෂණ ව්‍යවහාරයෙන් ඇති පාඨ වර්තමාන ලේඛන ව්‍යවහාරයෙන් ලියයි. | ● භාෂණ ව්‍යවහාරයෙන් ඇති පාඨ සමකාලීන (අද්‍යතන) සිංහලයට නංවා ලිවීම | ● භාෂණ ව්‍යවහාරයෙන් හා ලේඛන ව්‍යවහාරයෙන් ඇති පාඨ අතර වෙනස හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>● භාෂණය හා ලේඛනය අතර වෙනස්කම් පවතින බව පිළිගනියි.<br>● භාෂණ ව්‍යවහාරය අද්‍යතන ලිඛිත ව්‍යවහාරයට හරවා ලියයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 9.4 අනිර්දිෂ්ට පාඨවල අන්තර්ගතය අවබෝධ කරගැනීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | ● අනිර්දිෂ්ට ගද්‍ය පාඨවල අන්තර්ගතය අවබෝධ කර ගැනීම<br>- (ශාස්ත්‍රීය ලිපි, ලේඛන, සංවාද ඇසුරෙන්) | ● අනිර්දිෂ්ට ගද්‍ය පාඨ කියවා දුරවබෝධ වචනවල අර්ථ පැහැදිලි කරයි.<br>● ගද්‍ය පාඨයක අන්තර්ගතය වටහා ගැනීම සඳහා අවබෝධයෙන් කියවීමේ වැදගත්කම විස්තර කරයි.<br>● අනිර්දිෂ්ට ගද්‍ය පාඨ කියවා මූලික අදහස ඉදිරිපත් කරයි.<br>● අනිර්දිෂ්ට ගද්‍ය පාඨවල අන්තර්ගත අදහස ලිහිල් බසින් ලියයි. | 06 |
| | 9.5 නිර්දිෂ්ට ගද්‍ය පාඨ ඇසුරෙන් විවිධ ලේඛන ශෛලි හඳුනා ගෙන භාෂා කාර්යයේ යෙදෙයි. | ● උචිත ආකෘතිය හා ශෛලිය භාවිත කරමින් ලේඛනයේ යෙදීම<br>- විශේෂාංග ලිපි<br>- තීරු ලිපි<br>- ශාස්ත්‍රීය ලිපි | ● විවිධ ලේඛන සඳහා උචිත ආකෘති හා භාෂා ශෛලි පවතින බව විස්තර කරයි.<br>● විශේෂාංග ලිපියක විශේෂ ලක්ෂණ හඳුන්වයි.<br>● තීරු ලිපියක විශේෂතා විස්තර කරයි.<br>● ශාස්ත්‍රීය ලිපි යනු මොනවා දැයි පැහැදිලි කරයි.<br>● ලේඛනයේ ස්වභාවය අනුව උචිත ආකෘතිය හා භාෂා ශෛලිය තෝරා ගනියි.<br>● නිර්මාණශීලී ලෙසත් නිවැරදි ලෙසත් භාෂාව හසුරුවමින් ලේඛනයේ යෙදෙයි. | 21 |

## (ඇ) පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්

කිසියම් විෂයකට අදාළ විෂය නිර්දේශයක් සකස් කරනුයේ එම විෂය හදාරන ශිෂ්‍ය ප්‍රජාවට පොදුවේ ගැළපෙන පරිදි ය. එසේ වුවත් පන්ති කාමර මට්ටමෙන් එම විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ දී පවත්නා භෞතික පරිසරය මෙන් ම එක් එක් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ කායික, මානසික ස්වභාවය කෙරෙහි ද අවධානය යොමු කිරීමට සිදු වනු ඇත. සිංහල විෂය සම්බන්ධව ද මෙය පොදු තත්ත්වයකි.

එබැවින් සිංහල විෂයට අදාළ පන්ති කාමර ඉගැනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පාසලේ පවතින පහසුකම් අනුව ගුරුවරයා විසින් සුදුසු පරිදි සැලසුම් කරගනු ලැබිය යුතු ය. තව ද පන්ති කාමරයට පමණක් සීමා නො වූ ප්‍රායෝගික ඉගැනුම් අවස්ථා වෙත ද ශිෂ්‍යයා යොමු කළ යුතු ය. භාෂාව හා සාහිත්‍යය පිළිබඳ දැනුම, අවබෝධය මෙන් ම රසවින්දනය ද ශිෂ්‍යයා තුළ වර්ධනය වීමට තුඩු දෙන විෂය සමගාමී හා විෂය බාහිර ක්‍රියාකාරකම් මේ සඳහා ඉවහල් කරගත හැකි ය.

- දේශන
- සාකච්ඡා
- කේවල හා කණ්ඩායම් ක්‍රියාකාරකම්
- රස වින්දන වැඩසටහන්

ආදි ඉගැනුම් ඉගැන්වීම් ක්‍රමවේද මෙන් ම,

- බිත්ති පුවත් පත් හා සඟරා
- සාහිත්‍ය සංගම්/උත්සව
- පුස්තකාල පරිහරණය
- ක්ෂේත්‍ර චාරිකා
- නාට්‍ය
- භාෂා තරග
- භාෂා දින වැඩසටහන්/ප්‍රදර්ශන
- ජන මාධ්‍ය

ආදිය ද ඵලදායී අයුරින් යොදාගෙන ශිෂ්‍යයාගේ කුසලතා වර්ධනයට අත්වැලක් ලබා දිය හැකි ය.

## (ඇ) තක්සේරුව හා ඇගයීම

අ. පො. ස. (උසස් පෙළ) විෂය මාලාවේ 12 සහ 13 ශ්‍රේණි යටතේ වසර දෙකක කාල සීමාවකින් අනතුරු ව අ. පො. ස. (උසස් පෙළ) විභාගයට මුහුණ දීමට ශිෂ්‍යයාට සිදු වෙයි. උක්ත විභාගය මෙම විෂය නිර්දේශයට අදාළ ජාතික මට්ටමේ ඇගයීම වශයෙන් සැලකිය හැකි ය. මේ හැරෙන්නට පන්ති කාමර මට්ටමෙන් ක්‍රියාත්මක වන දෛනික ඇගයීම් වැඩපිළිවෙළක් සහ වාර අවසාන හා වර්ෂ අවසාන විභාග ක්‍රමයක් පාසල විසින් උචිත පරිදි සැලසුම් කරගත යුතු ය. පාසල් පාදක ඇගයීම් වශයෙන්,

- කේවල පැවරුම්
- කණ්ඩායම් පැවරුම්
- වාචික අභ්‍යාස
- ලිඛිත අභ්‍යාස



ආදිය යොදාගත හැකි ය.

නිපුණතා මට්ටම් 1.3 යටතේ ඇති සාහිත්‍ය නිර්මාණකරණය, 6.4 යටතේ ඇති කාව්‍ය නිර්මාණකරණය, 4.4 යටතේ ඇති කෙටිකතා නිර්මාණකරණය, 5.4 යටතේ ඇති නාට්‍ය පිටපත් රචනා කිරීම, 9.5 යටතේ ඇති පුවත්පත් වාර්තා රචනය, විශේෂාංග ලිපි රචනය, තීරු ලිපි රචනය හා ශාස්ත්‍රීය ලිපි සකස් කිරීම යන විෂය කොටස් පාසල් පාදක ඇගයීම් යටතේ ඇගයීමට ලක් කළ හැකි ය.

# (ඉ) නිර්දිෂ්ට ග්‍රන්ථ

## පුරාතන ගද්‍ය

- සද්ධර්මරත්නාවලිය (ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම සංස්.)
  - කුණ්ඩලකේශී වස්තුව
  - මට්ටකුණ්ඩලී වස්තුව

- පූජාවලිය (ඒ. වී. සුරවීර සහ තවත් අය සංස්.)
  - අනුරුද්ධ කුමාර කථාව - ''කපිලවස්තු පුරයෙහි ශුද්ධෝදන රජ්ජුරුවන් මල්..'' යන තන්හි සිට ''... අනුරුද්ධ මහ තෙරුන් වහන්සේ යැයි මේ නමින් ..ප්‍රසිද්ධ වූ සේක.'' යන තැනට
  - ජීවක වෛද්‍යවරයාගේ කථාව - ''විශාලා මහ නුවර අම්බපාලී නම් ගණිකාවක් ඇත'' යන තැන සිට ''.. තමන්ගෙන් ජීවකයන්ට ප්‍රසාද දුන්හ.'' යන තැනට

- ජාතක කතා පොත
  - චන්දකින්නර ජාතකය
  - චුල්ල ධනුද්දර ජාතකය

- සද්ධර්මාලංකාරය (බෙන්තර ශ්‍රද්ධාතිෂ්‍ය සංස්.)
  - ස්වර්ණතිලකා වස්තුව
  - නන්දිවාණිජ වස්තුව

## පුරාතන පද්‍ය

- ගුත්තිල කාව්‍යය - වැත්තෑවේ හිමි (ඩබ්ලියු. එෆ්. ගුණවර්ධන සංස්කරණය)
  91 - 317 කවි ( කවි 226ක් )

## නවකතා

- බැද්දේගම - ලෙනාඩ් වුල්ෆ් (ඒ. පී. ගුණරත්න පරිවර්තනය)

## කෙටිකතා

- වහල්ලු - මාර්ටින් වික්‍රමසිංහ
- වෙසක් පහන - ජී. බී සේනානායක
- දිසොන්චිනාහාමි - ගුණදාස අමරසේකර
- නොනිමි සිත්තම - කේ. ජයතිලක
- නංගී - ඇරැව්වල නන්දිමිත්‍ර
- අකුරට යන වෙලාවේ - ඒ. වී. සුරවීර
- ස්නේහය - සයිමන් නවගත්තේගම
- කපිතන්ගේ පුත්තු - දයාසේන ගුණසිංහ
- මිනිස් වටය - එරික් ඉලයප්ආරච්චි
- කරත්තය - සෝමරත්න බාලසූරිය
- කළු සපත්තු- ජයතිලක කම්මැල්ලවීර
- කවියෙකුට අත්දැකීමක් - රංජිත් ධර්මකීර්ති
- ගස් - නිශ්ශංක විජේමාන්න
- හැත්තෑ ලක්ෂයෙන් එකෙක් - ලියනගේ අමරකීර්ති
- නිදහස් උදෑසන - කීර්ති වැලිසරගේ

## නාට්‍ය

- ප්‍රේමතෝ ජායතී සෝකෝ - එදිරිවීර සරච්චන්ද්‍ර

## නූතන කාව්‍ය නිර්මාණ

- **කොළඹ කවියේ ප්‍රථම තරංගය**
  - ආනන්ද රාජකරුණා - සමනලයා
  - ඇස්. මහින්ද හිමි - ලක් මවුනි මගේ

- **කොළඹ කවියේ ද්විතීය තරංගය**
  - පී. බී. අල්විස් පෙරේරා - පැසුණු පැණ
  - සාගර පලන්සූරිය - ඉගිලෙන සිහින
  - මීමන ප්‍රේමතිලක - අඩසඳ
  - විමලරත්න කුමාරගම - වන්නියේ හැන්දෑව
  - එච්. එම්. කුඩලිගම - තවමත් ඔබ මගේ ය
  - ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ - ළදරු හැඟුම්

- **හෙළ හවුල් කවිය**
  - කුමාරතුංග මුනිදාස - නැළැවිල්ල
  - රැ. තෙන්නකෝන් - හැවිල්ල
  - අරීසෙන් අහුබුදු - මඟුල් ගීය

- **නිදහස් කවියේ ප්‍රථම තරංගය**
  - ජී. බී. සේනානායක - දෙවියන් මැරීම
  - සිරි ගුනසිංහ - අබිනික්මන
  - ගුණදාස අමරසේකර - අඳුර අපේ දුක නිවාවි
  - මහගම සේකර - මාර යුද්ධය
  - විමල් දිසානායක - නාගල කන්ද

- **නිදහස් කවියේ ද්විතීය තරංගය**
  - පරාක්‍රම කොඩිතුවක්කු - දේදුන්න පායාවි හෙටත් පාලම උඩින්
  - මොනිකා රුවන්පතිරණ - පොඩි දුව
  - දයාසේන ගුණසිංහ - රන්තැටියක කඳුළු
  - බුද්ධදාස ගලප්පත්ති - දුරු රට ගිය පුතු
  - රත්න ශ්‍රී විජේසිංහ - පරමල්
  - නන්දන වීරසිංහ - ආදරණීය පාසල
  - ආරියවංශ රණවීර - තුරු සෙනඟ හා තණ පඳුර
  - ධර්මසිරි රාජපක්ෂ - නංගීගේ රහසිගත සෙනෙහෙ වීණාව
  - ලාල් හෑගොඩ - සතුට

## (ඊ) විෂය නිර්දේශ සම්පාදක මණ්ඩලය

අභ්‍යන්තර

- එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම, අධ්‍යක්ෂ, සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.
- ඊ. ආර්. නිමල් ප්‍රේමකුමාර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.
- පූජ්‍ය කේ. ඥානවිමල හිමි, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.
- එම්. ජී. මුණසිංහ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.
- මංගල ගුණරත්න, කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.
- රුවනි සිසිජා ජයකොඩි, සහකාර කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.



බාහිර

- සේවාර්ජිත මහාචාර්ය විමල් ජී. බලගල්ලේ, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, නුගේගොඩ.
- සේවාර්ජිත මහාචාර්ය ජේ. බී. දිසානායක, කොළඹ විශ්වවිද්‍යාලය, කොළඹ.
- විශ්‍රාමික මහාචාර්ය රත්න විජේතුංග, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, නුගේගොඩ.
- විශ්‍රාමික මහාචාර්ය තිස්ස ජයවර්ධන, කොළඹ විශ්වවිද්‍යාලය, කොළඹ.
- ජ්‍යෙෂ්ඨ මහාචාර්ය හර්සන් ඩයස්, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.
- මහාචාර්ය පූජ්‍ය අගලකඩ සිරිසුමන හිමි, කොළඹ විශ්වවිද්‍යාලය, කොළඹ.
- මහාචාර්ය රත්නසිරි අරංගල, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, නුගේගොඩ.
- එස්. ඕ. ප්‍රනාන්දු, විශ්‍රාමික අධ්‍යක්ෂ, සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.
- එච්. පී. සුසිල් සිරිසේන, කථිකාචාර්ය, හාපිටිගම් අධ්‍යාපන විද්‍යාපීඨය, මීරිගම.

**ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

# 01. ගුත්තිල කාව්‍යය (148-193 කවි)

**නිපුණතාව :** 2.0 පුරාතන පද්‍ය සාහිත්‍යයේ විකාසනය, ආකෘතික ලක්ෂණ හා ස්වභාවය අධ්‍යයනය කරමින් රස වින්දනයේ හා විචාරයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 2.3 කාව්‍ය විචාර සංකල්ප හඳුනා ගෙන නිර්දිෂ්ට පද්‍ය නිර්මාණ රස විඳිමින් විචාරයට ලක් කරයි.

**කාලච්ඡේද :** 10 යි.

**ඉගැනුම් පල :**
- පෙරදිග කාව්‍ය විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට පුරාතන පද්‍ය රස විඳිමින් විචාරය කරයි.
- නිර්දිෂ්ට පුරාතන පද්‍ය රස වින්දනයෙන් ලත් පරිචය ඇසුරින් කාව්‍ය නිර්මාණකරණයට පෙලඹෙයි.

## පාඩම් සැලසුම සඳහා උපදෙස් :

### I පෙර සූදානම :

- ගුත්තිල කාව්‍යයේ 148 සිට 193 දක්වා කවි කියවා රස වින්දනයට හා විචාරයට අදාළ කරුණු රැස් කරගන්න.
- පරිශීලනීය ග්‍රන්ථ ඇසුරෙන් දැනුම පෝෂණය කරගන්න.
- පෙරදිග කාව්‍ය විචාර සංකල්ප පිළිබඳ 12 ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශයේ දැක්වෙන තොරතුරු පිළිබඳ අවධානය යොමු කරන්න.

### II ඉගැනුම සංවර්ධනය :

- පාඩම සඳහා සුදුසු ප්‍රවේශයක් ලබා ගන්න.
  උදා : * ගුත්තිල කාව්‍යයට පදනම් වූ ජාතක කතාවේ සාරාංශය ඉදිරිපත් කිරීම
  * පැරණි සහ නව අධ්‍යාපන ක්‍රමයේ ගුරු-ගෝල සම්බන්ධයේ ස්වභාවය සාකච්ඡා කිරීම
  * ගුත්තිල කාව්‍යය ඇසුරෙන් සැකසුණු ගීතයක් ඉදිරිපත් කිරීම
  * ගුත්තිල කාව්‍යයේ මෙතෙක් උගත් කවිවල සාරාංශය ඉදිරිපත් කිරීම
- පාඩමට අදාළ කවිවල (148 - 193) අරුත් පැහැදිලි කරන්න.
- පහත දැක්වෙන කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් ශිෂ්‍යයන් රස වින්දනයට හා විචාරයට යොමු කරන්න.
  * ගුත්තිල කාව්‍යයේ අදාළ කොටසේ අන්තර්ගතය/සාරාංශය
    - වෙළෙඳුන් විසින් ගුත්තිල ඇදුරු ගුණ වයනු ලැබීම
    - මූසිල වෙළෙඳුන් සමඟ බරණැස් නුවරට පැමිණීම
    - ගුත්තිල මූසිල හමුව
    - ගුත්තිල ඇදුරු වෙතින් වීණා ශිල්පය ඉගැනීම
    - මූසිල බරණැස් රජ මැඳුරෙහි සේවයට එක් වීම
    - සම වැටුප් ඉල්ලා සිටීම
  * අවස්ථානුකූල විරිත් භාවිතය
  * චරිත නිරූපණය (මූසිල, ගුත්තිල ඇදුරු, බඹදත් රජු)
  * අවස්ථා හා සිද්ධි නිරූපණය
    - ගුත්තිල ඇදුරුගේ වීණා නාදයෙන් ප්‍රමෝදයට පත්වූ අයගේ ක්‍රියාකලාපය
    - අඳ මවුපියන් වීණාව මීයන් කන බව සිතා අත් ගැසීම
    - මූසිල ගුත්තිල ඇදුරුතුමන් පා වැඳ ශිල්ප ඉල්ලා සිටීම
    - මූසිල සම වැටුප් ඉල්ලා සිටි අවස්ථාවේ රජුගේ හා ගුත්තිල ඇදුරුගේ ප්‍රතිචාරය

* කාව්‍ය භාෂාව
    - කට වහර
        උදා:- ''එසේ උවහොත් හිමි...'' (159 කවිය)
        ''උදේනී පුර සි ට...'' (164 කවිය)
    - සංස්කෘත අලංකාරයන්ගෙන් තොර ස්වාධීන වර්ණනා මාර්ගය
        උදා:- ''ගොදුරු ලොබ දුරු ක ර'' (156 කවිය)
    - ජන වහර
        උදා:- ''සුසූ යයි අත ගැසූ සැකයෙ න'' (162 කවිය)
* කවියාගේ ප්‍රතිභාව
* සාහිත්‍යික අගය

**III තක්සේරුව හා ඇගයීම**

- පාඩම අතරතුර ශිෂ්‍යයන්ගේ දැනුම තහවුරු කිරීම සඳහා පැවරුම් ලබා දී තක්සේරුකරණයේ යොදන්න.
- අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දීම සිදු කරන්න.
- පද්‍යවල අර්ථ විමසා දැනුම තහවුරු කරන්න.
- අර්ථය ලිහිල් බසින් ලිවීමේ අභ්‍යාසවල යොදවන්න.
- පහත සඳහන් ප්‍රශ්න ශිෂ්‍යයන්ට යොමු කරන්න.
    i. ගුත්තිල කාව්‍යයෙන් නිරූපිත සමකාලීන සමාජ චින්තනය විග්‍රහ කරන්න.
    ii. අවස්ථා නිරූපණයේ දී ගුත්තිල කවියා දක්වන කුසලතාව නිදසුන් දක්වමින් තහවුරු කරන්න.
    iii. මූසිල සහ ගුත්තිල චරිතවල කැපී පෙනෙන ලක්ෂණ උදාහරණ දෙමින් විස්තර කරන්න.

**ගුණාත්මක යෙදවුම්** : * ගුත්තිල කාව්‍යය පිළිබඳ විචාර ග්‍රන්ථ සහ ලිපි

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක** :

- ගුත්තිල කාව්‍යය රසාස්වාදයේ දී ඉවහල් කර ගත හැකි පෙරදිග කාව්‍ය විචාර සංකල්ප පිළිබඳ හැඳින්වීමක් කරයි.
- නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණයෙහි සාහිත්‍යික අගය ඉස්මතු කර දක්වයි.
- විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව කවි රසවින්දනයේ හා විචාරයේ යෙදෙයි.

**පරිශීලනීය ග්‍රන්ථ:**


- කරුණාරත්න, අශෝක - සාහිත්‍ය විවේචනය
- වික්‍රමසිංහ, මාර්ටින් - ගුත්තිල ගීතය
- සරච්චන්ද්‍ර, එදිරිවීර - සාහිත්‍ය විද්‍යාව
- ඥාණසීහ හිමි, හේන්පිටගෙදර - සාහිත්‍යය
- සුරවීර, ඒ. වී. - සිංහල සාහිත්‍ය සම්ප්‍රදාය
- ගම්ලත්, සුචරිත - සම්භාව්‍ය සිංහල පද්‍යයේ විකාසනය
- වික්‍රමසිංහ, මාර්ටින් - සාහිත්‍ය කලාව
- විජයවර්ධන, හේමපාල - කාව්‍ය විචාර ගවේෂණ
- පඤ්ඤාරාම හිමි, යක්කඩුවේ - ගුත්තිල විචාර විචාරය

# 02. නූතන කාව්‍ය - රස වින්දනය හා විචාරය

**නිපුණතාව :** 6.0 නූතන කාව්‍ය සාහිත්‍යයේ විකාසනය හා සුවිශේෂතා හඳුනා ගෙන කාව්‍ය විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට කාව්‍ය රස විඳිමින් විචාරයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 6.3 කාව්‍ය විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට කාව්‍ය රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.

**කාලච්ඡේද :** 16 යි.

**ඉගෙනුම් පල :**
- නිර්දිෂ්ට කාව්‍ය නිර්මාණවල කතුවරුන්, කාලය හා සාහිත්‍ය පසුබිම හඳුනා ගෙන විස්තර කරයි.
- නිර්දිෂ්ට නූතන කාව්‍ය නිර්මාණවල සුවිශේෂතා පැහැදිලි කරයි.
- නිර්දිෂ්ට නූතන කාව්‍යවල කලාත්මක අගය විමසමින් රස විඳියි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:**

**I පෙර සූදානම:**

- පහත සඳහන් නිර්දිෂ්ට පද්‍ය පන්තිවල රචකයන්, ඔවුන් විසූ කාලය, සාහිත්‍යික පසුබිම හා ඔවුන්ගේ වෙනත් නිර්මාණ ආදිය පිළිබඳ තොරතුරු රැස් කර ගන්න.
  1. හෙළ හවුල් කවිය
     - * කුමාරතුංග මුනිදාස - නැළැවිල්ල
     - * රැ. තෙන්නකෝන් - හැවිල්ල
     - * අරීසෙන් අහුබුදු - මඟුල් ගීය
  2. නිදහස් කවියේ ප්‍රථම තරංගය
     - * ජී. බී. සේනානායක - දෙවියන් මැරීම
     - * සිරි ගුනසිංහ - අබිනික්මන
     - * ගුණදාස අමරසේකර - අඳුර අපේ දුක නිවාවි
     - * මහගම සේකර - මාර යුද්ධය
     - * විමල් දිසානායක - නාගල කන්ද

- නිර්දිෂ්ට පද්‍ය පන්තිවල තේමාව/වස්තු විෂය, භාෂාව, ආකෘතිය, අලංකාර භාවිතය, කාව්‍යෝපක්‍රම ආදි තොරතුරු එක් රැස් කර ගන්න.
- ඉහත තොරතුරුවලට අදාළ ව පවර් පොයින්ට් ඉදිරිපත් කිරීමක් සකසා ගන්න.

**II ඉගෙනුම සංවර්ධනය :**

- පහත සඳහන් ක්‍රම අතරින් එකක් හෝ වෙනත් සුදුසු ක්‍රමයක් හෝ භාවිතයෙන් පාඩමට පිවිසෙන්න.
  - * සිංහල පද්‍ය සාහිත්‍යයේ විවිධත්වය පිළිබඳ කෙටි පවර් පොයින්ට් ඉදිරිපත් කිරීමක් සිදු කිරීම.
  - * අනිර්දිෂ්ට කවියක් හා ඒ පිළිබඳ ව ලියවුණු විචාරයක් ඉදිරිපත් කර සාකච්ඡා කිරීම.
  - * අනිර්දිෂ්ට කවියක් ඉදිරිපත් කර ඒ පිළිබඳ ව රස වින්දනයක් සිදු කිරීම සඳහා සංවාදයක් ගොඩනැගීම (ඇමුණුම i)
- නිර්දිෂ්ට කාව්‍ය නිර්මාණ එකින් එක ගෙන ඒවා හොඳින් කියවා අවබෝධ කර ගැනීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.

- නිර්දිෂ්ට කාව්‍ය නිර්මාණ පිළිබඳ රසාස්වාදයක නිරත වන්න. මේ සඳහා කණ්ඩායම් ක්‍රියාකාරකම්, රස වින්දන සංවාද, දේශන, සාකච්ඡා ආදි ක්‍රම යොදා ගන්න.
- කාව්‍ය නිර්මාණ රසාස්වාදයේ දී පහත සඳහන් කරුණු පිළිබඳ සැලකිලිමත් වන්න.
    * තේමාව/වස්තු විෂය
    * කවියාගේ දෘෂ්ටිය
    * අරමුණ
    * කාව්‍යෝපක්‍රම
    * භාෂා භාවිතයේ සුවිශේෂතා
    * ආකෘතිය
    * කාව්‍ය සන්දර්භය

**III තක්සේරුව හා ඇගයීම**

- සුදුසු නිර්ණායක මූලික ඇගැයීම් ක්‍රම යොදා ගනිමින් ඉහළ සාධන මට්ටමක් සඳහා අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- කණ්ඩායම්/කේවල පැවරුම්, ක්‍රියාකාරකම්, කාර්ය පත්‍රිකා, නිරීක්ෂණ, සාකච්ඡා, වාචික ප්‍රශ්නකරණය ආදි තක්සේරු ක්‍රම මේ සඳහා යොදා ගත හැකි ය.
- මෙහි දී පහත සඳහන් කරුණු වෙත අවධානය යොමු කරන්න.
    * නූතන කාව්‍ය විචාර සංකල්ප පිළිබඳ දැනුම
    * කාව්‍ය රස වින්දන හැකියාව
    * කාව්‍ය රසාස්වාදයක් විධිමත් ව ලිවීමේ හැකියාව

**ගුණාත්මක යෙදවුම් :**

* ප්‍රවේශය සඳහා පවර් පොයින්ට් ඉදිරිපත් කිරීමක්
* අනිර්දිෂ්ට කාව්‍ය නිර්මාණ කිහිපයක්

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක:**

- නිර්දිෂ්ට කාව්‍ය නිර්මාණවල මූලික තොරතුරු දැක්වෙන වගුවක් සකස් කරයි.
- නිර්දිෂ්ට කාව්‍ය නිර්මාණවල තේමාව හා අරමුණු හඳුනා ගෙන විස්තර කරයි.
- නිර්දිෂ්ට කාව්‍ය නිර්මාණවල භාෂාවේ සුවිශේෂතා අගය කරයි.
- නිර්දිෂ්ට කාව්‍ය නිර්මාණ රස විඳිමින් විචාරය කරයි.

**පරිශීලනීය ග්‍රන්ථ :**


- කරුණාරත්න, අශෝක - සාහිත්‍ය විවේචනය
- කරුණාරත්න, කුසුමා, සහ සරත් විජේසූරිය - නව කවි සංග්‍රහය
- ගුනසිංහ, සිරි - චිරන්තන සම්ප්‍රදායේ ප්‍රගතිය
- දිසානායක විමල් - නවකවි සරණිය
- සුරවීර, ඒ. වී. - නිර්මාණ පසුබිම
- සුරවීර, ඒ. වී. - සාහිත්‍ය විචාර ප්‍රදීපිකා
- සේනානායක, ජී. බී. - පළිගැනීම (ප්‍රස්තාවනාව)

ඇමුණුම 01 - හෙළ හවුලේ කවි (නිදර්ශන)

**පිය සමර**

ඇස වැසූ නුසුදුස්ස සුදුස්ස පෑ
බස නොබෝ පිරුණෙන් අරුතින් රෙසෙන්
වෙස ගිණූ මිතුරන් සතුරන් ලෙසෙ'ක්
පුබුදුවා ද අහෝ යළි මා කො දා

මගෙ පියාණෙනි හොත් අවසන් ඇඳේ
ඔබ ඔවා හිතුවක් කෙරෙතී දෙමින්
මඟට ගන්නට තැත් කළ ඒ පුතා
සිත-සිතා ළ තවයි ඔබ ගේ අගේ

සිතැ මගේ ඇති සේ කො තැනින් පටන්
ගෙනැ කියම් ද බොහෝ දිගු කල් ගියත්
එක වරේ නැගැ එයි අදහස් දහස්
හැම කරත් නිරවුල් පොහොසත් නො වම්

තතු අසා අවුදින් දූකැ සාදයත්
විඳැ ඔබේ වරුවක් දෙඩුමෙන් ගෙවා
යන නොයෙක් පැනවත් උගතුන් නිසා
ඔබ නිවෙස් අගයෙන් වැඩි වී බොහෝ

කෙළි බිමත් කජු ගස් සෙවණත් පියා
බොළඳ මා රැඳෙතොත් ළඟැ කවුළුයේ
සකුරු කා හුණු කෝපි ද බී දෙඩූ
ඔබ වියත් මිතුරන් කනැ ගැන්මෙනුයි

තැනෙකැ එක් මොහොතක් සිටුමක් නිකම්
බැරි වැ මැක්කකු මෙන් පනිනා හෙයින්
විහිළුවක් කොටැ-ගත් ඔබ ගේ පුතා
යහළුවෝ හළුවෝ ඔබ දොම්නසුත්

ගෙ මිඳුලේ සිටැ මාවත තෙක් වෙයින්
දිවෙන හූ කියමින් නැති තේරුමක්
පුතු බලා තිරිසන් වයසික්මැවූ
මතු සිතු ද වෙතී මෙ ලෙසක් පවා

හිරු බසුත් මැ නිඳන්නට යා නො දී
ගෙන'ත මා මිඳුලේ දිග බෝ වරක්
ඇවිදුවා බලවම්නි කියූ කතා
මට දූනුත් මතක යි අයවයි නුවන්

**කුමාරතුංග මුනිදාස**

(පිය සමර කෘතියේ කවි 118ක් ඇතුළත් වන අතර මෙහි උපුටා ගෙන ඇත්තේ මුල් කවි 08ක් පමණි.)

### අම්බලමේ පිනා

| | |
|---|---|
| අම්බලමේ පිනා | පිනා |
| වළං කදක් ගෙනා | ගෙනා |
| ඒක බිඳැපි ගොනා | ගොනා |
| ගොනාට හරි හිනා | හිනා |

| | |
|---|---|
| කා ගෙ ද මේ | ගොනා |
| කාටත් නැති | ගොනා |
| ගෙන් ගෙට | ඇවිදිනා |
| මූ හරි පින් | ගොනා |

| | |
|---|---|
| අම්බලමේ පිනා | පිනා |
| වළං කදක් ගෙනා | ගෙනා |
| ඒක බිදැපි ගොනා | ගොනා |
| ගොනාට හරි හිනා | හිනා |

| | |
|---|---|
| මුගේ දගේ | මකා |
| ගත්තොත් හොඳ | එකා |
| නිකම් නො ඉඳ | කකා |
| වැඩක් කරන | එකා |

| | |
|---|---|
| ටිකිරි ටිකිරි ටිකිරි | ලියා |
| කඹෙත් අරන් පෙරට | ගියා |
| ගොනු ගෙ ගෙලට කඹේ | ගියා |
| ගොනා ගෙලෙන් බැඳී | ගියා |

| | |
|---|---|
| කත් ලීයෙන් | වනා |
| දෙකක් දීපි | පිනා |
| නාස් ලණුව | ගෙනා |
| දූන් නම් ඌ | ගොනා |

| | |
|---|---|
| අම්බලමේ පිනා | පිනා |
| වළං කදක් ගෙනා | ගෙනා |
| ඒක ඇදපි ගොනා | ගොනා |
| පිනාට දූන් හිනා | හිනා |

**අරීසෙන් අහුබුදු**

*** නිදහස් කවියේ ප්‍රථම තරංගයට අයත් කාව්‍ය නිර්මාණ (නිදර්ශන)**

### ගම අමතකයි

සිදාදියට එන්නට මට
බුද්ධිය උඹ තමයි එදා
පාර කියා දුන්නේ
ගමෙන් උරුම වූ වස්තුව
පොදියක් බැඳ කර තියාන
උඹේ බහට රැවටීලයි සිදාදියට ආවේ

ඒ එන කොට ගෙන ආ දෙය
වියපැහැදම් කළා මිසක
මෙහිදී අලුතින් ඉපයූ කිසිම දෙයක් නැත්තේ
ඉස බර කළ පුහු නම්බුව විතරයි මට ඇත්තේ

සිදාදියෙන් ආපහු මගෙ
ගමට යන්න ආසයි මට
එත් ගමට යන්නට දැන්
පාර මතක නැත්තේ

ඉතිරිව ඇති සුළු වස්තුව
රැක ගෙන ආපහු එන්නට

ඇත ඉඳන් අත වනලා
අම්මේ මට ගමට එන්න
පාර කියාපන්නේ.

බෝ මළුවේ සුදු වැල්ලේ
බෝදිය මුල දණ ගහලා
නිවන් ලබා හිත නිවන්න
අම්මේ මට ගමට එන්න පාර කියාපන්නේ.
මැණික් ගඟෙන් දිය නාලා
ඇඟ පත ගිනියම් දුරලා
කිළි කුණු සෝදා හරින්න
අම්මේ මට ගමට එන්න පාර කියාපන්නේ.

වල් බිහි වී ගිය හේනේ
වල් පැල උදුරා දමලා
පැල ඉණි වැට තර කරලා
අලුතින් බිජුවට ඉහලා
රන් අස්වන් නෙළා ගන්න
ඇත ඉඳන් අත වනලා
අම්මේ මට ගමට එන්න පාර කියාපන්නේ.

**මහගම සේකර**

## දියෙහි ගිලුණු අයියාට

ඔබ කැටුව මෙහි පැමිණි වාර මා අපමණ ය
පීනන්ට මට ඉගැන්වූයෙ අයියේ ඔබ ය
දිය නාන මංකඩින් වතුර යට ගිලෙන ඔබ
කොතැනකින් මතු වේද කියා බලමින් සිටින
මවිත කොට මා දෑස ඔබේ හිස මතුව එයි
මඳ වෙලාවකට පසු මා නො සිතු පෙදෙසකින්
මා පුදුම වෙනු බලා ඔබ සිනාසෙයි එවිට

පැය ගණන් ගතව ඇති නමුත් තව අයියෙ අද
ඔබේ හිස මතු වූ තැන තව ම නොපෙනිණ මහට
අම්ම හා තාත්තා බාල මල්ලී කැටුව
ගමෙන් හරි අඩක් පමණ වූ සෙනඟ මෙහි
රැස්ව, නෙත් කිමිදුවති සාන්ත වූ වැව් දියෙහි.
ඔබෙ විකුම් බලන්නට මෙවන් පිරිසක් කලින්
වැ කන්ද වෙතට ආ දිනක් මට මතක නැත.
අයියෙ, එබැවින් යුහුව මවිත කොට අප සැවොම
දියෙන් හිස නඟා සුපුරුදු විකුම පානු මැන

**විමල් දිසානායක**

# 03. 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍යය - රස වින්දනය හා විචාරය
## (පළමු සහ දෙවන අංක)

**නිපුණතාව :** 5.0 නාට්‍ය සාහිත්‍යයේ විශේෂතා හා විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව නාට්‍ය පෙළ රස විඳිමින් විචාරය කරයි.

**නිපුණතා මට්ටම :** 5.3 නාට්‍ය විචාර සංකල්ප හඳුනා ගෙන නිර්දිෂ්ට නාට්‍ය පෙළ රස විඳිමින් විචාරයට ලක් කරයි.

**කාලච්ඡේද :** 08 යි.

**ඉගෙනුම් පල :**
- නිර්දිෂ්ට නාට්‍යයේ සුවිශේෂතා හඳුනා ගෙන පැහැදිලි කරයි.
- නිර්දිෂ්ට නාට්‍ය පෙළ රස විඳිමින් විචාරය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:**

**I පෙර සූදානම:**

- නිර්දිෂ්ට නාට්‍යයේ පෙළ කියවා ඒ පිළිබඳ පූර්ණ අවබෝධයක් ලබා ගන්න. (එම නාට්‍ය පෙළ ඇසුරින් නිෂ්පාදිත නාට්‍යය සජීව ව නැරඹීම ඔබේ පුළුල් අවබෝධයට හේතු වනු ඇත.)
- 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍ය පෙළෙහි ආරම්භයේ සිට දෙවන අංකය තෙක් කොටස කාලච්ඡේද 8ක දී ඉගැන්වීම සඳහා ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කර ගන්න.
- පහත සඳහන් කරුණු පිළිබඳ ව ශිෂ්‍යයන් සමඟ සාකච්ඡා කිරීමට අදාළ කරුණු රැස් කර ගන්න.
  - * නාට්‍ය පෙළෙහි කාව්‍යාත්මක ගුණය
  - * චරිත නිරූපණය
  - * නාට්‍යයෙහි ගැටුම
- 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍යය පිළිබඳ රස වින්දනය හා විචාරයට අදාළ ඔබ සතු පොත්පත්, ලිපි මෙන් ම ගුණාත්මක යෙදවුම් යටතේ ඉදිරිපත් කර ඇති අතිරේක පරිශීලනීය ග්‍රන්ථ ද කියවා අවශ්‍ය තොරතුරු රැස්කර ගන්න.

**II ඉගැනුම සංවර්ධනය :**

- සුදුසු ප්‍රවේශයක් යොදා ගෙන පාඩමට පිවිසෙන්න.

  *උදා :* * 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍ය පෙළෙහි සඳහන් සංවාද ඛණ්ඩයක් ශිෂ්‍ය-ශිෂ්‍යාවන් කිහිපදෙනකු ලවා වාචික අභිනයෙන් යුතු ව ඉදිරිපත් කිරීම.

  * 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍යයේ ගීතයක් ගුරු ආදර්ශනය ද සහිත ව ශිෂ්‍ය සහභාගිත්වය සමඟ ගැයීම

  * 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍යය පිළිබඳ පුවත්පතක/සඟරාවක පළ වූ ලිපියක් කියවීමට අවස්ථාව ලබා දීම
- 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍ය පෙළ කියවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍යය පිළිබඳ ලියැවී ඇති විවිධ විචාර ලිපි (ඇමුණුම II) ආදිය ශිෂ්‍යයන්ට කියවීමට අවස්ථාව ලබා දී ඒ පිළිබඳ සංවාදයේ යෙදීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- නිර්දිෂ්ට නාට්‍යයේ සාර්ථකත්වයට බලපාන්නා වූ කරුණු පෙළ ගැස්වීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න. (නාට්‍යයේ ගලා යන ආකාරය, නාටකීය සිදුවීම් පෙළගැස්වීම, චරිත හා ඒවායේ සුවිශේෂ ලක්ෂණ, භාෂාව ආදි)
- නාට්‍ය පෙළ ඇසුරින් විවිධ ලිඛිත අභ්‍යාස හා ක්‍රියාකාරකම්වල ශිෂ්‍යයන් නිරත කරවන්න.

- නාට්‍ය විචාර සංකල්ප ඇසුරින් 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍ය පෙළ රස වින්දනය සහ විචාරය පිළිබඳ ව පහත සඳහන් ක්ෂේත්‍රයන්ට අදාළ ව පුළුල් අවබෝධයක් ශිෂ්‍යයන් තුළ ඇති වන පරිදි ශිෂ්‍යයන් රැස් කර ගත් තොරතුරු සහ ගුරු ප්‍රතිපෝෂණ සහිත ව විවිධ නිර්මාණශීලී ක්‍රියාකාරකම්වල ශිෂ්‍යයන් නිරත කරවන්න.
  1. පෙරදිග - අපරදිග විචාර සංකල්ප ඇසුරෙන් නිර්දිෂ්ට නාට්‍ය පෙළෙහි සාර්ථක අසාර්ථක බව විචාරයට හා රස වින්දනයට ලක් කිරීම
  2. 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍ය පෙළ රස වින්දනය හා විචාරයේ යෙදිය යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීම
     * නාට්‍යයේ මූලාශ්‍රය
     * නාට්‍යයේ තේමාව
     * නාට්‍ය ආකෘතිය - ලෝක ධර්මී (යථාර්ථවාදී නැතහොත් ස්වාභාවික) *උදා :* කැලණි පාලම<br>නාට්‍ය ධර්මී (ශෛලිගත) *උදා :* 'පේමතෝ ජායතී සෝකෝ'<br>මිශ්‍ර ආකෘති - *උදා :* නරිබෑනා
     * නාට්‍ය පෙළෙහි අඩංගු නාටකීය භාෂාව සහ යටිපෙළ (subtext)
     * නාට්‍ය පෙළෙහි නාට්‍යයේ කාර්යයට අනුබල දෙන සංවාද
     * නාට්‍යයේ චරිත/චරිතවල අරමුණු/අන්තර්සම්බන්ධතා
     * නාට්‍යයෙන් හෙළි වන තත්කාලීන සමාජ පසුබිම
     * නාට්‍යෝචිත අවස්ථා මතු කරමින් කතා වින්‍යාසයේ ප්‍රබල අවස්ථා අධ්‍යයනය කිරීම
     * නාට්‍යයේ ගැටුම
     * නාට්‍ය සන්දර්භය (නාට්‍යයේ කාර්යය විකාසනය වී ඇති අයුරු)

**III තක්සේරුව හා ඇගයීම**

- නාට්‍ය විචාර සංකල්ප හඳුනා ගෙන නිර්දිෂ්ට නාට්‍ය පෙළ රස විඳිමින් විචාරයට ලක්කිරීම සඳහාත් ශිෂ්‍යයාගේ සාධන මට්ටම තක්සේරුව හා ඇගයීම සඳහාත් සුදුසු පැවරුම් ලබා දෙන්න.

  *උදා :* 1. 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍යයේ පළමු සහ දෙවන අංකයන්හි අන්තර්ගත කතා වින්‍යාසය (නාට්‍යමය සිදුවීම් පෙළගැස්ම) මතකයෙන් ලිවීමට අවස්ථාව ලබා දීම

  2. 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍ය පෙළෙහි පළමු සහ දෙවන අංකයන්හි මුණගැසුණු චරිත පිළිබඳ වෙන් වෙන් වශයෙන් විස්තරාත්මක ව කරුණු ඉදිරිපත් කිරීමට (වාචික ව/ ලිඛිත ව) යොමු කිරීම
  3. 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍ය පෙළෙහි පළමු වන සහ දෙවන අංකයන්හි අන්තර්ගත නාට්‍ය ගී ගායනයට අවස්ථාව ලබා දීම (කණ්ඩායම්/කේවල)
  4. 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍ය පෙළෙහි පළමු වන සහ දෙවන අංකවල අන්තර්ගත නාටකීය සංවාද රඟ දක්වා ඉදිරිපත් කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දීම
  5. නාට්‍ය විචාර සංකල්පවලට අනුකූල ව 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍ය පෙළෙහි පළමු සහ දෙවන අංක රස වින්දනයට හා විචාරයට යොමු කිරීම

- සුදුසු ඇගයීම් නිර්ණායක පදනම් කර ගනිමින් ශිෂ්‍යයන් ඇගයීමට ලක් කරන්න.

**ගුණාත්මක යෙදවුම් :** * 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍යයේ දර්ශන ඇතුළත් සංයුක්ත තැටි
* නාට්‍යය පිළිබඳ පුවත්පත් ලිපි/විචාර/පොත පත

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායකඃ**

(පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් තක්සේරුකරණයේ සහ ඇගයීමේ යෙදෙන්න.)

- 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍ය පෙළ කියවා දුරවබෝධ වචනවල අරුත් පැහැදිලි කර ගනියි.
- 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍ය පෙළෙහි සාහිත්‍යික අගය විමසයි.
- නාට්‍ය විචාර සංකල්ප ඇසුරු කර ගනිමින් 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍ය පෙළ පිළිබඳ විවාදයක නිරත වෙයි.
- 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍ය පෙළ රස වින්දනයට හා විචාරයට පෙලඹෙයි.

**අතිරේක පරිශීලනීය ග්‍රන්ථඃ**

- ගලහිටියාව, පී. බී., කේ. එන්. ඕ. ධර්මදාස - එදිරිවීර සරච්චන්ද්‍ර සාර සංග්‍රහය
- ධර්මකීර්ති, රංජිත් - නාට්‍යය ප්‍රවේශය
- සරච්චන්ද්‍ර, එදිරිවීර - කල්පනා ලෝකය
- මල්ලවාරච්චි, උදය සහ තවත් අය - එදිරිවීර සරච්චන්ද්‍ර - වීමංසා උපහාර අංකය
- සරච්චන්ද්‍ර, එදිරිවීර - නරිබෑනා
- සරච්චන්ද්‍ර, එදිරිවීර - මනමේ
- සරච්චන්ද්‍ර, එදිරිවීර - වෙස් මුහුණු ද, සැබෑ මුහුණු ද

ඇමුණුම 1ඃ

## එදිරිවීර සරච්චන්ද්‍රගේ නාට්‍ය දෘෂ්ටිය

- මහාචාර්ය ආරිය රාජකරුණා -

සිංහල නාට්‍ය රචකයන් හා නාට්‍ය නිෂ්පාදකයන් අතර එදිරිවීර සරච්චන්ද්‍රට හිමි වනුයේ අද්විතීය ස්ථානයකි. ඔහු මුලින් ම සාහිත්‍ය ලෝකයට පිවිසියේ විචාරකයකු ලෙසිනි. වර්තමාන සිංහල සාහිත්‍යය පළමු වරට ශාස්ත්‍රීය විමර්ශනයකට භාජන වූයේ ඔහු අතිනි. එමගින් නූතන සිංහල සාහිත්‍යයෙහි අගය විමසීමට යෝග්‍ය විචාර කලාවක් ගොඩනැගීමෙහිලා අගනා සේවයක් ඉටුවිය. ඔහු තම සාහිත්‍ය ජීවිතයෙහි ආරම්භයේ සිට ම නාට්‍ය කලාව කෙරෙහි ද අවධානය යොමු කෙළේ ය. 1940 පසුව ලංකා විශ්ව විද්‍යාලය මගින් වේදිකා ගත කෙරුණු **කපුවා කපෝති** (1945), **හැංගි හොරා** (1949), **වලහා** (1950), **මඟුල් ප්‍රස්තාව** (1950), **මැනේජර්** (1950), **වෙදහටන** (1953), ආදි ප්‍රධාන පෙළේ හැම නාටකයකට ම පාහේ ඔහු කිසියම් ආකාරයකින් සම්බන්ධ වී සිටියේ ය. ඉහත කී නාට්‍ය නිෂ්පාදනයෙහි ලා දහනම වන සියවසේ පමණ සිට අපරදිග රටවල ප්‍රචලිතව පැවැති ස්වාභාවික සංවාද නාට්‍ය සම්ප්‍රදාය ළඟින්ම ඇසුරු කෙරිණි. 1940 ගණන්වල සිට සරච්චන්ද්‍ර කෙරෙහි ද එකී නාට්‍ය සම්ප්‍රදාය බෙහෙවින් බලපෑවේ ය. එකල මෙරට රඟ දැක්වුණු හාස්‍යෝත්පාදක නාටකවලට පදනම් වූ බටහිර නාට්‍ය සම්ප්‍රදාය ඇසුරෙන් ඔහු තම නාට්‍ය දෘෂ්ටිය සකස් කර ගත්තේය. ඔහු ගේ ප්‍රථම ස්වතන්ත්‍ර නාටකය වන **බහිනා කලාව** (1951) එකී නාට්‍ය සංකල්පය මත පිහිටා නිර්මාණය කෙරුණු කෘතියකි. සිංහල නාට්‍ය කලාව පෝෂණය කළ හැක්කේ බටහිර නාට්‍ය කලාව ආදර්ශ කොට ගැනීමෙනැයි ඔහු එකල විශ්වාස කළ බව කිව හැකි ය.

1950 පමණ සිට සිංහල නාට්‍ය කලාවේ අනාගතය පිළිබඳව විවිධ මති මතාන්තර පළ වන්නට විය. සිංහල නාට්‍ය කලාව කෙසේ සකස් විය යුතු ද කෙබඳු ස්වරූපයක් ගත යුතු ද යනු එකල බොහෝ දෙනෙකුගේ විමසිල්ලට භාජන වූ කරුණකි. මෙකී වාද විවාද වඩාත් ම උත්සන්න වූයේ **වෙදහටන** නිෂ්පාදනයෙන් පසුවයි. එතරම් ජනප්‍රියත්වයට පත්නුවූ **වෙදහටන** හේතුකොට ගෙන විශ්ව විද්‍යාලයීය නාට්‍යයේ අනාගතය පිළිබඳ සැකයක් පහළ විණි. ලංකා විශ්ව විද්‍යාලය මගින් දශක දෙකකට පමණ

ආසන්න කාලයක් මුළුල්ලේ නිෂ්පාදනය කරගෙන ආ ස්වාභාවික සම්ප්‍රදාය ගත් හාස්‍යෝත්පාදක නාට්‍ය කෙරෙහි කලකිරුණු මාර්ටින් වික්‍රමසිංහ "සිනහවෙන් ම සිංහල නාටකය දියුණු කළ හැකි නොවේ" යැයි ඉඳුරාම කියා සිටියේය. ඔහු තම මතය විස්තර කෙළේ මෙසේ යඃ ''සිනාවත් උපහාසයත් යන දෙක හැම නාටකයෙහි ම හරය කර ගන්ට වැයම් කිරීම නිසා දූන් සිංහල නාටකය යළිත් පිරිහෙන්ට ළං වී ඇත. සිංහල නාටක මණ්ඩපය සිනා රස ඉස්කාගාරයක් ද නාටකය සිනාරස බෙදන මහා හැන්දක් ද වී ගෙන යයි'' (සංස්කෘති සඟරාව අප්‍රේල්/ජූනි 1954). අපරදිග හාස්‍යෝත්පාදක නාට්‍ය සම්ප්‍රදාය පමණක් අනුගමනය කිරීමෙන් මෙරටට යෝග්‍ය නාට්‍ය කලාවක් ගොඩනැගිය හැකි ද යනු එකල ඇතැම් උගතුන් නැගූ ප්‍රශ්නයකි. එසේ කළ හැකි යැයි පිළිගත් පිරිසක් ද සිටි බව කිව යුතුයි. සිංහල නාට්‍යකලාව ගොඩනැගීම සඳහා අපරදිග නාට්‍ය කලාව පදනම් කොට ගත යුතු ම ය යනු ඔවුන් ගේ පිළිගැනීම විය. මෙබඳු අදහස් උදහස් හේතුකොට ගෙන සිංහල නාට්‍ය කලාව කිසියම් සන්ධිස්ථානයකට එළඹ ඇති බව කාටත් අවබෝධ විණි.

1950 පමණ සිට සරච්චන්ද්‍ර ගේ නාට්‍ය දෘෂ්ටිය ද කිසියම් විපර්යාසයකට භාජන වීමට පටන් ගත්තේ ය. දශකයකට ආසන්න කාලයක් මුළුල්ලේ තමා විසින් අනුගමනය කෙරුණු අපරදිග ස්වාභාවික සංවාද නාට්‍ය සම්ප්‍රදාය කෙරෙහි ඔහු තුළ කුකුසක් පහළ විණි. ස්වාභාවික නාට්‍ය සම්ප්‍රදාය වනාහි බටහිර සංස්කෘතිය පදනම් කොට ගෙන වැඩුණු විදේශීය නාට්‍ය සම්ප්‍රදායකි. එය බහු ජනතාව සඳහා පවත්නා, බහු ජනතාව අරමුණු කොටගත් කලා මාධ්‍යයක් නොවේ. එබැවින් පොදු ජනතාව පිනවන නාට්‍ය ක්‍රමයක් ගොඩනැගීම පිණිස බටහිර නාට්‍ය සම්ප්‍රදාය අනුගමනය කිරීම ප්‍රමාණවත් නොවේ. සිංහල නාටකයට විශාල ප්‍රේක්ෂක සංඛ්‍යාවක් ඇද ගැනීමට නම් ඊට ජනප්‍රිය ලක්ෂණ ඇතුළත් කළ යුතුයි. මෙසේ තර්ක කළ ඔහුට දේශීය ලක්ෂණවලින් අනූන නාට්‍ය සම්ප්‍රදායක අවශ්‍යතාව පෙනී ගියේය. එබඳු නාට්‍ය සම්ප්‍රදායක් මෑත අතීතයේ සිට ම අපට උරුමව තිබෙන බව ඔහු කියා සිටියේය. අපරදිග ස්වාභාවික සංවාද නාට්‍ය සම්ප්‍රදාය අප රට වැඩි ප්‍රේක්ෂක පිරිසක් අතර ජනප්‍රිය විය නොහැකි බව **වෙදහටනින්** පසුව ඔහුට මනාව පැහැදිලි විණි. අනතුරුව ඔහු ගේ නාට්‍ය දෘෂ්ටිය ශීඝ්‍රයෙන් වෙස් වූ අයුරු පහත දැක්වෙන ප්‍රකාශයෙන් අනාවරණය වේ. ''**වෙද හටන** නිෂ්පාදනය හා සිංහල ස්වාභාවික නාට්‍ය කලාව" යන මැයෙන් ඔහු විසින් 1953 දී ලියන ලද ලිපියක මෙසේ සඳහන් වේඃ ''දේශීය නාට්‍ය සම්ප්‍රදායක් ගොඩනැගීමට නම් අප නව මඟක් ඔස්සේ ගමන කළ යුතු යයි සිතමි. අප මෙතෙක් කර ඇත්තේ බටහිර නාටකයෙන් ආභාසය ලැබීමට තැත් කිරීම පමණකි. විශ්ව කීර්තියට ලක් වුණු දෘශ්‍ය භාව්‍ය ගණනාවක් ඇති සංස්කෘත සාහිත්‍ය දෙසට අප නෙත් සිත් යොමු කළ යුතු අවධිය දූන් පැමිණ තිබේ. අපේ සභ්‍යත්වයට වඩාත් ළං වන භාරතීය සභ්‍යත්වයෙන් පැන නැඟුණු සංස්කෘත දෘශ්‍ය කාව්‍යයෙන් අභාසය ලැබීමෙන් අපට දේශීය නාට්‍ය සම්ප්‍රදායක් ගොඩනැගිය හැකිය. එබඳු නාට්‍ය සම්ප්‍රදයක් ගොඩනැගීමට සංස්කෘත නාට්‍යයෙන් පමණක් නොව අපේ ජාතික දායාදයක් වශයෙන් තවමත් ඉතුරු වී ඇති සොකරි, කෝලම් වැනි ජන සම්මත නාට්‍ය ක්‍රමවලින් ආභාසය ලැබීම ඉතාමත් අවශ්‍යයි.'' (පියවර සඟරාව, 1954/55) මෙතෙක් කල් බටහිර නාට්‍ය සම්ප්‍රදායෙන් පමණක් ආභාසය ලැබීමට තැත් කළ සරච්චන්ද්‍ර දේශීය නාට්‍ය සම්ප්‍රදායක් ගොඩනැගීම සඳහා සිංහල ගැමි නාටකයෙන් ද පැරණි සංස්කෘත නාට්‍යයෙන් ද ආභාසය ලැබිය යුතු බව අවධාරණයෙන් කියා සිටියේය.

සරච්චන්ද්‍ර තමාගේ වෙනස් වූ නාට්‍ය දෘෂ්ටියට අනුකූලව නාට්‍ය රචනා කොට නිෂ්පාදනය කිරීමට තැත් කෙළේය. 1952 දී කරළියට නැඟුණු ඔහුගේ **පබාවතී** නාටකය මෙහි මුල් පියවර ලෙස සැලකිය හැකි ය. ඔහු **පබාවතී** නාටකයට දේශීය ස්වරූපයක් දීමට කිසියම් ප්‍රයත්නයක යෙදුණේය. ඊට පැරණි පුවතක් පදනම් කරගැනීමටත් පොතේ ගුරුගේ චරිතයක් හා ගී කිහිපයක් ඇතුළත් කිරීමටත් පෙළඹුණේ එහෙයිනි. ඊට ස්වාභාවික හාස්‍යෝත්පාදක නාට්‍යයේ ඇතැම් ලක්ෂණ ද ඇතුළත් කෙරිණි. එදිනෙදා කතාබහ කරන බස සංවාදය සඳහා යොදා ගැනීම, සමහර චරිත හාස්‍ය රසය ඉස්මතු වන ලෙස නිරූපණය කිරීම, 'රදළ ජීවිතය එක්තරා ප්‍රමාණයකට උපහාසයට භාජනය කිරීම' ආදිය මෙනි. **පබාවතී** නාටකය හා හාස්‍යෝත්පාදක ස්වාභාවික සංවාද නාට්‍ය සම්ප්‍රදායේ ඇතැම් ලක්ෂණත් පසු කාලයේ ජනප්‍රියත්වයට පත් ශෛලීගත නාට්‍ය සම්ප්‍රදායේ ඇතැම් ලක්ෂණත් සම්මිශ්‍රණය කිරීමට දැරූ වැයමක ප්‍රතිඵලයක් ලෙස හැඳින්විය හැකි යි. ඉන් පසු ව ඔහු අතින් ලියවුණු **රත්තරන්** (1954) මේ අතින් තැබූ වත් පියවරක් බව පෙනේ. මීට පැරණි ගැමි කතාවක් වස්තු විණි. මෙහි ස්වාභාවික නාට්‍ය ලක්ෂණ අතරට නැටුම්න් හා ගැයුම්න් යුත් අවස්ථා කිහිපයක් ද ඇතුළත් කොට තිබුණි. මෙයත් ස්වාභාවික හා ශෛලීගත ලක්ෂණ මිශ්‍ර කොට රචිත නාටකයක් හැටියට හැඳින්විය හැකිය. කෙසේ වුව ද මෙම නාටකය ප්‍රථම වරට වේදිකා ගත වූයේ 1958 දී බව කිව යුතුයි.

1950 දශකයේ දී ස්වාභාවික සම්ප්‍රදාය ගත් සංවාද නාට්‍ය කිහිපයක් ද සරච්චන්ද්‍ර අතින් ලියවිණි. **තරුණ ලේඛකයා** (1951), **සත්ව කරුණාව** (1953), හා **වළ ඉහගෙන කෑම** (1954) යනු ඔහුගේ කෙටි නාට්‍ය තුනකි. අර්ථවත්, කෙටි සංවාද නාට්‍යකරණය අතින් ඔහු දැක් වූ නිපුණත්වය මෙබඳු කෘතීන් ගෙන්

අනාවරණය වේ. **වදින්න ගිය දේවාලේ** (1955) වූ කලී ස්වාභාවික සංවාද නාට්‍ය සම්ප්‍රදාය අනුගමනයෙන් කෙරුණු ඔහු ගේ දීර්ඝ ම නාටකයයි. මෙය වර්තමාන සමාජය කෙරෙහි එල්ල කෙරෙනු උපහාසයක් වුවද හුදු හාස්‍යෝත්පාදක නාටකයක් නොවේ. අපරදිග සම්ප්‍රදාය ගත් අර්ථවත් ස්වාභාවික සංවාද නාට්‍ය කලාවක් ගොඩනැගීමට වුවත් හැකියාවක් ඔහු තුළ තිබූ බව මෙබඳු කෘතීන්ගෙන් පැහැදිලි වේ. ඉන් අනතුරුව ස්වාභාවික නාට්‍ය රචනය හා නිෂ්පාදනය කෙරෙහි ඔහු එතරම් උනන්දුවක් දැක්වූ බවක් නොපෙනේ. අපරදිග නාට්‍ය සම්ප්‍රදාය මෙරට පොදු ප්‍රේක්ෂකයාට කොතෙක් දුරට රස විඳිය හැකි ද යන්න පිළිබඳව ඔහු තුළ සැකයක් පහළ වී තිබීම මීට ප්‍රධාන හේතුව ලෙස සැලකිය හැකිය.

සරච්චන්ද්‍ර ගේ නාට්‍ය සංකල්පය වෙනස් වීමට හේතු වූ වෙනත් බලපෑම් ද තිබුණි. විසිවන සියවසේ පස්වන දශකය පෙරදිග නාට්‍ය කලාව පිළිබඳ ලොව පුරා ලොකු උනන්දුවක් පැවති අවධියකි. දෙවන ලෝක මහා සංග්‍රාමයෙන් පසුව බටහිර උගතුන් විසින් පෙරදිග නාට්‍ය කලාව පිළිබඳ නොයෙක් පර්යේෂණ පවත්වන ලදී. ඉන්දියාව, චීනය, ජපානය ආදී පෙරදිග රටවල සම්භාව්‍ය නාට්‍ය කලාව පිළිබඳව ඔවුන් අතින් ලියවුණු පොත්පත් රාශියක් එකල ප්‍රකාශයට පත්විණි. මෙකී ශාස්ත්‍රීය කටයුතුවල ප්‍රතිඵලයක් වශයෙන් පෙරදිග රටවලට ආවේණික වූ විශේෂ නාට්‍ය කලාවක් පවතින බව අවබෝධ විණි. පෙරදිග සම්භාව්‍ය නාට්‍ය කලාවට දීර්ඝ ඉතිහාසයක් ඇති බව, එය මූලික ලක්ෂණ අතින් අපරදිග නාට්‍ය කලාවෙන් වෙනස් වූවක් බව පැහැදිලි විණි. පෙරදිග නාට්‍ය කලාවේ ඇතැම් අංග කෙරෙහි අපරදිග නාට්‍යකරුවන් ගේ අවධානය යොමු විණි. සමහරු පෙරදිග සම්භාව්‍ය නාට්‍ය සම්ප්‍රදායෙන් ආභාසය ලැබීමට පවා තැත් කළහ. ඉහත කී කරුණු ගැන සලකා බලන විට සරච්චන්ද්‍ර පෙරදිග නාට්‍ය සම්ප්‍රදාය වෙතට ඇදී යෑම පුදුමයක් කොට සැලකිය නොහැකි ය.

මුලදී ග්‍රන්ථාශ්‍රයෙන් පමණක් දත් පෙරදිග රටවල ඇතැම් පැරණි නාට්‍ය ක්‍රම සියැසින්ම දක ගැන්මට අවස්ථාවක් ඔහුට ලැබිණි. පෙරදිග රටවල කරන ලද සංචාරයන් හේතු කොට ගෙන එබඳු නාට්‍ය ක්‍රම පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා ගත හැකි විය. එකී නාට්‍ය ක්‍රමවල යථා තත්ත්වය තේරුම් ගැනීමට එබඳු සංචාරයන් බෙහෙවින් පිටුවහල් වූ බව කිව හැකිය. ඉන්දියාවේ පැරණි සම්භාව්‍ය නාට්‍ය කලාව අභාවයට ගොස් ඇති බවත් චීනය, ජපානය යන රටවල පැරණි සම්භාව්‍ය නාට්‍ය කලාව අඛණ්ඩව නොනැසී පවත්නා බවත් ඔහු දුටුවේ ය. විශේෂයෙන් ම චීනයේ පීකිං ඔපෙරා නාට්‍යයත් ජපානයේ නෝ, ක්‍යෝගෙන්, කබුකි හා බුන්රකු යන නාට්‍යත් ඔහුගේ සැලකිල්ලට භාජන විණි. මෙකී නාට්‍ය සම්ප්‍රදායන්ට පදනම් වූ නාට්‍ය ධර්මය මුළු මහත් පෙරදිගට ම පොදු වූවක් බව ඔහුට පෙනී ගියේය. තව ද පෙරදිග රටවල තවමත් නොනැසී පවත්නා ප්‍රබල නාට්‍ය සම්ප්‍රදායන් පිළිබඳ අපරදිග රටවල දක්වන උනන්දුව කෙබඳු ද යනු විදේශීය සංචාරයන් හේතු කොට ගෙන ඔහුට වටහා ගත හැකි විය. පෙරදිග නාට්‍ය කලාව කෙරෙහි අපරදිග උගතුන් දැක්වූ ආකල්පය ද ඔහු කෙරෙහි බලපෑ බවට සැකයක් නැත.

එතකුදු වුවත් දේශීය නාට්‍ය සම්ප්‍රදායක් ගොඩනැගීම පිණිස කෙබඳු මාර්ගයක් අනුගමනය කළ යුතු ද යන්න සරච්චන්ද්‍ර මුහුණ පෑ බැරෑරුම් ප්‍රශ්නයක් විය. සංස්කෘත සාහිත්‍යයෙහි මෙන් නොව පැරණි සිංහල සාහිත්‍යයෙහි නාට්‍ය රචනා දැකිය නොහැකි ය. පැරණි සිංහල සංස්කෘතියට නෑ සබඳකමක් දක්වන එක ම නාට්‍ය කලාව කෙටි ඉතිහාසයක් ඇති සිංහල ගැමි නාට්‍ය කලාව යි. කුඩා රටක් වන ලංකාවට ඇත්තේ ගැමි නාට්‍ය සම්ප්‍රදායන් කිහිපයක් පමණි. එනම් සොකරි, කෝලම්, නාඩගම් ආදිය යි. මෙබඳු ගැමි නාට්‍ය ක්‍රම ඇසුරු කොට ගෙන දේශීය ලක්ෂණවලින් යුත් නාට්‍ය ක්‍රමයක් ගොඩනැගිය හැකි බව ඔහුට පෙනී ගියේය. එබඳු නාට්‍ය ක්‍රමයක් බිහි කිරීම සඳහා පදනම් කර ගැනීමට වඩාත් යෝග්‍ය වනුයේ නාඩගම බව ඔහුට වැටහිණි. එය සොකරි, කෝලම යන දෙකට ම වඩා නාට්‍ය ලක්ෂණවලින් අනූන හෙයිනි. නාඩගම වනාහි පෙරදිග රටවලට අයත් අනිකුත් සම්භාව්‍ය නාට්‍ය කලාවන් සේ ම නැටුම, ගැයුම හා වැයුම පදනම් කොට ගත් නාටක විශේෂයකි. එබැවින් එය පෙරදිග ස්වරූපය ගත් දේශීය නාට්‍ය ක්‍රමයක් ගොඩනැගීමට අතිශයින් උචිත බවක් පිළිගත හැකි ය. වර්තමාන වේදිකාවට ගැළපෙන නාට්‍ය කලාවක් බිහි කිරීම පිණිස ඔහු දැරූ ප්‍රයත්නය බෙහෙවින් වැදගත් වේ. නාඩගම දේශීය නාට්‍ය සම්ප්‍රදායක් ගොඩනැගීමට තරම් ප්‍රබල මාධ්‍යයක් බව වටහා ගැනීමෙන් හෙළිවනුයේ කුමක් ද? සරච්චන්ද්‍ර නාට්‍ය කලාව පිළිබඳ සියුම් අවබෝධයකින් යුත් නිර්මාණාත්මක නාට්‍ය කරුවකු බව යි. නාඩගම් සම්ප්‍රදාය පදනම් කොට ගෙන ඔහු විසින් 1956 දී නිෂ්පාදනය කරන ලද **මනමේ** නාටකය සිංහල නාට්‍ය ලෝකයෙහි මහත් ආන්දෝලනයක් ඇති කිරීමට හේතු විය. 1956 වන තෙක් සිංහල වේදිකාවට පැමිණි නාට්‍ය අතර **මනමේ** පමණ බුද්ධිමත් ප්‍රේක්ෂකයන් සතුටට පත් කළ වෙනත් නාටකයක් නුවූ තරම් ය. අද වුවත් ප්‍රේක්ෂකයෝ **මනමේ** නැරඹීමට බෙහෙවින් ප්‍රිය කරති. නාට්‍ය ක්‍රමයක් ලෙස නාඩගම ප්‍රබල මාධ්‍යයකි. 1961 දී නිෂ්පාදනය වුණු **සිංහබාහු** නාටකය **මනමේ** නාටකයටත් වඩා බුද්ධිමත් ප්‍රේක්ෂකයන් පිනවීමට සමත් විය.

නාට්‍ය රචකයකු හා නාට්‍ය නිෂ්පාදකයකු ලෙස එකම සම්ප්‍රදායක ඇලී ගැලී නොසිටිම සරච්චන්ද්‍ර ගේ කැපී පෙනෙන ලක්ෂණයකි. **මනමේ** හා **සිංහබාහු** යන නාට්‍ය දෙකට පසු ව කරළියට නැඟුණු **පේමතෝ ජායතී සෝකෝ** (1969) හා **වෙස්සන්තර** (1980) යන ගීත නාටක සඳහා ඔහු වඩාත් ස්වාධීන රංග ශෛලියක් අනුගමනය කෙළේ ය. මීට අමතරව තවත් නාට්‍ය ගණනාවක් ම ඔහු විසින් රචනා කොට වේදිකාගත කරන ලදී. ඔහුගේ සෙසු කෘතීන් අතර **රත්තරන්** (1958), **කදාවළලු** (1958) **එලොව ගිහින් මෙලොව ආවා** (1959) **හස්ති කාන්ත මන්තරේ** (1959), **වෙල්ල වැහුම්** (1960) **ඒකට මට හිනා හිනා, මහාසාර** (1968) ආදිය සඳහන් කළ හැකි ය. මේවා රචනය අතින් මෙන් ම නිෂ්පාදනය අතින් ද එකම ස්වරූපයක් ගත් ඒකාකාරී කෘතීන් නොවන බව කිව යුතු යි. ඔහුගේ නාට්‍ය අතර විවිධත්වයක් ද නවතාවක් ද දැකිය හැකිය. බොහෝ විට පැරණි කතා පුවත් පදනම් කොට ගත් නමුදු ඔහුගේ වස්තු විෂයෙහි ද විවිධත්වයක් දැකිය හැකිය. ප්‍රධාන වශයෙන් ලෝකයේ ශෛලීගත හා ස්වාභාවික යනුවෙන් නාට්‍ය සම්ප්‍රදාය දෙකක් පවතියි. පෙරදිග රටවල පුරාණ කාලයේ සිට පැවත එන හැම නාට්‍ය සම්ප්‍රදායක් ම ශෛලීගත යි. සරච්චන්ද්‍ර ගේ පසු කාලයේ හැම නාට්‍යයක් ම පාහේ ශෛලීගත සම්ප්‍රදායට අයත් වේ. ඔහු බටහිර රටවල ප්‍රභවය ලැබූ ස්වාභාවික නාට්‍ය සම්ප්‍රදාය බැහැර කොට පෙරදිග රටවල ප්‍රචලිත ශෛලීගත නාට්‍ය සම්ප්‍රදාය අනුගමනය කිරීමට හේතුව කුමක් ද?

සරච්චන්ද්‍ර ගේ මුඛ්‍ය පරමාර්ථය වූයේ විශාල ප්‍රේක්ෂක පිරිසකට රසවිඳිය හැකි නාට්‍ය කලාවක් ගොඩනැගීම යි. නාට්‍ය කලාව බහු ජනතාව අරමුණු කොට ගත්තක් විය යුතුයි; බහු ජනතාව පිනවීමට සමත් වූවක් විය යුතු ය. එය පොදු ජනතාව ගේ සංස්කෘතික ජීවිතයේ අංගයක් බවට පත් වුව මනා ය. බටහිර වේශය ගත් ස්වාභාවික නාට්‍ය සම්ප්‍රදායෙන් සිදු වූයේ නාට්‍ය කලාව සුළු පිරිසකට සීමාවීම පමණි. ටික දෙකනුට පමණක් රස විඳිය හැකි කලා කාරියක් බවට පත්වීම පමණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් නාට්‍යය පොදු ජනතාවගේ ජීවිතයෙන් බොහෝ දුරට ඈත්වී ගියේ ය. ප්‍රේක්ෂකයන් වැඩි සංඛ්‍යාවක් ප්‍රබෝධවත් කිරීමට නම් දේශීය මුහුණුවරක් ගත් නාට්‍ය සම්ප්‍රදායක් අවශ්‍යයි. එබැවින් අපරට සංස්කෘතියට ආවේණික වූ ලක්ෂණවලින් යුත් නාට්‍ය සම්ප්‍රදායක් බිහි කිරීම පිණිස පෙරදිග රටවලට පොදු ශෛලීගත ලක්ෂණ අඩංගු නාට්‍ය සම්ප්‍රදායක් අනුගමනය කිරීම වඩාත් යෝග්‍ය බව ඔහුගේ පිළිගැනීම විය.

නාට්‍ය කලාව අන්‍ය කලාවන්ට වඩා විශිෂ්ට කලා මාධ්‍යයක් හැටියට ඔහු ගේ ගෞරවාදරයට පාත්‍ර විය. විශේෂයෙන් ම පෙරදිග නාට්‍ය කලාව අපරදිග නාට්‍යකලාවටත් වඩා අංග සම්පූර්ණ වූ නාට්‍යකලාවක් ලෙස ඔහු සැලකුවේ ය. මීට ප්‍රධාන හේතුව පෙරදිග නාට්‍ය කලාව විවිධ කලාවන් එක් රැස් වන ස්ථානයක් වීමයි. පෙරදිග නාට්‍යයට ආවේණික වූ එකී ලක්ෂණය ඔහු මෙසේ පැහැදිලි කොට දක්වයිඃ ''පෙරදිග නාට්‍යයට හුදු නාට්‍ය රසය හැරුණු විට, කාව්‍ය රසය ද ගීත රසය ද නෘත්‍ය රසය ද යන මේ රස ඇතුළත් වේ. මේ නොයෙකුත් කලාවන් එක් රැස්වන කේන්ද්‍රස්ථානයකි රඟමඬල. කාව්‍ය රසය, ගීත රසය හා නෘත්‍ය රසය (ඇතැම් විට චිත්‍ර රසය) යන මේ රසයන් නිසි ලෙස යෙදීමෙන් නාට්‍ය රසය, දියුණු තියුණු කළ හැකිය. මේ සියලුම රසයන් එක් තැන් කිරීමට අවස්ථාවක් ලැබෙන්නේ දේශීය නාට්‍ය කලාවක් ගොඩනැංවීමට තැත් කළහොත් පමණයි හඟිමි. නාට්‍ය කලාව බහු ජන ප්‍රිය කළ හැක්කේ ද මේ මාර්ගයෙන් යයි සිතේ (**මනමේ නාටකය, දේශීය නාට්‍ය කලාව**). ශෛලීගත නාට්‍ය සම්ප්‍රදායක් අනුගමනය කිරීමෙන් කාර්ය දෙකක් ඉටු වන බව මින් අනාවරණය වේ. පළමු වැන්න සියලු රස එක් තැන් කරන, දේශීය ලක්ෂණවලින් යුත් නාට්‍ය ක්‍රමයක් බිහිවීමයි. දෙ වැන්න බොහෝ දෙනෙකුට රසවිඳිය හැකි නාට්‍ය ක්‍රමයක් පහළ වීමයි.

කවර රටකට වුව ද එරටට ආවේණික වූ දේශීය ලක්ෂණවලින් යුත් නාට්‍ය සම්ප්‍රදායක් තිබීම වැදගත් වේ. එය සංස්කෘතියක ප්‍රෞඪත්වය පිළිබිඹු කරන සංකේතයක් වන හෙයිනි. චීනය, ජපානය යන රටවල පවත්නා ශෛලීගත සම්භාව්‍ය නාට්‍ය සම්ප්‍රදායන්ගෙන් මෙය මනාව පැහැදිලි වේ. චීනයට මෙන් ම ජපානයටත් බටහිර වේශය ගත් ස්වාභාවික නාට්‍ය සම්ප්‍රදායක් ද තිබේ. එසේ ම ස්වාභාවික සම්ප්‍රදාය අනුව ලියවුණු පුළුල් නාට්‍ය සාහිත්‍යයක් ද තිබේ. කෙසේ වුව ද එම රටවල පවත්නා නාට්‍ය සම්ප්‍රදායන් අතර වඩාත් කැපී පෙනෙනුයේ ශෛලීගත නාට්‍ය සම්ප්‍රදායන් බව කිව යුතුයි. සාහිත්‍යමය හා නාට්‍යමය අගය අතින් ද ස්වාභාවික සම්ප්‍රදාය අභිභවා ගෙන ශෛලීගත සම්ප්‍රදායන් නැගී සිටින බව පෙනේ. එම රටවලට අයත් ශෛලීගත නාට්‍ය සම්ප්‍රදායන්, ස්වාභාවික නාට්‍ය සම්ප්‍රදායට වඩා ජාත්‍යන්තර කීර්තියට පවා භාජන වී ඇති බව කිව යුතු ය. මෙම කරුණු වටහා ගත් සරච්චන්ද්‍ර අප රටෙහි ද දේශීය ලක්ෂණවලින් යුත් ශෛලීගත නාට්‍ය සම්ප්‍රදායක් ගොඩනැගීමෙහි ඇති වැදගත්කම දුටුවේ ය. දේශීය නාට්‍ය සම්ප්‍රදායක් බිහිකිරීමට ඔහු ගත් ප්‍රයත්නය බෙහෙවින් කාලෝචිත වූවක් ලෙස අගය කොට සැලකිය හැකිය.

පෙරදිග කවර සම්භාව්‍ය නාට්‍ය සම්ප්‍රදායකට වුව ද නැටුම, ගැයුම හා වැයුම පදනම් වේ. සරච්චන්ද්‍ර තමා ගේ හැම නාටකයකට ම පාහේ නැටුම්, ගැයුම් හා වැයුම් ඇතුළත් කර ගත්තේ ය. ඔහු තම නාටකවල රංග ශෛලිය ද ඊට අනුකූලව සකස් කර ගැනීමට පෙලඹුණේය. කෙසේ වුව ද ඔහු බටහිර රංග ශෛලිය සම්පූර්ණයෙන් ම බැහැර කළ බවක් කිව නොහැකි ය. ඔහුගේ ශෛලිගත නාට්‍යවල ස්වාභාවික ව රඟපාන අවස්ථා ද දැකිය හැකි ය. නාට්‍යයක සන්දර්භය, චරිත නිරූපණය, නාට්‍යෝචිත අවස්ථා ආදිය අතින් ද ඔහු බටහිර නාටකයෙන් කිසියම් ආභාසයක් ලැබූ බව පෙනේ. තව ද ඔහුගේ නාට්‍යවල වස්තු විෂය, ආකෘතිය, චරිත නිරූපණය අතින් පමණක් නො ව භාෂාව අතින් ද විවිධත්වයක් දැකිය හැකි යි. ඔහු තම නාට්‍යවල ඇතැම් අවස්ථා සඳහා පැරණි කව් බස යොදාගත් අතර ඇතම් අවස්ථා සඳහා කථා ව්‍යවහාරයෙහි පවතින භාෂාව යොදා ගත්තේය. ඔහු පැරණි කව් බසින් ද ව්‍යවහාරයෙහි පවත්නා නාගරික බසින් ද ගැමි බසින් ද උපරිම ප්‍රයෝජන ගැනීමට සමත් විය. ඔහු තම නාට්‍ය සඳහා ජනකථා, ජාතක කථා හා ඓතිහාසික කථා උපයෝගී කොට ගත්තේය. ඔහු ගේ වස්තු විෂය පොදු ජන රුචිකත්වය ගැන ද සලකා බලා සකස් කර ගත්තක් බව කිව යුතු යි.

වර්තමාන සිංහල නාට්‍ය කලාව දහනම වන සියවසේ අවසාන භාගයේ ආරම්භ වූවක් ලෙස සැලකිය හැකි යි. එබැවින් ඊට අවුරුදු සියයක පමණ පැරණි ඉතිහාසයක් තිබේ. එදා මෙදා තුර සිංහලෙන් ලියවුණු නාට්‍යවල සංඛ්‍යාව විශාලයි. එසේ වුවත් එකී නාට්‍ය අතර සාහිත්‍යමය අගයකින් යුත් ස්වතන්ත්‍ර නිර්මාණයන් ලෙස ගිණිය හැකි අපූරු කෘතීන් ඇත්තේ ස්වල්පයක් පමණි. මෙරට බිහිවුණු නාට්‍ය අතුරින් සිංහල සාහිත්‍ය වංශයට ඇතුළත් කර ගත හැකි කෘතීන් ඇත්තේ සීමා සහිත ගණනක් පමණි. එයිනුත් වැඩි හරියක් සරච්චන්ද්‍ර විසින් ශෛලීගත සම්ප්‍රදායට අනුව රඟදැක්වීම සඳහා ලියන ලද ඒවා බව සඳහන් කළ යුතුය. බටහිර ස්වාභාවික සම්ප්‍රදාය අනුව ලියවුණු උසස් ගණයෙහි ලා ගිණිය හැකි ස්වතන්ත්‍ර නිර්මාණයන් අප සාහිත්‍යයෙහි දක්නට නැති තරම් ය. මින් හෙළි වනුයේ කුමක් ද? දේශීය නාට්‍ය සම්ප්‍රදායක් බිහි කිරීමට, ශෛලීගත නාට්‍ය සම්ප්‍රදායක් ගොඩනැගීමට සරච්චන්ද්‍ර ගත් ප්‍රයත්නය යුක්ති සහගත බවයි. සිංහල සාහිත්‍ය වංශයට ඇතුළත් කර ගැනීමට වරම් වැදගත්කමකින් යුත් නාට්‍ය කිහිපයක් රචනා කළ එදිරිවීර සරච්චන්ද්‍ර වර්තමාන අවධියෙහි මෙරට පහළ වූ උසස් ම නාට්‍ය රචකයා හා නාට්‍ය නිෂ්පාදකයා ලෙස හඳුන්වා දිය හැකි ය. ඔහු අතින් නිර්මාණය වුණු නාට්‍ය බොහෝ කාලයක් ප්‍රේක්ෂක ලෝකයේ ගෞරවාදරයට භාජන වනු නිසැක යි.

මල්ලවාරච්චි, උදය සහ තවත් අය, **එදිරිවීර සරච්චන්ද්‍ර විමංසා උපහාර අංකය**, 1987, 307-314 පිටු.

# 04. පුරාතන ගද්‍ය - අර්ථාවබෝධය හා රස වින්දනය
## (චුල්ලධනුද්ධර ජාතකය හා නන්දිවාණිජ වස්තුව)

**නිපුණතාව :** 1.0 පුරාතන ගද්‍ය සාහිත්‍යය පරිශීලනයෙන් ලබා ගත් මානව ගුණධර්ම හා සංස්කෘතිකාංග මගින් ජීවිත පරිඥානය පුළුල් කර ගනිමින් රස වින්දනයේ හා විචාරයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 1.2 නිර්දිෂ්ට කෘතිවල සුවිශේෂතා, අන්තර්ගතය, භාෂා ලක්ෂණ හා රචනා රීති හඳුනා ගෙන රස විඳිමින් විමසුමට ලක් කරයි.

**කාලච්ඡේද :** 12 යි.

**ඉගැනුම් පල :**

- නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පාඨවල තේමාව, සන්දර්භය හා භාෂාවේ සුවිශේෂතා හඳුනා ගෙන පැහැදිලි කරයි.
- නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පාඨ අර්ථාවබෝධයෙන් යුතු ව ලිහිල් බසින් ලියයි.
- නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පාඨවල සාහිත්‍යමය අගය හඳුනා ගෙන රස විඳිමින් විචාරය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**චුල්ලධනුද්ධර ජාතකය**

**I පෙර සූදානම :**

- චුල්ලධනුද්ධර ජාතකය කියවා අවබෝධ කර ගන්න.
- එහි දුරවබෝධ වචනවල අර්ථ පැහැදිලි කර ගන්න. (මේ සඳහා පිළිගත් ශබ්දකෝෂයක් භාවිත කරන්න.)
- අතිරේක පරිශීලනීය ග්‍රන්ථ කියවා දැනුවත් වන්න.
- කතාවේ තේමාව පිළිබඳ අවබෝධ කර ගන්න.

**II ඉගැනුම සංවර්ධනය :**

- පහත සඳහන් ආකාරයේ සුදුසු ප්‍රවේශයක් පාඩම සඳහා යොදා ගන්න.

  උදා:-

  * ජාතක කතාවක කොටසක් ශ්‍රැති ගෝචර ශෛලියෙන් කියවීම

  * චුල්ලධනුද්ධර ජාතකයේ කතාව කෙටියෙන් ඉදිරිපත් කර, එය මනමේ නාට්‍යයේ කතාව සමඟ සැසඳීම

  * පන්සිය පනස් ජාතක පොත ගැන සාකච්ඡා කිරීම

- චුල්ලධනුද්ධර ජාතක කතාව කියවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- චුල්ලධනුද්ධර ජාතකයේ පහත කරුණු පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.

  * එම ජාතක කතාවේ තේමාව

  * ව්‍යූහය

  * වර්තමාන කතාව

  * අතීත කතාව

  * චරිත නිරූපණ

  * අවස්ථා නිරූපණ

  * භාෂාව

  මෙහි දී ශිෂ්‍ය සහභාගිත්වය ලබා ගන්න.

- අතීත කතාවේ අවස්ථා පිළිබඳ ශිෂ්‍යයන්ගේ දැනුම තහවුරු කරන්න.
    - * බ්‍රාහ්මණ කුමාරයකු  තක්සලා නුවර දිසාපාමොක් ඇදුරු වෙතින් ශිල්ප ශාස්ත්‍ර ඉගැනීම. චුල්ලධනුද්ධර යැයි නම් තැබීම
    - * ශිල්ප හදාරා අවසන් කළ චුල්ලධනුද්ධරට දිසාපාමොක් සිය දුව විවාහ කර දීම
    - * දෙදෙනා වනයක් මැදින් යන අතර පහර දීමට පැමිණි ඇතෙකු විද මරා දැමීම
    - * වනයේ දී මස් පුලුස්සා කමින් සිටි සොර කණ්ඩායමක් හමු වීම
    - * කුමාරයා දඩමස් ඉල්ලා ගෙන ඒම සඳහා කුමරිය සොරුන් වෙත යැවීම
    - * සොරුන් අමු මස් එවීම හා දෙවන වරටත් පිලිස්සූ මස් ඉල්ලා ගෙන එන ලෙස කුමරිය යැවීම
    - * සොරුන් සමඟ ගැටුමක් ඇති කර ගැනීම හා නායක සොරා හැර අන් සොරුන් කුමරු විසින් මරා දැමීම
    - * කුමරා හා සොර දෙටුවා අතර සටනින් සොරා යටත් කර ගත් කුමරා කුමරියගෙන් කඩුව ඉල්ලීම
    - * කුමරිය කඩු මිට සොරාටත් කොපුව කුමරාටත් ලබා දීම
    - * සොරා අතින් කුමරු මිය යැම
    - * සොරා කුමරියගේ ඇඳුම් පැලඳුම් ද රැගෙන ඇය අත හැර පලා යැම
    - * ශක්‍රයාගේ මැදිහත් වීම සහ කුමරිය අවමානයට පත් කිරීම
- මනමේ නාට්‍යයේ එන අවස්ථා හා චරිත චුල්ලධනුද්ධර ජාතකය සමඟ සංසන්දනය කරන්න.
- ජාතක කතාව විචාරයට ලක් කිරීමට යොමු කරන්න.

**III තක්සේරුව හා ඇගයීම**

- කතාවේ පෙළ හොඳින් කියවා කොටස් කීපයක් ලිහිල් බසින් ලිවීමට යොමු කරන්න.
- දුරවබෝධ වදන්වල අරුත් පැහැදිලි කර ගැනීම සඳහා ශබ්දකෝෂ භාවිතයට යොමු කරන්න.
- රස වින්දනයට හා විචාරයට අදාළ අභ්‍යාසවල නිරත කරවන්න.

**ගුණාත්මක යෙදවුම්:**
- * පන්සිය පනස් ජාතක පොත
- * ශ්‍රැති ගෝචර ශෛලියෙන් කියවන ලද ජාතක කතාවක කොටසක් ඇතුළත් හඬ පටයක් (හෝ සජීව කියවීමක්)

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක :**

- චුල්ලධනුද්ධර ජාතක කතාවේ තේමාව, සන්දර්භය හා භාෂාවේ සුවිශේෂතා පැහැදිලි කරයි.
- නිර්දිෂ්ට පාඨ ලිහිල් බසින් ලියයි.
- චුල්ලධනුද්ධර ජාතකය රස විඳිමින් විචාරයේ යෙදෙයි.

**නන්දිවාණිජ වස්තුව (සද්ධර්මාලංකාරය)**

**I පෙර සූදානම:**

- නිර්දිෂ්ට කතාව කියවා අවබෝධ කර ගන්න.
- දුරවබෝධ වචනවල අරුත් පැහැදිලි කර ගන්න.
- සද්ධර්මාලංකාරය ග්‍රන්ථය හා ඒ පිළිබඳ ලියැවුණු විචාර ග්‍රන්ථ කියවා දැනුවත් වන්න.
- ශිෂ්‍යයන්ට ලබා දීම සඳහා අවශ්‍ය වන ඉගැනුම් උපකරණ හා පැවරුම් සූදානම් කර ගන්න.

## II ඉගැනුම සංවර්ධනය :

- පාඩම සඳහා පහත සඳහන් ආකාරයේ සුදුසු ප්‍රවේශයක් යොදා ගන්න.

උදා:-

* සද්ධර්මාලංකාරය ග්‍රන්ථය ප්‍රදර්ශනය කරමින් ඒ පිළිබඳ සාකච්ඡාවක් ගොඩනැගීම
* සද්ධර්මාලංකාරයේ අනිර්දිෂ්ට කතාවක කොටසක් කියවීමෙන් හෝ පටිගත කළ කොටසක් ශ්‍රවණය කිරීමට සැලැස්වීම
* පතිවත රැකි කතුන් පිළිබඳ කියැවෙන ජාතක කතාවක්/ජනකතාවක්/කවියක්/ගීතයක් ඉදිරිපත් කිරීම.

- සද්ධර්මාලංකාරයේ එන නන්දිවාණිජ වස්තුවේ තේමාව පැහැදිලි කරන්න.
- කතාව කියවා ගැනීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- දුරවබෝධ වචනවල අරුත් පැහැදිලි කරමින් අර්ථාවබෝධයට මඟ පෙන්වන්න.
- කතාවේ පහත සඳහන් ප්‍රධාන සිද්ධි හා අවස්ථා පාදක කර ගනිමින් කතා සාරාංශය ගොඩනගන්න.
  * මාවටු පටුන්ගම නන්දිවාණිජ වෙළෙඳාම පිණිස විදෙස් ගත වීම
  * සිව ඇමති පටුන්ගම ප්‍රධානියා ලෙස පත් වී පැමිණීම
  * සිව, නන්දියගේ බිරිඳ දැක පිළිබඳ සිතක් ඇති කර ගැනීම
  * සිව, දාසියක අත සිවුවරක් මසුරන් යවා ඇය කැමති කර ගැනීමට උත්සාහ කිරීම
  * නන්දියගේ බිරිඳ, ඔහුගේ ඉල්ලීම තරයේ ම ප්‍රතික්ෂේප කිරීම
  * සැමියා ජීවත් ව සිටිය දී වෙන මිනිසකු ඇසුරු නො කරන බව කීම
  * සිව, යකැදුරෙකු ලවා විදේශගත නන්දිවාණිජ මරා දැමීමට උත්සාහ කිරීම
  * යකැදුරුගේ උත්සාහය තෙවරක් ම අසාර්ථක වීම
  * ඒ සඳහා යොදා ගත් යක්ෂයා, යකැදුරු හා සිව මරා දැමීම
  * ආපසු පැමිණි නන්දිවාණිජ, සියලු තොරතුරු දැන සිව කෙරෙහි අනුකම්පාවෙන් ඔහුට පින්පෙත් දීම
- නිර්දිෂ්ට කතාවේ ;
  * සර්වකාලීන අගය
  * කතුවරයාගේ භාෂා භාවිතය
  * චරිත නිරූපණය
  * අවස්ථා හා සිද්ධි නිරූපණය
  * ජීවන දර්ශනය

  යන අංශ පිළිබඳ අවධාරණය කරමින් රස වින්දනයට හා විචාරයට මඟ පෙන්වන්න.

## III තක්සේරුව හා ඇගයීම

- නිර්දිෂ්ට කෘතියේ පසුබිම් තොරතුරු, නිර්දිෂ්ට කතාවේ තේමාව, අවස්ථා, සිද්ධි පිළිබඳ කෙටි ප්‍රශ්න (වාචික/ලිඛිත) ඇසුරින් ශිෂ්‍ය අවබෝධය විමසන්න.
- දුරවබෝධ වචනවල අරුත් පැහැදිලි කිරීමටත්, සුදුසු කොටස් කිහිපයක් ලිහිල් බසින් ලිවීමටත් යොමු කරන්න.
- විචාර ප්‍රශ්න ලබා දී දැනුම හා අවබෝධය තව දුරටත් පිරික්සන්න.

- සුදුසු නිර්ණායක පදනම් කර ගෙන ඇගැයීමේ හා තක්සේරුකරණයේ යෙදෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**
* සද්ධර්මාලංකාරය ග්‍රන්ථය
* පතිවත රැකි කතුන් පිළිබඳ චරිත කතා/ජාතක කතා/ජන කතා/ කතාන්දර/ කවි/ගීත
* සද්ධර්මාලංකාරයේ කතාවක කියවන ලද කොටසක් ඇතුළත් හඬ පටයක් (හෝ සජීව කියවීමක්)

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක :**

- නිර්දිෂ්ට කතාවේ තේමාව හා කතා සාරාංශය පැහැදිලි කරයි.
- දුරවබෝධ වචනවල අරුත් පැහැදිලි කරමින් කතාවේ කොටස් ලිහිල් බසින් ලියයි.
- නිර්දිෂ්ට කතාවේ සාහිත්‍යික අගය විමසයි.
- නිර්දිෂ්ට කතාව රස විඳිමින් විචාරය කරයි.

**පරිශීලනීය ග්‍රන්ථ :**


- කුලසූරිය, ආනන්ද - සිංහල සාහිත්‍යය 4
- ජයතිලක, කේ - සිංහල කතා කලාවේ විකාසනය
- වික්‍රමසිංහ, මාර්ටින් - ජාතක කතා විමසුම
- වික්‍රමසිංහ, මාර්ටින් - බණකතා සාහිත්‍යය
- වික්‍රමසිංහ, මාර්ටින් - සිංහල සාහිත්‍යයේ නැඟීම

# 05. බැද්දේගම (නවකතාව) - රස වින්දනය හා විචාරය
## (1 - 5 පරිච්ඡේද)

**නිපුණතාව :** 3.0 නවකතා සාහිත්‍යාංගයේ ලක්ෂණ හා මූලිකාංග පිළිබඳ අවබෝධයෙන් යුක්ත ව නවකතා රස විඳිමින් විචාරයට ලක් කරයි.

**නිපුණතා මට්ටම :** 3.3 නවකතාංග කෙරෙහි අවධානයෙන් යුතු ව නිර්දිෂ්ට නවකතාව රස විඳිමින් විචාරයට ලක් කරයි.

**කාලච්ඡේද :** 08 යි.

**ඉගැනුම් පල :**

- නිර්දිෂ්ට නවකතාවේ ඇතුළත් නවකතාංග හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට නවකතාවේ කලාත්මක ලක්ෂණ පැහැදිලි කරයි.
- නිර්දිෂ්ට නවකතාවෙන් හෙළි වන සමාජ පසුබිම පැහැදිලි කරයි.
- නිර්දිෂ්ට නවකතාව රස විඳිමින් විචාරයට ලක් කරයි.

### පාඩම් සැලසුම සඳහා උපදෙස් :

**I පෙර සූදානම :**

- බැද්දේගම නවකතාවේ පළමු වන පරිච්ඡේදයේ සිට පස් වන පරිච්ඡේදය තෙක් මැනවින් අධ්‍යයනය කරන ලෙස ශිෂ්‍යයන්ට දැනුම් දෙන්න.
- නවකතාව පිළිබඳ අතිරේක පරිශීලනීය ග්‍රන්ථවල අදාළ කොටස් ද කියවා ගෙන එන ලෙස දන්වන්න.
- නවකතාවක් විචාරයට ලක් කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු පිළිබඳ ව තොරතුරු එක් රැස් කර ගන්න. ඒ සඳහා අතිරේක පරිශීලනීය ග්‍රන්ථ ඉවහල් කර ගන්න.

**II ඉගැනුම සංවර්ධනය :**

- පහත සඳහන් සුදුසු ප්‍රවේශයක් යොදා ගෙන පාඩමට පිවිසිය හැකි ය.

උදා:-

  * බැද්දේගම නවකතාවේ පළමු වන පරිච්ඡේදයේ කුඩා කොටසක් කියවීමෙන්
  * අදාළ කොටසේ එන සිදුවීමක් සිහිපත් කිරීමෙන්
  * නවකතාවේ චරිතයක් ගැන විස්තර කිරීමෙන්
  * බැද්දේගම නවකතාව ගැන ලියැවුණු විචාරයක් ඉදිරිපත් කිරීමෙන්

- බැද්දේගම නවකතාවේ පළමු වන පරිච්ඡේදයේ සිට පස් වන පරිච්ඡේදය තෙක් කොටසෙහි කතා සාරය පිළිබඳ ශිෂ්‍යයන් සමඟ සාකච්ඡා කරන්න.
- එහි අවස්ථා හා සිද්ධි මතු කර දක්වන්න.
- ශිෂ්‍යයන්ගෙන් වාචික ප්‍රශ්න අසමින් නවකතාවේ චරිත හැසිරෙන ආකාරය පිළිබඳ සාකච්ඡාවක් ගොඩනඟන්න.
- බැද්දේගම නවකතාවේ පහත සඳහන් අංග පිළිබඳ ශිෂ්‍යයන් සමඟ සාකච්ඡා කරන්න.
  * සිද්ධි හා අවස්ථා
  * ගමේ පවුල් අතර සබඳතා
  * ගැමි පරිසරය නිරූපණය වීම
  * හුදකලා වූ ගමක ජීවන තොරතුරු
  * සමාජ තත්ත්වය

**III තක්සේරුව හා ඇගයීම**

- ශිෂ්‍යයන්ගේ දැනුම හා අවබෝධය තහවුරු කිරීම සඳහාත්, සාධන මට්ටම් තක්සේරු කිරීම සඳහාත් සුදුසු පැවරුම් ලබා දෙන්න.
- ශිෂ්‍යයන් කුඩා කණ්ඩායම්වලට වෙන් කර ඉහත ඉගැනුම් සංවර්ධනය කොටසෙහි ඇති මාතෘකා යටතේ කරුණු ගොනු කිරීමට අවස්ථාවක් ලබා දෙන්න. (ඇමුණුම 1)
- කතාවේ සඳහන් දෙබස් භූමිකා රංගනයක ආකාරයෙන් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.
- බැද්දේගම නවකතාවේ 1-5 පරිච්ඡේද පිළිබඳ රස වින්දනාත්මක හා විචාරාත්මක අදහස් පළ කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්** : * ඇමුණුම 01

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක :**

- බැද්දේගම නවකතාවේ 1 - 5 පරිච්ඡේදවල සාරය උපුටා දක්වයි.
- බැද්දේගම නවකතාවේ නියමිත පරිච්ඡේදවල අවස්ථා හා සිද්ධි ඉදිරිපත් කරයි.
- බැද්දේගම නවකතාවේ චරිත හැසුරුණු ආකාරය පිළිබඳ අදහස් දක්වයි.
- බැද්දේගම නවකතාවේ නියමිත පරිච්ඡේදවල අවස්ථා හා සිද්ධි නිරූපණය ගැන අදහස් පළ කරයි.

**පරිශීලනීය ග්‍රන්ථ** :

- ඒකනායක, ධර්මසිරි - සාහිත්‍ය කලාව
- වික්‍රමසූරිය, සරච්චන්ද්‍ර - නවකතා විවරණය
- සුරවීර, ඒ. වී. - නවකතා නිර්මාණය හා අවබෝධය
- සුරවීර, ඒ. වී. - නිර්මාණ පසුබිම

ඇමුණුම 1

1. **සිද්ධි හා අවස්ථා**
   - අවට වනාන්තරයකින් වැසුණු ගමක විස්තරය
   - හේන් ගොවිතැනට යොමු වූ මිනිස්සු
   - ණය බරින් ජීවත් වූ ගොවීහු
   - සිලිඳු හා ඩිංගිහාමි දරුවන් ලැබීම
   - කර්ලිනාහාමි දරුවන් නැළවීමට ගැයූ නැළවිලි ගී

2. **පවුල් අතර සබඳතා**
   - ගම් ප්‍රධානියා වන බබේහාමි ආරච්චිල හා නැංවොහාමි
   - සිලිඳු හා ඩිංගිහාමි
   - දරුවන් (පුංචිමැණිකේ හා හින්නිහාමි)
   - දියණියන් හා සිලිඳු අතර බැඳීම
   - බබේහාමිගේ සොයුරිය ඩිංගිහාමි
   - සිලිඳුගේ සොයුරිය කර්ලිනාහාමි
   - පුංචි මැණිකා හා බබුන් අතර සම්බන්ධය

3. **වනගත පරිසරය**

- කුඩා ගෙවල්
- හේන් ගොවිතැනින් යැපීම
- සාමූහිකත්වය
- සීමා සහිත අදායම් මාර්ග

4. **හුදෙකලා ගම හා සමාජ තත්ත්වය**

- ගෙවල් සුළු ප්‍රමාණයක් තිබීම
- ප්‍රවාහන දුෂ්කරතා
- ආසන්න නගරයට පවතින දුර
- ණය බරින් පීඩිත වූ සමාජය
- ලෙඩ රෝගවලට ගොදුරු වීම
- රජයේ වෛද්‍ය පහසුකම් ලැබීමට ඇති දුෂ්කරතා
- අඩු අධ්‍යාපන මට්ටම

# 06. කෙටිකතා රස වින්දනය හා විචාරය

**නිපුණතාව :** 4.0 කෙටිකතා කලාවේ විකාසනය, මූලිකාංග හා විශේෂ ලක්ෂණ හඳුනා ගෙන කෙටිකතා රස විඳිමින් විචාරයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 4.3 කෙටිකතා ලක්ෂණ කෙරෙහි අවධානයෙන් යුතු ව නිර්දිෂ්ට කෙටිකතා රස විඳිමින් විචාරයට ලක්කරයි.

**කාලච්ඡේද :** 15 යි.

**ඉගැනුම් පල :**

- නිර්දිෂ්ට කෙටිකතාවල කතුවරුන් කාලය හා සාහිත්‍ය පසුබිම හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට කෙටිකතා කියවා තේමාව හා අන්තර්ගතය විස්තර කරයි.
- නිර්දිෂ්ට කෙටිකතාවල කලාත්මක ලක්ෂණ හඳුනා ගෙන පැහැදිලි කරයි.
- කෙටිකතා රස විඳිමින් විචාරයට ලක්කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**I පෙර සූදානම :**

- කෙටිකතා මූලිකාංග පිළිබඳ පෙර දැනුම අවදි කර ගන්න.
- පහත සඳහන් කෙටිකතා කියවා හොඳින් අවබෝධ කර ගන්න.
  - * කපිතන්ගේ පුත්තු - දයාසේන ගුණසිංහ
  - * මිනිස් වටය - එරික් ඉලයප්ආරච්චි
  - * කරත්තය - සෝමරත්න බාලසූරිය
  - * කළු සපත්තු - ජයතිලක කම්මැල්ලවීර
- ඉහත කෙටිකතා හතර කියවා ගෙන එන ලෙස ශිෂ්‍යයන්ට දන්වන්න.
- පරිශීලනීය ග්‍රන්ථ කියවා දැනුම යාවත්කාලීන කර ගන්න.

**II ඉගෙනුම සංවර්ධනය :**

- පහත සඳහන් ආකාරයේ සුදුසු ප්‍රවේශයක් යොදා ගෙන පාඩමට ප්‍රවිෂ්ට විය හැකි ය.
  - * කෙටිකතා පිළිබඳ ශිෂ්‍යයන්ගේ පෙර දැනුම විමසමින්
  - * කියවූ කෙටිකතාවක් ගැන සිහිපත් කරමින්
  - * කෙටිකතාකරුවන් ගැන ශිෂ්‍යයන්ගේ දැනුම, අවබෝධය අවදි කරමින්
- ශිෂ්‍යයන් කණ්ඩායම් හතරකට වෙන් කරන්න.
- නියමිත කෙටිකතා හතර අදාළ කණ්ඩායම්වලට ලබා දෙන්න.
- නිර්දිෂ්ට කෙටිකතාවල පහත සඳහන් ලක්ෂණ/කරුණු පිළිබඳ ශිෂ්‍ය අවධානය යොමු කරන්න.
  - * කතුවරයා පිළිබඳ හැඳින්වීම
  - * ඒ ඒ කෙටිකතාවට පදනම් වූ සමාජ සංස්කෘතික පසුබිම
  - * කෙටිකතා පිළිබඳ හැඳින්වීම
  - * තේමාව/කෙටිකතාවේ හරය
  - * අන්තර්ගතය
  - * කතා ප්‍රවෘත්තිය හා කතා වින්‍යාසය
  - * චරිත හා චරිත නිරූපණය
  - * රචනා උපක්‍රම
  - * කලාත්මක ලක්ෂණ
  - * ප්‍රබලතා සහ දුබලතා

- ඉහත සඳහන් මාතෘකා යටතේ සටහනක් සකස් කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාවක් ලබා දී එය පන්තියට ඉදිරිපත් කිරීමට යොමු කරන්න.
- සමාලෝචනයක යෙදී සුදුසු ප්‍රතිපෝෂණ ලබා දෙන්න.

**III තක්සේරුව හා ඇගයීම**

- ශිෂ්‍යයන්ට පොදු පැවරුමක් ලබා දෙන්න. (ඇමුණුම I පැවරුම් පත්‍රිකාව යොදා ගන්න.)
- කෙටිකතා හතර සඳහා විචාර ලිවීමට යොමු කරන්න.
- කෙටිකතා රස විඳීමට අභ්‍යාසයක් දී ඇගැයීමට ලක්කරන්න.

**ගුණාත්මක යෙදවුම්** : * ඇමුණුම 01
* පැවරුම් පත්‍රිකා

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක** :

- නිර්දිෂ්ට කෙටිකතාවල සාහිත්‍ය පසුබිම විස්තර කරයි.
- නිර්දිෂ්ට කෙටිකතාවල අන්තර්ගතය පිළිබඳ අදහස් දක්වයි.
- කෙටිකතාවල කලාත්මක ලක්ෂණ පැහැදිලි කරයි.
- කෙටිකතා රස වින්දනයේ හා විචාරයේ යෙදෙයි.

**පරිශීලනීය ග්‍රන්ථ** :

- ධර්මකීර්ති, රංජිත් - කෙටිකතා නිර්මාණය, අධ්‍යයනය හා මූලධර්ම
- වික්‍රමසිංහ මාර්ටින් - වහල්ලු (ප්‍රස්තාවනාව)
- සුරවීර, ඒ. වී. - බවතිමිර (ප්‍රස්තාවනාව)
- සේනානායක, ජී. බී. - විචාර ප්‍රවේශය

ඇමුණුම I

## පැවරුම් පත්‍රිකාව

| කෙටිකතාව | කතුවරයා | තේමාව | අන්තර්ගතය | චරිත |
|---|---|---|---|---|
| | | | | |

# 07. උක්ත-ආඛ්‍යාත පද සම්බන්ධ රීති

**නිපුණතාව :** 8.0 ව්‍යාකරණ රීති හා භාෂා සම්ප්‍රදාය නිවැරදි ව භාවිත කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 8.2 උක්ත-ආඛ්‍යාත යෝගය පිළිබඳ රීති නිවැරදි ව භාවිත කරමින් වාක්‍ය ලියයි.

**කාලච්ඡේද :** 12 යි.

**ඉගෙනුම් පල :**
- උක්ත-ආඛ්‍යාත පද සම්බන්ධ රීති හඳුනා ගෙන පැහැදිලි කරයි.
- වාක්‍ය රීති නිවැරදි ව භාවිත කිරීමේ වැදගත්කම ප්‍රකාශ කරයි.
- ලේඛනයේ දී උක්ත-ආඛ්‍යාත පද සම්බන්ධ රීති නිවැරදි ව භාවිත කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**I පෙර සූදානම :**

- ඇමුණුම 1හි සඳහන් නිර්දිෂ්ට උක්ත ආඛ්‍යාත පද සම්බන්ධ රීති පිළිබඳ ඔබගේ දැනුම තහවුරු කර ගන්න.
- මේ සඳහා පරිශීලනීය ග්‍රන්ථ ද ඉවහල් කර ගන්න.
- එක් එක් වාක්‍ය රීති සඳහා නිදසුන් වාක්‍ය එක් රැස් කර ගන්න.
- ශිෂ්‍යයන්ට ලබා දීම සඳහා සුදුසු පැවරුම් සකස් කර ගන්න.

**II ඉගැනුම සංවර්ධනය :**

- පහත සඳහන් ප්‍රවේශ හෝ වෙනත් සුදුසු ප්‍රවේශයක් හෝ යොදා ගනිමින් පාඩමට පිවිසෙන්න.

උදා:-
  * උපුටාගත් ගද්‍ය ඡේදයකින් වාක්‍ය රීති හඳුනා ගැනීමට සැලැස්වීම
  * ශිෂ්‍යයන් දන්නා වාක්‍ය රීති කීපයක් ඉදිරිපත් කිරීමට සැලැස්වීම
  * භාෂා රීති සාවද්‍ය ලෙස පරිහරණය කරන අවස්ථා කීපයක් උපුටා දැක්වීම

- භාෂාවේ ලේඛනයට, භාෂණයට හා චින්තනයට නිවැරදි භාෂා භාවිතය අත්‍යවශ්‍ය වන බව ශිෂ්‍යයන්ට අවබෝධ කර වීමට කටයුතු කරන්න.
- ප්‍රායෝගික ලේඛන කාර්යයේ නිරත වීමෙන් හා ග්‍රන්ථ පරිශීලනයෙන් බොහෝ භාෂා රීති අවබෝධ කරගත හැකි බව අවධාරණය කරන්න.
- සිංහල වාක්‍යයක උක්තය හා ආඛ්‍යාතය අතර අත්‍යන්ත සම්බන්ධතාවක් පවතින බවත්, ඒ ආශ්‍රයෙන් වාක්‍ය රීති සකස් වී ඇති බවත් තහවුරු කරන්න.
- උක්ත-ආඛ්‍යාත භේදය පිළිබඳ 12 ශ්‍රේණියේ දී උගත් විෂය කරුණු නැවත සිහිපත් කරන්න.
- සිංහල භාෂාවේ දක්නට ලැබෙන උක්ත - ආඛ්‍යාත සම්බන්ධ රීති නිදසුන් මඟින් පැහැදිලි කරන්න. (ඇමුණුම 1)
- වාක්‍යයක උක්තය ලෙස උක්ත නාම පදත්, ආඛ්‍යාතය ලෙස ශුද්ධ ක්‍රියා හා කෘදන්ත පදත් යොදා ගන්නා බව තහවුරු කරන්න.
- උක්තය හා ආඛ්‍යාතය යෙදීමේ දී ඒක වචන හා බහු වචන භේදය බලපාන බව තහවුරු කරන්න.
- ඇමුණුම 1 යොදා ගෙන වාක්‍ය රීති පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

**III තක්සේරුව හා ඇගයීම**

- එක් එක් වාක්‍ය රීති තහවුරු වන පරිදි පැවරුම් ලබා දෙන්න.
  * සදොස් වාක්‍ය ලබා දී ඒවා නිදොස් කරවීම
  * ඇමුණුම් අංක 1හි දක්වා ඇති වාක්‍ය රීති අවධාරණය වන පරිදි පැවරුම් ලබා දීම
  * උගත් වාක්‍ය රීති භාවිත කරමින් නිර්මාණාත්මක ලේඛනයට යොමු කිරීම
- සුදුසු ඇගයීම් නිර්ණායක පදනම් කර ගනිමින් ඇගැයීමක හා තක්සේරුවක නිරතවන්න.

**ගුණාත්මක යෙදවුම් :** * පැවරුම් පත්‍රිකා
* නිදර්ශන වාක්‍ය

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක :**

- එක් එක් වාක්‍ය රීතිය හා ඊට අදාළ උදාහරණය බැගින් දක්වා රීති වගුවක් සකස් කරයි.
- තෝරා ගත් උද්ධෘත කීපයක ඇතුළත් වාක්‍ය රීති හඳුනා ගෙන පැහැදිලි කරයි.
- උක්ත-ආඛ්‍යාත සම්බන්ධය පිළිබඳ ව නිර්දිෂ්ට රීති හා ඒවාට නිදසුන් සහිත ව පොත් පිංචක් සකස් කරයි.

**පරිශීලනීය ග්‍රන්ථ :**

- සිංහල ලේඛන රීතිය (නව සංස්කරණය) - ජාතික අධ්‍යාපන ආයතනය
- සිංහල ලේඛන ව්‍යවහාරය : උපදේශ සංග්‍රහය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- කුමාරතුංග, මුනිදස - ව්‍යාකරණ විවරණය
- කරුණාතිලක, ඩබ්.එස්. - සිංහල භාෂා ව්‍යාකරණය

ඇමුණුම 1

**නිර්දිෂ්ට වාක්‍ය රීති හා නිදසුන්**

1. යුගල උක්ත/ආඛ්‍යාත පූරණය සහිත වාක්‍ය (මෙම රීතිය පැහැදිලි කිරීමේ දී 'ද්විත්ව උක්තය' යන යෙදුමට වඩා 'ආඛ්‍යාත පූරණය' යන යෙදුම භාවිත කිරීම බෙහෙවින් උචිත ය.)
   * ගුණරත්න මහතා ගුරුවරයෙක් වෙයි.
   * දරුවෝ අනාගත පුරවැසියෝ වෙති.
   * සියලු ම ශිෂ්‍යයෝ දක්ෂයෝ ය.
   * අපි ශ්‍රී ලාංකිකයෝ වෙමු.
   * මම ශිෂ්‍යයෙක් වෙමි.

2. 'ඇත' සහ 'නැත' යන පද ආඛ්‍යාතය වෙනුවට යෙදෙන වාක්‍ය
   * කර්මාන්ත ශාලාවේ ප්‍රධානියෙක් ඇත.
   * මහා මාර්ගයෙහි සේවකයෝ නැත.

3. පූර්ව ක්‍රියා හෝ භාව ක්‍රියා පදයකට පසු ව 'ඇත', 'නැත', 'තිබේ' යන පද ආඛ්‍යාතය වෙනුවට යෙදෙන වාක්‍ය
   * ශිෂ්‍යයන් පාසලට පැමිණ ඇත.
   * දෙමාපියන් රැස්වීමේ දී අදහස් දක්වා නැත.
   * වන සතුන් ගොයම විනාශ කර තිබේ.

4. 'ද', 'හා', 'සහ', 'ත්' යන නිපාත සමුච්චයාර්ථයේ යෙදෙමින් නාම පද කීපයක් සම්බන්ධ කෙරෙන වාක්‍ය
   * ලේඛකයෝ ද විචාරකයෝ ද සාහිත්‍ය නිර්මාණ අගය කරති.
   * සාමාජිකයෝ ද සාමාජිකාවෝ ද චාරිකාවට එක් වූහ.
   * ශිෂ්‍යයෙක් හා ශිෂ්‍යාවක් තරගයෙන් ජය ලැබූහ.
   * දායකයෙක් සහ දායිකාවක් දන් පිදූහ.
   * ගුරුවරුත් දෙමාපියෝත් එක් ව ශ්‍රමදානය කළහ.
   * ඔහු ද මම ද මිනිසා ද ගමට යමු.
   * ගුරුවරයා ද තෝ ද පාසල් ගියෙහු.

5. 'හා', 'සහ' නිපාත 'සමඟ', 'කැටුව' යන අර්ථයේ යෙදෙන වාක්‍ය
   * 'සුරන් සහ සහසැස්-නොකර සිටියේ අහස් කුස් හිස්' (ගුත්තිල කාව්‍යය)
   * ඇය යෙහෙළියන් හා වෙළෙඳසලට පිවිසියා ය.
   * ළමයා මිතුරන් හා කෙළි සෙල්ලමෙහි නිරත විය.

6. 'සමඟ', 'කැටුව' යන නිපාත යෙදෙන වාක්‍ය
   * විචාරකයා ලේඛකයන් සමඟ සංවාද පවත්වයි.
   * අපි ඔබ සමඟ අමනාප නො වෙමු.
   * ගුරුවරු ශිෂ්‍යයන් කැටුව චාරිකාවට සහභාගි වූහ.
   * මව දරුවා කැටුව වෛද්‍යවරයා කරා ගියා ය.

7. නාම පදයක් සමග 'දෙනෙක්', 'දෙන', 'දෙනා' යන පද යෙදෙන වාක්‍ය
   * රසිකයෝ බොහෝ දෙනෙක් කලාකරුවන් අගය කරති.
   * රියැදුරෝ හැම දෙන ම පුහුණුවට පැමිණියහ.
   * මවුවරු සියලු දෙනා දරුවන්ට ප්‍රශංසා කළහ.

8. ප්‍රාර්ථනාර්ථ 'වා' නිපාතය සහිත වාක්‍ය
   * ගුරුවරු විමසිලිමත් වෙත්වා!
   * සියලු සත්වයෝ නිදුක් වෙත්වා!
   * මම නිදුක් වෙම්වා!
   * අපි නිදුක් වෙමුවා!
   * යහපත් සිතුවිලි පහළ වේවා!

9. නාම පදයකට පර ව 'වැනි', 'සඳහා', 'උදෙසා', 'මෙන්', 'කරා', 'හා', 'සේ', 'සමඟ' යනාදි නිපාත පද යෙදෙන වාක්‍ය
   * සරණාගතයන් වැනි අයට උදවු කරන්න.
   * මෙය ආබාධිතයන් සඳහා වෙන් කරන ලද ආසනයකි.
   * දායකයා භික්ෂූන් උදෙසා දානයක් දුන්නේ ය.
   * ඈ දෙවඟනක මෙන් රූමත් ය.
   * සිරිපාල මිනිසුන් හා අමනාප වූයේ ය.
   * පුතණුවෙනි, සොරකු සේ ගමන් නො යන්න.
   * ශිෂ්‍යයෝ ගුරුවරුන් සමඟ එක් වී ඒ උත්සවය පැවැත්වූහ.

10. කෘදන්ත පදයකට මුලින් අනුක්ත කර්තෘ පදයක් යෙදෙන වාක්‍ය
   * මම දරුවන් ගැයූ ගීත අසා සිටියෙමි.
   * මෙහිලා දෙමාපියන් සිතන ආකාරය වඩා වැදගත් ය.
   * සමහර ගායකයන් ගයන ගීත සමාජයට අහිතකර ය.
   * නරඹන්නන් පිනවන නාට්‍ය කලාවක් වෙනුවෙන් ඔහු පෙනී සිටියේ ය.
   * මා දුටු කඳුකරය ඒ මොහොතෙහි මීදුමින් වැසී තිබුණේ ය.

11. අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා පද ආශ්‍රිත වාක්‍ය
   * මා විභාගය සමත් වුවහොත් දෙමාපියෝ සතුටු වෙති.
   * ආරාධිතයන් නොපැමිණියහොත් සාමාජිකයෝ විසිර යති.
   * අප හොඳින් ඉගෙන ගතහොත් ගුරුවරු ප්‍රශංසා කරති.
   * නිර්මාණකරුවන් සාර්ථක නිර්මාණ බිහි කළහොත් අපි රස විඳිමු.

12. කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා පද ආශ්‍රිත වාක්‍ය
   * දරුවන් ඉගෙන ගනිද්දී දෙමාපියෝ සතුටු වෙති.
   * ශිෂ්‍යයන් නාට්‍ය රඟ දක්වද්දී ගුරුවරු අගය කරති.
   * ගායකයෙකු ගී ගයද්දී රසිකයෝ උද්දාමයට පත් වූහ.

13. සංශයාර්ථය හෝ වාර්තා අර්ථය හඟවන අන්තර් වාක්‍ය සහිත වාක්‍ය
   * අද කම්කරුවන් එති'යි පාලකයා සිතුවේ ය.
   * දෙමාපියන් ප්‍රශංසා කරති'යි දරුවෝ සිතූහ.
   * භාෂා රීතීන් කලින් කලට වෙනස් වෙති'යි ව්‍යාකරණඥයෝ අදහස් කළහ.

14. 'යනවා, බලනවා, බැලුවා' වැනි කෘදන්ත සමඟ බැඳෙන නාම පද යෙදෙන අන්තර්වාක්‍ය සහිත වාක්‍ය
   * රැස්වීමට සාමාජිකයන් යනවා අපි දුටුවෙමු.
   * දරුවන් නාට්‍ය බලනවා නම් දෙමාපියෝ සතුටු වෙති.
   * නළුවන් ප්‍රේක්ෂකාගාරය දෙස බැලුවා අපි ද දුටුවෙමු.

15. 'ඇයි', 'කෙසේ ද', 'කවරදා ද', 'කවදා ද' වැනි ප්‍රශ්නවාචී පද සමඟ යෙදෙන නාම පද සහිත වාක්‍ය
   * ඔවුන් දැක්වූ කරුණු මොනවා ද?
   * ශිෂ්‍යයන් ඉගෙන ගන්නේ කෙසේ ද?
   * ඔවුන් අකාරුණික වන්නේ ඇයි?
   * අප සමඟි වන්නේ කවදා ද?

16. කර්තෘ අවධාරණය කිරීම සඳහා කෘදන්ත රූපයක් යෙදෙන අවස්ථා
   * ගී ගැයුවේ ගායිකාවකි.
   * ක්‍රීඩා කරන්නේ ළමයින් ය.
   * රංගනයෙහි යෙදෙන්නේ නළුවන් ය.

   මේ වාක්‍ය,
   * ගී ගැයුවේ ගායිකාවක් ය.
   * ක්‍රීඩා කරන්නෝ ළමයි ය.
   * රංගනයෙහි යෙදෙන්නෝ නළුවෝ ය.

   යනුවෙන් ද ලිවිය හැකි ය.

17. 'යුතු', 'මැනවි', 'යෙහෙකි' වැනි පදයකින් අවසන් වන වාක්‍ය
   * ක්‍රීඩා කරන්නන් විනය ගරුක විය යුතු ය.
   * පයින් යන්නන් දකුණු පසින් යා යුතු ය.
   * සියලු කම්කරුවන් පෙරට අව මැනවි.
   * තරුණයන් ගුණ ගරුක වීම යෙහෙකි.

18. 'යුත්තේ', 'යුත්තෝ', 'යුත්තාහ' යනාදි පද සහිත වාක්‍ය
   ('යුතු' යන්න අවසාන ආඛ්‍යාතය සේ වරනැඟී යෙදෙන විට ඊට අනුරූපී උක්තය සමග යෙදේ.)
   * ශිෂ්‍ය ශිෂ්‍යාවෝ ගුණවත් විය යුත්තෝ ය/යුත්තාහ.
   * නිවේදකයා භාෂාව ගැන සැලකිලිමත් විය යුත්තේ ය.
   * ඔහු වැඩ කළ යුත්තේ ය.
   * ඇ වැඩ කළ යුක්තී ය.
   * මම සාවධාන ව අසා සිටිය යුත්තෙමි.
   * තෝ/නුඹ පොත් පත් කියවිය යුත්තෙහි.
   * තොපි/නුඹලා අඬදබර නො කළ යුක්තෙහු.
   * අපි ඥාති සංග්‍රහ කළ යුත්තෙමු.

19. 'දෙනකු', 'දෙනෙකු', 'දෙනකුන්', 'දෙනෙකුන්', 'දෙනා', 'දෙන' යන රූප සමඟ යෙදෙන නාම පද සහිත වාක්‍ය
    * අපි අසරණයන් බොහෝ දෙනෙකු/දෙනකු පෝෂණය කළෙමු.
    * සංවිධායකවරයා ගායකයන් සියලු දෙනා/දෙන හමු විය.
    * අධ්‍යක්ෂවරයා නිර්මාණ ශිල්පීන් බොහෝ දෙනෙකුන්/දෙනකුන් හමු විය.

20. අවිනිශ්චිතාර්ථයක් හෙවත් සැකයක් පළ කරන 'වි' නිපාතය යෙදෙන වාක්‍ය
    * ඔවුන් විභාගයෙන් ජය ගනීවි.
    * ශිෂ්‍යයන් අධ්‍යයන කටයුතුවල නිරත වේවි.

21. කිසිවෙක්, කෙනෙක්, අයෙක්, යමෙක්, කවරෙක් යන පද පැහැදිලි ව ඒකාර්ථය දෙමින් උක්ත වන වාක්‍ය
    * මෙහි කිසිවෙක් නැත.
    * එක් කෙනෙක් කවි ගායනා කරයි.
    * එක් අයෙක් හුදෙකලාව වාසය කරයි.
    * යමෙක් පොත් කියවයි.

22. 'අයෙක්', 'කිසිවෙක්', 'කෙනෙක්', 'යමෙක්', 'කවරෙක්' යන පද පැහැදිලි බහු වචන අර්ථය දෙමින් උක්ත වන වාක්‍ය,
    * අයෙක් ගුණදම් රකිති.
    * කිසිවෙක් ගම හැර දා යති.
    * කෙනෙක් අකුරු කරති.
    * යමෙක් චිත්‍ර අඳිති.
    * කවරෙක් පාසල් යත් ද?
    * "නටත් අයෙක් සුරා මතින්" (ගුත්තිල කාව්‍යය)

23. 'දෙනා', 'දෙනෙක්', 'රළ', 'රැස', 'සමූහය', 'රැන', 'රංචුව', 'පෙළ', 'කැල', 'පිරිස' ආදි සමූහවාචී පද උක්ත වන වාක්‍ය,
    * ගැමියෝ තුන් දෙන/දෙනා කුඹුරට යති.
    * දස දෙනෙක් ආයතනයෙන් ඉවත් වෙති.
    * මුව රළ වැව අසල සැරිසරති.
    * ''මීන් රළ'වුත් ගං වෙරළට රැස්වූ".
    * ළමයි රැසක් විභාගය සමත් වෙති.
    * නායකයෝ සමූහයක් රැලිය අමතති.
    * කුරුලු රැන තුරු වියනෙහි සැරිසරති.
    * අලි රංචුව වගා පාළු කරති.
    * සිසු පෙළ ගී ගයති.
    * දරු කැල රැඟුම් පාති.
    * බොහෝ පිරිසක් රැස්වීමට පැමිණියහ.

24. 'ඇතැමෙක්', 'ඇතැම්මු', 'ඇතැම්හු', 'සමහරෙක්', 'සමහරු', 'කවුරු' යන සමූහාර්ථ පද උක්ත වන වාක්‍ය,
    * ඇතමෙක් ගී ගයති.
    * ඇතැම්මු/ඇතැම්හු දම් අසති.
    * සමහරෙක් මවු ගුණ ගයති.
    * සමහරු ගමනට පිටත් වූහ.

* කවුරු මෙහි පැමිණෙත් ද ?

25. ගෞරවාර්ථ නාම පද උක්ත වන වාක්‍ය
    * පියාණෝ දරුවන් යහමඟ යවති.
    * මෑණියෝ දරුවන්ට ඔවදන් දෙති.
    * පුතණුවෝ දෙමාපියන් සනසති.
    * දියණියෝ සතුනට කරුණාව දක්වති.
    * වික්‍රමසිංහයෝ විරාගය ලියූහ.
    * විශාඛාවෝ දෙව්රමට ගියහ.

26. ආඛ්‍යාතය සඳහා ඒක වචන රූපය හෝ බහු වචන රූපය හෝ යෙදිය හැකි වාක්‍ය
    * අධ්‍යක්ෂ මණ්ඩලය තීරණ ගනියි./ගනිති.
    * විරුද්ධ පක්ෂය එකඟ වෙයි./වෙති.
    * ජනතාව වීදි බසියි./බසිති.
    * මහ ජනයා තම අදහස් ප්‍රකාශ කරයි./කරති.

# 08. වාක්‍ය රචනය

**නිපුණතාව :** 9.0 සංශ්ලේෂණ හා විශ්ලේෂණ පරිචය ප්‍රදර්ශනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 9.1 සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියා ප්‍රදර්ශනය කරමින් විචාරශීලී ව කරුණු සංවිධානය කර ශාස්ත්‍රීය, විචාරාත්මක හා නිර්මාණාත්මක රචනා ලියයි.

**කාලච්ඡේද :** 05 යි.

**ඉගැනුම් පල :**
- මාතෘකානුකූල රචනා ලිවීම සඳහා අවශ්‍ය තොරතුරු රැස් කරයි.
- මාතෘකාවට අදාළ ව රචනාවේ සැලැස්ම ගොඩනඟයි.
- රචනා ලිවීමේ දී තර්කානුකූල ව කරුණු සංවිධානය කරයි.
- සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියා ප්‍රදර්ශනය කරමින් රචනා ලියයි.

### පාඩම් සැලසුම සඳහා උපදෙස් :

**I පෙර සූදානම :**
- ඇමුණුම 01 හා 02හි සඳහන් විස්තර කියවා ගන්න.
- ඇමුණුව 02හි ඇතුළත් රචනා මාතෘකා ශිෂ්‍යයන්ට බෙදා දීම සඳහා අවශ්‍ය පිටපත් සංඛ්‍යාවක් පිළියෙල කර ගන්න.
- සුදුසු ආදර්ශ රචනා කිහිපයක් සූදානම් කර ගන්න.

**II ඉගෙනුම සංවර්ධනය :**
- පහත සඳහන් ප්‍රවේශවලින් සුදුසු ප්‍රවේශයක් යොදා ගන්න.

  *උදා :* * 12 ශ්‍රේණියේ දී ලියන ලද සාර්ථක රචනා අගය කිරීම
  * රචනා සැකිල්ලක් සහ ඒ අනුව ලියන ලද රචනාවක් ඉදිරිපත් කිරීම
  * රචනා ලිවීමේ අගය හා වටිනාකම පැහැදිලි කර ශිෂ්‍යයන් රචනා ලිවීමට පෙලඹවීම
- පන්තිය කණ්ඩායම් කිහිපයකට වෙන් කරන්න.
- ඇමුණුම අංක 02හි ඇති රචනා මාතෘකා කණ්ඩායම්වලට ලබා දෙන්න.
- තමන්ට ලැබුණු රචනා මාතෘකාවට රචනා සැකිල්ලක් සැකසීමට කණ්ඩායම්වලට පවරන්න.
- එම සැකිලි කණ්ඩායම් අතර හුවමාරු කරන්න.
- එම රචනා මාතෘකාවලට අනුව තනි තනි ව රචනා ලිවීමට ශිෂ්‍යයන්ට පවරන්න.

**III තක්සේරුව හා ඇගයීම**

ශිෂ්‍යයන් ලියූ රචනා සැකිලි සකස් කර ගත් ආකාරයත්, රචනා සැකිලිත්, රචනාත් ඇගයීමට ලක් කරන්න.

**ගුණාත්මක යෙදවුම් :** * ඇමුණුම 01 සහ 02
* ආදර්ශ රචනා

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක :**
- රචනාවක අන්තර්ගත විය යුතු මූලික ලක්ෂණ විස්තර කරයි.
- රචනා මාතෘකාවට අදාළ ව සැකිල්ලක් ගොඩනඟයි.
- කරුණු මනා ව සංවිධානය කරමින් රචනා ලිවීමේ ශිල්පීය කුසලතා ප්‍රදර්ශනය කරයි.
- රචනා කියවා විචාරශීලී ව අගය කරයි.

**පරිශීලනීය ග්‍රන්ථ :**

- තේනබදු, පී. - සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය
- මුනිදාස, කුමාරතුංග - ප්‍රබන්ධෝපදේශය
- ශුභවික්‍රම, මුනිදාස - භාෂාව හා රචනය

ඇමුණුම 01

(මුනිදාස ශුභවික්‍රම විසින් රචිත 'භාෂාව හා රචනය - ජ්‍යෙෂ්ඨ කාණ්ඩය' කෘතියේ ඇතුළත් අදහස් ඇසුරෙන් සකස් කරන ලදි.)

## රචනා ලිවීම
## (Essay Writing)

රචනය යන්නෙන් අදහස් කරන්නේ යම් කිසි මාතෘකාවකට අනුව ලියන ලද ගද්‍ය ලේඛනයකි. සමහර උගතුන්ගේ රචනා ප්‍රමාණයෙන් විශාල ය. පාසලේ දී නිර්මාණය කරන රචනය හුදෙක් අභ්‍යාසයකි. එහි භාෂාව මැනවින් භාවිත කරමින් පෞද්ගලික අදහස් සංක්ෂිප්ත ව දක්වා තිබීම අත්‍යවශ්‍ය වේ.

**හොඳ රචනයක දැකිය හැකි ලක්ෂණ**

**ඒකමිතිය (Unity)** -
රචනය ඒකකයකි. එහි එක ම කාරණයක් පැහැදිලි ලෙස විස්තරාත්මක ව ඉදිරිපත් කළ යුතු ය. රචනය ලිවිය යුත්තේ රචනා මාතෘකාව පිළිබඳ ව හොඳ මතකයකින් යුක්ත ව ය. මාතෘකාවෙන් බැහැර නො වී මාතෘකාව පිළිබඳ ව නව අදහස් උත්පාදනය කිරීමටත් විවිධත්වයෙන් යුක්ත ව ඉදිරිපත් කිරීමටත් උත්සාහ ගත යුතු ය.

**පිළිවෙළ (Order)** -
ක්‍රමානුකූල බව රචනයක තිබිය යුතු තවත් එක් ලක්ෂණයකි. ක්‍රමානුකූල ව ආරම්භ වී මනා ව අවසන් විය යුතු ය. ඉදිරිපත් කරන අදහස්, කරුණු නිරවුල් විය යුතු ය. එබැවින් රචනයක් ලිවීමට ප්‍රථම රචනයට ඇතුළත් වන කරුණු සැලකිල්ලට ගෙන කරුණුවල වැදගත්කම අනුව පෙළ ගස්වා ගත යුතු ය.

**සංක්ෂිප්තබව (Brevity)** -
පාඨශාලීය රචනා වඩා දීර්ඝ නො විය යුතු ය. මාතෘකාවට අනුව රචනයේ ප්‍රමාණය අඩු වැඩි විය හැකි ය. පාසලේ දී ලියන රචනයක් වචන 300කට පමණ සීමා විය යුතු ය. රචනය සංක්ෂිප්ත විය යුතු බව අමතක නො කළ යුතු ය.

**ශෛලිය (Style)** -
රචනය සඳහා වැදගත් වූත් සාහිත්‍යානුකූල වූත් ශෛලියක් භාවිත විය යුතු ය. ග්‍රාමීය අශාසත්‍රීය ව්‍යවහාර ඇතුළත් නො විය යුතු ය. ඉතා පහසුවෙන් යෙදිය හැකි සාමාන්‍ය වාක්‍ය හැකි පමණ අඩු කිරීම සුදුසු ය. ස්වාභාවික, සරල, භාෂා භාවිතයට හා වාක්‍ය නිර්මාණයට හුරු විය යුතු ය. ලේඛනයේ යෙදීමේ දී නිරවුල් මනසකින් යුක්ත ව සිටීම හොඳ රචනයක රහස යි.

**පෞද්ගලිකත්වය (Personal Touch)** -
රචකයාගේ පෞද්ගලික හැඟීම් හා මත රචනයෙන් ප්‍රකට විය යුතු ය. එබැවින් රචනා ලිවීමේ දී තම මතය හෝ අදහස හෝ නො පැකිළී ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. අන්‍යයන්ගේ අදහස් දැක්වීමට පමණක් සීමා නො වී තමන් ලියන දේ පිළිබඳ මනා විශ්වාසයක් ඇති කර ගන්න. හොඳ රචනයක සුදුසු මාතෘකාවක්, නිසි පිළිවෙළක් සහ ප්‍රකාශන ශක්තියක් තිබිය යුතු ය. මෙම ලක්ෂණ ත්‍රිත්වයෙන් හෙබි කල්හි එය හොඳ ම රචනයක් වේ.

## රචනා ලිවීමට උපදෙස්

### 1 සාමාන්‍ය සූදානම (General Preparation)

රචනා ලිවීමේ දී ආධුනිකයන්ට මුහුණ පාන්නට වන දුෂ්කරතාවක් නම් ප්‍රමාණවත් තරම් කරුණු නො ලැබීම ය. මාතෘකාවක් පිළිබඳ කරුණු සපයා ගැනීම ඔවුනට පහසු නො වේ. එහෙත් කියවීමෙන් හා නිරීක්ෂණ ශක්තිය දියුණු කර ගැනීමෙන් මේ දුෂ්කරතාව පහසුවෙන් මඟ හරවා ගත හැකි ය.

**(i.) කියවීම**

'කියවීම මිනිසා සම්පූර්ණ කරයි' යනු ප්‍රකට කියමනකි. හොඳ රචනයක් ලියන්නට උත්සාහ දරන්නා කියවීමේ මහත් රුචියක් ඇත්තකු විය යුතු ය. හුදු විනෝදය පිණිස කියවීම මෙයින් අදහස් නො කෙරේ. ඉතිහාසය, දේශ සංචාරය, ජීවන චරිත ආදිය ඇතුළත් සාරවත් කෘති කියවා වැදගත් කරුණු උකහා ගත යුතු ය.

**(ii.) නිරීක්ෂණය**

කියවීමෙන් පමණක් සෑහීමකට පත් නොවිය යුතු ය. ජීවිතය පිළිබඳ අද්දැකීම් ඇසීමෙන් හා නිරීක්ෂණයෙන් ලබා ගත හැකි ය. සජීව ජීවන අද්දැකීම්, රචනා ලිවීම සඳහා වැදගත් සාධකයෝ වෙති. ජීවිත අද්දැකීම්වලින් පෝෂණය වූ තරමට රසවත් රචනයක් ලිවිය හැකි ය.

**(iii.) සාකච්ඡාව**

පොත පතින් මෙන් ම වැදගත් සාකච්ඡා ශ්‍රවණයෙන් ද කරුණු උකහා ගත හැකි ය. විවිධ ක්ෂේත්‍ර පිළිබඳ අදාළ අද්දැකීම් ඇති අය සමග සාකච්ඡා කිරීමෙන් බොහෝ කරුණු අනාවරණය කර ගත හැකි ය.

රචකයෙක් වනාහී කියවන්නෙකි, නිරීක්ෂණය කරන්නෙකි, සාකච්ඡා කරන්නෙකි. මෙසේ කිරීමෙන් ස්වකීය මනස සාරවත් අදහස්වලින් හා දැනුමෙන් පුරවා ගන්නෙකි.

### 2 විශේෂ සූදානම (Special Preparation)

දැන් අපි රචනා ලිවීමේ දී පැවතිය යුතු විශේෂ සූදානම පිළිබඳ අවධානය යොමු කරමු. එහි දී ප්‍රථමයෙන් ම කළ යුත්තේ මාතෘකාව මැනවින් අවබෝධ කර ගැනීම යි.

**(අ) මාතෘකාව අවබෝධ කර ගැනීම**

රචනාවක් ලියන්නට පෙර මාතෘකාව පිළිබඳ ඉතා නිවැරදි අවබෝධයක් ලබා ගැනීම ඉතා වැදගත් ය. එයින් කුමක් අදහස් කෙරේ ද කුමක් අදහස් නො කෙරේ දැයි නිශ්චය කර ගත යුතු ය. ඇතැම් මාතෘකා කෙතරම් සුළු දැයි කිව හොත් එයින් ඇතැම් ශිෂ්‍යයෝ නොමඟ යති. නිදර්ශනයක් ලෙස 'බුදු දහම සිංහලයා කෙරෙහි සිදු කළ බලපෑම' යන මාතෘකාව යටතේ රචනාවක් ලියන්නකු විසින් බුදු දහම විස්තර කිරීම හෝ එය ලංකාවට ගෙනා ආකාරය හෝ එය මෙහි වර්ධනය වූ ආකාරය නොලිවිය යුතු ය. ලිවිය යුත්තේ සිංහලයාගේ සාරධර්ම, භාෂාව, සිරිත් විරිත්, ඇඳුම් පැළඳුම්, රැකීරක්ෂා, කර්මාන්ත, ශිල්ප ශාස්ත්‍ර ආදිය වෙනස් වූ ආකාරය හා එසේ වීමට හේතු වූ ප්‍රධාන කාරණා ආදිය යි. පාඨශාලා රචනාවක අනවශ්‍ය කරුණු ඇතුළත් කරන්නට අවකාශ නැති හෙයින් වහා ම නියම කාරණයට බසින්නට ඔබට සිදු වෙයි. එහෙයින් මාතෘකාව ඉතා නිවැරදි ව මනසෙහි තැන්පත් කර ගැනීමටත් කිසි විටෙක එයින් පිට නො පැනීමටත් තරයේ සිතට ගත යුතු ය.

**(අ) අදහස් රැස් කිරීම**

**i. මාතෘකාව ගැන කියවීම**

මාතෘකාව හොඳින් අවබෝධ කරගත් පසු ඔබ විසින් තැබිය යුතු අනෙක් පියවර නම් ඒ මාතෘකාව ගැන දන්නේ කුමක් දැයි කල්පනා කර බැලීම යි. ඇතැම් මාතෘකාවක් ගැන ඔබ දන්නා කරුණු රචනාවක් ලිවීම සඳහා හොඳට ම සෑහෙයි. එහෙත් ඇතැම් මාතෘකා ගැන පොත පතින් කරුණු සෙවීමට පවා සිදු වෙයි. ඔබ නො දන්නා ඓතිහාසික සිද්ධියක් ගැන හෝ නො දුටු රටක් ගැන හෝ රචනාවක් ලියන්නට සිදු වී යැයි සිතමු. මෙහි දී පොත් පත් කියවන්නට සිදු වෙයි. කෙසේ වුව ද රචනාවක් ලියන්නට පටන් ගන්නට

පෙර එයට අවශ්‍ය කරුණු ඔබ විසින් සපයා ගනු ලැබිය යුතු ය. පාසලේ දී නම් ගුරුවරයාගේ මාර්ගෝපදේශකත්වය ඇති ව පන්තියේ දී කරන සාකච්ඡාව මේ විශේෂ සූදානමට ඉතා ප්‍රයෝජනවත් ය. කෙසේ වුවත් මාතෘකාව ගැන කරුණු සපයා ගැනීමට ප්‍රමාණවත් කාලයක් නො යොදා රචනාව ලියන්නට ආරම්භ නොකිරීම මැනවි. තමන්ගේ සිතට මුලින් ම නැඟෙන අදහස ඊළඟට ලිවිය යුතු අනෙක් අදහස නො දැන ම ලිවීම බොහෝ ශිෂ්‍යයන් කරන වරදකි. මේ පුරුද්ද රචනා ලිවීමේ දී අනතුරුදායකය.

**ii. රැස් කිරීම**

ඔබ මාතෘකාව වින්‍යාස කිරීමේ දී විවිධ අදහස් ඔබ මනසේ පහළ වෙමින් යයි. එම අදහස් පහළ වන විට ම අල්ලා නොගත හොත් අවශ්‍ය අවස්ථාවේ දී අමතක වන්නට පුළුවන. පක්ෂියකු අල්ලා ගත් කල උගෙන් ප්‍රයෝජන ලබන්නට නම් ඒ මොහොතේ ම ඌ කූඩුවක දැමිය යුතු සේ සිතට නැඟෙන අදහස් ඒ මොහොතෙහි ම කඩදාසියක සටහන් කළ යුතු ය. මේ අවස්ථාවේ දී එම අදහස්වල සුදුසු නුසුදුසු බව හෝ අනුපිළිවෙළ ගැන නොසිතිය යුතු ය. අල්ලා ගත් පක්ෂීන් පරීක්ෂා කළ යුත්තේ පසු ව අවකාශ ලැබුණු විට ය. ඔවුන්ට අංක යොදා සුදුසු ලෙසින් සටහන් යොදා ගැනීම මැනවි.

**iii. තේරීම**

ඔබට ප්‍රමාණවත් තරම් කරුණු රැස් වී ය යි සිතුණු විට හෝ තවත් කරුණු සොයා ගන්නට නොහැකි වූ විට හෝ සටහන් කර ගත් කරුණු කියවා බලා ස්වකීය කාර්යයට ඉතා යෝග්‍ය කරුණු තෝරා වෙන් කර ගත යුතු ය. දැන් කූඩුව විවෘත කර පක්ෂීන් පරීක්ෂා කරන්න. එහි වටිනා නොවටිනා පක්ෂීහු වෙති. නොවටිනා පක්ෂීන් පිට කරන්න. නැතහොත් ඉතා යෝග්‍ය කරුණු ඉතිරි කර අයෝග්‍ය හෝ සුළු ය යි හැඟෙන කරුණු කපා දමන්න. ඇතැම් අදහස් කිහිප වර සටහන් වී තිබිය හැකි ය. සුදුසු බව තීරණය කළ යුත්තේ තමන්ගේ රචනාවේ ප්‍රමාණය අනුව ය.

**(ඉ) තර්කානුකූල පිළිවෙළ**

දැන් ඔබ විසින් තෝරා ගත් කරුණු රචනාවෙහි යොදන පිළිවෙළ සලකන්න. එය තර්කානුකූල විය යුතු ය. ඔබට ඉතා සුදුසු ය යි හැඟෙන පිළිවෙළ තෝරා ගන්න. එය රචනාවේ සැලැස්ම වෙයි. මේ සැලැස්ම නැති විට රචනාව රමණීය නො වේ; ආකුල වේ.

මාතෘකාව හොඳින් තේරුම් ගෙන, තොරා ගත් අදහස් ආදිය විමසා සැලැස්ම අනුශීර්ෂ කිහිපයකට බෙදා ගත යුතු ය. මෙහි දී ඔබ සපයා ගත් නා නා විධ කරුණු ස්වාභාවික වූ ද, තර්කානුකූල වූ ද, රමණීය වූ ද, පිළිවෙළට සිටින සේ සැලැස්ම සකස් කළ යුතු ය. ආරම්භය සංක්ෂිප්ත විය යුතු බව ද, අවසානය ප්‍රබල විය යුතු බව ද මෙහි දී සැලකිය යුතු ය.

දැන් ඔබ ලියන්නට යන කරුණු මෙසේ පිළිවෙළක් කර ගත් පසු ඒ ඒ අදහස් ඔබ සකස් කර ගත් අනුශීර්ෂ යටතේ සටහන් කර ගත යුතු ය. අනවශ්‍ය කරුණු තව ද ඇත්නම් අත්හල යුතු ය. ඉන් පසු රචනාවේ නියම සැලැස්ම ලැබේ. රචනාව ලියන්නට මඟ පෙන්වන්නා එය වෙයි. රචනාවේ සැකිල්ල එය වෙයි. මේ සැකිල්ල මසින් පිරවීම දැන් ඔබ විසින් කළ යුතු ය. එහෙත් සියල්ලට ම වඩා දුෂ්කර කාර්යයක් වෙයි. ඒ ඇටින්, මසින් යුතු ඒ සිරුරට ප්‍රාණ වායුව පිඹීම ය. නියම රචනාවක් වන්නේ ඉන් පසුව ය.

**ඇමුණුම 02**

- දී ඇති මාතෘකාවලින් එකකට අදාළ ව **වචන 300-350** අතර වන සේ ව්‍යාකරණානුකූල ව විශ්ලේෂණාත්මක රචනයක් ලියන්න.

i සාරධර්ම වර්ධනයෙහි ලා කලාවේ කාර්යභාරය

ii අන්තවාදය මානව වර්ගයාගේ යහ පැවැත්මට තර්ජනයකි

iii අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි දක්නට ඇති නව ප්‍රවණතා

iv ශ්‍රී ලංකාවේ වර්තමාන ආහාර රටා හා සෞඛ්‍ය ගැටලු

v අන්තර් ජාතික අර්බුද හමුවේ ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධනය

vi තාක්ෂණය අපභාවිතය සමාජ ප්‍රගමනයට අහිතකරය

උපුටා ගැනීම - **අ.පො.ස.(උසස් පෙළ) ප්‍රශ්න පත්‍ර ව්‍යුහය හා මූලාකෘති ප්‍රශ්න 6 වෙළුම,** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# 09. විශේෂාංග ලිපි රචනය

**නිපුණතාව :** 9.0 සංශ්ලේෂණ හා විශ්ලේෂණ පරිචය ප්‍රදර්ශනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 9.5 නිර්දිෂ්ට ගද්‍ය පාඨ ඇසුරෙන් විවිධ ලේඛන ශෛලි හඳුනා ගෙන භාෂා කාර්යයේ යෙදෙයි.

**කාලච්ඡේද :** 08 යි.

**ඉගැනුම් පල :**
- විවිධ ලේඛන සඳහා උචිත ආකෘති හා ලේඛන ශෛලි පවතින බව විස්තර කරයි.
- විශේෂාංග ලිපියක විශේෂ ලක්ෂණ හඳුන්වයි.
- ලේඛනයේ ස්වභාවය අනුව උචිත ආකෘතිය හා භාෂා ශෛලිය තෝරා ගනියි.
- නිර්මාණශීලී ලෙසත්, නිවැරදි ලෙසත් භාෂාව හසුරුවමින් ලේඛනයේ යෙදෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**I පෙර සූදානම :**
- පුවත්පත් විශේෂාංග ලිපි කිහිපයක් එක් රැස් කර ගන්න.
- විශේෂාංග ලිපියක විශේෂ ලක්ෂණ අධ්‍යයනය කරන්න.
- ශිෂ්‍යයන්ට ලබා දීම සඳහා පැවරුම් පත්‍රිකා සකස් කර ගන්න.

**II ඉගැනුම සංවර්ධනය :**
- පහත සඳහන් ආකාරයේ සුදුසු ප්‍රවේශයක් යොදා ගන්න.
  *උදා :* * පුවත් පත් විශේෂාංග ලිපි කිහිපයක් ශිෂ්‍යයන් අතර බෙදා දී ඒවා කියවීමට සැලැස්වීම
  * පුවත්පතක් ශිෂ්‍යයන්ට ලබා දී එහි ඇතුළත් විවිධ ලිපි අතරින් විශේෂාංග ලිපි හඳුනා ගැනීමට සැලැස්වීම
  * පුවත්පත් විශේෂාංග ලිපියක් පන්තිය ඉදිරියේ කියවීම
- පුවත් පත් විශේෂාංග ලිපි පිළිබඳ ව ශිෂ්‍යයන් සමඟ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- විශේෂාංග ලිපි බොහෝ විට ප්‍රවෘත්තියක් පදනම් කර ගෙන ලියවෙන ලිපි බව පෙන්වා දෙන්න.
- නිදසුන් සඳහා ප්‍රවෘත්තියක් පදනම් කර ගෙන ලියැවුණු විශේෂාංග ලිපියක් ද එම ලිපියට පාදක වූ පුවත්පත් වාර්තාව ද යොදා ගන්න.
- මේ සඳහා එදිනෙදා පළ වන පුවත්පත් වාර්තා හා විශේෂාංග ලිපි පිළිබඳ ව අවධානයෙන් සිටින්න.
- පුවත්පත් විශේෂාංග ලිපි විවිධ මාතෘකා යටතේ ඉදිරිපත් වන බව පෙන්වා දෙන්න. (ඇමුණුම 01 යොදා ගන්න.)
- විශේෂාංග ලිපියක් පුවත්පතක පළ වන වෙනත් වාර්තාවකින් වෙනස් වන ආකාරය පෙන්වා දෙන්න.
- විශේෂාංග ලිපියක් අංග ගණනාවකින් අනෙක් ලිපියකින් දුරස්ථ වන බවත් විශේෂාංග ලිපියක් විමසීමට ලක් කරන විට එහි සුවිශේෂ ලක්ෂණ හඳුනා ගත හැකි බව පැහැදිලි කරන්න. ඒ සඳහා ඇමුණුම 2 යොදා ගන්න.

**III ඇගයීම හා තක්සේරුව:**
- විශේෂාංග ලිපියක හා අනෙක් ලිපියක වෙනස හඳුනා ගැනීම සඳහා ශිෂ්‍යයන් අභ්‍යාසයක නිරත කරවන්න.
- කෙටි විශේෂාංග ලිපියක් ලිවීම සඳහා ශිෂ්‍යයන් යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :** * දිනපතා හා සතිඅන්ත පුවත් පත්වල විශේෂාංග ලිපි
* ඇමුණුම 01, 02 හා 03

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක :**

- විශේෂාංග ලිපි හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- විශේෂාංග ලිපිවල සුවිශේෂ ලක්ෂණ අගය කරමින් කතා කරයි.
- පාඨකයා ආකර්ෂණය වන පරිදි විශේෂාංග ලිපි ලිවිය යුතු බව පැහැදිලි කරයි.
- උචිත තේමා ඔස්සේ විශේෂාංග ලිපි ලියයි.

**පරිශීලනීය ග්‍රන්ථ :**

- කෝපරහේවා, සඳගෝමි - සිංහල පුවත්පත් කලාවේ පුරෝගාමියෝ
- කෝපරහේවා, සඳගෝමි - සිංහල පුවත්පත් කලාවේ මෑත ඉතිහාසය

ඇමුණුම 1 - **විශේෂාංග ලිපි වර්ග**

* ගවේෂණාත්මක විශේෂාංග ලිපි
* විද්‍යාත්මක තොරතුරු පිළිබඳ විශේෂාංග ලිපි
* චරිත පදනම් කරගත් විශේෂාංග ලිපි
* දේශපාලනය පදනම් කරගත් විශේෂාංග ලිපි
* තාක්ෂණය පදනම් කරගත් විශේෂාංග ලිපි
* ඡායාරූප පදනම් කරගත් විශේෂාංග ලිපි
* උපහාසය පදනම් කරගත් විශේෂාංග ලිපි
* හාස්‍යෝත්පාදක විශේෂාංග ලිපි
* පරිසර විද්‍යාත්මක විශේෂාංග ලිපි
* සමාජ විවරණාත්මක විශේෂාංග ලිපි
* මානවවිද්‍යාව පදනම් කරගත් විශේෂාංග ලිපි

ඇමුණුම 2 - **විශේෂාංග ලිපියක විශේෂ ලක්ෂණ**

* විශේෂාංග ලිපියකට බොහෝ විට ප්‍රවෘත්තියක් පදනම් වේ.
* ප්‍රවෘත්තියකට වඩා ගැඹුරක් විශේෂාංග ලිපියෙහි දැකිය හැකි ය.
* ප්‍රවෘත්තියට සම්බන්ධ පසුබිම හා එහි පරිසරය ප්‍රකාශ වේ.
* ප්‍රවෘත්තියට අදාළ කතාව විශේෂාංග ලිපියෙහි ඇතුළත් ය.
* එම ප්‍රවෘත්තිය පිළිබඳ ව විවිධ කෝණවලින් ඉදිරිපත් කරයි.
* පාඨකයාගේ බුද්ධියට මෙන් ම හදවතට ද අමතයි.
* හිත් ඇදබැඳ ගනියි.
* භාෂාව නිර්මාණාත්මක ය.
* පාඨක ආකර්ෂණය දිනා ගන්නා ලෙස ලියයි.

ඇමුණුම 3 - විශේෂාංග ලිපි කිහිපයක්


දියවැඩියාව
වෙනස්වන ජීවන රටාවේ ප්‍රතිඵලයක්


මලබඩ වැඩි කරන
ගෝලීය උණුසුම


මිනිස් වාසයට
සුදුසු
ග්‍රහලොවක්


ඉතිහාසයක
දැනුම් සයුර
මහාචාර්ය
සෙනරත් පරණවිතාන

# 10. අවබෝධය

## (අනිර්දිෂ්ට ගද්‍ය පාඨ)

**නිපුණතාව :** 9.0 සංශ්ලේෂණ හා විශ්ලේෂණ පරිචය ප්‍රදර්ශනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 9.4 අනිර්දිෂ්ට පාඨවල අන්තර්ගතය අවබෝධ කර ගැනීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද :** 06 යි.

**ඉගෙනුම් පල :**

- අනිර්දිෂ්ට ගද්‍ය පාඨ කියවා දුරවබෝධ වචනවල අර්ථ පැහැදිලි කරයි.
- ගද්‍ය පාඨයක අන්තර්ගතය වටහා ගැනීම සඳහා අවබෝධයෙන් කියවීමේ වැදගත්කම විස්තර කරයි.
- අනිර්දිෂ්ට ගද්‍ය පාඨ කියවා මූලික අදහස ඉදිරිපත් කරයි.
- අනිර්දිෂ්ට ගද්‍ය පාඨවල අන්තර්ගත අදහස ලිහිල් බසින් ලියයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**I පෙර සූදානම :**

- අවබෝධ පරීක්ෂණ සඳහා ශිෂ්‍යයන්ට ලබාදීමට සුදුසු පාඨ හා ඒ ඇසුරින් සකස් කරගත් ප්‍රශ්න සූදානම් කර ගන්න.
- ගුරු අධීක්ෂණයෙන් හෝ ශිෂ්‍යයන් ලවා ම හෝ හුවමාරු කරගෙන ඒවායේ උත්තර පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් පිළියෙල කර ගන්න.

**II ඉගෙනුම සංවර්ධනය :**

- පහත සඳහන් ආකාරයේ සුදුසු ප්‍රවේශයකින් පාඩම ආරම්භ කරන්න.
  *උදා :* * තෝරා ගත් ගද්‍ය ඡේදයක් පන්තිය ඉදිරියේ කියවා වාචික ප්‍රශ්න ඇසීම
  * කියවා අවබෝධ කර ගැනීමේ වැදගත්කම අවධාරණය කෙරෙන සාකච්ඡාවක් ගොඩනැගීම
- අවබෝධ පරීක්ෂණ සම්බන්ධයෙන් 12 ශ්‍රේණියේ දී උගත් කරුණු සිහිපත් කරන්න.
- අවබෝධ ප්‍රශ්නවලට උත්තර සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු ගැන අවධාරණය කරන්න.
- ගද්‍ය පාඨයක් අවබෝධයේ දී වචනයක වාච්‍යාර්ථය, ව්‍යංග්‍යාර්ථය, ලක්ෂ්‍යාර්ථය වැනි අර්ථ කෙරෙහි අවධානය යොමු කළ යුතු බව පෙන්වා දෙන්න.
- ඇමුණුම් අංක 1හි සඳහන් ඡේද හා ඒවාට අදාළ ප්‍රශ්න ශිෂ්‍යයන්ට ලබා දී පුහුණු වීම සඳහා අවස්ථාව ලබා දෙන්න.

**III තක්සේරුව හා ඇගයීම**

- එක් එක් ප්‍රශ්නවලට පිළිතුරු සපයා ගන්නා ආකාරය පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීමට අවස්ථාව දෙන්න.
- පිළිතුරු පරීක්ෂා කර ඇගයීම සිදු කරන්න.
- අවබෝධ ප්‍රශ්නවලට උත්තර සෙවීමේ දී නිර්දිෂ්ට පියවර අනුගමනය කිරීම, කියවීම හා උත්තර සැපයීම පරීක්ෂා කර බලා තක්සේරුව හා ඇගයීම සිදු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :** ඇමුණුම 01

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක :**

- අවබෝධ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ නිසි පියවර අනුගමනය කරයි.
- ඡේදය අවධානයෙන් හා විමසිලිමත් ව කියවයි.

- පාඨවල අන්තර්ගතය ලිහිල් බසින් ලියයි.
- ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු ලියයි.

**පරිශීලනීය ග්‍රන්ථ :**

- තේනබදු, පී. - සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය
- ශුභවික්‍රම, මුනිදාස - භාෂාව සහ රචනය

ඇමුණුම 1

**ඡේදය (i)**

''මනුෂ්‍යයා ජීවීන් අතර අසහාය තත්ත්වයක් දරයි. අන්‍ය සත්ත්වයන් සහිත වූ ජීව ලෝකය මෙන් ම තමා අවට ඇති ද්‍රව්‍ය ලෝකය ද පාලනය කිරීමේ ශක්තියක් මනුෂ්‍යයා ලබා සිටී. ඔහු මෙබඳු තත්ත්වයක් ලැබුවේ කෙසේ ද?

අන්‍ය සත්වයන් අබිබවා මෙබඳු තත්ත්වයක් ලැබීමට මනුෂ්‍යයාට හැකි වූයේ ඔවුනට නොමැති අන්දමේ ඉන්ද්‍රිය ශක්තියක් සහ බුද්ධි ශක්තියක් ඔහු සතු බැවිනි. ඉන්ද්‍රිය ශක්තිය අතින් මනුෂ්‍යයාගේ අද්විතීය භාවය ඔහු අන්‍ය සත්වයන්ට වඩා සියුම් අන්දමින් අත්, පා යනාදිය උපයෝගී කර ගැනීමට සමත් ව සිටීමෙන් පැහැදිලි වේ. සිය ඉන්ද්‍රියයන් ක්‍රමානුකූල ව මෙහෙයවීමෙන් විවිධ වස්තූන් නිර්මාණයට මනුෂ්‍යයා සමත් ය. මනුෂ්‍ය ජීවියා අන්‍ය ජීවීන් අබිබවා අසහාය ශිෂ්ටාචාරයක් ගොඩ නැංවූයේ මේ සමත්කම නිසා ය.

මනුෂ්‍යයාගේ බුද්ධිය ද අන්‍ය සත්වයන්ගේ බුද්ධිය අබිබවා ලූ අවයවයක් බව පැහැදිලි කරුණකි. අත්, පා යනාදි ඉන්ද්‍රියයන් ක්‍රමානුකූල ව පාලනය කිරීමේ ශක්‍යතාව මනුෂ්‍යයා ලබා ඇත්තේ මනුෂ්‍ය බුද්ධීන්ද්‍රියයේ ශක්ති මහිමය නිසා යැ යි පැවසිය යුතු ය. මොළයේ ඇතැම් කොටස් අනතුරට භාජන වූ අවස්ථාවන්හි දී ඊට සම්බන්ධව අන්‍ය ශරීර ඉන්ද්‍රියයන් ද ක්‍රියා විරහිත වන අයුරු අපට දක්නට ලැබෙන බැවිනි. තව ද, අන්‍ය සත්වයන්ගේ මනසට ගොදුරු වන්නේ තමා ඉදිරිපිට ඇති දේ පමණක් වුව ද මනුෂ්‍යයාට අතීතයේ පැවති දේ මෙන් ම අනාගතයේ ඇති විය හැකි දේ ද මනසෙහි මවා ගනිමින් තම කටයුතු සම්පාදනය කර ගත හැකි ය.''

ධර්මදාස, කේ. එන්. ඕ., **භාෂාව හා සමාජය**, කොළඹ, 1996, 01 පි.

1. මිනිසා අනෙක් සත්ත්වයන්ට වඩා අසහාය තත්ත්වයක් දරන්නේ කුමක් නිසා ද?
2. මිනිසාට මෙම ශක්තිය ලැබුණේ කුමක් නිසා ද?
3. අනෙක් සතුන් අබිබවා ශිෂ්ටාචාරයක් ගොඩ නැගීමට මිනිසා සමත් වූයේ ඇයි?
4. අත් පා ආදි අවයවයන් මනා ව පාලනය කිරීමේ හැකියාව මිනිසාට ලැබුණේ කෙසේ ද?
5. ශරීර අවයව හා මොළය අතර සම්බන්ධතා ඇති බව දැක්වීමට මෙහි දක්වා ඇති සාධකය කුමක් ද?

**ඡේදය (ii)**

''ශ්‍රී ලංකාවේ අපනයන ව්‍යුහය නිෂ්පාදිතයන්හි සහ වෙළෙඳපොළ ගමනාන්තයන්හි සංකේන්ද්‍රගත වීමෙන් අපනයන ආදායම්වල අස්ථායීතාවක් ඇති විය හැකි ය. ශ්‍රී ලංකාව තේ, ඇඟලුම් නිෂ්පාදිත හා රබර් නිෂ්පාදිත වැනි අපනයන කිහිපයක් මත රඳාපවතින අතර, මුළු අපනයනවලින් තුනෙන් දෙකක් පමණ යුරෝපය සහ ඇමෙරිකා එක්සත් ජනපදය වැනි සාම්ප්‍රදායික වෙළෙඳ පොළවල් වෙත සිදු කරයි. ආර්ථික ක්‍රියාකාරකම් අපරදිග සිට පෙරදිග බලවතුන් වන ඉන්දියාවට හා චීනයට විතැන් වන අවස්ථාවේ දී දැනට බටහිර දෙසට නැඹුරු වූ ශ්‍රී ලංකාවේ අපනයන ක්‍රමෝපායයන් නැවත සලකා බැලීම අත්‍යවශ්‍ය වේ. මේ සම්බන්ධ ව සැලකීමේ දී, චීනය සමඟ ඇති කර ගැනීමට යෝජිත වෙළෙඳ ගිවිසුම නිවැරදි මාවතක් වෙත යොමු වූ පියවරක් වේ. නව තාක්ෂණය උපයෝගී කර ගැනීම සහ නිෂ්පාදිත සඳහා එකතු කළ අගය ඉහළ නැංවීම සමඟ නිෂ්පාදිතවල නවීනත්වය වර්ධනය කිරීම ද අපනයන විවිධාංගීකරණය කිරීමෙන් කළ හැකි වේ. රටෙහි නිෂ්පාදන ව්‍යුහය රෙදිපිළි සහ ඇඟලුම්හි සිට ඉලෙක්ට්‍රොනික උපකරණ වැනි වඩාත් ඉහළ

තාක්ෂණික නිෂ්පාදන දක්වා වෙනස් කිරීමට දුන් කාලය එළැඹ ඇති අතර, එවැනි ක්‍රියාවලීන් ඔස්සේ ඇතැම් ආසියානු බලවතුන්ගේ වේගවත් කාර්මීක කරණ ක්‍රියාවලිය මෙවන් වර්ධනයක් සඳහා සාක්ෂ්‍ය දරයි. තව ද, ගෝලීය සහ කලාපීය අපනයන සම්මේලන තුළ ප්‍රබල සහභාගිත්වය, උපායශීලී අලෙවිකරණය සහ ඉලක්කගත රටවල් සමඟ ද්විපාර්ශ්වීය සහ බහුපාර්ශ්වීය ක්‍රියාකාරී වෙළෙඳ සබඳතා ඇති කර ගැනීමෙන් ශ්‍රී ලංකාවේ අපනයන වෙළෙඳපොළ වේගයෙන් ලෝකය වෙත විවෘත කළ හැකි වේ. අපනයන ශීඝ්‍රයෙන් ඉහළ නැංවීම සඳහා යන ගමනේ දී ව්‍යවසායකත්ව සහයෝගය වර්ධනය කිරීමට සහ සාර්ථක අලෙවි ක්‍රමෝපායයන් සඳහා පෞද්ගලික අංශයේ ඉහළ සහභාගිත්වය ඉතා වැදගත් වේ. සමස්ත අලෙවිකරණ ක්‍රියාවලියේ සියලු ම අංශ තුළ රාජ්‍ය සහ පෞද්ගලික අංශ එක් වූ බහුවිධ ප්‍රවේශයක් ඇති කිරීම, උපායමාර්ගික ගිවිසුම් සකස් කිරීම, උසස් තාක්ෂණය ඉහළ නැංවීම සහ ශක්තිමත් දේශීය හා ජාත්‍යන්තර බුද්ධිමය දේපළ රෙගුලාසි යොදා නවෝත්පාදනය ආරක්ෂා කිරීම ධෛර්යවත් කළ යුතු වේ.''

**මහබැංකු වාර්ෂික වාර්තාව, 2014**

1. ශ්‍රී ලංකාවේ අපනයන නිෂ්පාදනවල හා වෙළෙඳපොළ ගමනාන්තයෙහි සංකේන්ද්‍රගත වීම නිසා ඇති වන ප්‍රතිඵලය කුමක් ද?
2. සාම්ප්‍රදායික වෙළෙඳපොළ ලෙස දක්වා ඇත්තේ කුමන රටවල් ද?
3. ශ්‍රී ලංකාවේ අපනයන ක්‍රමෝපායයන් ගැන නැවත සලකා බැලිය යුත්තේ ඇයි?
4. අපනයන විවිධාංගීකරණය යන්නෙන් අදහස් කෙරෙන්නේ කුමක් ද?
5. අපනයන වෙළෙඳ පොළ වේගයෙන් ලෝකයට විවෘත කිරීම සඳහා ගත යුතු පියවර මොනවා ද?

ඇමුණුම 2

පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අපට ලැබී තිබෙන ආදි ම සිංහල පද්‍ය කාව්‍යය සංස්කෘත රීතියට වහල් ව කරන ලද්දක් නමුදු ගද්‍ය එසේ නොවී ය. ආදි ම සිංහල ගද්‍ය කාව්‍යය ලෙස සැලකිය යුතු අමාවතුරෙහි දක්නා ලැබෙන්නේ දේශීය මාර්ගයට හුරු වන රීතියකි. ගුරුළුගෝමීහුගේ අමාවතුරු භාෂාව ද ශ්‍රේෂ්ඨ ග්‍රන්ථකාරයකු අතින් සකස් වුණු ශිලාලිපි භාෂාව ම ය. සංස්කෘත සාහිත්‍යයෙහි ද හසළ දැනුම ඇති ගුරුළුගෝමීහු, සංස්කෘත ගද්‍ය රීතියට වඩා පාලි රීතිය ගුරු කොට සැලකුවෙකි. බෞද්ධ සංස්කෘතියට ද බෞද්ධ රටක පරිසරයට ද ගැළපෙන්නේ වාක් ප්‍රපඤ්චයෙන් හා අලංකරණයෙන් දූෂණය වුණු සංස්කෘත රීතිය නො ව පාලි රීතිය ය. එහෙයින් පාලි රීතිය ගුරු කොටගත් ගුරුළුගෝමීන් අතින් හැඩගැසුණු දේශීය මාර්ගයක් ලෙස සැලකිය යුතු අමාවතුර රීතිය නවීන කවර බසක වුව ද උසස් සරල රීතියට දෙවන නොවන්නකි. විද්‍යාචක්‍රවර්තී නිස්සාර සංස්කෘත රීතිය ගුරු කොට නොගෙන අමාවතුරු රීතිය ම තම කවිත්වය නමැති කෝවයෙහි දමා මනා සකස් කොට ගත්තේ නම් ගද්‍ය සිංහලය, කවි බසක් වශයෙන් පාලි සංස්කෘත යන දෙකට ම වඩා මධුර ලලිත ගුණයෙන් අනූන වියත් බසක් වන්නේ ය. පාලි රීතිය හැර සංස්කෘත රීතිය ගැනීම, නියම මැණික් ඉවත දමා විදුරු මිණි අගය කොට සැලකීමක් වැන්න.

i පැරණි ම සිංහල ගද්‍ය කාව්‍යය ලෙස මෙහි සැලකෙන කෘතිය හා කතුවරයා නම් කරන්න.

ii ඔහුගේ රචනා රීතියේ දැකිය හැකි විශේෂත්වය කුමක් ද?

iii බෞද්ධ සංස්කෘතිය හා සබැඳි රටකට ගැළපෙන රචනා ශෛලිය කෙබඳු විය යුතු ද?

iv ''නියම මැණික් ඉවත දමා විදුරුමිණි අගය කොට'' යන්න යෙදුවේ කවර අදහසක් තහවුරු කිරීමට ද?

v **නිස්සාර, වාක් ප්‍රපඤ්චය** යන වචන පැහැදිලි කර දක්වන්න.

උපුටා ගැනීම - අ.පො.ස. (උසස් පෙළ) විභාගය, වර්ෂ 2011 සහ ඉන් පසු ව පැවැත්වෙන විභාග සඳහා ප්‍රශ්න පත්‍ර ව්‍යුහය හා මූලාකෘති ප්‍රශ්න - 6 වෙළුම, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# 11. ගුත්තිල කාව්‍යය (194 - 259 කවි)

**නිපුණතාව :** 2.0 පුරාතන පද්‍ය සාහිත්‍යයේ විකාසනය ආකෘතික ලක්ෂණ හා ස්වභාවය අධ්‍යයනය කරමින් රස වින්දනයේ හා විචාරයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 2.3 කාව්‍ය විචාර සංකල්ප හඳුනා ගෙන නිර්දිෂ්ට පද්‍ය නිර්මාණ රස විඳිමින් විචාරයට ලක් කරයි.

**කාලච්ඡේද :** 10 යි.

**ඉගැනුම් පල :**
- පෙරදිග කාව්‍ය විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට පුරාතන පද්‍ය රස විඳිමින් විචාරය කරයි.
- නිර්දිෂ්ට පුරාතන පද්‍ය රස වින්දනයෙන් ලත් පරිචය ඇසුරින් වෙනත් කාව්‍ය නිර්මාණ රසවින්දනයට පෙලඹෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**I පෙර සූදානම :**
- ගුත්තිල කාව්‍යයේ 194 සිට 259 දක්වා කවි කියවා රස වින්දනයට හා විචාරයට අදාළ කරුණු රැස් කර ගන්න.
- පරිශීලනීය ග්‍රන්ථ කියවා දැනුම පෝෂණය කර ගන්න.
- පෙරදිග කාව්‍ය විචාර සංකල්ප පිළිබඳ දැනුම යාවත්කාලීන කර ගන්න.

**II ඉගෙනුම සංවර්ධනය :**
- පහත සඳහන් ආකාරයේ සුදුසු ප්‍රවේශයකින් පාඩමට පිවිසෙන්න.
  * ගුරු ගෝල සම්බන්ධය ගැන කියැවෙන ගීතයක් හෝ කවියක් ඉදිරිපත් කිරීම
    (උදා : පැන මඩ කඩිති වැව් තා . . .)
  * ගුරු ගෝල සම්බන්ධය ගැන විස්තර වන කතන්දරයක් හෝ සිදුවීමක් ඉදිරිපත් කිරීම
- ගුත්තිල හා මූසිල පිළිබඳ විවෘත ව අදහස් ප්‍රකාශ කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව සලසා දෙන්න.
- මූසිල, වාදයට එළඹීම දක්වා කතාව නැවත සිහිපත් කරවන්න.
- පාඩමට අදාළ කවි (194 - 259) කියවා ඒවායේ අරුත් පැහැදිලි කර ගැනීමට ශිෂ්‍යයන්ට මඟ පෙන්වන්න.
- අදාළ කොටසේ හමු වන විරිත් දෙක හඳුන්වා දෙන්න. (ගී - පෙද) (ඇමුණුම 01)
- නිර්දිෂ්ට කවිවල පහත සඳහන් කරුණු අවධානයට ගනිමින් ශිෂ්‍යයන් රස වින්දනයට හා විචාරයට යොමු කරන්න.
  * අන්තර්ගතය
  * කාව්‍ය ආකෘති
  * යොදා ගෙන ඇති උපමා රූපකාදි අලංකාරෝක්ති
  * අවස්ථා නිරූපණ
  * චරිත නිරූපණ
  * කාව්‍ය භාෂාව
  * කවියාගේ නිර්මාණ කුසලතාව
  * සාහිත්‍යික අගය
  * විවිධ අවස්ථාවන්ට ගැළපෙන ලෙස විරිත් තෝරා ගැනීම
  * ගුත්තිලයෙන් හෙළි වන සමකාලීන සමාජ තොරතුරු
  * ගුරු-ගෝල සම්බන්ධය පිළිබඳ තොරතුරු
  * ගුත්තිලයේ ස්වාධීන රචනා මාර්ගය

## III තක්සේරුව හා ඇගයීම

- පාඩම අතරතුර ශිෂ්‍යයන්ගේ දැනුම හා අවබෝධය තහවුරු කිරීමට උචිත නිර්ණායක මූලික ඇගයීම් ක්‍රම යොදා ගන්න.
- අර්ථය ලිහිල් බසින් ලිවීමේ අභ්‍යාසවල යොදවන්න.
- පද්‍ය රසවින්දනය හා විචාරය කිරීමට අභ්‍යාස ලබා දෙන්න.

**නිදර්ශක ඇගයීම්**

- සජීව ලෙස අවස්ථා නිරූපණයෙහි ගුත්තිල කවියා දක්වන කුසලතාව අවස්ථා හතරක් නිදසුන් ලෙස දක්වමින් පැහැදිලි කරන්න.

**ගුණාත්මක යෙදවුම්** : ඇමුණුම 01

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක** :

- නිර්දිෂ්ට පුරාතන පද්‍ය කියවා අරුත් පැහැදිලි කරයි.
- විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට කවි රස විඳිමින් විචාරය කරයි.
- විචාරයෙන් ලත් පරිචය ඇසුරෙන් කාව්‍ය නිර්මාණය කරයි.

**පරිශීලනීය ග්‍රන්ථ** :

- කරුණාරත්න, අශෝක - සාහිත්‍ය විවේචනය
- ප්‍රඥාරාම හිමි, යක්කඩුවේ - ගුත්තිල විචාර විචාරය
- වික්‍රමසිංහ, මාර්ටින් - ගුත්තිල ගීතය
- සරච්චන්ද්‍ර, එදිරිවීර - සාහිත්‍ය විද්‍යාව
- සේනානායක, ජී. බී. - විචාර ප්‍රවේශය

ඇමුණුම 01 :

ගී විරිත -

මෙම විරිතෙන් බැඳි පද්‍යවල පළමු සහ තෙවන පාදවල මාත්‍රා සමාන වන අතර දෙවන සහ සිවුවන පාදවල මාත්‍රා අසමාන ය.

| | |
|---|---|
| පළමු පාදය මාත්‍රා | - 9 |
| දෙවන පාදය මාත්‍රා | -11 |
| තුන්වන පාදය මාත්‍රා | - 9 |
| සිවුවන පාදය මාත්‍රා | -14 |

උදා:-

ඔහු සිරුරෙහි නපු රු
ලකුණු දැක එන උවදු රු
දැන දැනම අප ගු රු
බසින් නොකෙළෙමි එදා මොහු දු රු

-ගුත්තිල කාව්‍යය, 196 කවිය-

පෙද විරිත -

සතර සතර මතින් - යති සතරක් දුටහොත්
සොළොස් මතින් රැඳියේ - පෙද නම් විරිත් හෙ මෙසේ

මාත්‍රා සතර බැගින් යති (විරාම) හතරක් ඇති ව මාත්‍රා සොළසකින් සමන්විත වනුයේ 'පෙද' නම් විරිත යි.

උදා:-

වෙසෙසින්/ දුටු දුටු/ සත සිත/ පා දා
මෙලෙසින්/ මනහර / එමඩුව/ සුස දා
සිරසින්/ රජු සිරි/ සරණත/ නැම දා
සතොසින්/ දන්වූ/ සඳ ඒ/මැති ඳා

-ගුත්තිල කාව්‍යය, 232 කවිය-

# 12. නූතන කාව්‍ය - රස වින්දනය හා විචාරය
## (නිදහස් කවියේ ද්විතීය තරංගය)

**නිපුණතාව :** 6.0 නූතන කාව්‍ය සාහිත්‍යයේ විකාසනය හා සුවිශේෂතා හඳුනා ගෙන කාව්‍ය විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට කාව්‍ය රස විඳිමින් විචාරයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 6.3 කාව්‍ය විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට කාව්‍ය රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි.

**කාලච්ඡේද :** 16 යි.

**ඉගැනුම් පල :**
- නිර්දිෂ්ට කාව්‍ය නිර්මාණවල කතුවරුන්, කාලය හා සාහිත්‍ය පසුබිම හඳුනා ගෙන විස්තර කරයි.
- නිර්දිෂ්ට නූතන කාව්‍ය නිර්මාණවල සුවිශේෂතා පැහැදිලි කරයි.
- නිර්දිෂ්ට නූතන කාව්‍යවල කලාත්මක අගය විමසමින් රස විඳියි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**I පෙර සූදානම :**

- පහත සඳහන් නිර්දිෂ්ට පද්‍ය පන්තිවල රචකයන්, ඔවුන් විසූ කාලය, සාහිත්‍යික පසුබිම හා ඔවුන්ගේ වෙනත් නිර්මාණ ආදිය පිළිබඳ තොරතුරු රැස් කර ගන්න.
  * නිදහස් කවියේ ද්විතීය තරංගයට අයත් නිර්දිෂ්ට කාව්‍ය නිර්මාණ
    * පරාක්‍රම කොඩිතුවක්කු - දේදුන්න පායාවි හෙටත් පාලම උඩින්
    * මොනිකා රුවන්පතිරණ - පොඩි දුව
    * දයාසේන ගුණසිංහ - රන්තැටියක කඳුළු
    * බුද්ධදාස ගලප්පත්ති - දුරු රට ගිය පුතු
    * රත්න ශ්‍රී විජේසිංහ - පරමල්
    * නන්දන වීරසිංහ - ආදරණීය පාසල
    * ආරියවංශ රණවීර - තුරු සෙනඟ හා තණ පඳුර
    * ධර්මසිරි රාජපක්ෂ - නංගීගේ රහසිගත සෙනෙහෙ වීණාව
    * ලාල් හෑගොඩ - සතුට

- නිර්දිෂ්ට කාව්‍ය නිර්මාණවල තේමාව/වස්තු විෂය, භාෂාව, ආකෘතිය, අලංකාර භාවිතය, කාව්‍යෝපක්‍රම ආදි තොරතුරු එක් රැස් කර ගන්න. (ඇමුණුම 01)

**II ඉගෙනුම සංවර්ධනය :**

- පහත සඳහන් ක්‍රම අතරින් එකක් හෝ වෙනත් සුදුසු ක්‍රමයක් හෝ භාවිතයෙන් පාඩමට පිවිසෙන්න.

උදා:- * ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක ලවා පද්‍ය පන්තියක් ඉදිරිපත් කරවීම
* සිංහල පද්‍ය සාහිත්‍යයේ විවිධත්වය පිළිබඳ කෙටි පවර් පොයින්ට් ඉදිරිපත් කිරීමක් සිදු කිරීම
* අනිර්දිෂ්ට කවි පන්තියක් හා ඒ පිළිබඳ ව ලියවුණු විචාරයක් ඉදිරිපත් කර සාකච්ඡා කිරීම
* අනිර්දිෂ්ට කවි පන්තියක් ඉදිරිපත් කර ඒ පිළිබඳ ව රස වින්දනයක් සිදු කිරීම සඳහා සංවාදයක් ගොඩනැගීම (ඇමුණුම 01)

- නිර්දිෂ්ට පද්‍ය නිර්මාණ එකිනෙක ගෙන ඒවා හොඳින් කියවා අවබෝධ කර ගැනීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- නිර්දිෂ්ට පද්‍ය පන්ති පිළිබඳ රසාස්වාදයක නිරත වන්න. මේ සඳහා කණ්ඩායම් ක්‍රියාකාරකම්, රස වින්දන, සංවාද, දේශන, සාකච්ඡා ආදි ක්‍රම යොදා ගත හැකි ය.
- පද්‍ය පන්ති රසාස්වාදයේ දී පහත සඳහන් කරුණු පිළිබඳ සැලකිලිමත් වන්න.
  - * තේමාව/වස්තු විෂය
  - * කවියාගේ දෘෂ්ටිය
  - * අරමුණ
  - * කාව්‍යෝපක්‍රම
  - * භාෂා භාවිතයේ සුවිශේෂතා
  - * ආකෘතිය
  - * කාව්‍ය සන්දර්භය

## III තක්සේරුව හා ඇගයීම

- පාඩම සංවර්ධනයේ දී ශිෂ්‍ය සාධන මට්ටම තක්සේරුව සඳහා සුදුසු නිර්ණායක මූලික ඇගයීම් උපක්‍රම යොදා ගනිමින් ඉහළ සාධන මට්ටමක් සඳහා අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- කණ්ඩායම්/කේවල පැවරුම්, ක්‍රියාකාරකම්, කාර්ය පත්‍රිකා, නිරීක්ෂණ, සාකච්ඡා, වාචික ප්‍රශ්නකරණය ආදි තක්සේරු ක්‍රම මේ සඳහා යොදා ගත හැකි ය.
- මෙහි දී පහත සඳහන් කරුණු වෙත අවධානය යොමු කරන්න.
  - * නූතන කාව්‍ය විචාර සංකල්ප පිළිබඳ අවබෝධය
  - * කාව්‍ය රසවින්දන හැකියාව
  - * කාව්‍ය රසාස්වාදයක් විධිමත් ව ලිවීමේ හැකියාව

**ගුණාත්මක යෙදවුම්** : * පවර් පොයින්ට් ඉදිරිපත් කිරීමක්
* කවි ඇතුළත් සංයුක්ත තැටි/කැසට් පට
* සංයුක්ත තැටි ධාවකයක්/කැසට් යන්ත්‍රයක්
* අනිර්දිෂ්ට කවි හා ඒවා පිළිබඳ ලියැවුණු විචාර කිහිපයක්

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක :**

- නිර්දිෂ්ට කාව්‍ය නිර්මාණවල මූලික තොරතුරු දක්වෙන වගුවක් සකස් කරයි.
- නිර්දිෂ්ට කාව්‍ය නිර්මාණවල තේමාව හා අරමුණු හඳුනා ගෙන විස්තර කරයි.
- නිර්දිෂ්ට කාව්‍ය නිර්මාණවල භාෂාවේ සුවිශේෂතා අගය කරයි.
- නිර්දිෂ්ට කාව්‍ය නිර්මාණ රස විඳිමින් විචාරය කරයි.

**පරිශීලනීය ග්‍රන්ථ** :

- කරුණාරත්න, අශෝක - සාහිත්‍ය විවේචනය
- කරුණාරත්න, කුසුමා, සරත් විජේසූරිය - නව කවි සංග්‍රහය
- ගුනසිංහ, සිරි - චිරන්තන සම්ප්‍රදායේ ප්‍රගතිය
- දිසානායක, විමල් - නවකවි සරණිය

**පුත්‍ර හස්න**

මල් හිනා පිරුනු මුහුනිනි
ගජ ඉලන්දාරි ගමනිනි
ලොකු පුතා ගෙදර එන සැටි
සිතසිතා ඔබ දෙපොල ඇති

කපු මහත්වරුන් එන්නැති
කටයුතුන් කතා කොට ඇති
මඟ බලා නැගනියත් ඇති
ඇගෙ විවාහයත් ලඟ ඇති

මට සමාවන්න දෙගුරුනි
ඔබෙ දෙපා නමැද පවසමි
කියකියා ඉන්ට බැරි වුනි
හදිසියේ කරුනු සිදු වුනි

නගරයේ අඳුර හඳ නැති
දුරු වුනේ සඳලතාගෙනි
ඇය දිරිය ලදකි මව් නැති
හද සෙනේ බවට පෙරලුනි

වැඩපොලේ සිරුර හප වුනි
බෝඩිමට පඩිය දිය වුනි
සහලවා උනෙන් වැටුනෙමි
ඇය නිසා දිවිය සුරකුනි

මට වඩා බිඳක් වයසැති
අඩු කුලේ කියා පවසති
බඳ වටා කසී සලු නැති
සෙනසුරා හතේ වෙන්නැති

වත සිනා එහෙත් අඩු නැති
හිතපුරා මෙලෙක ගති ඇති
ලේලියක කැටුව පැමිනෙමි
කටපුරා දුවේ කිව්වැකි!

දර්ශන මේදිස්

# ගිං ගඟේ විලාපය

තෙලිකඩ වෙල් යාය මැද මහ වේල්ලේ
බුල්ඩෝසර ටිපර ඩම්පර ඉගිල්ලේ
දෙගංබඩ පතින ගිංගඟ බැඳිල්ලේ
කෝලාහලය ගැන කවුරුත් දෙඩිල්ලේ

පස්කඳු කපා ඩැහැගෙන වාහන එන්නේ
එනමුදු තාච්චිය කූඩය රඟ දෙන්නේ
වාරුව දිය වුනත් වීරිය අරගන්නේ
තාත්තා ය තාච්චි පෙළ පුරවන්නේ

වේල්ල ගොඩවෙලා වැඩ බිම වැහුණු දිනේ
තාත්තා හොරෙන් ඉකිබිඳිනව ඇහුණේ
වේලි බැඳි අයගෙ දුක්ගිනි හඳුනමිනේ
ගඟ වේදනාවෙනි ගිංතොට වෙත ඇදුණේ

රතුපස් උඩට ලේ දහදිය මුහු කරලා
ඉදිකළ බැම්ම අයිනේ සොහොනේ දමලා
ගම ම තාත්තා අමතක කළ සැණිනා
ගඟ උතුරලා වේල්ල මැද ඉරි පැළුණා

තාත්තා වගෙ ම තව සිය දහක් දෙනා
ගඟේ යන සුඹුල් රොඩුවලට සමවුණා
වක්වැල්ලේ තොටින් ගිංගඟ බැස යමිනා
ඒ මිනිසුන් නමින් මේ මොහොතෙත් හඬනා

**නන්දන වීරසිංහ**

# 13. 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍යය - රස වින්දනය හා විචාරය

## (තෙවන අංකය)

**නිපුණතාව :** 5.0 නාට්‍ය සාහිත්‍යයේ සුවිශේෂතා හා විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව නාට්‍ය රසවිඳිමින් විචාරය කරයි.

**නිපුණතා මට්ටම :** 5.3 නාට්‍ය විචාර සංකල්ප හඳුනා ගෙන නිර්දිෂ්ට නාට්‍ය පෙළ රස විඳිමින් විචාරයට ලක්කරයි.

**කාලච්ඡේද :** 08 යි.

**ඉගැනුම් පල :**
- නිර්දිෂ්ට නාට්‍යයේ සුවිශේෂතා හඳුනා ගෙන පැහැදිලි කරයි.
- නිර්දිෂ්ට නාට්‍ය පෙළ රස විඳිමින් විචාරය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**I පෙර සූදානම :**

- 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍ය පෙළ කියවා ඒ පිළිබඳ පූර්ණ අවබෝධයක් ලබාගන්න.
  ('පේමතෝ ජායතී සෝකෝ' නාට්‍ය පෙළෙහි තෙවන අංකය කෙරෙහි විශේෂ අවධානය යොමු කරන්න.)
- අතිරේක පරිශීලනීය ග්‍රන්ථ කියවා අවශ්‍ය තොරතුරු රැස් කර ගන්න.
- නිර්දිෂ්ට නාට්‍ය පෙළ රසවින්දනයට හා විචාරයට අදාළ ව පහත මාතෘකා ඔස්සේ අදාළ නිවැරදි තොරතුරු රැස් කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
  1. 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍ය පෙළ
  2. නාට්‍ය නිෂ්පාදනයේ ගී/සංවාද ඇතුළත් සංයුක්ත තැටි, ඡායාරූප
  3. 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍ය පෙළ පිළිබඳ ලියැවී ඇති පුවත්පත් විචාර ලිපි, විචාර ග්‍රන්ථ

**II ඉගැනුම සංවර්ධනය :**

- සුදුසු ප්‍රවේශයක් යොදා ගෙන පාඩමට ප්‍රවේශ වන්න.
  *උදා :* * 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍යයේ ඇතුළත් සංවාදයක් ශිෂ්‍යයකු හෝ කිහිප දෙනකු ලවා නාටකීය ආකාරයෙන් ඉදිරිපත් කිරීම
  * 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍ය ගීතයක් ගායනා කිරීම
  * 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍යයේ පාඩමට අදාළ කොටස ඇසුරෙන් සකස් කළ පවර් පොයින්ට්/පිටුපෙරළනය ආශ්‍රිත කෙටි සාකච්ඡා ප්‍රවේශයක් ලබා ගැනීම
- පාඩමට අදාළ 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍ය පෙළෙහි 03 අංකය අධ්‍යයනයට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- සම්මත ශබ්දකෝෂ භාවිතයෙන් දුරවබෝධ වචනවල අරුත් පැහැදිලි කර ගැනීමට යොමු කරන්න.
- නිර්දිෂ්ට නාට්‍යයේ සාර්ථකත්වයට බලපාන්නා වූ කරුණු පෙළ ගැස්වීමට, නාට්‍යයේ නාටකීය සිදුවීම් පෙළ ගැස්වීමට, චරිත සහ එම චරිතවල සුවිශේෂ ලක්ෂණ පිළිබඳ විමර්ශනයට හා සටහන් කිරීමට කණ්ඩායම් හෝ කේවල ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
- නාට්‍ය විචාර සංකල්ප ඇසුරෙන් 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍ය පෙළ රසවින්දනය සහ විචාරයට අදාළ නිර්මාණශීලී ක්‍රියාකාරකම්වල ශිෂ්‍ය ශිෂ්‍යාවන් නිරත කරවන්න. එහි දී පහත සඳහන් අංග කෙරෙහි අවධානය යොමු කරවන්න.

* නාට්‍යයේ තේමාව (තේමාවේ වැදගත් බව/සර්වකාලීන බව/ මූලාශ්‍රය ඇසුර/නාට්‍යෝචිත බව)
* නාට්‍ය ආකෘතිය (නාට්‍ය ධර්මී)
* නාට්‍ය පෙළෙහි අඩංගු නාටකීය භාෂාව සහ යටිපෙළ (subtext)
* නාට්‍යයේ චරිත/චරිතවල අරමුණු/චරිත අතර අන්තර්සම්බන්ධතා
* නාට්‍යයෙන් හෙළි වන තත්කාලීන සමාජ පසුබිම
* නාට්‍යෝචිත අවස්ථා මතු කරමින් කතා වින්‍යාසයේ ප්‍රබල අවස්ථා අධ්‍යයනය කිරීම
* නාට්‍යයේ ගැටුම
* නාට්‍ය සන්දර්භය (නාට්‍යයේ කාර්යය විකාසනය වී ඇති අයුරු)
* නාට්‍යයේ භාෂාව

3. නාට්‍ය පෙළෙහි ගීත සංවාද අභිනයෙන් යුතු ව ඉදිරිපත් කිරීමට ශිෂ්‍යයන් සම්බන්ධ කර ගන්න.
4. 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍ය පෙළ රසවින්දනය හා විචාරය කිරීම මඟින් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ලද හැකි ජීවිතාවබෝධය පිළිබඳ කථිකාවක නිරත වන්න.
5. නාට්‍ය පෙළෙහි සාහිත්‍යික අගය, කතුවරයාගේ භාෂාව, භාවිත කර ඇති විශේෂ භාෂා ප්‍රයෝග කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් නාට්‍ය පෙළ රසවින්දනයට හා විචාරයට මඟ පෙන්වන්න.

**III තක්සේරුව හා ඇගයීම**

- නාට්‍ය විචාර සංකල්ප හඳුනා ගෙන නිර්දිෂ්ට නාට්‍ය පෙළ රස විඳිමින් විචාරයට ලක් කිරීම සඳහාත්, ශිෂ්‍යයන්ගේ සාධන මට්ටම තක්සේරුව හා ඇගයීම සඳහාත් සුදුසු පැවරුම් ලබා දෙන්න. (ප්‍රායෝගික/ලිඛිත)

*උදා :* 1. 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍යයේ තෙවන අංකයෙහි අන්තර්ගත කතා වින්‍යාසය (නාට්‍යයේ සිදුවීම් පෙළ ගැස්ම) මතකයෙන් ඉදිරිපත් කිරීමේ අභ්‍යාසවල නිරත කිරීම

2. ඇමුණුම 01හි සඳහන් මාතෘකා ඔස්සේ කරුණු ගවේෂණය කර ඉදිරිපත් කිරීම සඳහා ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දීම

3. නාට්‍ය විචාර සංකල්ප පිළිබඳ ලද අවබෝධය ප්‍රකට වන පරිදි 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍ය කෘතිය පිළිබඳ ව (සමස්ත නාට්‍ය පෙළ හෝ තෙවන අංකය ආශ්‍රිත ව) විවාදයක් කරවීම (ඇමුණුමේ II සඳහන් මාතෘකා හෝ වෙනත් සුදුසු මාතෘකාවක් පිළියෙල කරගන්න)

4. කණ්ඩායම් හෝ කේවල වශයෙන් 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍ය කෘතිය පිළිබඳ කෙටි ඉදිරිපත් කිරීමකට, (පවර් පොයින්ට් පුවරු/පිටු පෙරළන/බිත්ති පුවත්පත් වැනි මාධ්‍යයක් භාවිත කර) ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දීම

5. 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍ය පෙළ පිළිබඳ රස වින්දනාත්මක, විචාරයක නිරත කරවීම

- සුදුසු ඇගයීම් නිර්ණායක පදනම් කර ගනිමින් ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඇගයීමට ලක් කරන්න.
- මෙතෙක් උගත් විෂය කරුණු පිළිබඳ උචිත ඉගැනුම් - ඉගැන්වීම් උපකරණයක් භාවිත කරමින් අවසන් සමාලෝචනයක නිරත වන්න.
- මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍ය පෙළ ඇතුළු විවිධ නාට්‍ය රචනා කියවීමට, රස විඳීමට හා විචාරයට මෙන් ම තොරතුරු ගවේෂණයට ශිෂ්‍ය ශිෂ්‍යාවන් යොමු කරවන්න.

**ගුණාත්මක යෙදවුම්** : ඇමුණුම් 01, 02

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක** :

- 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍යය පිළිබඳ තොරතුරු ඇතුළත් පොත් පිංචක් සකස් කරයි.
- 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍ය පෙළෙහි දෙබස්, ගීත සහිත ව රංගනයේ යෙදෙයි.
- 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍ය පෙළෙහි දුරවබෝධ වචනවල අරුත් පැහැදිලි කරයි.
- 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍යයෙහි භාෂාවේ සුවිශේෂතා අගය කරයි.
- 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍ය පෙළ රසවිඳිමින් විචාරය කරයි.
- නාට්‍ය පිටපත් කියවීමට පෙලඹෙයි.
- නාට්‍ය පිටපත් රචනයට යොමු වෙයි.

**පරිශීලනීය ග්‍රන්ථ** :

- කාරියවසම්, තිස්ස, ආරියවංශ රණවීර - සිංහබාහු සම්ප්‍රශංසා
- ගම්ලත්, සුචරිත - නාට්‍ය ප්‍රවේශය
- ගලහිටියාව, පී. බී, කේ. එන්. ඕ. ධර්මදාස - එදිරිවීර සරච්චන්ද්‍ර සාර සංග්‍රහය
- ධර්මකීර්ති, රංජිත් - නාට්‍ය ප්‍රවේශය

ඇමුණුම් :

ඇමුණුම 01

1. 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍ය පෙළින් හෙළිදරව් වන ගුරු සිසු සබඳතා පිළිබඳ විග්‍රහය
2. 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍ය පෙළින් ඉස්මතු කර දක්වන ප්‍රේමය සහ මනුෂ්‍යයා පිළිබඳ සංකල්පය
3. 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍ය පෙළ රචනයට බලපෑ බෞද්ධ සාහිත්‍ය මූලාශ්‍රය
4. 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍ය පෙළෙහි අන්තර්ගත උද්දාල, ස්වර්ණතිලකා චරිතද්වය සහ තාරුණ්‍යයේ සිතුම් පැතුම්

ඇමුණුම 02

**විවාද මාතෘකා**

උදා:- • 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍යය මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ විශිෂ්ටතම නිර්මාණය වේ/නො වේ.

# 14. පුරාතන ගද්‍ය-අර්ථාවබෝධය හා රස වින්දනය
## (කුණ්ඩලකේසීගේ වස්තුව හා ජීවක වෛද්‍යවරයාගේ කතාව)

**නිපුණතාව :** 1.0 පුරාතන ගද්‍ය සාහිත්‍යය පරිශීලනයෙන් ලබා ගත් මානව ගුණධර්ම හා සංස්කෘතිකාංග මගින් ජීවිත පරිඥානය පුළුල් කර ගනිමින් රස වින්දනයේ හා විචාරයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 1.2 නිර්දිෂ්ට කෘතිවල සුවිශේෂතා, අන්තර්ගතය, භාෂා ලක්ෂණ හා රචනා රීති හඳුනා ගෙන රස විඳිමින් විමසුමට ලක් කරයි.

**කාලච්ඡේද :** 12 යි.

**ඉගැනුම් පල :**
- නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පාඨවල තේමාව, සන්දර්භය හා භාෂාවේ සුවිශේෂතා හඳුනා ගෙන පැහැදිලි කරයි.
- නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පාඨ අර්ථාවබෝධයෙන් යුතු ව ලිහිල් බසින් ලියයි.
- නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පාඨවල සාහිත්‍යික අගය හඳුනා ගෙන රස විඳිමින් විචාරය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**කුණ්ඩලකේසීගේ වස්තුව**

**I පෙර සූදානම :**
- සද්ධර්මරත්නාවලිය ග්‍රන්ථයේ පසුබිම් තොරතුරු පිළිබඳ දැනුවත් වන්න.
- සද්ධර්මරත්නාවලියේ එන කුණ්ඩලකේසී වස්තුව කියවා අවබෝධ කර ගන්න.
- සද්ධර්මරත්නාවලී කතා පිළිබඳ ලියැවුණු විචාර ග්‍රන්ථ කියවා අවබෝධයක් ලබා ගන්න.
- කතාවේ තේමාව ගැන දැනුවත් වන්න.

**II ඉගැනුම සංවර්ධනය :**
- පහත සඳහන් සුදුසු ප්‍රවේශයක් යොදා ගන්න.

උදා: * සද්ධර්මරත්නාවලියේ කොටසක් කියවීමෙන්
* කුණ්ඩලකේසී කතාවේ අවස්ථාවක් සිහිපත් කරමින්
* සද්ධර්මරත්නාවලී ග්‍රන්ථය ගැන සාකච්ඡා කිරීමෙන්

- කුණ්ඩලකේසී කතාව කියවීමට සියලු ම ශිෂ්‍යයන්ට අවස්ථාවක් ලබා දෙන්න.
- දුරවබෝධ වචන පිළිබඳ අර්ථ දක්වා සිසුන් සමඟ සාකච්ඡාවක නිරත වන්න.
- කුණ්ඩලකේසී කතාවේ පහත සඳහන් කරුණු පිළිබඳ ශිෂ්‍ය අවධානය යොමු කරන්න.
  * කුණ්ඩලකේසී සිර කර තැබීම
  * සොරකු කෙරෙහි පිළිබඳ සිතක් ඇති කර ගෙන සොරා නිදහස් කර ගැනීම
  * සොරා සමග සරණ යෑම
  * සොරාගේ උපාය සඳහා සිටු කුමරිය රැගෙන යාම
  * ඇය නුවණින් ක්‍රියා කිරීම
  * පැවිදි වීම
  * වාදයෙහි අගතැන් ඇත්තියක වීම
- සද්ධර්මරත්නාවලී කතාවලින් හෙළි වන සමකාලීන සමාජ පසුබිම පිළිබඳ සාකච්ඡා කරන්න.

**III තක්සේරුව හා ඇගයීම**

- කතාවේ පෙළ හොඳින් කියවා කොටස් කීපයක් ලිහිල් බසින් ලිවීමට යොමු කර තක්සේරුවක යෙදෙන්න.
- දුරවබෝධ වචන පිළිබඳ අභ්‍යාසයක් ලබා දී ඒ පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.
- විචාර ප්‍රශ්න ආශ්‍රයෙන් දැනුම තහවුරු කිරීම සඳහා පැවරුමක් ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්** : සද්ධර්මරත්නාවලිය ග්‍රන්ථය

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක** :

- කුණ්ඩලකේසී කතාවේ තේමාව පැහැදිලි කරයි.
- කතා සන්දර්භය, භාෂාවේ සුවිශේෂතා සම්බන්ධයෙන් කුණ්ඩලකේසී කතාව විමර්ශනය කරයි.
- කුණ්ඩලකේසී කතාව රස විඳිමින් විචාරයේ යෙදෙයි.
- විචාරාත්මක ප්‍රශ්නවලට සාර්ථක ව පිළිතුරු ලියයි.

**පරිශීලනීය ග්‍රන්ථ** :

- කුලසූරිය, ආනන්ද - සිංහල සාහිත්‍යය
- වික්‍රමසිංහ, මාර්ටින් - බණකතා සාහිත්‍යය
- වික්‍රමසිංහ, මාර්ටින් - සිංහල සාහිත්‍යයේ නැඟීම

**ජීවකාරාම පූජා කතා (පූජාවලිය)**

**I පෙර සූදානම** :

- පූජාවලිය ග්‍රන්ථයේ පසුබිම් තොරතුරු පිළිබඳ දැනුවත් වන්න.
- ජීවකාරාම පූජා කතාව කියවා අවබෝධ කරගන්න.
- එහි දුරවබෝධ වචනවල අර්ථ පැහැදිලි කර ගන්න.
- කතාවේ තේමාව අවබෝධ කර ගන්න.
- ඉගෙනුම් පල සාක්ෂාත් කර ගැනීම සඳහා ඉගෙනුම් ආධාරක සකසා ගන්න.

**II ඉගැනුම සංවර්ධනය** :

- පහත සඳහන් ආකාරයේ සුදුසු ප්‍රවේශයකින් පාඩම ආරම්භ කරන්න.

උදා: * පූජාවලිය ග්‍රන්ථයෙන් කොටසක් කියවීමෙන්
  * කැපවීමෙන් සේවය කරන දක්ෂ වෛද්‍යවරයකු පිළිබඳ සත්‍ය සිදුවීමක් සිහිපත් කිරීමෙන්
  * පූජාවලිය කෘතියේ පසුබිම් තොරතුරු සාකච්ඡා කිරීමෙන්

- ජීවකාරාම පූජා කතාවේ පෙළ කියවීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- දුරවබෝධ වචනවල අර්ථය පැහැදිලි කර දෙන්න.
- නිර්දිෂ්ට කතාවේ අන්තර්ගතය පිළිබඳ ශිෂ්‍යයන් සමඟ සාකච්ඡාවක නිරත වන්න. පහත සඳහන් කරුණු පාදක කර ගන්න.
  * ජීවක වෛද්‍යවරයාගේ ජීවන තොරතුරු හා චරිත ලක්ෂණ
  * උපත හා නම ලැබුණු හැටි
  * ශිල්ප ඉගැනීම
  * වෛද්‍ය වෘත්තියෙහි යෙදීම
  * සිටු දේවියගේ ශීර්ෂාබාධය සුව කිරීම

* රජුගේ භගන්දරාබාධය සුව කිරීම
* සිටාණන්ගේ ශීර්ෂාබාධය සුව කිරීම
* බුදුරජුන්ගේ ශරීරාබාධය සුව කිරීම

- මෙම කතාවේ කතුවරයා විසින් යොදා ගෙන ඇති විශේෂ භාෂා ලක්ෂණ හඳුනා ගැනීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- මෙම නිර්මාණයෙන් හෙළි වන සමකාලීන සමාජ තතු සාකච්ඡාවට ලක් කරන්න.

**III තක්සේරුව හා ඇගයීම**

- කතාවේ පෙළ හොඳින් කියවා කොටස් කීපයක් ලිහිල් බසින් ලිවීමට යොමු කර තක්සේරුවක යෙදෙන්න. ඒවා අගය කරන්න.
- දුරවබෝධ වචනවල අර්ථ ලිවීමේ පැවරුමක් ලබා දෙන්න.
- විචාර ප්‍රශ්නයක් සඳහා පිළිතුරු ලිවීමට යොමු කර දැනුම තහවුරු කරන්න.
- නිර්දිෂ්ට නිර්මාණ රස වින්දනය හා විචාරය සඳහා සුදුසු අභ්‍යාස ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

* ඇමුණුම 01

* පූජාවලිය ග්‍රන්ථය පිළිබඳ විචාර කෘති

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක :**

- නිර්දිෂ්ට කතාව කියවා අර්ථය ලිහිල් බසින් ලියයි.
- ජීවකාරාම පූජා කතාවේ තේමාව පැහැදිලි කරයි.
- ජීවකාරාම පූජා කතාවේ කතා සන්දර්භය, භාෂා ලක්ෂණ විමසීමට ලක් කරයි.
- ජීවකාරාම පූජා කතාව රස විඳිමින් විචාරයට ලක් කරයි.
- ජීවක චරිතයේ චරිත ලක්ෂණ අගය කරයි.

**පරිශීලනීය ග්‍රන්ථ :**


- ආරියපාල, එම්. බී. - මධ්‍යකාලීන ලංකා සමාජය
- කුලසූරිය, ආනන්ද - සිංහල සාහිත්‍යය 1
- වික්‍රමසිංහ, මාර්ටින් - බණකතා සාහිත්‍යය
- වික්‍රමසිංහ, මාර්ටින් - විචාර ලිපි
- වික්‍රමසිංහ, මාර්ටින් - සිංහල සාහිත්‍යයේ නැගීම


ඇමුණුම 01

**සද්ධර්ම රත්නාවලියෙහි ගැමියෝ**

**- මාර්ටින් වික්‍රමසිංහ -**

මීට කලකට පෙර සිංහල පණ්ඩිතයන් අතින්, පුරාතන සිංහල පද්‍යය පමණ, ගද්‍යය සංග්‍රහ නොලැබුයේ, විස්තරාර්ථ වර්ණනයය, අලංකාර විභාගය, යනාදීන් විසින් තමන්ගේ උගත්කම් ඇද බෑමට සිංහල ගද්‍යය නොතැන ය යි ඔවුන් සැලකූ බැවිනැ යි සිතමි. අවුරුදු විස්සකට තිහකට පමණ පෙර කවිකාරයන් බහුල වුව ද තමන් සිතූ සිතුම් හා පැතූ පැතුම් පණ ඇති බසින් පැහැදිලිව ලියන්ට පුළුවන් ලේඛකයන් දැන් මෙන් බහුල නොවූයේ, පණ්ඩිතයන් පුරාණ සිංහල ගද්‍යය නොතකා පද්‍යය පමණක් සැලකූ නිසා විය යුතු ය. ගද්‍ය භාෂාව කාලානුරූප ව හැඩ ගැසීමට, අනෙක් නොයෙක් කරුණුත් සමඟ පුරාණ පද්‍ය ග්‍රන්ථයන් සංස්කරණයෙන්

මුද්‍රණයෙන් සුලභ කිරීම ද අනුබලයක් වී ය. මෙකල අමුතු භාෂා විලාසයන් හා රීතීන් ස්වෝත්සාහයෙන් හැඩගසා ගැනීමට වෑයම් කරන ග්‍රන්ථ කාරයන්, අමාවතුර ය, සද්ධර්ම රත්නාවලිය ය, බුත්සරණ ය, ථූපවංශය යන ආදී පුරාතන ගද්‍යයන්ගෙන් ලත් පෝෂණය ඔවුන්ගේ පොතපතින් ම හැඳින ගත හැකි ය.

සිංහල ගද්‍ය ග්‍රන්ථයන් වස්තු විසින් හා රචනා විලාසයෙන් ගතානුගතික වුව ද, ශ්‍රේෂ්ඨත්වයෙහි ගැණෙන කිහිපයක් නවතායෙන් කියවිය හැකි ය. අමාවතුර, බුත්සරණ, සද්ධර්ම රත්නාවලිය යන මේ වාසගම් පොත් තුන වූ කලී ගතානුගතික සිංහල ග්‍රන්ථ කාරයන් අතුරෙන් තිදෙනකුගේ පිරිමිකම් හා කල්පනා ශක්තිය හෙළි කරන කෘතීහු ය යි සිතමි. කිව යුත්ත කොටින් ද, ව්‍යක්ත ලෙසින් ද, සිත් කා වදින පරිදි ද කීමට ගුරුළුගෝමීහු, පාලි භාෂාව අනුව ගොස් තමන්ගේ ම ගතිගුණවලට හා සිතීම්වලටත් අනුකූල, හදවතට වඩා බුද්ධියට ප්‍රිය වූ, කාන්තිමත් භාෂා විලාසයක් තිපදවූහ. ඇනුම් පද කීමෙහි සමත් ගුරුළුගෝමීහු, පොත පත උගැන්මෙන් ලත් දැනුමෙන් රහල් හිමියන්ට දෙවැනි වුව ද, බුද්ධි මහිමයෙන් ඔවුන් ද ඉක්මවූහ. ගුරුළුගෝමීන්ගේ භාෂාව, ඔවුන්ගේ කල්පනා ශක්තිය මැඩගෙන නැඟුණ බුද්ධියට රුචි වූ පරිදි විකසිත වූවක් බව, අමාවතුරෙහි නොයෙක් තැන දක්නා ලැබෙන වර්ණයන්ගේ අනුසාරයෙන් නිශ්චය කළ හැකි ය.

''පෙර උපාලි මහ සිටි, නිගණ්ඨනාථ පුත්‍රයා එන කල දුර ම දැක, පෙර මඟට ගොස් අත වටාගෙන ගෙට ඇරැ, හැමයට උතුම් අස්නෙහි උතුරු සළුයෙන් පිසපියා එම උතුරු සළුව බඩ වටා ඕමින්, 'ආචාර්ය, සෙමෙන් හිඳුව, සෙමෙන් හිඳුව' යෙමින් මහත් තෙල් කළක් බහා තබන්නක්හු සේ දොහො අතින් ගෙන බහා හිඳුවයි. හේ දැන් හැමයට උතුම් අස්නේ තෙමේ හිඳ, 'හිඳැටි වුව තිලී බැස සිඳුව'යි කී යැ.'' උපාලි මහ සිටුහුගේ ද නිගණ්ඨනාථ පුත්‍රයාගේ ද මුහුණුවර හා හැඩහුරු කම් පවා කියවන්නහුගේ සිතට නඟන පරිදි ලියවුණ මේ වර්ණනයෙන් ඔවුන් දෙදෙනාගේ ගතිගුණ ද හඟවමින්, එකකු පරිහාසයටත් ලක් කරනුයේ කොතරම් සියුම් විධියකින් ද? ගුරුළුගෝමීන් සොම්නස් සිනාවෙන් සැහැල්ලු වූ ද දයානුකම්පාවෙන් බර වූ ද සිතින් නො ව, කලකිරුණකුගේ බුද්ධියෙන් හා වේෂයෙන් ලෝකය දෙස බැලූවකු බව, අමාවතුරට වස්තු පිණිස බමුණන් ද නිවටුන් ද කුල ගර්වයෙන් දැපුණුවුන් ද උපහාසයට ලක් කරන කතා පුවත් තෝරා ගෙන, මහත් වූ අභිරුචියෙන් ඒ කතා පුවත් වර්ණනය කළ සැටියෙන් ම හෙළි වෙයි. උපහාසාලාප හා විශාලාර්ථ ගැප් කොට ඇති කෙටි කියුම් ද කීමට වර ලැබෙනුයේ බුද්ධියෙන් සියුම් වුණු කවිත්වය ඇත්තන්ට ය. ගුරුළුගෝමීන් පාලිය සිංහලයට නැඟුවකු වුව ද ඔවුන්ගේ අපූර්ව භාෂා විලාසය, වර්ණනා ක්‍රමය, ඔවුන් උපහාසයට දැක්වූ අභිරුචිය යන මේ තුන, ඔවුන්ගේ කවිත්වයට ද උත්පාදක ශක්තියට ද දෙස් කියයි.

ඇඳ පැලඳ සැරසුණ ඇතැම් රුවැති කාන්තාවකගේ ඇඳුමෙහි නොසැලකිල්ලෙන් හෝ ඉක්මන්කමින් හෝ ලිහිල්ව ගිය රෙදි පොටක්, රැළි - බුරුලක්, සමහර විට විනීතයකුගේ සියුම් නෙත් සඟළට අසු වන්නාක් මෙන් සිංහල ගද්‍යයෙහි ද නො සැලකිල්ලෙන්, වෙහෙසීමෙන්, ඉක්මන්කමින්, මැළිකමින් ලියවුණ පදයක්, වැකියක් හෝ වැනුමක්, විචාරකයකුට හසු වෙයි. ඒ වැනි ඇද පලුදු පමණක් නො ව, ඔප මට්ටම් නො කළ තැන් ද අනෙක් සිංහල ග්‍රන්ථයන්ගෙන් සොයා ගත හැකි වුවත් අමාවතුරෙන් සොයාගැනීම දුෂ්කර ය යි හැඟේ. තමාගේ ඇඳුමෙහි, පැලඳුමෙහි, රැළි - බුරුලක්, ඇද - කුදයක් නොතබා නිවැරදි ලෙස ම ඇඳ පැලඳ ගන්නා විනීත කාන්තාවක මෙන් ගුරුළුගෝමීන් ද, මුල සිට අග දක්වා අමාවතුර භාෂාව පරිසමාප්ත ස්වරූපයෙන් ම නිර්මල කොට නිම කළහ යි හැඟේ.

බුත්සරණ, ගතානුගතික සිංහල ගද්‍ය ග්‍රන්ථාවලියෙන් වෙන් කොට සැලකීමට තුඩු දෙන අංග දෙකක් එහි ඇතැ යි මට වැටහේ. ආචීර්ණකල්පික කවි සමය අනුව ගිය නමුදු විද්‍යාචක්‍රවර්තීන්ගේ වර්ණනා ක්‍රමය වූ කලී ඔවුන්ගේ සාඩම්බර කල්පනා ශක්තියට දෙස් දෙන්නකි. ඔවුන්ගේ වර්ණනා ක්‍රමය මෙන් භාෂාව ද බුදුන් වහන්සේ නිසා උපන් බොළඳ ගුණයෙන් යුතු අවංක භක්ති ප්‍රේමයට අනුගුණ ව විකසිත වූයේ, භක්ති රසයෙන් අනූන වී ය. රැයෙහි, වලාකුළින් තොර වූ අහසෙහි බැබැළෙන පුන් සඳ මඬළ දැකීමෙන් හටගත් විස්මයෙන් මූඪ ව දෙඩවූ දරුවකු මෙන් විද්‍යාචක්‍රවර්තීහු ද බුදුන් වහන්සේ කෙරෙහි පැහැදීමෙන් ළෙහි හටගත් විස්මයෙන් බැඳී දෙඩවූහ. ඒ දෙඩවීම; තමන්ගේ පාණ්ඩිත්‍යය සිහි කිරීමට නතර වූ කල නීරස වූවාක් මෙන් ම, පාණ්ඩිත්‍යය අමතක කොට දෙඩවූ තැන වඩාත් රස වත් වී ය. බුත්සරණයෙහි, ඒ දෙවිධියට ම නිදසුන් කළ හැකි වර්ණනා බහුල බැවිනැ යි සිතමි, ඇතැම් විට, එය පහත් ගද්‍ය ග්‍රන්ථයක් ලෙසත් තවත් විටක උසස් ග්‍රන්ථයක් ලෙසත් සැලකීමට මට අනුබල ලැබෙනුයේ, නාලාගිරි දමන වර්ණනය රසවත් වනුයේ, කෝපයෙන් ඇවිසුණු ප්‍රචණ්ඩ නාලාගිරිහුගේ ස්වරූපය බුදුන් වහන්සේගේ ශාන්ත ස්වරූපයට ප්‍රතිවිරුද්ධ කොට දැක්වූ සැටියෙනැ යි සිතිය යුතු වුව ද, එය විද්‍යාචක්‍රවර්තීන් තතනා කළ උත්පාදනයක් නොව, ඔවුන් අතින් නොදැන නිතැතින් වූ උත්පාදනයකි. ඔවුන් තතනා කළ ඇතැම් වර්ණනයක් මගේ සිතට නඟනුයේ, ඔවුන්ගේ කවිත්වය පිළිබඳ හැඟීමක් නො වැ, කැමරාව ඉදිරියට එළඹෙන පිණිස, පෙට්ටගමෙන් ගත් නන් පැහැයෙන් බැබළෙන සළු - පිළි හැඳ පොරවා, අතට හසු වන තරම් ස්වර්ණාභරණයෙන් අත් පා සරහාගෙන ගෙයින් එළියට බසින, ගර්වයෙන් දැපුණ ස්ත්‍රියකගේ ස්වරූපය යි.

මා මේ නිබන්ධය කරනුයේ, මෙහි මුලින් සඳහන් වුණු ග්‍රන්ථයන්ගෙන් තුන් වැන්න වන සද්ධර්ම රත්නාවලිය කියවීමෙහි දී මා තුළ පහළ වූ හැඟීම් මඳක් කියනු පිණිස ය. අමාවතුර හා බුත්සරණ ලෙව් ලැකියට වඩා කව් ලැකියෙන් නොහොත් ග්‍රන්ථාන්තරයෙන් ලත් පෝෂණයෙන් ගර්විත වූ කවිත්වය කියන පොත් දෙකක් වුව ද, සද්ධර්ම රත්නාවලිය කව් ලැකියට වඩා ලෙව් ලැකියෙන් ලත් පෝෂණයෙන් වැඩුණු නිහතමාන සිංහල කවිත්වය කියන්නකි. ගුරුළුගෝමීන් පොත් අතරට බැස, එහි කියූ දෙය ම සිහි කරමින් ජීවත් වූවකු බැවින්, ඔවුන්ගේ පොත් කියවන විට අපට දැනෙනුයේ ජීවනයෙහි සුවඳට වඩා පුස් කොළ පොත්වල සුවඳ ය. සද්ධර්ම රත්නාවලිකාර ධර්මසේන ස්ථවිරයෝ, ගැමියන් අතරට බැස ඔවුන් හා එක් ව දොඩමින්, සිනාසෙමින් දිවි පෙවෙත, හිසින් ගත් බරක් මෙන් නො ව, හිස සරසනාවක් මෙන් සලකමින් ජීවත් වූ ප්‍රිය වාදියෙකි. උන් වහන්සේ වීදගම හිමියන් මෙන් කුමන නැටුම් කෙළි කවට සිනා දා' යන උවදෙස සිහි කරමින් විසුවකු නොව, තමන් කරා පැමිණි උපාසකයන් හා ගැමියන් සමඟ ද කෙළි කවට තෙපුල් තෙපලීමෙන් සන්තෝෂයෙන් විසූවෙක් ය යි සිතීමට අනුබල දෙන්නේ සද්ධර්ම රත්නාවලියයි. සද්ධර්ම රත්නානාවලියෙහි සුලභ ඇතැම් කියුම් එවැන්නකුගේ කටින් මිස, මනුෂ්‍යාත්ම භාවයෙහි දුර්ගුණ ද, සසර දුක් ද නිතර මෙනෙහි කිරීමෙන් කලකිරී කිපුණකුගේ කටින් නම් ගිලිහිය හැකි නොවේ. රත්නාවලිය කියවන විට මට දැනෙනුයේ පුස් කොළ පොත්වල සුවඳ නොව, ජීවනයෙහි, විශේෂයෙන් සිංහල ගැමියන්ගේ ජීවනයෙහි, සුවඳ යි.

ඇතැම් පද්‍ය කාව්‍යයන් කළ පැරණියන්ගේ වගතුග ටිකක් සමහර විට, ජන කථාවෙන් දත හැකි වුව ද ගද්‍ය කාව්‍යයන් කළවුන්ගේ වගතුග ඒ මගිනුදු නොදත හැකි ය. ග්‍රන්ථයක් හරි හැටි තේරුම්ගැනීමට ද, අගය කිරීමට ද, ග්‍රන්ථ කාරයාගේ වගතුග, ඔහුගේ කාලයෙහි සමාජ තත්ත්වය, ඔහුගේ පරිසරය යන මේ කරුණු උපකාර වෙයි. අනෙක් පැරණි ග්‍රන්ථයන්ගෙන් ලත් පෝෂණයෙන් රචිත ග්‍රන්ථයක වුව ද ඇතුළු වනුයේ, ග්‍රන්ථ කාරයාගේ සිතුම් පැතුම් හා ආශා ද රුචි අරුචි කම් ද අනුව අඩු වැඩි වශයෙන් සකස් වුණු වස්තු සම්භාරයකි. ග්‍රන්ථ කාරයකුගේ චරිතය ය, පරපුර ය, ආගම ය, ඔහුගේ ඔහු අවට සිටි අනෙක් ජනයාගේ සිරිත් විරිත් ය, යන ආදිය හා ඔහු කෙරෙහි පැතිරවූ බලය අනුව ඔහුගේ සිතුම් පැතුම් හා කියුම් ද වෙනස් වන බැවිනි, ග්‍රන්ථයක් අගය කිරීමට ඒ ග්‍රන්ථ කාරයාගේ වගතුග ද උපකාර වෙති යි කීයේ.

පුරාණ ග්‍රන්ථ කාරයන්ගේ වගතුග කියන, ඔවුන්ගේ චරිත කථා අපට ලැබී නැතත්, ඔවුන්ගේ සිතුම් පැතුම් හා ගතිගුණ ද, ඔවුන්ගේ කාලයෙහි වූ සිරිත් විරිත් ද පිළිබඳ තොරතුරු ඔවුන්ගේ පොතපතින් ම අනුමානයෙන් දත හැකි ය. 'ලෙඛකස්‍ය යද් රූපම් චිත්‍රෙ භවති තද් රූපම්' [ලේඛකයා හට යම් රූපයක් වේ නම් ඒ රූපය චිත්‍රයෙහි ද වෙයි.] යන පැරණියකුගේ අගනා කීම වඩාත් ගැළපෙනුයේ කවීන්ගේ රචනාවන් පිළිබඳ වූ තැනට යයි හැඟේ. එසේ නම් සද්ධර්ම රත්නාවලිකාරයන්ගේ ස්වරූප, ඔවුන්ගේ පොතින් ම අවුලාගත හැකි තොරතුරු අනුව සලකාගන්නට වෑයම් කොට බලමු. මා සද්ධර්ම රත්නාවලිකාරයන්ගේ ස්වරූප දක්වනුයේ, ඔවුන්ගේ පොත කියවන කල මගේ සිතට නැඟෙන මතිමාත්‍ර අනුව බැවින්, එය ඇතැම් විට, සද්ධර්ම රත්නාවලිය කියවන අනෙකකුගේ සිතට නැඟෙන ස්වරූපයට වෙනස් විය හැකි ය. අපේ ග්‍රන්ථකාරයන් පිළිබඳ තොරතුරු අපට ලැබී නැති බැවින්, ඔවුන් ගැන යට කියවුණ අයුරින් වුව ද නිපදවන ලද තොරතුරු සුලභ කිරීම, නොමැනවැයි නොසිතමි.

'ධර්මසේන ස්ථවිරයන් නගරයෙහි නො ව, පිටිසර ඉපිද පිටිසරයන් අතර ම ඇති දැඩි වූ පිටිසරයෙකු විය යුතු ය.' යනු සද්ධර්ම රත්නාවලිය කියවන කල මා තුළ ඇති වන හැඟීමකි. පුරාතනයෙහි, නගරය හා පිටිසර හා අතර, මෙකල දන්නා ලැබෙන වෙනස නොවූව ද ධර්මසේන ස්ථවිරයන් පිටිසර ඉපිද පිටිසරයන් අතර ඇති දැඩි වූවකු පමණක් නොව, ඔවුන් අගය කළ, ඔවුන්ට ඇලුම් කළ, ඔවුන්ගේ ව්‍යවහාරයෙන් පෝෂණය ලත් කවිත්වය ඇත්තකු වූ හයි මම සිතමි. මෙකල පිටිසර තතු එකල නගරයෙහි වූ නමුත් පිටිසරින් නගරය වෙන් කළ ලක්ෂණ එකල ද වී ය. නගරයෙහි වූ එබඳු විශේෂ ලක්ෂණ පිළිබඳ තොරතුරු, අපේ පද්‍ය කවීන්ගේ ද අනෙක් සියලු ම ගද්‍ය කවීන්ගේ ද රචනයන්හි දක්නා ලැබෙතත්, සද්ධර්ම රත්නාවලියෙහි එතරම් සුලභ නොවේ. අනෙක් සිංහල ගද්‍ය ග්‍රන්ථයන්හි මෙන් පද්‍ය ග්‍රන්ථයන්හි ද සිංහල ගැමියන්ගේ දිවි පෙවෙත පිළිබඳ තොරතුරු දුර්වල වනුයේ, ඒ ගද්‍ය පද්‍ය කාව්‍යයන් කළවුන් පොතින් ම පෝෂිත කවිත්වය ඇති නාගරිකයන් වූ නිසා විය යුතු ය. ධර්මසේන ස්ථවිරයන්ගේ වාග්විලාසය, ඔවුන් පොතින් ලත් උගැන්මට වඩා පිටිසරයන්ගේ දිවි පෙවෙතින් ලත් උගැන්ම, ඔවුන්ගේ සිත තරයේ අල්ලාගැනීමෙහි ප්‍රතිඵලයකි.

ධර්මසේන ස්ථවිරයන්, ගුරුළුගෝමීන් වැනි සූක්ෂ්ම බුද්ධියෙන් යුක්ත තාර්කිකයකු නොව ලෝකයෙහි ජඩ පක්ෂය වුව උපේක්ෂාවෙන් ද, හොඳ පැත්ත සිනාවෙන් හා විනෝදයෙන් ද සැලකූ සෙම් වැඩි තරබාරු දේහයකින් යුතු වෘද්ධතර බහුශ්‍රැතයකු වූහ යි මම සිතමි. බමුණන්ගේ කපටිකම් ද, කූට තර්ක ද, අනුවණ සිරිත් ද, ලෝකයෙහි ජඩ පක්ෂය හැඳින්වෙන සලකුණු මෙන් ගත් විචාරකයකු වූ ගුරුළුගෝමීන්, පිත් වැඩියන්ට හිමි සිහින් කයක් ද, උකුස්සකුගේ මෙන් තියුණු නෙත් සඟළක් ද, වඩා පුළුල් නොවූත් පටු නොවූත් නළල් තලයක් ද ඇතිව සිටියකු විය යුතු ය යනු අමාවතුර කියවන කල මගේ සිතට නැඟෙන හැඟීමකි.

ධර්මසේන ස්ථවිරයන් ග්‍රන්ථ ඥානයෙන් නොව ජීවනයෙහි දුක සැප දැකීමෙන්, ඇසීමෙන් හා වහා වටහා ගැනීමෙන් ලත් ප්‍රත්‍යක්ෂ ඥානයෙන් පැසුණු බුද්ධිය ඇත්තකු විය යුතු ය. ලෝකය, සැඟවීගත් සර්පයන් බහුල පරණලයෙන් හා පැළෑටියෙන් වැසුණු වත්තක් මෙන් සලකාගෙන, සැකයෙන් හා බියෙන් ඉඟි කරුව එහි පා තබන්නන් මෙන් ජීවිත යාත්‍රාව කරන බුද්ධිමතුන්ට කළ සරදම් ලෙස ගත හැකි කියුම් හා ප්‍රස්තාව පිරුළු ද සද්ධර්ම රත්නාවලියෙහි සුලභ ය.

බුදුන් වහන්සේගේ පියවර සලකුණු බැලූ මාගන්දි, සූක්ෂ්ම බුද්ධියෙන් දුටු අර්ථයක් හෙළි කරන්නී, ''මෙය ගෑනුන්ගේ තන නැමැති මස් ගඩුවෙහි තමන්ගේ ළය පහරවා අපවිත්‍ර කරන කෙනෙකු එබූ පියවරෙක් නොවෙයි.'' කී ය. බැමිණිය, තම ග්‍රන්ථ ඥානයෙන් සුනිශිත බුද්ධියෙන් දුටු අර්ථය විහිළුවක් මෙන් සලකමින් ව්‍යවහාරෝචිත ඥානය ම අගය කළ බමුණා, ''හෙම්බල බැමිණිය, තෝ තලියේ පැනෙහි කිඹුලුන් දක්නා එකක වැන්නෙහි ය; ගෙ මැද සැඟවී වසන සොරුන් දක්නා එකක ද වැන්නෙහි ය''යි කළ සරදම පාලියෙන් ගත්තක් නමුදු, ලෝකය නයින් වැසි තුඹසක් වැන්නැ යි සලකමින් මනුෂ්‍යයන්ට ද්වේෂ කරන බුද්ධිමතුන්ට එල්ල කරන ලද ඇනුම් පදයක් වැන්න. බුදුන්ට වෛර බැඳගත් මාගන්දිය හෝ ඇයගේ මව්පියන් හෝ කෙරෙහි හටගත් ද්වේෂයකින් තොර ව, පහන් සිතින් ම, ඔවුන් කළ කී දේ සිනා වැකිවලට නඟන ධර්මසේන ස්ථවිරයෝ, ලෝකය තමන්ගේ සිතැඟි පරිදි සකස් කිරීමට සිතුවකු නොව, තමන්ට ලැබෙන සැටියෙන් ගෙන, එයින් හැකි පමණ හොඳක් ද ප්‍රීතියක් ද උකහා ගැනීමට සිතූ ප්‍රිය වාදියෙකි.

ධර්මසේන ස්ථවිරයන් කවි සමයට වඩා ලෝක ව්‍යවහාරය අගය කළ ග්‍රන්ථ කාරයකු බව කියන සලකුණු සද්ධර්ම රත්නාවලියෙහි හැම පිටුවකින්ම ලැබිය හැකි ය. ඔවුන්ගේ භාෂාව, ග්‍රන්ථ ඥානයෙන් සුනිශිත බුද්ධිය ඇති පඬිවරයන් ප්‍රිය නොකළ ගැමියන්ගේ වදනින් ද ව්‍යවහාරයෙන් ද පෝෂිත වීමෙන් අපූර්ව ස්වෛරීත්වයකින් හා රස භාවයකින් ද සිත් අදිනුයේ නිසැකව ම ඔවුන් ගමෙහි ඉපිද, දිය උරාගන්නා කඩ මාල්ලක් සේ, ගැමියන්ගේ ව්‍යවහාරයෙන් ලැබූ පෝෂණයෙන් වැඩුණු කවිත්වය ඇත්තකු වූ බැවිනි.

ධර්මසේන ස්ථවිරයන් පිටිසර ඉපිද එහිම වැඩුණු හ යි අනුමාන කිරීමට අනුබල දෙන්නේ, පණ්ඩිත ප්‍රිය භාෂාව ය, කවි සමයෙහි සම්භාවිත උපමා ය, ලෝක ව්‍යවහාරය ය, ගැමියන්ගේ බස ය යන මෙහි සංකලනයෙන් තැනුණ, ඔවුන්ගේ භාෂා විලාසය හා රචනා විලාසය ද පමණක් නොවේ. බුදු දහම හා සසුන ද නැවත නැවතත් ගොයමට සම කරමින් ගොවිතැන පිළිබඳ වූ තමන්ගේ ප්‍රියතම ඥානය හෙළි කරන කියුම් සද්ධර්ම රත්නාවලියෙහි දක්නා ලැබීම ද, ඔවුන් පිටිසර ඉපිද එහි ම වැඩුණ, ගැමියන් හා ඔවුන්ගේ කම් අගය කළ, බහුශ්‍රැතයකු වූ හ යි සිතීමට අනුබල දෙයි. සද්ධර්ම රත්නාවලියෙන් ගෙන පහත දැක්වෙන විවරණය, ගොවිතැන පිළිබඳ තොරතුරු ප්‍රියතම ඥානය කොට ගත්තෙකු හැර අනෙකෙක් කරයි ද?

''පළමු කොට කුඹුරු ගෙවඩිය යුතු ය; ඉක්බිති බිම් නැඟිය යුතු ය; පසු ව දෙසී සෑව යුතු ය; මියර කෙටිය යුතු ය; තුන් සීසාන්ට යුතු ය; කැට තළා පෝරු ගෑ යුතු ය; කලල්ලම් කට යුතු ය; ඉස්සන් තෙමිය යුතුය; දිය බැන්ද යුතු ය; ගොයම් රෝගයට කෙම් කළ යුතු ය; ගොයම් පැසී ගිය කලට ද මැඬ වී අටුකොටුවල ලිය යුතු ය; පෙරළා හිපිනැලි සෑව යුතු ය; වල් පොළ කෙටිය යුතු ය; දවා හෙළි කට යුතු ය; වපුළ යුතු ය; මාස් සමයක් මෙලෙසම කට යුතු ය.'' මේ ගොවිකම් විවරණය කෙළවර වනුයේ "සසර කෙළවර නොපෙනෙන්නා සේ මේ කර්මාන්තයෙහිත් කෙළවරක් නොපෙනෙයි; යනුවෙනි.

චක්ඛුපාල වස්තු වර්ණනයෙහි දී ධර්මසේන ස්ථවිරයන් කුඹුරට බසින්ගේ මෙසේ යː ''අපගේ සදහම් නැමැති අමා ගඟ තමාගේ කන් නැමැති පීලි තබාගෙන සදහම් නැමැති දිය ගෙන ගොසින් සිත් නැමැති කුඹුරු තෙමා ගෙන සැදැහැ නැමැති බිජුවට වපුටගෙන ලොවී ලොව්තුරු සැපත් නැමැති වී මීරිකා ගන්ට අවසරත් පාමි හ.'' නැවත නැවතත් තමන්ගේ බස සැරසීමට ගොයමට බසින සද්ධර්ම රත්නාවලි කාරයන් මිත්‍ර දෙනමකගේ වස්තුවෙහි කරන වර්ණනයක් ද මෙහි දක්වීම පාඨකයන් වෙහෙසීමක් නොවෙති යි සිතමි.

''යම් සේ ඇස නොවන යහපත් බිජුවට තෙමේ මනා වී නමුත් සරු කෙත වපුරන ලද්දේ වැසි දිය ලත් නම් අසු පැවත යහපත් ද එමෙන් බුදු සසුන් නැමැති සරු කෙත සිල් නැමැති බිජුවට වපුට භාවනා නැමැති ඇළවලින් මාර්ග නැමැති දිය පෑ අර්හත් ඵල නැමැති වී ලබනු නිසා වීර්ය නැමැති කර්මාන්ත කොට, යම් සේ සී සකස් කුඹුරෙහි වපුළ බිජුවට වපුළවුන් සතුටු කරවා උදවු කොට ම පීද පැසේ ද, එමෙන් වීර්ය කර්මාන්තයේ සකස් නිසා කෙලෙස් කුඩු මැටි නැංග නොදී බුදු සසුන් කෙතින් රහත් ඵල නැමැති වී මීරිකා සිත් සතන් ගැළෙහි පුරා ගත් සේක.''

සංස්කෘත හා පාලි කාව්‍යයන්ගෙන් පෝෂණය ලත් අනෙක් සිංහල ග්‍රන්ථ කාරයන් සිය රටත්, සිය රට ජනයාත් සිය ඇටියන්ගේ ජන්ම උරුමයත් නොතකා නිපදවූ ව්‍යාජ ශිෂ්ට සම්ප්‍රදායට විරුද්ධත්වය ප්‍රකාශ කිරීමක් වශයෙන් ධර්මසේන ස්ථවිරයන් වහන්සේ ගම්බද ජනයාගේ ජීවනය ද බස ද ප්‍රස්තාව පිරුළු ද අභිරුචියෙන් ගෙන තමන්ගේ රචනා විලාසය හා භාෂා විලාසය නිපද වූ හ යි සිතිය හැකි සලකුණු සද්ධර්ම රත්නාවලියෙහි දක්නා ලැබේ.

සද්ධර්ම රත්නාවලියෙහි වස්තුවට ඔබින බසින් වර්ණනා කරන ලද මට්ටකුණ්ඩලී කථාවෙහි, 'පය

බරවායට පිටිකර බෙහෙත් බඳිනා සේ'', ඇස් සරහන්ට තොල අඳුන් ගානා සේ,'' 'ආඳා යවා තබාලා වල් පත ගත්තා සේ' යන ගැමියන්ගේ ප්‍රස්තාව පිරුළු, ස්ථානෝචිත බැවින් භාෂාවෙහිත් කතාවෙහිත් රසවත් භාවය දියුණු කරයි. 'කන්නට එන බල්ලන් අසුරු ගසා සාද කරවන්නා සේ,'' 'මුසුප්පුව පියා බත් කන තැන බලා හිඳන් උළක් නොලත් බල්ලකු පරිද්දෙන්,'' දඬයම් බලු මුළක් රැස්ව වැද හිඳ තලා සපා බත් කන්නා සේ,' නිවටෝ ද ඒ දැක බලු මුළක් බුරා වන්නා සේ එක විට ම සිටාණන්ට දොඩා වැද ගියාහු,' 'උඹ . . . බල්ලන් ලවාලා හුරන් ලුහු බඳවන්නා සේ තුමූ නොපෙනී අඹුවන් ලවාලා දොඩවා බණවා නෙරිති' යන ආදිය ලෝක ව්‍යවහාරයෙන් ගෙන තිසි තැන යෙදීම නිසා, ගෝනුසු වලග තුඩු මෙන් උපහාස විෂ පෙවූ ඇනුම් පදවලට හැරෙයි. 'මෙලොව නාසා කොට්ටු පර ලොවත් නාසා කොට්ටු වෙති,' 'කළ මිඩියක පැන් කළය ගෙයි තබා පියා බඩ දළ දැඩි හෙයින් වහවහා වළන් මුල්ල සමනාපියන්ට යන ගමනක් සේ' යනු ගැමියන්ගේ කතා බහ හා ගතිගුණ පිරික්සූ ධර්මසේන ස්ථවිරයන්ගේ සිතට අනායාසයෙන් නැගුණ සිනා වැකි විය යුතු ය.

ථූල තිස්ස වස්තුව ධර්මසේන ස්ථවිරයන්ගේ භාෂා විලාසය නිසා වඩාත් රසවත් වෙයි; සිත් ඇද ගනියි. ථූල තිස්ස ස්ථවිරයන්ගේ මෙන් ඔවුන්ගේ හැඩහුරු කම් ද මුහුණුවර ද කියවන්නවුන්ගේ සිතට වහා නැගෙන සේ එම කථා වස්තුව වර්ණනය කර තිබෙන අයුරු කොතරම් මනෝඥ ද? ථූල තිස්ස ස්ථවිරයන් බුදුන්ට ලැබෙන මියුරු දන් බතින් මහත් කළ කයක් ඇති ව, බුදුන්ට නෑකම් කියමින් කුසීත ව, අහංකාර ව, ඇනුම් පදයට හා පරිහාසයට ලක් වෙමින් විසූ නුවණ මඳ කෙනකු වූ සැටි සද්ධර්ම රත්නවලියෙහි වර්ණනා වනුයේ මෙසේ ය.

''ථූල තිස්ස තෙරුන් වහන්සේ නම් ශුද්ධෝදන රජ්ජුරුවන්ගේ නැගණි කෙනකුගේ පුතණුවන් වහන්සේ ය. ඔබ වැළිත් ගොයම් කළ මනා වක තබා පියා කල් පසු කොට කරන ගොයමක් සේ පිළිවෙත් පිරීමට යෝග්‍ය වූ බාල අවස්ථාවෙහි ගිහි ගෙයි ම රඳා වැඩි මාලු කල මහණව රූක්ෂ ප්‍රතිපත්ති නැමැති රළු පරළු දෙය හැර, බුදුන්ට උපන් මියුරු ආහාර සුව සේ වළඳා පිළිවෙතින් සීන් වුවත් මසින් ලෙයින් මහත්ව, ඉසත් බඩත් මහත් සෙයින්, ථූල තිස්ස තෙරුන් වහන්සේ ය යි ප්‍රසිද්ධව, මට සිලුටු වූ සීන් සිවුරු වැලඳ පියා, ආඪ්‍ය තරම් හඟවනු නිසා විහාර මධ්‍යයෙහි බොහෝ තැන් රැස් වන හෙයින් උස්ව තිබෙන හස්නකට නැඟී පියා බොහෝ සේ හිඳිනා සේක. බුදුන් දක්නට යන එන වහන්දෑ බුඩ්ඪ පබ්බජිත තෙරුන් වහන්සේ දැක, වැඩි මාලු කල මහණ වූ නියාව නොදැන මහ තෙර කෙනකුත් වහන්සේ වනැ යි සිතා ළඟට ගොසින් කළ මනා වත් පිළිවෙතුන් විචාරන සේක; එසේ විචාළ කලට බසක් කියාලුවොත් බාල නියාව කියාලන ව්‍යවහාර ලෙසින් හැගෙති බැණ නොනැගෙන සේක.''

දරුමාල්ලන් ගෙදර දී ඔවුනොවුන් හා කථා කරන සුරතල් බසට සම වන බසින් ථූල තිස්ස තෙරුන්ගේ චරිතය මෙන් ඔවුන්ගේ ශරීර විලාසය ද දක්වමින් කරන ලද යට සඳහන් වර්ණනය කියවන කාගේ වුව ද කට කොනට සිනාවක් නැගෙන අතර, තමා දැක පුරුදු වර්තමාන ථූල තිස්ස තෙරවරුන් ද මතක් වන බව කිව මනා නොවේ.

එක් හෙරණ නමක් ථූල තිස්ස තෙරුන් වහන්සේ කෝප කරවන්නේ මෙ ලෙසිනි.

''හැයි, නොහික්මුණු මාල්ලණුවෙනි! වයසින් වැඩි මාලු වුවත් පැවිද්දෙන් තමන් බාල නියාව නොදන්නා නියා ද? වැඩි මහලු වහන්දෑ දුටු කල බිම් හස්නෙක හුනත් නැඟී සිටිනා ආකාර දක්වා අවසර ලදින් හුන මනා තැන, සසර බැඳ රඳවන්නට හිඳවාලු කණුවක් සේ නැඟී නොසිට හිඳින්නේත් හැයි ද? විචාළ දෙයට බැණ නොනැගෙන්නට යුක්තියකුත් මේ බුදු සස්නෙහි ඇද්ද? උසින් මහතින් මහත් බව මුත් කටයුත්තෙහි මහත් නොවන්නට කාරණා කීම් ද?.''

හෙරණ නමගේ මේ ඇනුම් පද අසා කිපුණු ථූල තිස්ස තෙරුන් වහන්සේ කුලය නිසා අභිමානයක් උපදවා, අනෙක් භික්ෂූන් අමතා, 'තමන් හැම යන්නේ කවුරුන් ළඟටදැ'යි විචාරා, 'බුදුන් ළඟට ය, යි කී කල්හි'-

''එසේ කල තමන් හැම මාගේ තරම් නොදන්ට කාරණා කීම් ද? මම තමන් හැම දෙනාගේ බුදුන්ට අවශ්‍යයෙමි. තමන්ගේ බුදුන්ගේ පිය රජ්ජුරුවෝත් අපගේ මෑණියෝත් දෙබින්නෝ ය. අපගේ තරම් නොදන තමන් හැම අපට දෙඩූ සැටියට බුදුන්ගේ නෑ කම් සැබෑ වී නම් අද කියටි කියවමි'' යි තර්ජන කොට නියං සමයේ හඬන ආසක් මෙන් ගර්ජනා කොටගෙන, හඬමින් වලපමින් බුදුන් කරා ගිය සේක.'

තරහයෙන් පිපිරෙමින් සිටිය ද, බුදුන් තුළ දයානුකම්පාවක් උපදවන අදහසින් බොරු හැඬුමක් හඬාගෙන ගිය ථූල තිස්ස ස්ථවිරයන්ගේ විලාසය, 'නියං සමයේ හඬන ආසක් මෙන්' යි යන කියුම නිසා විවිධාකාරයෙන් පාඨකයාගේ සිතට නැගෙයි. තරහයෙන් කළ ගිගුරුම ද, කඳුළු නැති බොරු හැඬුම ද, සුදුසු තැන සුදුසු අවස්ථාවෙහි යෙදුණු යට කියන ලද පිරුළ නිසා, පිටු ගණනකින් වර්ණනය කොටත් නොකොට හැකි තරම් විවිධ ලෙස වර්ණිත ය.

පාලියෙන් කථා වස්තු සිංහලයට නැගූ අනෙක් සියලුම ග්‍රන්ථ කාරයන්ට වඩා ධර්මසේන ස්ථවිරයෝ කථා කීමෙහි දක්ෂයෙකි. ඔවුන් හැම කථාවක් ම කීයේ, දරුමාල්ලන් ගෙදර දී ඔවුනොවුන් හා සාද කථා කරන බසට අනුගුණ ව හැඩ ගැසූ අපූරු බසින්, පාඨකයන් හා සාද කථාවක් කරන්නාක් මෙනි. සිනාවට ලක්

කළ යුත්තන් සිනාවෙන් ද, ද්වේෂයෙන් තොර වූ, ඇනුම් පදයෙන් සැරසූ බසින් ද, දයාවටත්, අනුකම්පාවටත්, ජීවිත පරිඥානය නිසා ලබන නුවණටත් ගොදුරු විය යුතු චරිත, ඔවුහු පරිහාසයෙන් හා කෙළිකවට සිනාවෙන් තොර වූ, පාඨකයන්ගේ සිත් කලකිරවන ශෝකාකුල ගුර්වර්ථ භාෂාවෙන් ද කී හ. අප යට විවේචනය කළ මාගන්දි හා ථූල තිස්ස තෙරුන් පිළිබඳ වස්තු ද රත්නාවලියෙහි නිවටුන්ගේ වත් ද කියූ සැටි, පටාචාරා වහන්දැගේ වස්තුවෙහි රචනා විලාසය හා උපයුක්ත භාෂාව ද සමඟ සැසඳීමෙන් ඒ බව වටහාගත හැකි ය.

පටාචාරාවන්ගේ කථාව, මනුෂ්‍ය ජීවනයෙහි සුන්දරත්වය මෙන් භයංකරත්වය ද, නිෂ්ඵලත්වය මෙන් කුල ධර්මයන්ගේ ගතානුගතික දුෂ්ටත්වය ද, ඇසිල්ලකින් හටගත් සිතිවිල්ලකින් මෙහෙයනු ලැබීමෙන් හරිශ්චන්ද්‍ර රජතුමාට වධ කරවූ දෙවියන් හා සමාන අසාධාරණ කර්ම බලයකින් පීඩා ලබන මනුෂ්‍යාත්ම භාවයෙහි අනාථ භාවය ද මෙනෙහි කරවන ජීවප්‍රවාහයෙන් ගත් ජීව බින්දුවක් වැන්න.

'ධර්මසේන ස්ථවිරයන්ගේ කවිත්වය හා වර්ණනා ශක්තිය බෙහෙවින් පිබිදෙනුයේ, ගැමියන් ද ඔවුන්ගේ දිවි පෙවෙත ද ඔවුන්ගේ ව්‍යවහාරයන් ද පිළිබඳ අවස්ථාවන්හි දී ය' යන මතයට පටාචාරාවතින් වඩාත් නිදසුන් ලැබෙයි.

ගෙයි දාසයකුට පෙම් බැඳි පටාචාරාවෝ. දෙමව්පියන් නියම කළ කුලවත් සිටු පුත්‍රයා සමඟ සරණ යනු නොකැමැති වූවහු, කලින් කරගත් කතාබහ අනුව ඒ දසයා සමඟ සැඟවී ගිය හ. ''සිටු දියණියෝ ද දෙවන දවස් කිලුටු අදහස් සේම කිලුටු කඩ රෙද්දක් කොයින් දෝ සොය හැඳගෙන මිඩියන්ගේ ලෙස ලීල් කොට හිසකේ බැඳගෙන රැ දෙවරු වී පැරියා සේ ඇඟ මුළුල්ල ධූලි ගාගෙන කළයක් හැරගෙන පැනට යන කෙල්ලක මෙන් කෙල්ලන් හා එක් ව ගෙන් පිටත් ව මිඩී වෙස් ගත් ලෙසට කොල්ලා සිටි තැනට ගිය හ. ඒ කොලු ද ක්‍රියාවෙන් කුමක් වුව ද ජාතීන් හා සම්පත්තීන් උතුම් තරම් අති සිටු දියණියන් රෙදි කඩකින් වසා ලූ මැණිකක් පරිද්දෙන් කැඳවාගෙන දුරට ගොසින් එක් ගමෙක රඳා හිඳ අයට අඳයට සී සාගෙන වප් වපුටගෙන දර පළා ගෙනවුත් ජීවත් වෙයි. සිටු දියණියෝ ද, "කුස රජ ව උපන් බෝසතුන් පභාවතීන් නිසා නිකෘෂ්ට ලෙසින් හැසිරුණ නියාවට, හුදක් පිරිමිහු ම ගෑනුන් නිසා නිකෘෂ්ට ලෙස ඇවිදුනෝ නොවෙති; ගෑනුත් පිරිමින් නිසා නිකෘෂ්ට ලෙසින් හැසිරෙති, යන්න හඟවන්නාක් මෙන් කළයෙන් පැන් ගෙනවුත් තබමින් සිය අතින්ම පරමන් පිසමන් ආදිය කෙරෙමින් . . . අකුසලයෙහි අනිෂ්ට විපාකය, වී බත් කමින් සිට හමු බත් කන්නා සේ, අනුභව කරන්නට පටන් ගත් හ.''

මෙය පටාචාරාවන් කොල්ලා සමඟ සැඟවී ගිය සැටි ද, අනතුරුව ඔවුන් දෙදෙනා ඔවුනොවුන් කෙරෙහි බැඳී, දුක ද සැපයක් කොටගෙන ජීවත් වූ සැටි ද විස්තර කළ පරිදියි. 'කිලුටු අදහස් සේ ම කිලුටු කඩ රෙද්දක් හැඳගෙන' යන කියමන එතැනට කොතරම් උචිත ද? එයටත් වඩා අගනා කියුමක් සේ හැඟෙන්නේ, 'ඒ කොලු ද ක්‍රියාවෙන් කුමක් වුවත් ජාතීන් හා සම්පත්තීන් උතුම් තරම් ඇති සිටු දියණියන් රෙදි කඩකින් වසා ලූ මැණිකක් පරිද්දෙන් කැඳවාගෙන දුරට ගොසින් ...ජීවත් වෙති' යන්නෙහි එන 'ඒ කොලු ද සිටු දියණියන් රෙදි කඩකින් වසා ලූ මැණිකක් පරිද්දෙන් කැඳවාගෙන දුරට ගොසින්' යන කීමයි. පිටුවකිනුදු නොකළ හැකි අලංකාර වර්ණනයක් ගර්භ කොට ඇති, තැනට සුදුසු මේ කියුම වූ කලී ක්ෂුද්‍ර කාව්‍යයක් මෙන් රසවත් ය.

දෙවන වර සැමියා නොගිවිස්නා කල පටාචාරාවෝ, 'පළමු උපන් කුමාරයා අතින් අල්ලාගෙනැ පෙර සේ ම නෑයන්ගේ ගෙට නික්මුණාහ''යි බුත්සරණෙහි පටාචාරාවන්ගේ වත වර්ණනය කරන විද්‍යාචක්‍රවර්තීන් කී නමුත් ධර්මසේන ස්ථවිරයන්ගේ වර්ණනය කරන මෙසේ ය. 'උපන් දරුවන් පයින් යන්නට දුබල හෙයින් උනුත් වඩාගෙන බඩ දරුවනුත් බඩින් ගෙන නික්මුණා හ.' අතර මඟ දී විළි වේදනායෙන් පහරනු ලැබූ පටාචාරාවන් හඳුන්වන ධර්මසේන ස්ථවිරයන්, ව්‍යාජ කවිත්වය බෙහෙවින් අගය කළ ශිෂ්ටත්වය නොසැලකූ බව, ඔවුන්ගේ මේ වර්ණනයෙන් පෙනේ. ''එවේලාවට ගසන විදුලියෙන් හා මේඝ නාදයෙන් වස්නා වැස්සෙන් ආකාශය අතුරු සිදුරු නැති විය. එවේලාවට ම පිට හෙළා විදුලිය ගසන්නා සේ විළිත් පහරනට වන. අහස ගුගුරන්නා සේ හඬ ගසන්නටත් වන. වස්නා වැසි බෝවා සේ ම ප්‍රසව දුකුත් බෝ විය. සමුණන් බණවාලා, 'විළිත් පහරනට වන; ශීත පීඩා බලවත් හෙයින් ඇල් වැදපියා විළිත් ලාගත නොහෙමි; නොතෙමී වදාපියන තැනක් ඉදිකරව'යි කිවු ය. උයිත් දණ්ඩක් පතක් කපාගන්නට නිසි යකඩයක් හැරගෙන දඬු පත් බලා ඇවිදිනෝ, තුඹසක් පිට සිටි කැලයක් දැක දණ්ඩක් පතක් කපන්නට වන්හ. කපන සොල්මනට තුඹසින් නයෙක් අවුත් ලා දඬු කපන තැනැත්තවු කාපී ය. එවේලෙහි ම, මරාලූ ගසෙක වැද ගත් ගින්නක් මෙන්, දෂ්ට මුඛයෙන් පටන් ගින්න නැඟීලා, ලේ ගුණය නැති වලා, ගත නිල්ව ගොසින්, මිය වැටි ගියෝ ය."

ධර්මසේන ස්ථවිරයන්ගේ වූ කලි, පොතින් ම පෝෂණය ලත් කවිත්වයක් නොව, ජීවනය නමැති තක්සලාවෙන් ලත් පසක් නුවණින් පෝෂිත අව්‍යාජ කවිත්වයකි. සිංහල කවීන් අතුරෙන් ලෝකය පිළිබඳ අපූරු දැනුමකින් කාව්‍ය රචනා කෙළේ රහල් හිමියන් වුව ද, ධර්මසේන ස්ථවිරයෝ ද එකල සිංහල ජනයාගේ දිවි පෙවෙත දැකීමෙන් හා ඇසීමෙන් ද ලත් පරිඥානය ඇත්තෙක් වූහ. ලෝක ව්‍යවහාරය නොදන්, නොතකා

ව්‍යාජ වර්ණනයෙන් තමන්ගේ පද්‍යය හා ගද්‍යය ද සැරසූ බොහෝ සිංහල ග්‍රන්ථ කාරයන් කළ අනුචිත සාධු සංවාදයන්, සද්ධර්ම රත්නාවලියෙහි එතරම් සුලභ නොවනුයේ, ධර්මසේන ස්ථවිරයන්ගේ වෘද්ධ ඥානය නිසාය යි සිතමි.

පටාචාරාවන් තමන්ගේ ගෙයි වැසි කොල්ලකුට පෙම් බැඳීම කියූ විගස විද්‍යාචක්‍රවර්තීන් ඒ කථා වස්තුවටවත්, පටාචාරාවන්ගේ චරිතයටවත්, බුදුන් පටාචාරාවන්ට දැක්වූ දයානුකම්පාවටත් නොගැළපෙන සාධු සංවාදයක් කරන්නේ මෙසේ යඃ 'සිංහධෙනුව කැනහිලුන් හා සංවාස කරත්. බෝධි සත්වයන්ට අඹුව වැ කොටුන් ඉසින් උසුලත්. කොසොල් රජ්ජුරුවන් වැනි කෙනකුන් හැරැ බල්ලන් හා සංවාසය කරත්. ගැනුන්ගේ නුගුණ කවුරු කියා නිමවා ගනිත් ද?' විද්‍යාචක්‍රවර්තීන්ගේ අපරිණත බුද්ධියට හා සුලභ කවිත්වයට මේ නිදසුනකි.

ධර්මසේන ස්ථවිරයන්, පටාචාරාවන්ගේ කථාව කියද්දී ලෙව් ලැකියට බසින කල, විද්‍යාචක්‍රවර්තීන් කව් ලැකියට බැස්ස සැටි සද්ධර්ම රත්නාවලියෙන් ගෙන යට දැක්වුණු වර්ණනයත් සමඟ, බුත්සරණෙහි එන පටාචාරාවන්ගේ රූ සපුව කියන සුලභ වර්ණනය සසඳා බැලීමෙන් දත හැකි ය. ''සැවැත් නුවරැ සතළිස් කෙළක් ධන ඇති සිටුහුගේ පටාචාරා නම් එක් දුවක් ඇත. ඕ තොමෝ සඳමඬුලු වැනි මුහුණ ඇත්තී ය, දික් වූ ඇස් ඇත්තී ය, කොඳ කැකුළු වැනි දත් ඇත්තී ය, රන්වන් වූ ශරීර ඇත්තී ය, මනාව වට වූ පයෝධර ඇත්තීය යනාදීන් වර්ණනා කරතහොත් කියා ගෙවාගත නොහැකි රූ ඇත්තී ය. අලුත් යෞවන ඇත්තී ය. මහත් වූ ඓශ්වර්ය ඇත්තී ය.''

උපදිනුයේ නිතැතිනි; සාදනුයේ නිතැතිනි. වර්ණනයක් කරනු රිසි වූ ධර්මසේන ස්ථවිරයන් තමන් දන්නා ගැමි ජීවිතය සිහි කරත් ම, 'පිපෙන්ට මෝරා තුබූ පියුමක් හිරු රැස් ගැසීලා වහා පිපෙන්නා සේ' තැනට තිසි වර්ණනය ඔවුන්ගේ සිත්හි විකාසනය වූ නමුදු, බෙහෙවින් කවි සමය හිමි කළ විද්‍යාක්‍රවර්තීන්ට, නොඑක් විට තැතනීමෙන් ව්‍යාජ වර්ණනයන් කරන්නට සිදු වී ය. නිතැතින් සිතට නඟින සිතිවිලි වුව ද වඩාත් හොඳින් නිර්මල කොට කිව හැක්කේ තෝරාගන්නා පදයන් තැතින් ගැළපීමෙනි. ධර්මසේන ස්ථවිරයන් ඒ කාරිය සඳහා නම් එතරම් වෙහෙසුණු සැටියක් නොපෙනේ.

''ලේඛකයා හට යම් රූපයක් වේ නම්, ඒ රූපය චිත්‍රයෙහි ද වෙයි.'' (ලෙඛකස්‍ය යද්රූපම් චිත්‍රෙ භවති තද්රූපම්) යන අගනා කියුම කවීන්ගේ රචනයන් සම්බන්ධයෙන් වඩාත් ගැළපේ. ලේඛකයකු අවංකව තම ජීවනය ගැන ලියූ නිබන්ධයකින් වුව ද, උත්පාදිත වස්තුවක් හෝ ප්‍රඛ්‍යාත වස්තුවක් හෝ මුල් කොට ගෙන ලියූ ප්‍රබන්ධයකින් වුව ද හෙළි කරනුයේ තමාගේ රුචි අරුචිකම්, නොපටු කල්පනා හා පටු කල්පනා, හද තුළ සැඟවුණු දුෂ්ටත්වය, දයානුකම්පාව, ඊර්ෂ්‍යාව හා ක්‍රෝධය ආදි ඔහුගේ චරිතය පිළිබඳ සලකුණු ය. එහෙයින් යම් ගද්‍ය ග්‍රන්ථයකින් හෝ පද්‍ය ග්‍රන්ථයකින් හෝ පාඨකයන්ට පොදුවේ ලැබෙන විනෝදය හැර, වන වැඩ අවැඩ විනිශ්චය කිරීමෙහිදී අවසානයෙහි සැලකිය යුතු වනුයේ ග්‍රන්ථ කාරයාගේ සිතෙහි තතු ය. දයානුකම්පාවෙන් තොර වූ ක්‍රෑර මනස් ඇත්තකු හෝ මනුෂ්‍යයන් ගැන පුළුල් දැනුමක් නැත්තකු හෝ කළ, අගනා ධර්මෝපදේශයන් ඇතුළත් කථා ප්‍රබන්ධය වුව ද, ඒ උවදෙස් මෙන්, ඔහුගේ හද තුළ සැඟවුණු යට කියන ලද ගුණාගුණ ද ඉතා සියුම් විධියෙන් පාඨකයන්ගේ සිත්හි ප්‍රක්ෂේප කරයි. රෝගයක් සුව කිරීමට පොවන බෙහෙතෙහි ඇතුළත් ද්‍රව්‍යයන්හි සිඟිති කොට ලූ වස ද ඇති විය හැකි ය. සිඟිත්ත නිසා වස ඇතුළු වීමේ විපාක නොදැනුණ ද, ඇතැම් විට එය මඳක් වැඩි වීමෙන් ද, ඇබිත්තෙන් ඇබිත්ත එක් වීමෙන් ද, රෝගියා හට පසක් කර ගත හැකි සේ ප්‍රකට වෙයි. ධර්මය, අර්ථය ය, කාමය ය, මෝක්ෂය ය, යන සතර සම්පත් අත් කොට දෙනු පිණිස කළ ප්‍රබන්ධය වුව ද ඇතැම් විට, පාඨකයාගේ දුෂ්ට කම් ද කුරිරු කම් ද ඊර්ෂ්‍යා ක්‍රෝධ ද වඩයි. ඊයම් අකුරු නිතර අත පත ගෑම නිසා ඇබිත්තෙන් ඇබිත්ත ඊයම් ශරීරයට ඇතුළු වී එකතු වීම, අකුරු අමුණන්නන්ට පෙණහැල්ලේ රෝග හටගන්වන හේතුවකැ යි කියති. පොත් පත් මඟින්, ඒ පොත් පත් කරන්නන්ගේ සිත්හි සැඟවී ඇති ඊර්ෂ්‍යා ක්‍රෝධ හා කුරිරු ගති ටිකින් ටික පාඨකයන්ගේ සිත් තුළ ගන්වන්නේ ද ඇබිත්තෙන් ඇබිත්ත ය. කෙලෙස් තැවීමෙන් නිර්මල වූ සිත්සතන් ඇති අපරිමිත දයානුකම්පාවෙන් යුත් උසස් ශාස්තෘන් දෙසූ සැටියෙන් නොවෙනස් ව ලැබෙන, ඔවුන්ගේ ධර්ම කථා නිර්මල සාහිත්‍ය රත්නයෝ ය. කවීන් හා ග්‍රන්ථ කාරයන් ද තමන්ගේ අඩු වැඩි ප්‍රතිභා ශක්තීන් හා ගුණ නුවණ ද අනුව වක්‍රෝක්තීන්ට හැරවූ ධර්ම කථා ප්‍රබන්ධයන්, විචාර කලාව අනුව පරීක්ෂා කිරීම ධර්ම ගෞරවය පිණිස ම වන බැවින්, එබඳු විචාර විධි නැති නම් අප විසින් නිපදවිය යුතු ය.

සද්ධර්ම රත්නාවලියෙහි පටාචාරා වස්තුව කියවූ ඉක්බිති බුත්සරණයෙහි එම වස්තුව කියවූ මා තුළ හටගත් හැඟීම් මෙහි දක්වනුයේ යට කියවුණු තර්කයට නිදසුන් වශයෙනි. විද්‍යාචක්‍රවර්තීන් කල්පනා ශක්තියෙන් හා සාහිත්‍ය කලා විඥානයෙන් ධර්මසේන ස්ථවිරයන්ට වැඩි කෙනෙකු වුව ද, ප්‍රතිභා ශක්තියෙන් හා මනුෂ්‍ය ජීවිතය පිළිබඳ දැනුමෙන් නම් ධර්මසේන ස්ථවිරයන්ට බෙහෙවින් හීනයෙකි. 'මම (සාහිත්‍ය) කලා කාරයෙක්මි' යන හැඟීමෙන් ගර්විත වූ විද්‍යාචක්‍රවර්තීන් තැතනීමෙන් කළ වර්ණනයන්ගේ භාෂාව, පරිසමාප්ත ස්වරූපයෙන් නිම කිරීමට වෑයම් කළ නමුත් ධර්මසේන ස්ථවිරයන් එවැනි තැතක් කළ සැටි නොව නොකළ සැටි කියන සලකුණු නම් සද්ධර්ම රත්නාවලියෙහි දක්නා ලැබේ. ගුරුළුගෝමීන් හා විද්‍යාචක්‍රවර්තීන් මෙන්

තමන්ගේ භාෂාව පරිසමාප්ත ස්වරූපයෙන් නිම කිරීමට තැතක් කරන ලද නම්, ධර්මසේන ස්ථවිරයන්ගේ සද්ධර්ම රත්නාවලිය අග්‍ර ගණ්‍ය සිංහල ගද්‍ය කාව්‍යය වෙයි. ධර්මසේන ස්ථවිරයන්ගේ නිහතමාන කවිත්වය, සද්ධර්ම රත්නාවලි භාෂාව මීට වඩා උසස් ස්වරූපයෙන් නිම කිරීමට ඔවුන්ට රුකුල් නොදෙන ලදැ යි සිතීමට ග්‍රන්ථාරම්භයෙහි එන 'ශාස්ත්‍ර දන්නුවන්ගේ ජාති අඩු වූවත් උන්ගේ තරම් නොසලකා, ශාස්ත්‍ර පමණක් සලකා ශාස්ත්‍ර උගන්නුවන් මෙන් . . . සද්ධර්ම රත්නාවලී නැමැති බෙහෙදින් මෝහ නැමැති පටලය නැති කොට, නුවණැස අඳුරු හැර, කුසල් මහවතට බැස නිවන් පුරයට සුවයෙන් යා යුතු' ය යන කියුම අනුබල දෙයි. බුත්සරණෙහි සමහර වර්ණනාවලින් ප්‍රකාශ වන්නේ ලෝකය නොහඳුනන, ප්‍රතිභා ශක්තියෙන් ඉතා හීන, නොපැසුණ කවිත්වයකි. සෙළුව, හඬමින් වලපමින් එන පටාචාරාවන් දුටු මිනිස්සු 'ඈ වියරු හිණියකැ යි කසළින් පසින් හිස ගසා, කැට කැබිලිති බහලා මරන්නට වන්හ' යි විද්‍යාචක්‍රවර්තීන් කී නමුදු ධර්මසේන ස්ථවිරයෝ මෙසේ කී හ. 'මිනිස්සු උන් දක සසර නොසලකා වියරු හුණු එකකැ යි කියාගෙන කසළත් පසුත් හැරගෙන හිස ඕනෝ කැබිලිති බාලා ගසති.'

පටාචාරාවන්ගේ විපත ඔවුන්ගේ දොසට වඩා සසරෙහි දොස් නිසා ය යි මෙනෙහි කිරීමෙන් ධර්මසේන ස්ථවිරයන් ඔවුන්ට අනුකම්පාව දක්වූයේ, තමන් ප්‍රතිභානය හා පැසුණු බුද්ධිය ඇත්තකු නිසා විය යුතු ය. බුදුන් නිසා ළෙහි හටගත් අපූර්ව භක්ත්‍යාදරය, ඇතැම් විට, විද්‍යාචක්‍රවර්තීන් ද ඉතා රමණීය කියුම් කීමට මෙහෙයූ බව පෙනේ. පටාචාරාවන්ට එන්ට නොදෙව යි කියනු ඇසූ බුදුහු "කිරි ඉල්ලා හඬාගෙනැ සෙලු වැ දිවන දුවක දුටු මවක සේ සිතා, "ඈ ඉය දෙව, නොවළකව" යි වදාළ සේක'' යන වර්ණනය, විද්‍යාචක්‍රවර්තීන් බුත්සරණෙහි ඇතැම් තැන්හි කළ දීර්ඝ වර්ණනයන්ගෙන් නොදක්විය හැකි වූ බුදුන්ගේ අපරිමිත දයානුකම්පාදි ගුණ සුකුමාර මතීන්ගේ දෙනෙතට කඳුළු නඟන තරම් විවිධ කොට දක්වයි.

වික්‍රමසිංහ, මාර්ටින්, **විචාර ලිපි**, නාවල, 2013, 1-17 පි.

ඇමුණුම 02 - පූජාවලිය කෘතියට රාජ්‍ය ගෞරව දක්වූ ආකාරය

''එකල උභය කුල පරිශුද්ධව පැවති ගණවැයි කුලෙහි අවිනෂ්ට වූ **මහාපණ්ඩිත වංශ** ඇති **වාතගිරි පර්වතයෙහි** එම රජුගේ ආරාධනාවෙන් සිවුපස දානය ලදින් වාසය කළා වූ **මහනෙත් පා මූල සුමඞ්ගල** මහා ස්ථවිරයන්ගේ සහෝදර වූ ඔවුන්ගෙන් ම කිසියම් දහම් නයක් දැනගත්තා වූ **මයුරපාද පරිවේණාධිපති බුද්ධපුත්‍ර** ස්ථවිරයන් විසින් **නව අරහාදි බුදුගුණයෙහි පළමු වන අර්හත් ගුණය** ගෙන සූතිස් පරිච්ඡේදයෙකින් හා සූවිසි දහසක් පමණ ග්‍රන්ථ සංඛ්‍යාවෙකින් හා සයානූ බණවරෙකින් හා සත් ලක්ෂ අට සැටදහසක් පමණ අක්ෂර සංඛ්‍යාවෙකින් හා අසංඛ්‍ය ගණන් පූජා නයින් උපලක්ෂිත වූ **මේ පූජාවලී නම් ධර්ම ව්‍යාඛ්‍යාන කථාව** මේ රජහට තිස්වන්නෙහි උපදවා "අප බුදුහු එක අස්නේ වැඩ හිඳ නානා ලෝකධාතුයෙහි සත්ත්වයන්ට බණ වදාරන්නාහ. ඔහුගේ පුත්‍රවංශයෙහි ජාත වූ හෙයින් අප දු අපගේ වෙහෙර ම හිඳ අප රජු හා ශ්‍රී ලංකාද්වීපවාසී සත්ත්වයන්ට අනුශාසනා කොට බුදුන්ට උතුම් වූ ප්‍රතිපත්ති පූජා කරම් හ" යි සිතා එම **දේවප්‍රතිරාජ නම්** අමාත්‍යයාණන් අතට දී යවන ලද.

එ කල **රජ පා මේ පූජාවලිය** දැක දෙවන රජයක් ලදුවා සේ උදාර වූ සන්තෝෂයෙන් පිනා දෙ පෝයක් මුළුල්ලෙහි අනික් රාජ්‍ය ක්‍රියාවෙක නො යෙදී සිත් එකඟ ව අසා බුදුන්ගේ අපරිමිත වූ ගුණයෙහි පැහැද රාජ්‍යය පුදා පියන තරම් උදාර වූ සන්තොෂයෙන් යෙදී පොත ලක්දිව නො එක් ප්‍රඥාවන්ත ජනයන්ට පැ **බිසොවු ලවා මඟලැතු පිට තබා සේසත්** හා සමඟ නුවර නො එක් පූජායෙන් උත්සව කරවා, බොහෝ කලක් ඇසු ඇසූ ශ්‍රද්ධාවන්තයන් මෙහි ආදර කරන සේ, බුදුන් ගේ ද තමන් ගේ ද මේ කීර්ති ශරීරය ස්ථාවර කොට නො එක් සත්කාර කළහ.''

ඤාණවිමල හිමි, කිරිඇල්ලේ, **පූජාවලිය**, 1997, 805 පි.

# 15. බැද්දේගම (නවකතාව) - රස වින්දනය හා විචාරය
## (6 - 10 පරිච්ඡේද)

**නිපුණතාව :** 3.0 නවකතා සාහිත්‍යාංගයේ ලක්ෂණ හා මූලිකාංග පිළිබඳ අවබෝධයෙන් යුක්ත ව නවකතා රස විඳිමින් විචාරයට ලක් කරයි.

**නිපුණතා මට්ටම :** 3.3 නවකතාංග කෙරෙහි අවධානයෙන් යුතු ව නිර්දිෂ්ට නවකතාව රස විඳිමින් විචාරයට ලක් කරයි.

**කාලච්ඡේද :** 08 යි

**ඉගැනුම් පල :**
- නිර්දිෂ්ට නවකතාවේ ඇතුළත් නවකතාංග හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට නවකතාවේ කලාත්මක ලක්ෂණ පැහැදිලි කරයි.
- නිර්දිෂ්ට නවකතාවෙන් හෙළි වන සමාජ පසුබිම පැහැදිලි කරයි.
- බැද්දේගම නවකතාව රස විඳිමින් විචාරයට ලක් කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**I පෙර සූදානම :**
- බැද්දේගම නවකතාවේ 6 - 10 පරිච්ඡේද කියවා එහි පසුබිම, චරිත නිරූපණය හා භාෂා ප්‍රයෝග පිළිබඳ අධ්‍යයනය කරන ලෙස ශිෂ්‍යයන්ට දන්වන්න.
- පරිශීලනීය ග්‍රන්ථ කියවා නවකතා විචාර සංකල්ප පිළිබඳ අවබෝධයක් ලබා ගන්න.
- අදාළ කොටසේ අවස්ථා හා සිද්ධි ගොනු කර ගන්න.

**II ඉගැනුම සංවර්ධනය :**
- පහත සඳහන් ආකාරයේ සුදුසු ප්‍රවේශයකින් පාඩමට පිවිසෙන්න.

උදා:- * බැද්දේගම නවකතාවේ අදාළ පරිච්ඡේදවල පසුබිම සාකච්ඡා කිරීමෙන්
* බැද්දේගම නවකතාව පිළිබඳ ලියැවුණු විචාරයක් කියැවීමෙන්
* අහඹු ලෙස තෝරා ගත් ශිෂ්‍යයකුට නවකතාවේ 6 - 10 පරිච්ඡේදවල කතා සාරාංශය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීමෙන්
* බැද්දේගම නවකතාවේ පෙර පරිච්ඡේදවල විශේෂ අවස්ථාවක්/සිද්ධියක් සිහිපත් කිරීමෙන්

- අදාළ කොටසෙහි කතා සාරය පිළිබඳ වත් එහි අවස්ථා හා සිද්ධි පිළිබඳ වත් ශිෂ්‍යයන් සමඟ සාකච්ඡාවක නිරත වන්න. එහි දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.
  * සිද්ධි හා අවස්ථා
  * චාරිත්‍ර විධි
  * වනගත දිවි පෙවෙත
  * ඇදහිලි විශ්වාස
  * සංවාද සහ ආඛ්‍යාන
  * කලාත්මක ලක්ෂණ (භාෂා භාවිතය, ආකෘතිය හා ප්‍රතිනිර්මාණය)
  * යථාර්ථවාදී බව
  * අවස්ථා, සිද්ධි හා චරිත නිරූපණය

- බැද්දේගම නවකතාවේ අදාළ පරිච්ඡේදවලින් හෙළි වන සමාජ පසුබිම තව දුරටත් සාකච්ඡා කරන්න.
- සොබාදහමේ බලවේග සහ සමාජ බලවේග අතර දෝලනය වන මිනිසුන්ගේ ජීවිත පිළිබඳ සාකච්ඡා කරන්න.
- සමාලෝචනයක යෙදෙන්න.

**III තක්සේරුව හා ඇගයීම**

- ශිෂ්‍යයන්ගේ දැනුම හා අවබෝධය තහවුරු කිරීම සඳහා සුදුසු පැවරුම් ලබා දී තක්සේරුවක නිරත වන්න.

උදා:- * බැද්දේගම නවකතාවේ භාෂා භාවිතයේ සුවිශේෂතා ඇගයීමට ලක් කරන්න.
* බැද්දේගම නවකතාවේ අවස්ථා හා සිද්ධි නිරූපණයේ සූක්ෂ්ම බව අගයන්න.
* බැද්දේගම නවකතාවේ සමාජ විවරණය විමර්ශනයට ලක් කරන්න.
* බැද්දේගම නවකතාවේ චරිත නිරූපණය පිළිබඳ විචාරාත්මක ඇගයීමක නිරත වන්න.

**ගුණාත්මක යෙදවුම් :**

* බැද්දේගම නවකතාව පිළිබඳ ලියැවී ඇති විචාර පොතපත
* ලෙනාඩ් වුල්ෆ් විසින් රචිත වෙනත් පොත පත

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක :**

- බැද්දේගම නවකතාවේ අවස්ථා, සිද්ධි විස්තර කරයි.
- බැද්දේගම නවකතාවේ කතා සාරය ඉදිරිපත් කරයි.
- අදාළ කොටසේ නිරූපිත මානව චර්යා උපුටා දක්වයි.
- එහි චරිත ක්‍රියා කරන ආකාරය පැහැදිලි කරයි.
- බැද්දේගම නවකතාවේ 6 - 10 පරිච්ඡේද රසවිඳිමින් විචාරයට ලක් කරයි.
- බැද්දේගම නවකතාව පිළිබඳ ලියැවුණු වෙනත් පොත පත කියවීමට පෙලඹෙයි.

**පරිශීලනීය ග්‍රන්ථ :**


- අල්විස්, ප්‍රේමචන්ද්‍ර - ලක්බිමේ සත්වසක්
- ඒකනායක, ධර්මසිරි - සාහිත්‍යය හා කලාව
- වික්‍රමසූරිය, සරච්චන්ද්‍ර - නවකතා විවරණය
- සුරවීර, ඒ. වී. - නවකතා නිර්මාණ හා අවබෝධය
- Wolf , Lenard - Diaries in Ceylon

ඇමුණුම 1

<u>සිද්ධි හා අවස්ථා</u>

- පුංචිමැණිකා හා බබුන් වෙන ම නිවසක පදිංචි වීම
- පුංචිරාළ හා හින්නිහාමි අතර සිදුවීම
- සිලිඳු අසරණ වීම
- කර්ලිනාහාමි දේව පිහිට පැතීම
- හින්නිහාමි පුන්චිරාළගේ ග්‍රහණයට නතු වීම
- හින්නිහාමි හා ඇගේ දුව මරණයට පත් වීම

<u>ජීවන ව්‍යවහාර</u>

- පුංචිමැණිකා හා බබුන් අතර කුටුම්බ ජීවිතය
- පුංචිරාළ හින්නිහාමි ග්‍රහණයට ගැනීම

<u>වනගත දිවිපෙවෙත</u>

- සොබාදහමට අවනත ව ජීවත් වීම
- සමාජයට අවනත ව ජීවත් වීම

<u>ඇදහිලි විශ්වාස</u>

- දේව විශ්වාස
- යකුන් පිළිබඳ විශ්වාස
- පෙරහැර චාරිත්‍ර

# 16. කෙටිකතා - රස වින්දනය හා විචාරය

**නිපුණතාව :** 4.0 කෙටිකතා කලාවේ විකාසනය, මූලිකාංග හා විශේෂ ලක්ෂණ හඳුනා ගෙන කෙටිකතා රස විඳිමින් විචාරයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 4.3 කෙටිකතා ලක්ෂණ කෙරෙහි අවධානයෙන් යුතු ව නිර්දිෂ්ට කෙටිකතා රස විඳිමින් විචාරයට ලක් කරයි.

**කාලච්ඡේද :** 14 යි.

**ඉගැනුම් පල :**
- නිර්දිෂ්ට කෙටිකතාවල කතුවරුන්, කාලය හා සාහිත්‍ය පසුබිම හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට කෙටිකතා කියවා තේමාව හා අන්තර්ගතය විස්තර කරයි.
- නිර්දිෂ්ට කෙටිකතාවල කලාත්මක ලක්ෂණ හඳුනා ගෙන පැහැදිලි කරයි.
- කෙටිකතා රස විඳිමින් විචාරයට ලක් කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**I පෙර සූදානම :**

- කෙටිකතා ස්වලක්ෂණ පිළිබඳ නැවත ආවර්ජනය කරන්න.
- පහත සඳහන් කෙටිකතා කියවා හොඳින් අවබෝධ කර ගන්න.
  - * කවියෙකුට අත්දැකීමක් - රංජිත් ධර්මකීර්ති
  - * ගස් - නිශ්ශංක විජේමාන්න
  - * හැත්තෑ ලක්ෂයෙන් එකෙක් - ලියනගේ අමරකීර්ති
  - * නිදහස් උදෑසන - කීර්ති වැලිසරගේ
- කෙටිකතා කියවා රස විඳිමින් විචාරයට ලක් කිරීමට ඉගැනුම් ආධාරක සකසා ගන්න.
- පාඩමට පෙර නියමිත කෙටිකතා කියවාගෙන එන ලෙස ශිෂ්‍යයන්ට දන්වන්න.
- පරිශීලනීය ග්‍රන්ථ කියවා දැනුම යාවත්කාලීන කර ගන්න.
- ඉගැනුම් පල ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය ඉගැනුම් උපකරණ සකසා ගන්න.

**II ඉගැනුම සංවර්ධනය :**

- පහත සඳහන් ආකාරයේ සුදුසු ප්‍රවේශයකින් පාඩමට පිවිසෙන්න.

උදා :-
  - * කෙටිකතා පිළිබඳ ශිෂ්‍යයන්ගේ පෙර දැනුම විමසමින්
  - * කියවූ කෙටිකතාවක් ගැන සිහිපත් කරමින්
  - * ඉහත කෙටිකතා පිළිබඳ ලියැවුණු විචාර ලිපියක් කියවමින්

- ශිෂ්‍යයන් කණ්ඩායම් හතරකට වෙන් කරන්න. කෙටිකතා හතර බෙදා දෙන්න.
- ඉහත සඳහන් මාතෘකා යටතේ කෙටි සටහන් සකස් කර ගැනීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- ඔවුන් සකස් කළ කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- නිර්දිෂ්ට කෙටිකතාවල රස විඳිය හැකි තැන් ඉස්මතු කර දෙන්න.
- විචාරයට ලක් කළ හැකි අවස්ථා පෙන්වා දෙන්න.
- සමාලෝචනයක යෙදී ප්‍රතිපෝෂණ ලබා දෙන්න.

**III තක්සේරුව හා ඇගයීම**

- ඇමුණුම 1හි සඳහන් පැවරුම් පත්‍රිකාව ඇසුරින් කේවල පැවරුමක් ලබා දෙන්න.
- නිර්දිෂ්ට කෙටිකතා රස වින්දනය හා විචාරය සඳහා යොමු කරන්න.
- එක් එක් කෙටිකතාව පිළිබඳ පූර්ණ විවරණයක් ඇතුළත් වන සේ බිත්ති පුවත්පත් කලාපය බැගින් සකස් කිරීමට කණ්ඩායම් පැවරුමක් ලබා දෙන්න.
- එක් කෙටිකතාවක් පිළිබඳ රස වින්දනාත්මක ලිපියක් ලියා පුවත්පතකට, සඟරාවකට යොමු කිරීමට මඟ පෙන්වන්න.

**ගුණාත්මක යෙදවුම්** : ඇමුණුම 01

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක :**

- නිර්දිෂ්ට කෙටිකතාවල සාහිත්‍ය පසුබිම විස්තර කරයි.
- නිර්දිෂ්ට කෙටිකතාවල අන්තර්ගතය පිළිබඳ කරුණු පැහැදිලි කරයි.
- කෙටිකතා රස වින්දනයේ හා විචාරයේ යෙදෙයි.

**පරිශීලනීය ග්‍රන්ථ :**

- ධර්මකීර්ති, රංජිත් - කෙටිකතා නිර්මාණය අවබෝධය හා මූලධර්ම
- සුරවීර, ඒ. වී. - කෙටිකතාවේ විකාසනය සහ සිංහල කෙටිකතාව
- සුරවීර, ඒ. වී. - බවතිමිර
- වික්‍රමසිංහ, මාර්ටින් - වහල්ලු

ඇමුණුම 01

**පැවරුම් පත්‍රිකාව**

| කතුවරයා | කෙටිකතාව | තේමාව | අන්තර්ගතය | චරිත | ආඛ්‍යාන රීතිය |
|---|---|---|---|---|---|
| | | | | | |

# 17. කාරක භේදය (ක්‍රියාකාරක පද සම්බන්ධය)

**නිපුණතාව :** 8.0 ව්‍යාකරණ රීති හා භාෂා සම්ප්‍රදාය නිවැරදි ව භාවිත කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 8.2 උක්ත-ආඛ්‍යාත යෝගය පිළිබඳ රීති නිවැරදි ව භාවිත කරමින් වාක්‍ය ලියයි.

**කාලච්ඡේද :** 18 යි.

**ඉගැනුම් පල :**
- කාරක භේදය පිළිබඳ රීති පැහැදිලි කරයි.
- වාක්‍ය රීති නිවැරදි ව භාවිත කිරීමේ වැදගත්කම ප්‍රකාශ කරයි.
- කාරක භේදය නිවැරදි ව හඳුනා ගෙන භාවිත කරයි.
- ලේඛනයේ දී උක්තාඛ්‍යාත පද සම්බන්ධ රීති නිවැරදි ව භාවිත කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**I පෙර සූදානම :**
- වාක්‍යයක් යන්න අර්ථ නිරූපණය කිරීමට අවශ්‍ය තොරතුරු සපයා ගන්න.
- 'අර්ථ සහිත පද, සම්මත රටාවකට අනුව එකතු කිරීමෙන් සෑදෙන වගන්තියක්' වාක්‍යයක් බවත්, එවැනි වාක්‍ය රටා රාශියක් පවතින බවත් අවබෝධ කර ගන්න.
- එකී වාක්‍ය රටා අතර කර්තෘ කාරක, කර්ම කාරක සහ භාව කාරක වාක්‍ය රීතිවලට අදාළ නිදර්ශන සපයා ගන්න. (මේ සඳහා පරිශීලනීය ග්‍රන්ථ යොදා ගන්න.)
- ඒ අතුරින් කර්තෘ කාරක වාක්‍යයක දැකිය හැකි ලක්ෂණ අවධාරණය කර ගන්න.
- මෙම වාක්‍ය රටාවලට අදාළ ව වෙන වෙන ම වාක්‍ය රීති පවතින බව ශිෂ්‍යයන්ට අවබෝධ කරවීමට සුදුසු ඉගෙනුම් උපකරණ සකස් කර ගන්න.

**II ඉගැනුම සංවර්ධනය :**
- සුදුසු ප්‍රවේශයක් යොදා ගනිමින් පාඩමට පිවිසෙන්න.

  *උදා :* * අහඹු ලෙස ලබා දෙන වාක්‍යයක ඇතුළත් රීතිය හඳුනා ගැනීමට සැලැස්වීම
  (බහුල ව ප්‍රදර්ශනය වන දැන්වීම් නිදසුන් ලෙස යොදා ගන්න.)

  * පුවත්පතකින් උපුටා ගත් ශීර්ෂ පාඨ ඇසුරින් කර්ම කාරක වාක්‍ය හඳුන්වා දීම
  (*උදා :* අභිනව විද්‍යාගාරය සිසු අයිතියට පැවරේ . . ., ගුවන් පාලම විවෘත කෙරේ . . රබර් මිල දී ගනු ලැබේ.)

  * පොතක පිටුවක් හෝ පුවත්පත් පිටුවක් හෝ ලබා දී කර්ම කාරක හා කර්තෘ කාරක වාක්‍ය හඳුනා ගැනීමට සැලැස්වීම

- විවිධ වාක්‍ය රීති දැක්වෙන වාක්‍ය කීපයක් ඉදිරිපත් කර ඒවායේ විශේෂ ලක්ෂණ අවධානයට ලක් කරන්න.
- ඒ අතුරින් කර්තෘ කාරක, කර්ම කාරක හා භාව කාරක වාක්‍යවල දක්නට ලැබෙන විශේෂතා වෙන වෙන ම සාකච්ඡා කරන්න. (ඇමුණුම 1 යොදා ගන්න.)
- කාරක තුනෙහි ඇති විශේෂතා වගුගත කිරීමට සලස්වන්න. (ඇමුණුම 2 හා 3 යොදා ගන්න)
- භාෂණයෙහි සහ ලේඛනයෙහි ඇති මෙවැනි වාක්‍ය රීති අධ්‍යයනය කිරීමට යොමු කරවන්න.

**III තක්සේරුව හා ඇගයීම**

- වාක්‍යවල කාරක භේදය පිළිබඳ දැනුම හා අවබෝධය පුළුල් වන ආකාරයේ ඇගැයීම් ලබා දෙන්න.
- අදාළ විෂය කරුණු පිළිබඳ සාධන මට්ටම තක්සේරුවට සුදුසු පැවරුම් ලබා දෙන්න. දැනුම තහවුරු කරන්න.
  * කාරක තුනෙහි පවත්නා විශේෂ ලක්ෂණ
  * කර්තෘ කාරක වාක්‍ය නිර්මාණය කරවීම
  * එම වාක්‍ය කර්ම කාරකයෙන් ලිවීම
  * භාව කාරක වාක්‍ය නිර්මාණය කිරීම
  * ධාතු ප්‍රකෘතියක් කර්තෘ කාරකයේ හා කර්ම කාරකයේ වරනැගීමට සැලැස්වීම - (ඇමුණුම 2 යොදා ගන්න.)
  * මෙම වාක්‍ය රටා ලේඛනයේ හා භාෂණයේ යෙදී ඇති ආකාරය උපුටාගත් ලේඛනවලින් අධ්‍යයනය කිරීම

**ගුණාත්මක යෙදවුම්** : ඇමුණුම 01, 02 හා 03

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක** :

- කර්තෘ කාරක, කර්ම කාරක හා භාව කාරක වාක්‍යවල ඇති විශේෂ ලක්ෂණ වගුගත කරයි.
- කර්තෘ කාරක වාක්‍ය නිර්මාණය කරයි.
- කර්තෘ කාරක වාක්‍ය කර්ම කාරකයට හරවයි.
- භාව කාරක වාක්‍ය නිර්මාණය කරයි.
- උපුටා ගත් ඡේදවල දක්නට ලැබෙන කාරක තුනට අයත් වාක්‍ය සොයා ඉදිරිපත් කරයි.
- කර්තෘ කාරක හා කර්ම කාරක ආඛ්‍යාත සකස් වන ආකාරය දැක්වෙන සටහන් පිළියෙල කරයි.

**පරිශීලනීය ග්‍රන්ථ** :


- අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව - සිංහල ලේඛන ව්‍යවහාරයː උපදේශ සංග්‍රහය
- කරුණාතිලක, ඩබ්ලිව්. එස්. - සිංහල භාෂා ව්‍යාකරණය
- ජාතික අධ්‍යාපන ආයතනය - සිංහල ලේඛන රීතිය (නව සංස්කරණය)
- තේනබදු, පී. - සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය
- බලගල්ලේ, විමල් ජී. - භාෂා අධ්‍යයනය හා සිංහල ව්‍යවහාරය

ඇමුණුම 1

**කර්තෘ කාරක වාක්‍ය**

- වාක්‍යයක ආඛ්‍යාතය හෙවත් අවසාන ක්‍රියාවෙන් එහි කර්තෘ පදය උක්ත වේ නම් එය කර්තෘ කාරක වාක්‍යයකි.
- උක්ත කර්තෘ නිතර ම ප්‍රථමා විභක්තියෙන් යෙදේ.
- ආඛ්‍යාතය කර්තෘ කාරකයෙන් යෙදේ.
- කර්මය අනුක්ත වී කර්ම විභක්තියෙන් යෙදේ.
- කර්මයක් සහිත ව පවතින එවැනි වාක්‍ය සකර්මක වාක්‍ය වේ.
- කර්මයක් රහිත ව පවතින වාක්‍ය අකර්මක වාක්‍ය වේ.
- කර්තෘ කාරක වාක්‍යයේ එන කර්තෘ කාරක ආඛ්‍යාතය උත්තම, මධ්‍යම, ප්‍රථම යන පුරුෂ තුනේ, ඒක වචන හා බහු වචන යන වචනවල අතීත, වර්තමාන, අනාගත යන කාල තුනෙහි වරනැඟිය හැකි ය. (ඇමුණුම 2 බලන්න.)
- නිදසුනක් විග්‍රහ කිරීම -

  ගුරුවරු ශිෂ්‍යයන් ආරක්ෂා කරති.

  මෙහි - <u>ගුරුවරු</u> - උක්ත ය - ප්‍රථමා විභක්තිය ගනී.

  <u>ශිෂ්‍යයන්</u> - කර්මය අනුක්ත ය. කර්ම විභක්තියෙන් යෙදේ.

  <u>ආරක්ෂා කරති</u> - කර්තෘ කාරක ආඛ්‍යාත පදය, ආඛ්‍යාතය හා උක්තය සමාන පුරුෂ, වචන ආදියෙන් යෙදෙයි.
- මෙම වාක්‍යය කර්මයක් සහිත බැවින් සකර්මක වෙයි.

  මල් පිපෙයි - කර්මයක් නැති බැවින් අකර්මක ය.

**කර්ම කාරක වාක්‍ය**

- කර්ම කාරක වාක්‍යයක පහත සඳහන් ලක්ෂණ පවතින බව අධ්‍යයනය කරන්න.
  - * වාක්‍යයක ආඛ්‍යාතයෙන් කර්මය උක්ත වේ නම් ඒවා කර්ම කාරක වාක්‍ය බව
  - * වාක්‍යයේ ආඛ්‍යාතය සකර්මක ධාතුවකින් සකස් විය යුතු බව
  - * කර්මයක් නොමැති වාක්‍ය කර්ම කාරකයට හැරවිය නොහැකි බව
  - * කර්තෘ කාරක වාක්‍යයක් කර්ම කාරකයට හැරවීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු කිහිපයක් පවතින බව
    - කර්තෘ කාරක වාක්‍යයේ ඇති උක්තය අනුක්ත බවට පත් කිරීම
    - එම අනුක්ත කර්තෘ පදයට 'විසින්' යන විභක්ති අර්ථ දෙන නිපාත පදය එකතු කිරීම
    - අනුක්ත ව පැවැති කර්මය උක්ත කිරීම
    - උක්ත කර්මයට අනුව අවසාන ක්‍රියාව තැබීම
    - අවසාන ක්‍රියාව කර්ම කාරක වීම
    - උක්ත - ආඛ්‍යාතයන්හි වචන භේදය, ලිංග භේදය, කාල භේදය, පුරුෂ භේදය ගැන අවධානය යොමු කිරීම
  - * නිදසුනක් විග්‍රහ කිරීම

    ගුරුවරු ශිෂ්‍යයන් ආරක්ෂා කරති. - කර්තෘ කාරක

    ගුරුවරුන් විසින් ශිෂ්‍යයෝ ආරක්ෂා කෙරෙති/කරනු ලබති - කර්ම කාරක
  - * කර්ම කාරක ආඛ්‍යාතයක් ද පුරුෂ, වචන, කාල ආදියෙහි වරනැඟිය හැකි බව (ඇමුණුම අංක 03)

භාව කාරක වාක්‍ය

* භාව කාරක වාක්‍යයක පහත සඳහන් ලක්ෂණ පවතින බව අවධාරණය කරන්න.
  - භාව කාරක වාක්‍යයකින් කිසියම් ක්‍රියා භාවයක් හෝ ක්‍රියා හැඟීමක් දැනවෙන බව
  - ආඛ්‍යාතයෙන් උක්තයක් නොකියවෙන බව
  - ආඛ්‍යාතය ප්‍රථම පුරුෂ ඒක වචනයෙන් පමණක් යෙදෙන බව
  - ලේඛන ව්‍යවහාරයේ දී බහුල ව නොයෙදෙන බව
  - අකර්මක ධාතු පමණක් භාව කාරකයේ යෙදෙන බව

  නිදසුන් : ළමයා හඬයි. - (අකර්මක) කර්තෘ කාරක වාක්‍යය
  ළමයාට හැඬෙයි. - භාව කාරක වාක්‍යය
  ඔහු අසයි (සවන් දෙයි). - (අකර්මක) කර්තෘ කාරක වාක්‍යය
  ඔහුට ඇසෙයි. - භාව කාරක වාක්‍යය

- ඉහත සඳහන් කරුණු අධ්‍යයනය සඳහා ගුණාත්මක යෙදවුම් යටතේ දක්වා ඇති පරිශීලනීය ග්‍රන්ථ උපයෝගි කර ගන්න.

ඇමුණුම 2

'කර' ධාතුව කර්තෘ කාරකයෙහි වරනැඟීම

| | අතීත කාල | | අනතීත කාල | |
|---|---|---|---|---|
| පුරුෂ | ඒක වචන | බහු වචන | ඒක වචන | බහු වචන |
| උත්තම පුරුෂ | කළෙමි | කළෙමු | කරමි | කරමු |
| මධ්‍යම පුරුෂ | කළෙහි | කළෙහු | කරහි | කරහු |
| ප්‍රථම පුරුෂ | කළේ ය/ කළා ය | කළෝ ය /කළහ | කරයි | කරති/කරත් |

ඇමුණුම 3

'කර' ධාතුව කර්ම කාරකයෙහි වරනැඟීම

| | අතීත කාල | | අනතීත කාල | |
|---|---|---|---|---|
| පුරුෂ | ඒක වචන | බහු වචන | ඒක වචන | බහු වචන |
| උත්තම පුරුෂ | කෙරිණිමි/<br>කරන ලදිමි/<br>කරනු ලැබීමි | කෙරුණුමු/<br>කරන ලදුමු/<br>කරනු ලැබූමු | කෙරෙමි/<br>කරනු ලබමි | කෙරෙමු /<br>කරනු ලබමු |
| මධ්‍යම පුරුෂ | කෙරිණිහි/<br>කරන ලදිහි | කෙරුණුහු/<br>කරන ලදුහු | කෙරෙහි/<br>කරනු ලබහි | කෙරෙහු/<br>කරනු ලබහු |
| ප්‍රථම පුරුෂ | *කෙරිණි/<br>කරනු ලැබී ය/<br>කරනු ලැබුවා ය/<br>කරන ලදි | *කෙරුණු/<br>කරනු ලැබූහ/<br>කරන ලදහ | කෙරෙයි/<br>කරනු ලබයි | කෙරෙති/ කෙරෙත්<br>කරනු ලබති/ලබත් |

(* 'කෙරිණි', 'කෙරුණු' යනාදි රූප ප්‍රශස්ත වුවත් වර්තමානයෙහි අභාවිත ය.)

# 18. සාරාංශකරණය

**නිපුණතාව :** 9.0 සංශ්ලේෂණ හා විශ්ලේෂණ පරිචය ප්‍රදර්ශනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 9.2 සංශ්ලේෂණ ශක්‍යතා දක්වමින් සාරාංශකරණයේ යෙදෙයි.

**කාලච්ඡේද :** 05 යි.

**ඉගෙනුම් පල :**
- සාරාංශකරණයේ වැදගත්කම විස්තර කරයි.
- සාරාංශකරණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු පැහැදිලි කරයි.
- ශිල්පීය කුසලතා ප්‍රදර්ශනය කරමින් සාරාංශ ලියයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**I පෙර සූදානම :**
- අතිරේක පරිශීලනීය ග්‍රන්ථවල 'සාරාංශකරණය' පිළිබඳ ලියැවී ඇති ඡේද කියවා දැනුවත් වන්න.
- සාර්ථක ලෙස සාරාංශ කරන ලද ඡේද කිහිපයක් සූදානම් කර ගන්න.

**II ඉගෙනුම සංවර්ධනය :**
- පහත සඳහන් ප්‍රවේශවලින් එකක් තෝරා ගෙන ඒ අනුව පාඩමට පිවිසෙන්න.

  *උදා :* * අහඹු ලෙස තෝරාගත් ශිෂ්‍යයකුට තමා ගිය චාරිකාවක් පිළිබඳ විස්තර කිරීමට ලබා දී ඔහුගේ ප්‍රකාශය චාරිකාව පිළිබඳ සාරාංශයක් බව පැහැදිලි කිරීම

  * අහඹු ලෙස ශිෂ්‍යයකුට පාසල හෝ එවන් ආයතනයක් පිළිබඳ ප්‍රකාශයක් කිරීමට අවස්ථාව ලබා දී එය ද සාරාංශයක් බව පැහැදිලි කිරීම
  * විස්තරාත්මක ප්‍රකාශනයක් හා සාරාංශ කරන ලද ප්‍රකාශනයක් පන්තියට ඉදිරිපත් කිරීම
- සාරාංශකරණය පිළිබඳ 12 ශ්‍රේණියේ දී උගත් කරුණු නැවත සිහිපත් කරන්න.
- සාරාංශකරණයේ ප්‍රයෝජන පැහැදිලි කර දෙන්න.
  * පුවත්පතක හෝ කියවූ ලිපියක හෝ හරය සඳහන් කිරීමට
  * සවන් දුන් දේශනයක ඉදිරිපත් කළ කරුණු කෙටියෙන් සටහන් කිරීමට
  * තමා ලද අද්දැකීම් සම්භාරයක් කෙටියෙන් ප්‍රකාශ කිරීමට
  * අනවශ්‍ය වර්ණනා බැහැර කොට කෙටියෙන් යමක් පැවසීමට
  * කාලය, ධනය, ශ්‍රමය ඉතිරි කර ගැනීමට
- සාර්ථක සාරාංශයක ලක්ෂණ සාකච්ඡා කරන්න.
- ඡේදයක් සාරාංශ කිරීමේ දී අනුගමනය කළ යුතු පියවර විස්තර කරන්න.
  * මනා අවධානයෙන් ඡේදය කියවන්න. අන්තර්ගතය හොඳින් අවබෝධ කරගන්න.
  * දෙවන වර කියවීමේ දී ප්‍රධාන අදහසට අදාළ වචන, වාක්‍ය, වාක්‍යාංශවලට යටින් ඉරක් අඳින්න.
  * ප්‍රධාන අදහසට සෘජු ව අදාළ නොවන උපමා රූපක, විශේෂණ, විස්තර, වාක්‍ය, නිපාත ආදිය බැහැර කරන්න. (කපා හරින්න)
  * තමා ලකුණු කළ කොටස් පමණක් කියවන්න.
  * සාරාංශයේ ලිවිය යුතු වචන ගණන පිළිබඳ සැලකිලිමත් ව ප්‍රධාන අදහස මැනවින් ගළපා නැවත ලියන්න.
  * මුල් පිටපතේ ඡේද කිහිපයක් තිබුණත් එක ඡේදයක් ලෙස සාරාංශය ලියන්න.
  * සාරාංශය කියවන්නාට මුල් ඡේදයේ අදහස මැනවින් අවබෝධ වන සේ ලියන්න.

මුඛ්‍ය පද (**Key Words**) :

- සාරාංශකරණය යනු - වාක්‍යයක හෝ අනුච්ඡේදයක හෝ ඡේදයක හෝ පරිච්ඡේදයක හෝ ප්‍රබන්ධයක හෝ දේශනයක හෝ සාරය හෙවත් හරය පමණක් ගෙන හැර දැක්වීම හෙවත් පිඩු කර දැක්වීම සාරාංශකරණය නම් වේ.

**III තක්සේරුව හා ඇගයීම**

- තෝරා ගත් ලේඛනයක් ඔබගේ මඟපෙන්වීම යටතේ සාරාංශ කිරීමට හුරු කරවන්න.
- සුදුසු ඡේද කිහිපයක් සාරාංශ කිරීමට කේවල පැවරුමක් ලබා දෙන්න. ඇගයීමක යෙදෙන්න.
- මේ සඳහා තක්සේරුකරණ නිර්ණායක යොදා ගන්න.

**ගුණාත්මක යෙදවුම්** : * සාරාංශකරණය සඳහා ආදර්ශන (සාරාංශ කරන ලද ඡේද)
* පැවරුම් පත්‍රිකා (සාරාංශ කිරීමට උචිත ඡේද)

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක** :

- සාරාංශකරණය සඳහා අනුගමනය කළ යුතු පියවර විස්තර කරයි.
- සාරාංශකරණයේ ප්‍රයෝජන විස්තර කරයි.
- නිරන්තර අභ්‍යාස මඟින් සාරාංශකරණයට හුරුව ලබයි.
- නියමිත පියවර අනුගමනය කරමින් සාරාංශකරණයේ යෙදෙයි.

**පරිශීලනීය ග්‍රන්ථ** :

- තේනබඳු, පී. - සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය

# 19. තීරු ලිපි රචනය

**නිපුණතාව :** 9.0 සංශ්ලේෂණ හා විශ්ලේෂණ පරිචය ප්‍රදර්ශනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 9.5 නිර්දිෂ්ට ගද්‍ය පාඨ ඇසුරෙන් විවිධ ලේඛන ශෛලි හඳුනා ගෙන භාෂා කාර්යයේ යෙදෙයි.

**කාලච්ඡේද :** 05 යි.

**ඉගැනුම් පල :**
- විවිධ ලේඛන සඳහා උචිත ආකෘති හා භාෂා ශෛලි පවතින බව විස්තර කරයි.
- තීරු ලිපියක විශේෂතා විස්තර කරයි.
- ලේඛනයේ ස්වභාවය අනුව උචිත ආකෘතිය හා ලේඛන ශෛලිය තෝරා ගනියි.
- නිර්මාණශීලී ලෙසත් නිවැරදි වත් භාෂාව හසුරුවමින් ලේඛනයේ යෙදෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**I පෙර සූදානම :**
- පුවත් පත් තීරු ලිපි රචනය පිළිබඳ ඔබගේ දැනුම, අවබෝධය යාවත්කාලීන කර ගන්න.
- ශිෂ්‍යයන්ට සති අන්ත සිංහල පුවත් පත් රැගෙන එන ලෙස කල් ඇති ව දැනුම් දෙන්න.
- තීරු ලිපිවල සුවිශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න. ඒ සඳහා ඇමුණුම 2 යොදා ගන්න.
- තීරු ලිපි අධ්‍යයනය කිරීමට තවදුරටත් යොමු කරන්න. එම තීරු ලිපිවල රචනා ශෛලිය හඳුනා ගැනීමට අවස්ථාව ලබා දෙන්න. ඇමුණුම 3 යොදා ගන්න.
- සුදුසු තේමාවක් පදනම් කරගෙන තීරු ලිපියක් රචනා කිරීමට යොමු කරන්න.

**II ඇගයීම හා තක්සේරුව :**
- තීරු ලිපි ලිවීමේ පැවරුමක් ලබා දී තක්සේරුවක නිරත වන්න.
- ශිෂ්‍යයන් ලියූ ලිපි ඇගයීමට ලක් කර සමාලෝචනයක යෙදෙන්න.
- තෝරාගත් ලිපි බිත්ති පුවත් පත සඳහා යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :** * ඇමුණුම 1, 2 හා 3

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක :**
- පුවත් පත් තීරු ලිපි හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- තීරු ලිපිවල අන්තර්ගතයේ ස්වභාවය විස්තර කරයි.
- උචිත තේමා ඔස්සේ තීරු ලිපි රචනා කරයි.
- විවිධ තීරු ලිපි හඳුනා ගෙන කියවීමට පෙලඹෙයි.

**පරිශීලනීය ග්‍රන්ථ :**
- කාරියවසම්, තිස්ස - ප්‍රවෘත්ති රචනය හා වාර්තාකරණය
- නිමල් ශාන්ත, කිත්සිරි - සිංහල පුවත් පත් තීරු ලිපියේ විකාශනය හා සන්නිවේදනය

8. ඇමුණුම් :

ඇමුණුම 1

**පුවත්පත් ලිපි**

1. ප්‍රවෘත්ති වාර්තා
2. කතුවැකි
3. තීරු ලිපි
4. විශේෂාංග ලිපි ආදි විවිධ වර්ගයේ ලිපි ඇතුළත් වේ.

ඇමුණුම 2

**තීරු ලිපි හැඳින්වීම**

ඇමරිකානු පුවත් පත් කලා විශ්වකෝෂයෙහි සඳහන් වන්නේ වචන 250ත් 750ත් අතර සංඛ්‍යාවක් සහිත ලියවිල්ලක් බවයි. මෙය පුවත් පතක තීරුවක අඩක්, තීරුවක් හෝ තීරු කිහිපයක් තුළ දක්නට ලැබෙන හෙයින් මෙම ලිපි තීරු ලිපි වශයෙන් හඳුන්වනු ලැබේ. තීරු ලිපියක ආකෘතිය එසේ වූ පමණින් ම එය තීරු ලිපියක් නො වේ. තීරු ලිපියක් ලියන්නේ විශේෂ ශෛලියකිනි. එම ශෛලිය ලේඛකයාගෙන් ලේඛකයාට වෙනස් වේ. ඇමරිකානු පුවත්පත් කලා විශ්වකෝෂය තීරු ලිපි ලියන්නා හඳුන්වන්නේ මෙසේ ය. 'හෙතෙම දේශපාලනය ගැන අදහස් පළ කරයි; ආර්ථිකයේ ස්වභාවය ගැන සාකච්ඡා කරයි; පෞද්ගලික මට්ටමින් අවවාද දෙයි; පොතපත, චිත්‍රපට, සංගීත නිර්මාණ විවේචනය කරයි; කාඩ් ගැසීම, වෙස් ඇඳීම, විලාසිතා, ආහාර හා ගේදොර කටයුතු ආදිය ගැන ලියයි. ගමන් බිමන් පිළිබඳ විවිධ අද්දැකීම් ඉදිරිපත් කරයි.' ඒ අනුව තීරු ලිපියක අන්තර්ගතය පිළිබඳ සීමාවක් නැත.

අන්තර්ගතය හා ශෛලිය අතින් තීරු ලිපි එකිනෙකට බෙහෙවින් වෙනස් වේ.

ඇමුණුම 3

පහත සඳහන් තීරු ලිපි ඇසුරෙන් ලේඛකයන් යොදා ගෙන ඇති විවිධ ශෛලි අධ්‍යයනය කරන්න. (මෙම තීරු ලිපි උපුටා ගන්නා ලද්දේ කිත්සිරි නිමල් ශාන්ත විසින් රචිත 'සිංහල පුවත් පත් තීරු ලිපියේ විකාශනය හා සන්නිවේදනය' කෘතියෙනි.)

**කෙසේද යත්**

**තැවිල්ල**

තැලිල්ලට පසුව එන්නේ තැවිල්ල ය. තැලිල්ලෙන් ලේ ගල් ගැසෙයි. තැවිල්ලෙන් ඒ ටික බුරුල් වෙයි. ඒ නිසා තැවිල්ල බුරුල් කිරියාවක් හැටියට අඳුන්වනවා සුබයි.

කොට්ටපොල්
සිද්ධිගුරු
තිත්ත අඹිං
මී ඇට
නිකකොළ
අගල් ආදාර
තල ඇට

මේවා එක පමණට ගෙන කොටා පොට්ටනි කර වණ්ඩුවෙන් තම්බා තෙල් ගා උදේ සවස තවනු.

වෙද මාමා හීනි දිග කඩදාසි පටියේ ඔය ටික ලිව්වා ම ඒක පැළලි කයියක් තරමට සෝබමාන ය.

තැවිල්ලට කොනක් නැත. අමාරුව තියන කොයි කොන උනත් තවනු ලැබේ. ඇගේ අමාරුවක දී නම් දෙළුම් කොළ ටික තම්බා තවන්නට නියම කරනු ලැබේ.

තැවිල්ලෙන් පසු ව එන්නේ පත්තුව ය. ඒ ගඟබඩපත්තු, කන්දබඩ පත්තු නොහොත් අතපත්තු වැනි

පත්තු නො ව දෙහි ඇඹුලෙන් නොහොත් තල තෙලෙන් නොහොත් මී පැණියෙන් දිය කර ගාන බේත් පත්තු ය.

තැවිල්ලේ හැටි හැටියට ඒ ඒ තැන රත්වෙයි. සමහර තැවිලිවල දී රත්වෙන්නේ සැක්කර මුත්තාගේ පාණ්ඩු කම්බල සයිලාසනේ.

උන් සඳ තැවි තැවී
ඹහු ගුණ තෙදින් මැනැවී
මෙර මුදුනත හි වී
සුරිඳු පඬුපුල් අසුන් උණුවී

කොරගත්තු මෝඩකමට කැලේ වැදී ගහක් යට වාඩි වී ගුත්තිල පඬිතුමා තැවුණු තැවිල්ලට සැක්කර තුමාගේ ආසනේ උණුවෙච්ච වග ගුත්තිල කවි පොතේ ලියා තිබෙන්නේ අන්න ඒ විදියට ය.

මේ කියන තැවිල්ලට කියන්නේ පසුතැවිල්ල ය කියා ය. පසුතැවිල්ලට බේත් අහන්නේ නැත.

**මැණික් සාමි - (සිසිර කුමාර මාණික්ක ආරච්චි)**
**සිළුමිණ - 1979.11.7**

## පකිස්ලන්තය

**සත්තු වත්තෙ**

පකිස්ලන්තයේ රිලා නැටුම් මුළු ලෝක ධාතුව පුරා ම ප්‍රසිද්ධ ය. කොච්චර ප්‍රසිද්ධ ද කියනවා නම් රිලා නැටුම් බැලීම සඳහා සංචාරකයෝ දස දහස් ගණනින් පකිස්ලන්තයට ගොඩ බසිති. මේ නැටුම් විශේෂය අනාදිමත් කාලයක සිට පැවත එන සාම්ප්‍රදායික එකකි. රිලා නැටුම් බලන්නෝ විනෝද වෙති. රිලව් නටවන්නෝ බඩගෝස්තරය සොයා ගනිති. රිලව් වේවැල් පාරට බයේ නටති. අල මුල ගිය තැන් කොහොම උනත් මේ නැටිල්ල නම් බලන්ට වටින නැටිල්ලක් ය. අනිත් අතට පකිස්ලන්ත වාසීන් රිලව් නටවන්ඩ බෝම දස්ස ය. මා පකිස්ලන්තයට ගොඩ බසින විට ම රිලා නටවන්නෙක් පැමිණ මා පිළිගත්තේ ය. මිනිහා පමණක් නොව රිලවා ද මා පිළිගත් ආකාරය හරි ම ආෂික් ය.

'එන්ඩ සැර් නියම නැටුමක් පෙන්වන්ඩ. ග්‍රහ ලෝක හතේවත් මේ වගේ නැටිලි නෑ සැර් ආ . . . වරෙන් පුතා. මේ වැදගත් මහත්තුරුන්ට නැන්ද මාමගෙ ගෙදර යන හැටි පෙන්නපන් පුතා.'

රිලා නටවන්නා කියයි. පුදුමයි ! ඒත් ඇත්තයි !! රිලවා කෝටු කැබැල්ල කර උඩ තියාගෙන කදක් ගෙන යන විලාසය පෙන්වන්නේ හරිම අපූරුවට ය.

'හොග් . . . හොග් . . . හොග්'

මට ඉබේට ම හිනා ගියේ ය. මම ඒ දුප්පතාට කහවනු එකක් ම දී තවත් නැටුමක් පෙන්වන මෙන් ඉල්ලා සිටියෙමි.

'ආ . . . පුතා මේ පිටරට මහත්තැන්ට ජේන්ඩත් එක්කල පොඩි අඩව්වක් අල්ලපන් පුතා.'

රිලවා වේවැලේ එල්ලී පිනුමක් ගැසුවේ ය. බලන්ඩ ආෂික් ය. මේ රිලවාට කලිසමක් හා කමිසයක් අන්දවා මහත්තැන් කෙනෙක් වාගේ සරසා ඇත.

'ආ පුතා . . . උඹට ලොකු තෑග්ගක් හම්බවෙයි. අපේ රටේ පරණ දඬුවමක් පෙන්නපන් පුතා.'

රිලවා කෝටු කැබැල්ලේ උල මත ඉඳගත්තේ ය. ඔක්කොම ටුවරිස්ට්ලා 'අපොයි' යනුවෙන් ඔලුවේ අත් ගසා ගත්තෝ ය.

**ආරච්චිල (දයාසේන ගුණසිංහ),**
**පකිස්ලන්තය, දිවයින ඉරිදා සංග්‍රහය**

**නර පණුවෝ සහ ගරිල්ලෝ**

හොර හිත ඇති තැනැත්තා නිතර ම බියෙන් පසුවෙයි. ඔහු පොලිස් කාරයෙකැ යි සිතා තැපැල් පියුන්ට බය වෙයි. සුරාබදු නිලධාරියෙකැ යි සිතා මහජන සෞඛ්‍ය පරීක්ෂකට බය වෙයි.

මෙය පුදුමයක් නො වේ. බිය පත් වූ මිනිසාට දැස හරියාකාර නො පෙනේ. කන හරියාකාර නෑසේ. අදහස් පැහැදිලි ව ප්‍රකාශ කර ගත නො හැකි ව ගොත ගැසෙයි. මේ සිදුවන්නේ හෘදය සාක්ෂිය නම් යමක් හැම අයෙකු තුළ ම සැඟ වී ඇති හෙයිනි. අන්තිම බිහිසුණු හොරා තුළ පවා යම් පමණක හෝ හෘදය සාක්ෂියක් වෙයි.

අන් කවරෙකුට බොරු කළත් හෘදය සාක්ෂියට නම් බොරු කළ නො හැකි ය. එහෙයින් හොරෙකු විසින් කරනු ලබන හැම හොරකමක් පාසා ම ආභ්‍යන්තරික ව පිරිහෙයි; අධ්‍යාත්මික ව පිරිහෙයි. මෙසේ දිගින් දිගට ම බොරු කළ හොත් අවසානයේ දී ඔහු තුළ ඉතිරි වන්නේ ආධ්‍යාත්මයත් නො ව ඉහඳ පිරී, ගඳ ගසන කුණු ගොඩක් පමණකි.

**රයිගම්රාළ**

**දිවයින - ඉරිදා සංග්‍රහය**

# 20. භාෂණ ව්‍යවහාරය, ලේඛන ව්‍යවහාරයට හැරවීම

**නිපුණතාව :** 9.0 සංශ්ලේෂණ හා විශ්ලේෂණ පරිචය ප්‍රදර්ශනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 9.3 භාෂණ ව්‍යවහාරයෙන් ඇති පාඨ වර්තමාන ලේඛන ව්‍යවහාරයෙන් ලියයි.

**කාලච්ඡේද :** 04 යි.

**ඉගැනුම් පල :**

- භාෂණ ව්‍යවහාරයේ හා ලේඛන ව්‍යවහාරයේ ඇති පාඨ අතර වෙනස හඳුනා ගෙන පැහැදිලි කරයි.
- භාෂණය හා ලේඛනය අතර වෙනස්කම් පවතින බව පිළිගනියි.
- භාෂණ ව්‍යවහාරය අද්‍යතන ලිඛිත ව්‍යවහාරයට හරවා ලියයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**I පෙර සූදානම :**

- පහත සඳහන් භාෂා ව්‍යවහාරවල සුවිශේෂ ලක්ෂණ පිළිබඳ ව කරුණු ඇතුළත් ගොනුවක් සකස් කර ගන්න. (මේ සඳහා 12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශයෙහි සඳහන් භාෂාණය හා ලේඛනය අතර වෙනස හඳුනා ගැනීමේ ක්‍රියාකාරකම ද ප්‍රයෝජනයට ගන්න.)
- ලිවීම සඳහා අද්‍යතන ලේඛන ව්‍යවහාරය භාවිත කිරීමේ අවශ්‍යතාව ගැන ශිෂ්‍යයන්ට පැහැදිලි කිරීමට අවශ්‍ය කරුණු සංවිධානය කර ගන්න.
- ඒ සඳහා පහත සඳහන් ක්ෂේත්‍ර යොදා ගන්න.
  - * වර්තමාන ලේඛන ව්‍යවහාරයේ දී බොහෝ දෙනකු වැරදි යෙදුම් භාවිතා කරන බව
  - * ලේඛන ව්‍යවහාරය භාෂණ ව්‍යවහාරයෙන් වෙනස් විය යුතු බව
  - * වර්තමාන ලේඛන ව්‍යවහාරය පුරාතන ලේඛන ව්‍යවහාරයට වඩා වෙනස් බව

**II ඉගැනුම සංවර්ධනය :**

- පහත සඳහන් ප්‍රවේශයන්ගෙන් සුදුසු ප්‍රවේශයක් තෝරා ගෙන පාඩමට ප්‍රවේශ වන්න.
  - * වර්තමාන ලේඛන ව්‍යවහාර, පුරාතන ගද්‍ය ව්‍යවහාරය හා වර්තමාන කථා ව්‍යවහාරය යන රීතිවලින් ලියවුණු පාඨ කිහිපයක් පන්තියට ඉදිරිපත් කර ලේඛනයේ වැදගත්කම ප්‍රකාශ කිරීම
  - * ලිවීම සඳහා වර්තමාන ලේඛන ව්‍යවහාරය යොදා ගැනීමේ වැදගත්කම පැහැදිලි කිරීම
  - * දෝෂ සහිත ලේඛන ව්‍යවහාර කිහිපයක් පන්තියට ඉදිරිපත් කර දෝෂ රහිත ව ලිවීමේ වැදගත්කම ප්‍රකාශ කිරීම
- ඇමුණුම 1හි සඳහන් කථන ව්‍යවහාරයෙන් ලියවුණු පාඨ වර්තමාන වියත් ලේඛන ව්‍යවහාරයට හරවා ලිවීමේ අභ්‍යාසයක නිරත කරවීම
- ශිෂ්‍යයන්ගේ ලේඛන ඉදිරිපත් කිරීම හා තක්සේරුකරණය

**III තක්සේරුව හා ඇගයීම**

- ශිෂ්‍ය ඉදිරිපත් කිරීම්වලට හා තක්සේරුකරණයට අවශ්‍ය කාලය ලබා ගන්න.
- වර්තමාන ලේඛන ව්‍යවහාරයෙන් ලිවීමේ කුසලතාව දී ඇති නිර්ණායකවලට අනුව පරීක්ෂා කර ඇගැයීම හා තක්සේරුකරණය කරන්න.
- සුදුසු පැවරුම් ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

* ඇමුණුම 1 -

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක :**

- භාෂණ ව්‍යවහාරය හා ලේඛන ව්‍යවහාරය අතර වෙනස හඳුනා ගෙන පැහැදිලි කරයි.
- භාෂණ ව්‍යවහාරයෙන් යුත් පාඨ ලේඛන ව්‍යවහාරයට හරවයි.
- වාක්‍ය දෝෂවලින් තොර ව වාක්‍ය ලියයි.
- අර්ථය නිරවුල් වන සේ වාක්‍ය ලියයි.
- වාක්‍යාන්තර සම්බන්ධතාවකින් යුතු ව වාක්‍ය ලියයි.

**පරිශීලනීය ග්‍රන්ථ :**

- තිලකසිරි, සිරි - සිංහල ව්‍යාකරණ විදි
- තේනබදු, පී. - සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය
- දිසානායක, ජේ. බී. - භාෂාවක රටා සමුදාය
- මුනිදාස, කුමාරතුංග - ප්‍රබන්ධෝපදේශය
- විතාරණ, විනී - පදය, වාක්‍යය හා ඡේදය
- සේනාධීර, ගුණපාල - නිවැරැදි වහර

ඇමුණුම 1 - **පැවරුම**

**භාෂණ ව්‍යවහාරයෙන් ලියවුණු මෙම පාඨ වර්තමාන වියත් ලේඛන ව්‍යවහාරයට හරවා ලියන්න.**

1. ලෝකය පැයෙන් පැයට, දවසින් දවසට වේගයෙන් වෙනස් වෙනවා. ඒ වෙනස්වීමත් එක්ක අපටත් වෙනස් වෙන්න සිද්ද වෙලා තියෙනවා. ලෝකයත් එක්ක වෙනස් නොවුණොත් අපි තරගයෙන් පරාද වෙනවා. අපට තරගය තියෙන්නේ පන්ති කාමරයේ විතරක් නෙවෙයි. අලුත් ඉස්කෝලේ විතරකුත් නෙවෙයි. අප ඉගෙන ගන්න කලාපේ විතරක් නෙවෙයි. අපේ රට තුළ ජාතික වශයෙන් පමණක් නෙවෙයි. මේ ඔබේ පින්වන්ත වයසේ දී පාසල් ඔබ ජීවිතේ තුළ ජාත්‍යන්තර තරගයක තරගකරුවන් වෙලා ඉන්නවා.

2. තරුණ වයසේ දී අධ්‍යාපන හා සමාජ ප්‍රශ්න පිළිබඳ ව ඔබට අවබෝධයක් තියෙන්න පුළුවන්. දැන් උතුර දකුණ බස්නාහිර ඇතුළු හැම පළාත්වල දරුවන් එකට වාඩි වී ඉන්නවා. ජාත්‍යන්තර තරගයවලින් ජය ගන්න නම් අප මුලින් ම රට දිනවිය යුතු යි. රට දිනෙව්වොත් ඔබට ඔබේ ජීවිතය ජයගන්න පුළුවන්.

3. මහාමාන්‍ය ඩී. එස්. සේනානායක මැතිතුමා අපේ ජාතියේ පිනට පහළ වූ ජනතා පුත්‍රයෙක්. එතුමා මේ රටේ සංස්කෘතිය ආගම දහම සහ සමාජය ගැන පුදුම අවබෝධයක් තිබුණ ජනනායකයෙක්. එතුමා තමන්ගේ ධනය බුද්ධිය යොදා ගෙන මේ රටේ ජාතීන් අතර තිබූණු අසමගිය නැති කර සමගිය සමාදානය ඇති කළා. මේ රටේ ජීවත් වන ජාතීන් අතර සමගියක් සමාදානයක් නැති නම් නිදහස ලබා දෙන්නේ කෙසේ දැයි අධිරාජ්‍යවාදීන්ගෙන් ප්‍රශ්න කළා.

# 21. ගුත්තිල කාව්‍යය (260 - 317 කවි)

**නිපුණතාව :** 2.0 පුරාතන පද්‍ය සාහිත්‍යයේ විකාසනය, ආකෘතික ලක්ෂණ හා ස්වභාවය අධ්‍යයනය කරමින් රස වින්දනයේ හා විචාරයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 2.3 කාව්‍ය විචාර සංකල්ප හඳුනා ගෙන නිර්දිෂ්ට පද්‍ය නිර්මාණ අර්ථාවබෝධයෙන් යුතු ව රස විඳිමින් විචාරයට ලක් කරයි.

**කාලච්ඡේද :** 15 යි.

**ඉගැනුම් පල :**

- පෙරදිග කාව්‍ය විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට පුරාතන පද්‍ය රස විඳිමින් විචාරය කරයි.
- නිර්දිෂ්ට පුරාතන පද්‍ය රස වින්දනයෙන් ලත් පරිචය ඇසුරෙන් වෙනත් කාව්‍ය නිර්මාණ රසවින්දනයට පෙලඹෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**I පෙර සූදානම :**

- ගුත්තිල කාව්‍යයේ 260 සිට 317 තෙක් කවි කියවා රස වින්දනයට හා විචාරයට අදාළ කරුණු රැස් කර ගන්න.
- පරිශීලනීය ග්‍රන්ථ ඇසුරින් දැනුම පෝෂණය කර ගන්න.

**II ඉගෙනුම සංවර්ධනය :**

- පහත සඳහන් ආකාරයේ සුදුසු ප්‍රවේශයකින් පාඩමට පිවිසෙන්න.
  - * ගුත්තිල කාව්‍යයේ පෙර රස විඳි සිද්ධි හා අවස්ථා නැවත සිහිපත් කරමින්
  - * සුරඟන රැඟුමේ එන කවි උචිත රිද්මයකට අනුව ශිෂ්‍යයන් ලවා ගායනා කරවමින්
  - * ගායන හැකියාව ඇති සම්පත් දායකයෙකු ලවා සුරඟන රැඟුමේ කවි සංගීතය ද සහිත ව ගායනා කරවමින්
- ගුත්තිල කාව්‍යයේ 260 සිට 317 තෙක් කවි ශිෂ්‍යයන්ට කියවීමට සලස්වා අරුත් පැහැදිලි කරන්න.
- අදාළ කොටසේ හමු වන විරිත් හඳුන්වා දෙන්න. (ගී, පෙද, මාත්‍රා 26 විරිත)
- පහත සඳහන් කරුණු කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරන්න.
  - * අන්තර්ගතය
  - * කවියාගේ ප්‍රතිභාව
  - * කාව්‍ය ආකෘති
  - * සාහිත්‍යික අගය
  - * යොදා ගෙන ඇති අලංකාරෝක්ති
  - * භාව පූර්ණ භාෂාව
  - * චරිත නිරූපණ
  - * අවස්ථා නිරූපණ
- ගුත්තිල කාව්‍යයට සිංහල සාහිත්‍යයේ හිමි තැන සාකච්ඡා කරන්න. එහි දී
  - * නිර්ව්‍යාජ වර්ණනා මාර්ගය
  - * ජනකවි ආභාසය
  - * ස්වාධීන රචනා ශෛලිය
  - * ජනකාව්‍ය සම්ප්‍රදාය කෙරෙහි ගුත්තිල කාව්‍යයේ බලපෑම

  යන කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.

- ගුත්තිල කාව්‍යය පිළිබඳ සමස්ත සමාලෝචනයක් සිදු කරන්න.

**III තක්සේරුව හා ඇගයීම**

- පාඩම අතරතුර ශිෂ්‍යයන්ගේ දැනුම හා අවබෝධය තහවුරු කිරීමට උචිත පැවරුම් හා නිර්ණායක මූලික ඇගයීම් ක්‍රම යොදා ගන්න.

  *උදා :* * ගුත්තිල කාව්‍යය පිළිබඳ තොරතුරු ඇතුළත් පොත් පිංචක් සකස් කිරීමට පැවරීම
  * අර්ථය ලිහිල් බසින් ලිවීමේ අභ්‍යාස ලබා දී තක්සේරුවක යෙදීම
  * ගුත්තිල කාව්‍යයේ ප්‍රධාන චරිත පිළිබඳ විචාරාත්මක සංවාදයක නිරත වීමට අවස්ථාව ලබා දීම
  * ගුත්තිල කවියාගේ භාෂා භාවිතයේ සුවිශේෂතා නිදර්ශන සහිත ව විමසීමට පැවරුමක් ලබා දීම
  * විචාර ප්‍රශ්න සඳහා පිළිතුරු ලිවීමට අවස්ථාව ලබා දීම (ඇමුණුම 01)

**ගුණාත්මක යෙදවුම්** : ඇමුණුම 01, 02 හා 03

මුඛ්‍ය පද **(Key Words)** :

* **සිංහල ඡන්දස**

සිංහලයේ ඡන්දස් ක්‍රමය සඳහා අනුගමනය කොට ඇත්තේ සංස්කෘත ඡන්දස් ක්‍රමයයි. හෙළ සිලෝ සකු සඳසට අයත් විරිත්වලින් බැඳේ.

හෙළ ගී විරිත් බැඳී ඇත්තේ මාත්‍රා ඡන්දසිනි. ගීයක අර්ධයක් හෙවත් පාද දෙකක් එකක් ලෙස සලකනු ලැබේ. ගී අර්ධය මාත්‍රා වශයෙන් සමාන හෝ අසමාන හෝ විය හැකිය.

මත් ගණනින් ගැනෙන ගී විරිත් සීගිරි පද්‍යවලද දක්නා ලැබේ. මත් සඳසින් බැඳි ගී විරිතකට නිදසුන් මෙසේය.

'සැරදෙ සුලකළකුරු - මියුරු තෙපලෙන් රඳනා
රජකුල රහස මැතිනිය - සියනිහි සැලළිහිණිසඳ.''

සැලළිහිණි සඳෙසින් උපුටා ගැනුණු මේ යහ ගී දෙඅඩෙහි ප්‍රථමාර්ධයෙහි මත් විස්සකි. දෙවැන්නේ මත් දෙවිස්සෙකි.

හෙළයේ වර්ණ ඡන්දසින් බැඳි පද්‍ය සිලෝ රචනාවන්හි දක්නා ලැබේ. එබන්දකට නිදසුන් වශයෙන් ගංගාරෝහණ වර්ණනාවෙහි එන පළමු සිලෝව දැක්විය හැකිය.

'' සිළුමිණි රැසගින් සෙව් දෙව්බඹුන් නා නරන්ගේ
හළ පලග' යුරාගේ දප් මුලින් සක් සිරින් යුත්
සැදි සුදුනිය රැස් මී කත් අලුත් පුල් සරින් ගත්
වඳිම් සිරිපතුල් අත් දී මුදුන් දම්රදුන්ගේ''

මෙය රචනා කොට ඇත්තේ මාලිනී නමින් යුත් සකු විරිතිනි. එහි එක් එක් පාදය 'න' ගණ දෙකකින් ද 'ම' ගණයකින් ද 'ය' ගණ දෙකකින් ද යුක්ත වෙයි. ප්‍රස්තාරය මෙසේ ය.

න න ම ය ය
--- / --- / ◡ ◡ ◡ / - ◡ ◡ / - ◡ ◡ //

යට කී සිලෝවේ පාද චතුර්ථයම මේ ලක්ෂණයෙන් යුතු වෙයි.

සුරවීර, ඒ. වී., ***සාහිත්‍ය විචාර ප්‍රදීපිකා,*** කොළඹ, 2005, 237- 238 පිටු.

**තක්සේරුකරණය හා ඇගයීම් නිර්ණායක :**

- ගුත්තිලයේ නිර්දිෂ්ට කවිවල අර්ථය ලිහිල් බසින් ලියයි.
- ගුත්තිල කාව්‍යයේ භාෂා භාවිතය අගය කරයි.
- විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව, ඒවාට අනුගත ව නිර්දිෂ්ට පුරාතන පද්‍ය රස වින්දනයෙහි යෙදෙයි.
- පුරාතන පද්‍ය විචාරයට ලක් කරයි.

**පරිශීලනීය ග්‍රන්ථ :**

- මාර්ටින් වික්‍රමසිංහ - ගුත්තිල ගීතය
- යක්කඩුවේ ප්‍රඥාරාම හිමි - ගුත්තිල විචාර විචාරය
- එදිරිවීර සරච්චන්ද්‍ර - සාහිත්‍ය විද්‍යාව
- ජී. බී. සේනානායක - විචාර ප්‍රවේශය
- අශෝක කරුණාරත්න - සාහිත්‍ය විවේචනය

ඇමුණුම 01

**මාත්‍රා 26 විරිත**

රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙළ දිදී  විදුලිය පබා

◡ ‾ ◡   ‾ ‾  ◡   ‾   ◡   ◡  ‾  ‾  ‾  ◡  ‾ ‾ ‾ ‾  ‾  ◡

ඇමුණුම 02

- **නිදර්ශක ඇගැයීම් :**
  - * 'උචිත  රූපක යෙදූ අලංකාර, කාව්‍යය ශෝභාවත් කරයි' ගුත්තිල කාව්‍යය ඇසුරින් මේ කියමන සනාථ කරන්න.
  - * වර්ණිත ප්‍රස්තුතයට උචිත කාව්‍ය ආකෘති (විරිත්) යොදා ගැනීමේ දී කවියා දක් වූ කුසලතාව නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.
  - * 'බස් වහරෙහි ගීතවත් බව ගුත්තිල කාව්‍යයේ කැපී පෙනෙන ලක්ෂණයකි' උදාහරණ දෙමින් මේ කියමන තහවුරු කරන්න.
  - * ගුත්තිලය ධ්වනි පූර්ණ කාව්‍යයක් ලෙස අගය කළ හැකි බවට කරුණු ඉදිරිපත් කරන්න.
  - * මූසිල ගුරු ද්‍රෝහියෙක් ද?  මේ පිළිබඳ පන්තියේ සිසුන් අතර විවාදයක් පවත්වන්න.
  - * ඔබ සිත් ගත් වර්ණනාවක් ඇසුරින් ගුත්තිල කතුවරයාගේ වර්ණනා චාතුර්යය පැහැදිලි කරන්න.

ඇමුණුම 03

## උත්කෘෂ්ට පද්‍ය ග්‍රන්ථයක්

**- ජී. එච්. ද අල්විස් -**

කවි සංකල්පනයන් ප්‍රකාශ කිරීමට සිංහල භාෂාව විශේෂයෙන් ම උචිත වූවෙකැයි යන්න අපේ ජාතිය කෙරෙහි ඇති ළෙන්ගතුකමින් කියවෙන්නෙකැයි ගත හැකි වුව ද අපේ සාහිත්‍යයික උරුමය හඳුනන්නන් ගේ විශ්වාසය ද එය වෙයි. ඉංගිරිසියට නැඟුණු විට කවි 'කල්පිතයන් ' ලෙස පෙනී යා හැකි කියුමින් අප එදිනෙදා ජීවිතයෙහි වහරන බස පිරී පවතී. අපේ මුල් බස කයෝර ශබ්දවලින් හා මහා ප්‍රාණාක්ෂරවලින් ද

තොර වූවකි. කවි බැඳුමෙහි දී අප දනුදු 'මිශ්‍ර සිංහලය' වෙනුවට අපේ මුල් බස වන හුදු හෙළ බස යොදා ගනිමු. එ සේ ම කවි බැඳුමෙහි දී සකු වදන් යෙදීමෙන් ද වළකිමු. ගද්‍යයෙහි දී සකු වදන් නිසා හුදු හෙළ වදන් ඉවතට තල්ලු වී ඇත්තේ ඉංගිරිසි බසෙහි දී ලතින් හා ග්‍රීක මූලයන්ගෙන් නිපන් වදන් නිසා ඇංග්ලෝ-සැක්සන් වදන් ඉවතට තල්ලු වී ගිය අයුරින් ම ය මධුර වාඞ් මාලාවකුත් සුබනම්‍ය රචනා රීතියකුත් හේතු කොට සිංහල භාෂාව කවි බැඳුමට කො තරම් බැහැවී ඇත්තේ ද යත් හිගමන් යැදීම පිණිස වේවයි, තෙල් බෙහෙත් ප්‍රචාරය සඳහා වේවයි, කලඹන සුලු පුවත් සැපැයීම සඳහා වේවයි යන මේ කී අන්දමේ හිසට නොව හදට කා වදින සියලු කටයුත්තකට ම 'පද්‍යය' ජනප්‍රිය මාධ්‍යයක් බවට පත් ව ඇත. මීට අවුරුදු දහසකට පෙර සීගිරිය නැරඹීමට ගිය ආගන්තුකයන් විසින් එහි පවුරේ ලියන ලද සීගිරි කුරුටු ගී වැනි උරුමයක් - එකල අප ලබා සිටි සාංස්කෘතික හා අධ්‍යාපනික තත්ත්වය පමණක් නො ව සමකාලීන යුරෝපයෙහි ද නො පැවති පරිද්දෙන් මෙහි පැවති අධ්‍යාපනයේ පෘථුල ව්‍යාප්තිය ද පෙන්වා ලන එ බඳු උරුමයක් - ගැන ආඩම්බර විය හැක්කේ අන් කවර ජාතියකට ද?

මේ කරුණ මෙ සේ වතත් පුදුම උපදවන අන්‍ය සිද්ධිය නම් මේ කවි බිමෙහි ශ්‍රේෂ්ඨ කවීන් ගේ පහළ වීම සිරිතට වඩා විශේෂය බවට පත් ව තිබීමයි. රටේ ශ්‍රේෂ්ඨතම කවියා වන **කුමාරදාසයෝ** සිංහලයෙන් නො ව සංස්කෘතයෙන් ලියූ හ. සිංහලයෙන් ලියූවන් අතරින් සතර දෙනකු ගේ නම් සෙසු සුළු කවියන් රැස අබිබවා මතු වී පෙනෙයි. ඔවුන'තුරින් **'කව් සිළුමිණ කතුවරයා** (සාමාන්‍යයෙන් පිළිගෙන ඇත්තේ 11 පරාක්‍රමබාහු රජු ලෙස ය.) ශ්‍රේෂ්ඨතමයා ලෙස පිළිගනු ලැබ ඇත. එ හෙත් එ තුමා ගේ කාව්‍යය උගතුනට විනා සෙසු අයට වැසුණු අරුත් ඇත්තෙකි. සිරි රහල් හිමියන් ගේ ශ්‍රේෂ්ඨත්වය බෙහෙවින් ම රඳා පවත්නේ එ තුමන් ගේ කාව්‍යමය ප්‍රතිභාව මත නො ව, ඔවුන් ගේ විස්මයජනක බහුශ්‍රැතත්වය මත යැයි කිව හැකි ය. ෂඩ් භාෂාවෙක පරමේශ්වරත්වයට පැමිණි සිටි එ තුමෝ සකල දැනීමක් ම තම විෂයප්‍රාප්ත කොට සිටිය හ. මයූර සන්දේශයේ කතුවර **කවීශ්වර** නිසැකයෙන් ම අපේ අතිස්වායත්ත කවීන් අතරෙහි ලා ගැනෙන්නකු මෙන් ම 'වාගීශ්වරයෙක්' ද විය. එහෙත් ඔහු ගේ කාව්‍යය 'මහා කාව්‍ය' ගණයට නො වැටේ. මේ මහා කවීන් අතරෙහි අන්තිම–එහෙත් කිසි ලෙසෙකිනුත් නො දෙවැනි–වූයේ 'ගුත්තිල කාව්‍යයේ' අඥාත කර්තෘවරයා ය. ගුත්තිල කාව්‍යය වූකලී ගාම්භීර පාණ්ඩිත්‍යයක් පිළිබිඹු නො කරතුදු, කවීන් තම කාව්‍යයනට 'දීප්තිය' ලබාදීම පිණිස එක් කරන්නට යැතු අලංකාර ප්‍රයෝගයන් ගෙන් මුළුමනින් ම තොර වුව ද සිංහල කාව්‍ය ප්‍රියයන් ගේ සදා ප්‍රීති ප්‍රමෝදයටත් විස්මයටත් ප්‍රභවස්ථානයක් වූවකි.

(පොදුවේ මේ කාව්‍යය හැඳින්වෙන සැටියට) ගුත්තිලය නම් වූ මේ කෘතියේ කතුවරයා කුරුණෑගල දිසාවේ වැත්තෑව නම් ගමේ භික්ෂුවක බව පාරම්පර්යයෙහි කියැවේ. මේ පිළිබඳ ව සත්‍ය වාර්තා කිසිත් නො ලැබෙතත් පුරාවෘත්තවලින් ඒ අඩුව සපිරෙන අතර කතුවරයා ගේ දස්කම් පිළිබඳ ව පවත්නා කථා රාශියෙක් ද වෙයි. කවර ඓතිහාසික ප්‍රවෘත්ති මාත්‍රයෙකින් මේ පුරාවෘත්ත පහළ විණි ද යනු තීරණය කිරීම අපි අනාගත පර්යේෂකයනට පවරමු. එහෙත් මේ පුරාවෘත්ත වැදගත්කමින් තොර වූයේ නො වේ. කවර හෙයින් ද යත්, ශ්‍රේෂ්ඨ කාර්ය සිද්ධියෙක මහිමයෙන් ජාතියෙක සන්තානයෙහි නිදන් ගන්නා ප්‍රමුඛ පුද්ගලයන් ගැන විනා මෙ බඳු පුරාවෘත්තයක් ජනතාවක අතින් නොතැනෙන හෙයිනි. එ හෙයින් මේ පුරාවෘත්ත පිළිබඳ ව ලුහුඬින් කරුණු දැක්වීමක් කිරීම නුසුදුසු නො වෙතියි සිතමි.

වැත්තෑවේ (කිවියා සාමාන්‍යයෙන් හැඳින්වෙනුයේ මේ නමිනි.) හිමියන් ශ්‍රී රාහුල හිමි වැනි ශ්‍රේෂ්ඨ පුරුෂයකු ගේ අධීශ්වරත්වය යටතෙහි පැවති සුප්‍රසිද්ධ තොටගමුවේ සරසවියෙහි ශිෂ්‍යයකු වූ බව පෙනේ. එ වකට කවීන් අතරෙහි අග්‍රගණ්‍ය වූවෝ රහල් හිමියෝ ය. එහෙත් තරුණ ශිෂ්‍යයා කවිත්වය අතේ නව

බිමක් සකසනු දුටු එ හිමියෝ වික්ෂේපයට පත් වූ හ. පාණ්ඩිත්‍යයෙන් හෙබී සිටිමිනුත් නොහොත් ඇතැම් විට ඒ නිසා මත්–සිරි රහල් හිමියනට ඇති විය නොහැකි වූ සියත් බවක් හේ දක්වන්නට විය. ඔහු ගේ කවි සිතුවිලි නවමු බැවින් පණවත් විය. ඔහු ගේ වදනිසුරු බව පුදුම එලවිය. එ තරම් යසසෙකින් තමන් වැජඹෙමිනුත් තම සිතෙහි හටගත් ඊර්ෂ්‍යාව මැඬ ලන්නට සිරි රහල් හිමියෝ අපොහොසත් වූ හ. එ හෙයින් තරුණ කවියා පිටු දක්නට සිතාගත් එ හිමියෝ වැත්තෑවේ ගේ බත් පතට පළා කොළ තුන් පංගුවක් දිනපතා බෙදන සේ අතවැසියකු ඇණ වූ හ. බස ඉතා පැහැදිලි විය. ඉන් හැඟැවුණේ (රහස් බසෙක දී අප කළ යුතු සැටියෙන් මෙහි අගට ඇති දීර්ඝ ස්වරය නොතකා හළ හොත්) ''පල, පල, පල'' යනු ය. තරුණ කවියා තම ගමට පෙරළා ගොස් තමා අකෘතඥයකු නොවන බව තම ගුරුහුට ඒත්තු ගැන්වීම පිණිස කවක් පබඳින්නට ඇරැඹියේ ය. මෙ වැනි අරමුණකට ගුත්තිල කථාව අත්‍යර්ථයෙන් ම උචිත විය. සිය ගුරුහු තව දුරටත් සංසිඳවනු පිණිස හෙතෙමේ උවමනාවෙන් ම තම කාව්‍යය අසුබ ගණයෙකින් අරඹමින් කරදරයකට මුල පිරී ය. එහි අනිෂ්ට විපාකය මිහි පිට ඉබාගාතේ ඇවිදින්නකු බවට පත් වීම ය. එ පරිද්දෙන් ම අතවැස්සකු ද කැටි ව රට හැර ගිය කවියා තවත් 'සින්බාදයකු' මෙන් විවිධ වික්‍රමයනට මුහුණ දෙමින් දේශ-දේශාන්තරයෙහි සැරිසැරීය. මෙ සේ සැරිසරන අතර වරෙක හේ නන් දිගින් වන්දනා කාරයන් ගලා ආ දෙවොලක් බැලීමට ද පැමිණියේ ය. එහි පූජා කුටිය මැද අහසෙහි නිරාලම්බව තුබූ ලෝ මුවා පෙට්ටියක් (මෙහි තුළ දෙවියකු වැඩ විසූ හ යි කියනු ලැබී ය) ඔවුන් එහි අදවන්නට හේතු විය. තෙර නම තමා ගේ තල් අත්ත පූජා කුටියේ එක් බිත්තියක් ඇවිරෙන සේ ඇල්ලී ය. එ කෙණෙහි ම ඒ පෙට්ටිය කුටි මධ්‍යයෙන් ඉවතට තල්ලු විය. කුටියේ බිත්ති සතර මහත් චුම්භක (=කාන්දම්) සතරක් බවත් ඉන් ලෝමුවා පෙට්ටිය වෙතට එක් සම ව පැවැත්වූ ආකර්ෂණයෙන් එය අහසෙහි රැඳී පැවති බවත් තෙර නම තම ගෝලයාට පහදා දුන්නේ ය. දෙවොලට කළ මේ නිග්‍රහය නිසා කාමරයක් තුළ මොහු දෙදෙන සිර කොට තබනු ලැබූ හ. එය කෙ තරම් ශීතවත් වී ද යත් එහි තුළ එ සේ සිර කොට තබනු ලැබූ කිසිවෙකුත් නො මැරී ඉතිරි නො වී ය. එහෙත් තෙර නමත් ශිෂ්‍යයාත් මුළු මහත් රැය පුරා ම මල්ලව පොරයෙහි යෙදීමෙන් තම ශරීර උෂ්ණත්වය රැක ගත් හ. පසු දා උදෑසන මළ සිරුරු රැගෙන යැමට පැමිණි මුරකරුවෝ පැමිණ සිටි අතවරයෙන් කිසි දු හානියකට නො පැමිණ ඔවුන් දෙදෙන පසු වනු දැක මහත් පුදුමයට පත් වූ හ. අන්තරායකර විජ්ජාකාරයන් ලෙස සලකනු ලැබූ ඔහු දෙදෙනා වහා ම රටින් පිටුවහල් කරන ලද හ. කවියා පෙරළා මවුබිමට පැමිණියේ ද යන්න පිළිබඳ ව පුරාවෘත්තවලින් අපට කිසිවක් නො පැවැසෙයි. වෙනත් කෘතියෙක කර්තෘත්වය මේ කවියාට පැවැරී නැත. ඒකාන්තයෙන් ම, ගීතමය සෞන්දර්යයත් සංකල්පනයේ ස්වායත්තතාවත් වාඞ්මාලාවේ හා වෘත්තයේ ද මාධුර්යයත් අතින් සිංහල සාහිත්‍යයෙහි අන් කවර කාව්‍යයක් වත් ගුත්තිලය හා පැහැසී සිටීමට සුදුසු නොවන්නේ ය.

කාව්‍යයේ වස්තු සාරය පිළිබඳ ව අපේ කාලය එ තරම් ගෙවිය යුතු නො වේ. බඹදත් රජු ගේ කීර්තිමත් වාසල ගාන්ධර්වයා වූ ගුත්තිල ඇදුරු වෙත දිනක් ගාන්ධර්වයකු වීමේ අටියෙන් තරුණයෙක් පැමිණියේ ය. සිය නිජ පුරය වූ උදේනියට පැමිණි වෙළෙඳුන් කිහිප දෙනකු අතින් ගුත්තිල ඇදුරු පිළිබඳ කීර්තිය හේ අසා සිටියේ ය. තරුණයා කෙරෙහි පැහැද සිටි සිය දෙමාපියන් ගේ පෙරැත්තය නිසා තම සිතට පටහැණි ව ගුත්තිල ඇදුරු ඔහුට වීණා ශිල්පය ඉගැන්වී ය. මූසිල තෙමේ (ඒ එකී තරුණයාගේ නමයි.) අතිදක්ෂ ශිෂ්‍යයකු බව පසක් කෙරෙමින් කල් නො යවා ම රාජ ගාන්ධර්වයා දත් සියලු ශිල්පයෙහි කෙළ පැමිණියේ ය. ගුත්තිල ඇදුරු ගේ උදව්වෙන් රාජ සභාවෙහි දිවෙලක් ද ඔහුට ලැබිණි. එහි දී සිය ගුරුහු හා තමා සමානයකු කොට සැලකූ මූසිල තෙමේ සමාන සේවයට සමාන වැටුපක් ඉල්ලා සිටියේ ය. ගෝලයා ගුරුවරයා තරම් දක්ෂයෙකැ යි රජු නොපිළිගත් හෙයින් තරුණ මදයෙන් මෙහෙයනු ලැබූ මූසිල තෙමේ

තමා හා වාදයකට පැමිණෙන සේ ගුරුහුට අභියෝග කෙළේ ය. ඒ වූකලී ගුරුවරයා ස්වකීය ශිෂ්‍යයන් විසින් අතිශය සම්මානනීය ස්ථානයෙහි ලා සැලැකුණු පෙරදිග සියලු සම්ප්‍රදායයනට එරෙහි ව එල්ල කළ අභියෝගයෙක් විය. ඒ අකෘතඥ ක්‍රියාව හේතු කොට ගෙන ගුරුහු ගේ හද කො තරම් වේදනාවකට පත් වී ද යත් ඉන් සක් දෙව් රජු ගේ (පඬුපුල්) සල'ස්න ද හුණු විය. ගුත්තිල ඇදුරු හට පත් දුක දුටු සක් දෙවිඳු එහි ලා මැදිහත් වීමට තීරණය කොට කොතරම් දුරට ක්‍රියා කෙළේ ද යත් තරග බිමෙහි දී තම ප්‍රතිවාදියා මහත් අයසකට පත් කරවීමට ගුත්තිල ඇදුරිඳුට හැකි වූවා පමණක් නො ව බරණැස් නුවරුනට දෙව් ලොවින් බට දෙවඟනන් පෑ නැටුම් සියැසින් දක ගැනීමේ අපූර්ව අවස්ථාව ද ලැබිණ. තරගයෙන් පසු සුරපුරයට පැමිණි දෙවඟනන් හමුවෙහි වෙණ වැයුමක් පවත්වන සේ සක් දෙවිඳු ගෙන් අරයුමෙක් ගුත්තිල ඇදුරිඳුට ලැබිණ. එ සේ කළ සේවයට හිලව්‍ වශයෙන් දෙවඟනෝ ඔවුන් සුරඟනන් ලෙස උපත ලැබූ සැටි ගුත්තිල ඇදුරිඳුට හෙළි කළ හ.

කාව්‍යයේ වස්තුව එයයි. එහෙත් වැත්තෑවේ කිවි එයට අත පොවනුයේ මහත් චකිතයෙනි. තම කාව්‍යයට වස්තුව කොට ගත්තේ බුදු බණ හෙයිනි. සිරි රහල් හිමියනට තම කව – කාව්‍ය ශේඛරය – පබැඳීමෙහි දී එ බඳු බිය සැක නො වී ය. ඔබ "සියල් ලෝ වියතුනට සිළුමිණි" වූ හ. විජයබාහු පරිවෙණාධිපති ව වැඩ සිටි ඔබ කෙරෙහි සදහම විවරණය කිරීමට තුබූ සාමර්ථ්‍යය අතර්කණීය විය. එහෙත් වැත්තෑවේ කිවිඳු ගේ පාණ්ඩිත්‍යය උසස් තැනෙක නො වැජැඹිණ. එතෙකුදු වුවත් තම දැනුම් පමණින් එ වැන්නක් කිරීමට තැත් දැරීමෙහි වරද කිමෙක් ද? සරසවිය එයට මෙසේ පිළිතුරු දෙයි.

"පරසතු මලින් පුද
ලද මුනිසඳුට දිය නඳ
වන පස මලින් පුද
කළැ'යි පවසනු කවර වරද ද"

සිරිත් පරිදි කාව්‍යය ඇරැඹෙනුයේ නමස්කාරයෙනි. ඉක්බිති එනුයේ ඒ යුගයේ ශාස්ත්‍රානුග්‍රාහකයකු වූත් කවියා ගේ අනුග්‍රාහකයා වූත් හලාවත ජයපාල මන්ත්‍රීවරයා පිළිබඳ ව ස්තුති මුඛයෙන් කියැවුණු පද්‍ය කිහිපයෙකි. ඉක්බිති දක්ෂ තෙලි පහර කිහිපයෙකින් බුදු සිරිත පිළිබඳ දළ හැඩයක් ඇඳ දක්වන කවියා සැණෙකින් ම භික්ෂූන් සාකච්ඡාවෙක යෙදී හුන් ධම් සභා මණ්ඩපය වෙතට අප පමුණුවයි. සාකච්ඡාවට මැය වූයේ නොබෝ දිනෙක මහා සංඝයා අතරෙහි භේදයක් ඇති කොට ඉක්බිති බුදු රදුන් ගේ නායකත්වයට ද අභියෝග කරමින් සිටි දේවදත්ත ගේ දුෂ්ට චේතනාවත් නින්දනීය අකෘතඥතාවත් ය.

කිසි යම් අවස්ථාවෙක හෝ සිද්ධියෙක හෝ සරලත්වයට හා ස්වාභාවිකත්වයට ද හානියක් නො කොට කවිත්වයේ උසස් ම තලයට ඉතා පහසුවෙන් ම පිවිසිය හැකි වීම අප කවියා කෙරෙහි දක්නට ලැබෙන ශ්‍රේෂ්ඨ ලක්ෂණයෙකි. මෙසේ මේ සාකච්ඡාවෙහි දී නිවන් අත්පත් කර ගැනීමට දෙව්දතු ලද අවස්ථාවක් ඔහු පැහැර හළ සැටිත් ඔහු ගේ පාපී ක්‍රියාත් විස්තර කරමින් මහ සඟහු කම්පාවට පත් වෙති. ඒ හැම සිද්ධියක ම සැබෑ කාව්‍යමය ආස්වාදනීයත්වය නිසගයෙන් ම කැවී ඇත ද එහි වැඩ හුන් සුපේශල භික්ෂූන් ගේ මුවින් නිතැතින් ගිලිහුණු සේ හඟවන උපමාවක් හෝ පාඨයක් හෝ නිසා චිත්තාකර්ෂණීය සජීවත්වයෙන් ඔපවත් වී ඇත. එබඳු එක් සිද්ධියක් භික්ෂූන් දක්නේ මෙසේ ය :

"යන ලෙස නො පැකිළී
අවා පුරයට නියැළී
කරනේ'වි මඟ හෙළී
බුදුන් මුදුනට ගලක් පෙරළී"

බුදු රදහු මෙ විට ධම් සභා මණ්ඩපයට වඩිති. සාකච්ඡාවට නිදානය වූ කරුණ ගැන අසා දෙ දෙනා අතර පැවැති භේදයට මුල් වූ අතීත කථාව ගෙන හැර දක්වති. ඒ වූකලී ''හිම පටලින් වැසී නො දිසි සිසි බිඹු සදිසි ව බවයෙන් වැසී සිටි'' කථාවෙකි.

ඒ උදේනි පුරයෙහි සැණකෙළි සමයයි. මෙහි දී නන් වැදෑරුම් විරිත් හා අලංකාර යෙදුම් ද පිළිබඳ ව නෛපුණ්‍යයක් ලැබ සිටි කවියා තම විශේෂ දක්ෂතාවන් මෙහෙයවා තම කාව්‍යය පුරා බහුල ව දක්නට ලැබෙන එකී විශේෂ ගුණාංගයන් ගේ ආස්වාදය අපට ලබා දීමට මුලින් ම අවස්ථාවක් සලසා ගනී. සැණකෙළි ගොස නගරය පුරා රැවු දෙයි. කා බී තුටු වන්නටත් කෙළි දෙළෙන් පසු වන්නටත් නුවරු කැප වෙති. තෙරපි-තෙරපී රොක් වන ජනී-ජනයා ගෙන් නගරයේ වීදි පිරී යෙයි. තාළම් හඬ, නූපුර රාවය, ගීත නාදය, (වැනෙන ගතින් හා ඔඩම් ගත් අතින් ද යුත්) බීමත් කෙළි ලොලුවන් ගේ රළු පරළු ගොස යන මේ සියල්ල අසමාන පද්‍යයෙන්, නිරතුරු ව නැඟෙන වැනි කිසි යම් තාලයෙකින් අප හිස තුළ රැවු පිළිරැවු දෙන්නට වෙයි. ''අසුරන් ජය ගත් '' දවසේ ''සුර සෙන් සැණකෙළි මෙ ලෙසේ'' කෙළින්නට ඇත. (කවියා මෙ සේ වැඩි දුරටත් පවසයි.)

බරණැස් නුවරින් පැමිණි වෙළෙඳුන් ගේ සිත සැණකෙළි ලොලින් වෙළෙයි. තමන් ''මන් තුටු කරවනු '' පිණිස ඔහු ගඳඹ ඇදුරකු කැඳවා ගනිති. එහෙත් අහෝ! තම නුවර වෙසෙන රජ වාසල ගඳඹ ඇදුරා ගේ සංගීතයට පුරුදු වූ ඔවුන් දෙ කනට ඔහු ගේ වෙණ නද අමිහිරි ය. හේ නොයෙක් අයුරින් තම වීණාව සදමින් වයයි. එහෙත් ඒ සියල්ල,

''සැරයට ළං නොවන
ළිහිණියකු අත් පසුරින
ගනිමියි තැත් කරන
එකතු මෙන් ගායනා කෙරෙමින''වැනි වෙයි.

මූසිල තෙමේ ගුත්තිල ඇදුරු යටතේ ශිල්ප හැදෑරීම ඇරඹී. එ සේ කරන හේ තම කුසලතාව වටහා ගෙන මහලු වියෙහි පසු වන තම ගුරුවර ගුත්තිලයන් වාසල ගඳඹ පදවියෙන් අස් කරවා තමා එ තැනට පත් වීමට බලාපොරොත්තු වෙයි. තමා රජු වෙතට පමුණුවනු ලබන තෙක් කල් යල් බලමින් පසු වූ හෙතෙමේ අවස්ථාව පැමිණි කල්හි තමාත් තම ගුරුනුත් එක් සම බව රජුට කියා සිටී. රජ ඔහු ගේ මානය හෙළා දකී. එහෙත් ඔහු දැක්වූ ආත්ම විශ්වාසයේත් ප්‍රගල්භතාවේත් එල ඔහුට ලැබේ. ගුත්තිල ඇදුරුහට වාසි වන අයුරින් ක්‍රියා කිරීමට රජුට හැකියාව පැවතිය ද මේ විචක්ෂණ සංගීතඥයන් දෙ දෙන අතරෙහි තරගයක් වුව හොත් ඒ වූකලී පැහැර හළ නො හැකි තරම් මහඟු අවස්ථාවෙකි. තමා අභියෝගය පිළිගන්නේ දැයි රජ ගුත්තිල ඇදුරුගෙන් විමසයි. එ බසට ගුත්තිල ඇදුරු මෙ සේ පිළිතුරු දෙයි.

''ගින්නෙන් නැඟුණු දුම්
දවත හොත් වැද මහ දුම්
එම ගිනි කඳ එ දුම්
කිමැයි නො දවා ද කැර විහිදුම්"

අඳුරෙක පෙර නිමිති දක දුකින් බර ව ගිය හදවතින් යුතු ව ගුත්තිල ඇදුරු රජ වාසලින් නික්ම යෙයි. මෙතෙක් තමා ලැබ සිටි අප්‍රතිම කීර්තිය තමා ගේ ම ශිෂ්‍යයා හා තරගයෙක යෙදීමෙන් රැක ගැනීමට ඔහුට සිදු ව ඇත. ඉක්බිති ව කියැවෙනුයේ අපේ සාහිත්‍යයෙහි ඇති අනුස්මරණීයතම පද්‍යයන් ගෙන් කිහිපයෙකි. එහි දී විරිත වෙනස් ව නැත. එතෙක් ගෙතුණු විධියේ කථානුරූප පද්‍යයෝ ම තව දුරටත් ගෙතෙති. පද යෙදුම සුහුරු ය. කට වහරට පවා හුරු ය. යෙදී ඇති පද ඉතා ම ලිහිල් ය. එතෙකුදු වුවත් කිසියම් සියුම් විධියෙකින් කළ ස්වර ගැළපීම්, කෙටි තියුණු ඒකාක්ෂර ශබ්ද, අසාමාන්‍ය එළි වැට යන මේ සියල්ලේ සංකලනයෙන් ගුත්තිල ඇදුරු තුළ පහළ වූ වේදනාව, කෝපය, ශූන්‍යතාව, තමාට කැරුණු අයුක්තියක් පිළිබඳ හැඟීම, අපේක්ෂා භංගත්වය යන මෙකී නානාවිධ මනෝභාවයක් පාඨකයා ඉදිරියෙහි නිරූපණය කිරීමට කවියා සමත් වී ඇත. ඉවසන්නට බැරි තරම් ලොව අප පෙළෙන විටෙක හෝ හැම මානුෂික ප්‍රයත්නයෙක ම නිස්සාරත්වය පිළිබඳ හැඟුමින් අප මැඬී සිටින විටෙක හෝ නොඑසේ නම් උදාසීනත්වය හේතු කොට අප අප ගෙන් ම ඉවත් වී බැහැරට සිත් යොමු කරන කලෙක හෝ අප සමහර දෙනකු සැනසිල්ල සොයනුයේ මී විතෙන් නොව අපේ ම හෘදයංගම පද්‍ය සමහරෙකිනි. එ වැනි උදාසීන අවස්ථාවල දුකට පත් මගේ ආත්මයට මේ පද්‍ය නොවරදිනසුලු දිව බෙහෙදෙක් විය.

මේ පද්‍යයන් අතරින් සෑහෙන සංඛ්‍යාවක් ම උපදේශ වශයෙන් අපේ දෛනික කථා ව්‍යවහාරයට පිවිස ඇත. තව ද එ හැම මේ කාව්‍ය නොකියැවූවනට පවා හුරුපුරුදු කියුම් ය. කලින් කියැවුණු දැයට ඉඳුරා පටහැණි බව පෙනෙතත් මේ පිළිබඳ ව අදහසක් පළ කළ යුතු ව ඇත. කවර හෙයින් ද යත්, ජීවිතයේ කටුකත්වය මෙහි මුල් පද්‍යයන් ගෙන් ප්‍රකාශිත තරම් පමාණවත් අයුරින් කවර නමුත් අන් මගෙකින් නො කිය හැකි හෙයිනි. නිදසුනක් ලෙස මෙහි පහත දැක්වෙන දෙ වැනි පද්‍යයේ අන්තිම දෙ පෙළෙහි ගැප් ව ඇති උපහාසයත් පිළිකුලත් යන දෙකේ අතිදක්ෂ සම්මිශ්‍රණය දැක්විය හැකි ය.

'දුරු කර හිරි ඔතප්
පෙන්විය දුදන ගුණ ගප්
මොහුට අප දුන් සිප්
පෙවූ කිරි වැන්න විස ගොර සප්'

'නුවණ නොසියුම් මට
ගෙන ගියෙමි සිප් නිම්මට
මා කළ නොදැන්මට
යෙදේ මූ කරන දේ දැන් මට'

මේ අතරෙහි තරගය සඳහා කටයුතු උත්කර්ෂවත් අයුරින් සකස් වමින් පැවැතිණ. අවස්ථාව සඳහා විශේෂයෙන් ඉදි කරන ලද මණ්ඩපයෙහි රජවරුන්, කුමාරයන්, වියත් බමුණන්, කවියන්, යුද්ධයෙහි මෙන් ම කලා ශිල්ප ශාස්ත්‍රාදියෙහි ද ප්‍රවීණයන් යන මෙ තෙක් දෙන ඇතුළු ව මහත් ජනකායක් රැස් ව සිටිය හ. රජ සියසුන අරා හිඳී. රජු සඳහා පැදි සයක් කියැවේ. එ තරම් වැදගත් කමක් මේ පැදිවල නැති අතර තරමක් දුරට පුන-පුනා කියුම් ද එහි දක්නට ලැබේ. හුදෙක් මේ පැදි ලියැවී ඇත්තේ පද වශිය පිළිබඳ ව කවියා තුළ පැවති මහත් රුචිය නිසා විය හැකි ය. ඒ පැදි කියවන්නා වශියට පත් වේ. පැදිවල අරුත වටහා ගන්නට යමකු තැත් නොකරනුයේ ඉන් ඇති වූ මෝහනය එ බඳු තැනෙකින් සිඳී යන හෙයිනි.

මෙ සේ වාදය අරඹේ. ගාන්ධර්වයෝ දෙ දෙන දිව්‍ය ගාන්ධර්වයන් දෙ දෙනකු මෙන් වාදනයෙහි යෙදෙති. ඉක්බිති සක් දෙවිඳු දෙන සංඥවක් අනුව ගුත්තිල ඇදුරු වෙණ තතක් සිඳී. ආශ්චර්යයෙකි! මිනිස් කනෙකින් ඉන් පෙර නොඇසූ විරූ මිහිරිතර නාදයක් සුන් තතින් නික්මෙන්නට වෙයි. ගුත්තිල ඇදුරු තම වීණාවෙහි සියලු තත් එකින් එක බැගින් සිඳ ලත් ම වීණා නාදය "සිය සිය ගුණයෙන්" දියුණුව නික්මෙන්නට වෙයි. උඩට ගත් හුස්ම පහතට නො හෙළා මුළු ලොව ම වීණා නාදයට සවන් දී සිටී. රාජ භක්තිය ගැන එ තෙක් නම් දරා සිටි ආරක්ෂක භටයන් ගේ අතින් නො දැනුවත් ම ව අවි ගිලිහී වැටෙයි. බිළිඳු දරුවෝ සිය මවුන් ගේ ඇකයෙන් වැටෙති. කුඹුරෙහි සිටින සිවුපා සත්තුත් අහසෙහි සරන සියොත්හුත් මතුරෙකින් ජප කරනු ලැබූ කලෙක මෙන් නිසල රූ බවට පත් වෙති. මෙ විට බෝසත් සක් දෙවිඳු තමාට කලින් දුන් ගුළි තුනින් එකක් අහසට විසි කෙරෙයි. පුදුමයෙකි! සිය දහස් ගණනින් කෙටෙන, දිලෙන විදුලිය සේ දෙවඟනෝ අහසින් බැස ගුත්තිල අදුරු ගේ වෙන නදට අනුව රඟන්නට වෙති, මෙහි දී කවියා තැනට ඔබින සේ ''චමත්කාරයෙන් '' මත් වෙයි. 'කාව්‍යය වූකලී සරල, සරාග, සකාම ගුණයෙන් යුත් විය යුත්තෙකැ'යි මිල්ටන් පැවැසී ය. මිල්ටනුත් සියත් ව අදහස් කළ මේ සියලු ගුණ සුරඟන රැඟුම පිළිබඳ ව කවියා කළ වැනුමෙහි අසිරිමත් අයුරෙකින් ගප් ව ඇති සේ ය. ඒ වනාහි තථ්‍ය වූ වාග්ධාරා සන්දර්ශනයෙකිඃ

'රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙළ දිදී විදුලිය පබා
රන් රසේ එක් වන ලෙසේ වෙණ නාදනූ පා තබ තබා
කම් පසේ දෙන සැර ලෙසේ දෙස බල බලා නෙත'ගින් සබා
මම් කෙසේ පවසම් එ සේ වර සුර ළඳුන් දුන් රඟ සුබා

'පුන් මදාරා මල් දමින් මුදු දිගු සුනිල් වරලස ගොතා
මන් මදා කිතු ලිය ලෙසින් උරතුර සරා දිළි මුතු ලතා
මන් නදා වන මිණි මෙවුල් නද වෙණ නදින් එක් කොට ඉතා
උන් එදා දුන් රඟ දුටොත් තව සක් සැපත් කවරෙක් පතා

පිපි සමන් කුසුමන් පටින් තන රන් හසුන් මන් මෙන් බැඳේ
ලඹ සවන් දිගු රන් පසින් දන නෙත් මුවන් බඳිමින් තදේ
මඳ පවන් වැද ලෙළ පහන් සිළු මෙන් රැගුම් දෙන රන් බඳේ
දිලි ඔවුන් රූ සිරි නුවන් වන් බඹ වුවත් දැහැනින් මිදේ

පා පියුම් බිඟු රොන් සළා වන් දිලි රුවන් නූපුර ගොසේ
පා දගම් රා නාදනූ කොට ගත් නැටුම් සුරඟන රැසේ
ලූ බැලුම් පමණින් සුරන් සිත් මත් කෙරෙත් මැයි නොකමසේ
ඒ රැගුම් රඟ දුටු දනන් නුමුළා වෙතියි පවසනු කෙසේ

'පෑ උදුල් සිතියම් ලෙසින් සිටිනේ සුරන් සහ සක් නුබේ
රූ නිමල් සුර ලිය තොසින් බැස රඟ කෙරෙත් නර රජ සෙබේ
මීරි කල් තත් සුන් වෙණින් බෝසත් ඔවුන් කරවයි ලොබේ
මේ සියල් විසිතුරු උතුම් එක තැන දැකුම් කිකලෙක ලැබේ

මේ 'ශක්ති ප්‍රදර්ශනයට' අනතුරු ව ලියැවෙන කවි දුර්වලත්වයට වැටීම අවශ්‍යයෙන් ම සිදු වන්නෙකි. එහෙත් මේ වාදයෙන් පසු ව ඇති වන සංක්ෂෝභය පිළිබඳ දර්ශනය කවියට නැඟෙනුයේ ද අද්විතීය කවිත්වයක් පිළිබිඹු කෙරෙමිනි. මෙ විට මූසිල ගේ සිත මෙන් මුළු ලොව ද අඳුරින් වැසී යෙයි. ජයග්‍රාහකයාට හරසර දක්වනු පිණිස දෙවඟනන් අහස් බිමෙහි විසුරුවා හළ සමන් මල් ලෙසින් තරු මහත් ගණනින් බැබැළෙන්නට වෙයි. තීව්‍රත්වයට පමුණුවන ලද උද්වේගී ප්‍රකම්පනයෙකින් යුත් කලබලකාරී දිනයෙකින් පසු වචනයට කැවුණු මෘදු සංගීතයෙන් අපි නැළැවිල්ලට වැටෙමු.

'හැම සිත් බැඳුම් හැම කිවි දස්කම්        දියත

බෙහෙවින් පිපෙනු තනි වදනක් තුළ    නියත'

(ටෙනිසන්)

වාදයේ ප්‍රතිරාවය තවමත් ඇසෙන නමුදු ඒ හැම සන්හඳියාවේ මතක පමණෙකි. ''ගිනියම්'' වූ සිතට මේ පද්‍යයන්හි යොදා ඇති උපමා - රූපක – එ නම් සිහිල් පහස එළවන අංගරාග, දිය වගුරුවන සඳකැන් මැණික්, සුපිපි කුමුදු මල් පොරොවාගත් පොකුණු, සඳ පහනින් නැහැවුණු මිහිතලය යන මෙ තෙක් දෑ තරම් සිසිල එළවන වෙන යමක් නො ලැබිය හැකි ය.

මාතලී විසින් පැදවෙන දෙව් රිය නැඟී දෙව් ලොව බලා අහසින් යන ගමන පිළිබඳ වැනුමෙහි වෙසෙසා සිහි කටයුතු කිසිත් නැත. එය දක්ෂ වර්ණනයෙකැ යි කීම නොපැහැදිලි පැසැසුමෙකින් එය හෙළා දැකීමෙක් පමණක් වෙයි. එ බඳු නොපැහැදිලි පැසැසුමකට වැඩි කිසිවක් ලබන්නට ඒ නොනිසි ය. සැබැවින් කියතොත් දූත කාව්‍යයන්හි කියැවෙන මොනර, තිසර, ගිරා යන මොහු නගර කෙත් වතු හා වන ගොමු මතින් පියාසර කෙරෙමින්, දෙව් රියෙහි නැඟී ගත් ගුත්තිල ඇදුරිඳු දුටු පමණට වඩා විසිතුරු දකුම් දුටුව හ.

එහෙත් එයටත් වඩා අතෘප්තිකර වූ කොටසට  තව ම අප පැමිණ නැත. දැන් අපි ප්‍රතිභා ශක්තියෙන් අතිශයින් ම අනූන වූ කවියකු සමග ඉහළ ම දෙව් ලොවේ එළිපත මත සිටින්නමු. එසේ සිටිමින් 'රළ වැලේ එකමුතුවට පීඩාවක් නො කොට දිය රැල්ලට එක් වන ඉරු රස් දහරක් සේ' බියට්‍රිස් හා කැටි ව පාරාදීසයට පිවිසෙන දාන්තේ මෙන් අජටාකාශයත් කාලයත් පිළිබඳ සීමාවන් ඉක්මවා කල්පනයේ පියාපත් මඟින් අලුත් ලොවකට පිවිසෙන්නට බලාපොරෙත්තු වමු.  එහෙත් අහො! වැත්තැවේ ගේ සුර පුර වූකලි කිසි දු සැසැඳීමෙකින් සැප යැයි අපට නොහැඟැවෙන කිසි යම් ලෞකික සැප දහස් වරෙකින් ලොකු කොට දක්වීමෙන් පමණෙකි. ඒ වනාහී සැදැහැවත් උවැසියන් සිහිනෙන් දක්නා සුරපුරෙක් පමණෙකි. එතෙකුදු වුවත් කවියා ගේ පද බැඳුම් හැකියාව ඔහු නො හැර පියා රැඳී ගනී. (ඇතැම් විට මෙ සේ නොවන්නේ දෙවඟනන් තම-තමන් ගේ පින් කම් තොරතුරු හෙළි කරන ඡේදයන්හි පමණකි. මෙහි දී කවියා ගේ පද මාලාව දෙව් ලොවේ අනුහස් පිළිබඳ ව ඔහු ගේ සංකල්පය තරම් ම නීරස ය.) පැහැදිලි දිය දහරින් යුත් ගඟුලැල්ලෙක සුව දනවන එක් බඳු බැවින් මෙන් තව දුරටත් අප නළවමින් පැදි පෙළ ගලා ගලා බසී. එහෙත් අප පොළොවෙන් ඉහළට යන බවක් නො හැඟේ. ස්වප්නමය දර්ශන අප නෙතට ලක් නො වේ. අප මෙහි ලා පමණට වඩා බලාපොරොත්තු වනු විය හැකි ය. අපේ කවියා භූම්‍යස්ථ පුද්ගලයෙකි. පෘථිවිය ඔහු ගේ විෂය මූලය යි. එහි පටු සීමා තුළ පවත්නා ඔහු ගේ ගුප්ත බලය අනන්ත වූ විවිධත්වයෙන් යුක්ත ය. එ හෙයින් දාගිය පියාපත් ඇති පක්ෂියකු මෙන් අත් තටු ගැසීම පමණක් කළ හැකි ව තිබිය දී ඉහළ ම දෙව් ලොවට යෑමට ඔහු තැත් නො දැරිය යුතු ව තිබිණි.

උපුටා ගැනීම -**අධ්‍යාපන සියවස, 1 කාණ්ඩය**

# 22. නූතන කාව්‍ය අභ්‍යාසකරණය

**නිපුණතාව :** 6.3 නූතන කාව්‍ය සාහිත්‍යයේ විකාසනය හා සුවිශේෂතා හඳුනා ගෙන කාව්‍ය විචාර සිද්ධාන්ත පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට කාව්‍ය රස විඳිමින් විචාරයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 6.3 නූතන කාව්‍ය නිර්මාණවල විශේෂ ලක්ෂණ හඳුනා ගනිමින් නිර්මාණකරණයේ යෙදෙයි.

**කාලච්ඡේද :** 05 යි.

**ඉගෙනුම් පල :**
- කාව්‍ය නිර්මාණ පරිශීලනය කර විශේෂ ලක්ෂණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- විවිධ කාව්‍ය නිර්මාණවලට පාදක වූ අද්දැකීම් විස්තර කරයි.
- කාව්‍ය නිර්මාණයට උචිත තේමා හා අද්දැකීම් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- විවිධ ආකෘතීන්ට අනුව කාව්‍ය නිර්මාණකරණයේ යෙදෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**I පෙර සූදානම :**

- කාව්‍ය නිර්මාණකරණය පිළිබඳ පොත පත කියවා දැනුවත් වන්න.
- විවිධ අද්දැකීම් පාදක කර ගෙන විවිධ ආකෘතිවලින් නිර්මාණය කරන ලද කාව්‍ය නිර්මාණ කිහිපයක් තෝරා ගන්න. (ඇමුණුම 01)
- එම පද්‍ය ද ඇසුරු කර ගෙන කාව්‍ය නිර්මාණකරණය පිළිබඳ ශිෂ්‍යයන්ට මඟ පෙන්වීම සඳහා සුදුසු ඉගෙනුම් උපකරණ හා පැවරුම් සකස් කර ගන්න.

**II ඉගෙනුම සංවර්ධනය :**

- පහත සඳහන් ප්‍රවේශ අතරින් සුදුසු ප්‍රවේශයක් හෝ වෙනත් නිර්මාණශීලී ප්‍රවේශයක් යොදා ගෙන පාඩම ආරම්භ කරන්න.

උදා:- * අනිර්දිෂ්ට නූතන කවියක් ඇසුරින් එම කවියට පාදක වූ අද්දැකීම පිළිබඳ සාකච්ඡා කිරීම (ඇමුණුම 01)
- * අභඹු ලෙස තෝරාගත් ශිෂ්‍යයකුට ජන කවියක් ගායනා කිරීමට අවස්ථාව ලබා දී එම කවියේ අද්දැකීම, ආකෘතිය හා භාෂාව පිළිබඳ සාකච්ඡා කිරීම
- * නූතන කාව්‍ය නිර්මාණයක, නිර්මාණ පසුබිම පිළිබඳ පොත පතෙහි/ජන මාධ්‍යයෙහි පළ වූ විස්තරයක් ශිෂ්‍යයන්ට ඉදිරිපත් කිරීම (ඇමුණුම 02)

- ප්‍රවේශයේ දී මතු වූ කරුණු ද ඉවහල් කර ගෙන කාව්‍ය නිර්මාණකරණය පිළිබඳ පුළුල් සාකච්ඡාවක් ගොඩනඟන්න.
- සෑම කාව්‍ය නිර්මාණයකට ම කිසියම් අද්දැකීමක් මුල් වී ඇති බවත්, කවියා විසින් එම අද්දැකීම ප්‍රතිනිර්මාණය සඳහා සුදුසු කාව්‍ය ආකෘතියක් හා උචිත භාෂාවක් යොදා ගෙන ඇති බවත් නිදර්ශන සහිත ව පෙන්වා දෙන්න.
- නූතන කාව්‍ය රසාස්වාදය හා විචාරය පිළිබඳ පෙර පාඩම්වල දී ඉගෙන ගත් කරුණු ඇසුරෙන් කාව්‍ය නිර්මාණයක,
  - * තේමාව/වස්තුවිෂය
  - * කවියාගේ දෘෂ්ටිය
  - * අරමුණ
  - * කාව්‍යෝපක්‍රම

* භාෂා භාවිතයේ සුවිශේෂතා
* විරිත
* ආකෘතිය යන කරුණු නැවත සිහිපත් කර පද්‍ය නිර්මාණයේ දී එම කරුණු පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් බව පෙන්වා දෙන්න.

- කවියකු තුළ පැවතිය යුතු,
  * ප්‍රතිභාව
  * ව්‍යුත්පත්තිය
  * සතතාභ්‍යාසය යන ගුණාංග පිළිබඳ සාකච්ඡා කරන්න.
- පන්තියේ ශිෂ්‍යයන් කණ්ඩායම් කිහිපයකට වෙන් කරන්න.
- එක් එක් කණ්ඩායමට පද්‍ය නිර්මාණයක් ගොඩ නැගීම සඳහා සුදුසු අද්දැකීමක් තෝරා ගැනීමට මඟ පෙන්වන්න.
- කණ්ඩායම තෝරා ගත් අද්දැකීම පදනම් කර ගෙන පහත සඳහන් කරුණු කෙරෙහි ද සැලකිලිමත් වෙමින් පද්‍ය පන්තියක් නිර්මාණය කිරීමට යොමු කරන්න. (කණ්ඩායම් වශයෙන්)
- එම කාව්‍ය නිර්මාණ ඇගයීමට ලක් කරන්න. සාර්ථක නිර්මාණ බිත්ති පුවත්පත්, සඟරා ආදියට යොමු කරන්න.

**III තක්සේරුව හා ඇගයීම**

- ශිෂ්‍ය නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ඇගයීමට ලක් කරන්න.
- සාර්ථක නිර්මාණ බිත්ති පුවත් පත්, සඟරා හා ජාතික පුවත්පත් වෙත යොමු කරන්න.
- කේවල වශයෙන් ද පද්‍ය නිර්මාණ කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

මුඛ්‍ය පද **(Key Words)** :

* **ප්‍රතිභානය /ප්‍රතිභාව - Creativity**

ප්‍රතිභානය නම් වැටහෙන නුවණය. පෙළ සකු බස්හි ප්‍රතිභානය යන්නෙන් බැබළීම, දර්ශනය වීම, ආත්මීය වශයෙන් කෙරෙන එළිදරව්ව හෝ ප්‍රකට වීම, විශද චින්තනය යනාදි අරුත් ලැබේ.

පාලි ඇදුරෝ මෙහි නිරුක්තිය මෙසේ දක්වති.

''පති සම්මුඛා භවන්ති - ඤෙය්‍යා එතායානි පටිභා'' (පූර්ව ජන්මයෙහි පුරුදු කළ බැවින් උපනිශ්‍රයාදි ප්‍රත්‍යය බලයෙන් එකෙණෙහි උපන් ප්‍රඥාව පටිභා යනුයි.)

සාහිත්‍ය විෂයෙහි ලා වෙසෙස් කොට සැලකෙනුයේ කාව්‍ය නිර්මාණය සඳහා වන්නා වූ ධී ශක්තියයි.

කාව්‍ය හේතු දක්වන දණ්ඩ්‍යාචාරීහු ප්‍රතිභාව මෙසේ දක්වති:

නෛසර්ගිකීච ප්‍රතිභා - ශ්‍රුතඤ්ච බහු නිර්මලම්

අමන්දශ්චාභියොගොස්‍යාත් - කාරණම් කාව්‍ය සම්පදඃ

මේ අනුව කාව්‍ය සම්පත්තියට මුඛ්‍ය හේතු වශයෙන් සැලකෙනුයේ නෛසර්ගික ප්‍රතිභාවයි. ප්‍රතිභාව කවිත්වයෙහි බීජයයි. වාමනාචාරීහු "කවිත්ව බීජං ප්‍රතිභානාම්'' යනුවෙන් හඳුන්වති. පහත දැක්වෙන ශ්ලෝකයෙන් මෙකරුණ වඩාත් විග්‍රහ කෙරේ:

'ප්‍රතිභෛව ශ්‍රුතභ්‍යාස - සහිතා කවිනාම්ප්‍රති
හේතුර්මෘදම්බු සම්බන්ධ - වීජව්‍යාත්තිර්ලතාමිව'

(මැටි හා ජලයාගේ සංයෝගයෙන් වැලක් හට ගැනීමට බීජයාගේ ඇති ශක්තිය මෙන් ශ්‍රැතය, අභ්‍යාසය යන දෙකින් උපස්තම්භක වූ ප්‍රතිභාවම කවිත්වය පෝෂණය කරයි.)

මේ ප්‍රතිභානය හෙවත් කවි ශක්තියම හේතු කොටගෙන සියලු කල්හි එකඟ වූ සිත්හි ශබ්දාර්ථයාගේ වැටහීමද නොකිලිටි පදයන්ගේ පහළ වීමද සිදු වන බව ආලංකාරිකයෝ දක්වති.

ප්‍රතිභා හෙවත් කාව්‍ය ශක්තිය අතිශයින් දුර්ලභ වූවක් බව අග්නිපුරාණයේ මෙසේ දක්වා ඇත්තේ ය.

'නරත්වං දුර්ලභං ලෝකෙ - විද්‍යා තත්‍ර සුදුර්ලභා
කවිත්වං දුර්ලභං ලෝකෙ - ශක්තිස්තත්‍ර සුදුර්ලභා

රාජශේඛර නමැති සංස්කෘත කාව්‍යාලංකාරිකයා පවසන අන්දමට ප්‍රතිභාව යනු කවියාගේ අභ්‍යන්තරය ආලෝකමත් වීමේ ශක්තියයි; ඥාන ප්‍රභාවයි. ඒ මගින් ඔහුට නොපෙනෙන්නා වූද දුරස්ථ වූද බොහෝ දෑ දැක ගත හැකි වන්නේය. සහෘදයා හඳුනන, එහෙත් ඔහුට පහසුවෙන් නොපෙනෙන දෑ පෙන්වා ලන හෙයිනි, කාව්‍යයක නිර්මාණයක් ඇති බව පෙනී යන්නේ. යට කී ඥාන උජ්ජ්වලිතතාව ආභ්‍යන්තරික යැයි රාජශේඛර දක්වනුයේ අන්ධ මිනිසකුට වුවද කවියෙකු වීමේ කුසලතා පවත්තා බැවිනැයි සඳහන් කරමිනි.

ප්‍රතිභාවේ ප්‍රධාන අංග දෙකක් වෙතැයිද හේ පෙන්වා දෙයි. එනම්, කාරයිත්‍රී සහ භාවයිත්‍රී යනුය. කාරයිත්‍රී ප්‍රතිභාව නිර්මාණකරණය සම්බන්ධයෙන් සාහිත්‍යකරුවා තුළ පැවතිය යුතු අතර, භාවයිත්‍රී ප්‍රතිභාව සාහිත්‍යකරුවා විසින් නිර්මාණය කරන ලද කෘතියේ රසාස්වාදය උදෙසා සහෘදයා තුළ තිබිය යුතුය.

ආනන්දවර්ධනගේ විවරණය වඩාත් අර්ථවත් වේ.

'ප්‍රතිභා අපූර්වවස්තු නිර්මාණක්ෂමා ප්‍රඥා; තස්‍යා විශෙෂො රසාවෙශ වෛශද්‍ය සෞන්දර්ය කාව්‍ය නිර්මාණක්ෂමත්වම්.' (ප්‍රතිභා යනු අපූර්ව වස්තු නිර්මාණයෙහි ශූර ප්‍රඥාවයි. විශේෂයෙන් රස ආවේශ කරන ලද නිර්මල සෞන්දර්ය කාව්‍ය නිර්මාණයෙහි හුරුකමය.)

සුරවීර, ඒ. වී., **සාහිත්‍ය විචාර ප්‍රදීපිකා**, 2005, 140-141 පිටු.

* **ව්‍යුත්පත්තිය**

ගුණ දෝෂ පරිඥානය, ව්‍යක්තභාවය යන අර්ථ ගනී. සාහිත්‍ය ක්ෂේත්‍රයෙහි ව්‍යුත්පත්තිය යන්නෙන් මේ අර්ථ දෙකේම සංකලනයක් ගම්‍යමානය. 'උචිතානුචිතවිවෙකො ව්‍යුත්පත්තිඃ' යනාදි කාව්‍ය මීමංසා පාඨය අනුව ඉන් උචිතානුචිත විවේකයෙහි අපූර්ව බුද්ධිය යන අර්ථ ලැබේ. ව්‍යුත්පත්තිය ඇති වීම සඳහා බාහුශ්‍රැත්‍යය හෙවත් ඇසූ පිරූ තැන් ඇති බව අවශ්‍යය. සංස්කෘත විචාරකයන්ගේ මතය අනුව කාව්‍ය නිර්මාණයෙහි කුසලතා ලබන්නේ ප්‍රතිභාව, ව්‍යුත්පත්තිය, සතතාභ්‍යාසය යන ගුණයන්ගෙන් හෙබි තැනැත්තේ ය.

සුරවීර, ඒ. වී., **සාහිත්‍ය විචාර ප්‍රදීපිකා**, 2005, 201 පිටු.

* **සතතාභ්‍යාසය**

නිරන්තරයෙන් අදාළ කාර්යයෙහි යෙදීමෙන් පුහුණු වීම, ප්‍රගුණ කිරීම.
සාහිත්‍ය කලා නිර්මාණ ක්ෂේත්‍රයෙහි අඛණ්ඩව ඒ කටයුතුවල නිරත වීම අපේක්ෂිතය.

සුරවීර, ඒ. වී., **සාහිත්‍ය විචාර ප්‍රදීපිකා**, 2005, 217 පි.

**ගුණාත්මක යෙදවුම්** : * අනිර්දිෂ්ට නූතන කාව්‍ය නිර්මාණ කිහිපයක් (ඇමුණුම 01)
* ඇමුණුම 02

**තක්සේරුකරණය හා ඇගයීම් නිර්ණායක :**

- කාව්‍ය නිර්මාණයක ලක්ෂණ පැහැදිලි කරයි.
- කවියකු සතු විය යුතු ගුණාංග විස්තර කරයි.
- කාව්‍ය නිර්මාණ සඳහා සුදුසු අද්දැකීම් තෝරා ගනියි.
- විවිධ ආකෘති භාවිත කරමින් පද්‍ය නිර්මාණය කරයි.
- පද්‍ය නිර්මාණයේ දී කාව්‍යෝපක්‍රම භාවිත කරයි.

**පරිශීලනීය ග්‍රන්ථ** :

- කරුණාරත්න, අශෝක - සාහිත්‍ය විවේචන
- රණවීර, ආරියවංශ - රන්රෝස
- විජේතුංග, රත්න - ඡන්දස් හා සිංහල පද්‍ය සම්ප්‍රදාය
- සිලෝගම, ටිකිරි බණ්ඩාර - කාව්‍ය නිර්මාණයට පෙරහුරුවක්
- සුරවීර, ඒ. වී. - නිර්මාණ පසුබිම
- සුරවීර, ඒ. වී. - සාහිත්‍ය විචාර ප්‍රදීපිකා

ඇමුණුම 1 - **නූතන කාව්‍ය නිර්මාණ කිහිපයක්**

**රාත්‍රිය**

සමන් පිච්ච මල් ඉහිරුණු
නිල් තණ කොළ පිට්ටනියක්
වගෙයි අහස අන්න බලනු
කොච්චර ලස්සන ද රෑට

බකමූණෝ පියාඹතී
අනිත් කුරුල්ලෝ නිදතී
බෝ අතුවල එල්ලීගෙන
මාවවුලෝ කෑ ගසතී

මගෙ හුරතල් අක්කාගේ
මාලේ මුතු ඇට වාගේ
මේ වැටෙන්නෙ පිනි බින්දුත්
හදමු එකක් ඒ වාගේ

හඳහාමී අප දිහාව
එබී බලයි පා හිනාව
සිසිල් සුළං දූල් විඳින්ට
දොරට යන්ට හොඳ වෙලාව

අහසේ තරු වැල් පිරිලා
පොළොවේ සුදු මල් පිපිලා
මඟුල් ගෙවල් දෙකක් වගෙයි
මේ දෙපළම හැඩ ගැහිලා

**ඇස්. මහින්ද හිමි**

**හේරත් හාමි**

අලියා වැටුණු වැව සිටි හේරත් හා මී
මා වැනියකු වුව ද මම වැදගත් වී මී
මිනී කපන මුත් ඒ හේරත් හා මී
ඔහු මට වඩා විසි තිස් ගුණයෙන් දෑ මී

ඉස්පිරිතාලයේ අලියා වැටුණු වැ වේ
මළ මූ ඇදීමෙන් ඔහුගේ දවස ගෙ වේ
මාසික පඩිය ලැබ පෙන්නූ නමුදු සු වේ
ඔහු දුටු සැම විට මා දුක්මුසු ව තැ වේ

ඇඟපත දූඩිය හැඩ ඇත හීන් දෑ          රිය
වයසක් නොමැත - නාඹර ඉලන්දා          රිය
කිසිවෙක් තව ම නැත පැවසුමට බා          රිය
මට පුදුමයකි ඔහු මේ කරන කා          රිය

මා වැනියකුට තද සංවේගය ම දි          දී
හැමදා උදේ ඔහු මගෙ වැසිකිළිය අ          දී
හදිසියෙ යමකු මළහොත් දොස්තර ද ව          දී
අප ඉදිරියේ ඔහු මළකුණ කපන ල          දී

ගොවි - කම්කරු - රදල උඩරට කිසිම කු          ලේ
වෙන කිසි කෙනෙක් තව නැත මේ වැඩය කෙ          ළේ
දූන ගන්නට කිසිදු වරදක් නොමැත මො          ළේ
කිසි අනතුරක් නොකරයි කිසිවෙකුට කැ          ලේ

අවනත සිනා රැලි වන නිතර ම පතු          රයි
හැම වදනක් ම අවිහිංසක ව ම මතු          රයි
හැමදා වගේ සවසට බොන ගිනිවතු          රයි
ඔහුගේ පපුව දූඩි කරුණාවෙන් උතු          රයි

පිහියා පහර ලැබ ඔහු ගේ නැගණි අ          නේ
මළ හැටි සිහි ව මගෙ නෙත තෙත ගතිය දැ          නේ
නෑඬුව නමුත් ඔහු නැගණිය මැරුණ දි          නේ
උණුගත් දාට වැලපෙයි නෙත කඳුළු පෙ          නේ

නැගණිය මළ විටදි දොස්තර සමග ගො          සින්
ඇගෙ කය කපන ලදි හේරත් හාමි වි          සින්
බැන්නත් ඔහුට මේ ගැන ගම නරක බ          සින්
ඔහු හට වැඩක් නැත ලොව ඇති රිහිරි ම          සින්

නූපන් නිසා දනවත් මහරු පාය          ක
පන්සල වෙතට යයි හැම විට ම පෝය          ක
අලුතෙන් හැදුව වෙහෙරට ඔහු ද දාය          ක
ඊටත් වඩා සලකයි අයියනාය          ක

**විමලරත්න කුමාරගම**

## දිවා භෝජනය

අට වයස් නොදරුවා
හැට පිරුනු කලු සමින්
වැසුනු ඇට සැකිල්ලකි

එහෙත් ඔහු සිනාසෙයි
දත් පුරා සිනාසෙයි
කට පුරා සිනාසෙයි

ඇට පෙනෙන මුහුන මත
දෙකන තෙක් දිග් ගැහුනු
සිනාවෙන් ඔහු මුහුන
පුරුදු නැති සිත්තරෙකු

නොංචි කෝලමට කැපූ
සරිය වෙස් මුහුනකට

වමත පොල් කටුවෙ සිට
කට ලඟට ගොස් වැටෙන
ලී කැබැල්ලෙකි සුරත

බට්ටෙක් මෙන් ඔර්ලෝසුවෙ
ගනන් බලා තුන්විඩයක්
උඩහට පහලට ගිය අත
හිස් පොල් කටුවේ
එකවර නැවතින

''පොඩි ලමයෝ
බත්
ඉවරද කාලා''

පුදුමයෙන් මෙන් බලා මා දෙස
දෙකන තෙක් දික් සිනා පාලා
විසි කොට පොල් කටුව කානුවෙ
පිසදමයි අත ඉරුනු සරමේ

**සිරි ගුනසිංහ**

**වක්කඩ බඳිමු**

කළුකර ගෙන හතර වටින් වැහි කළුවක් මුදුන් වෙන	ව
හනිකට බැඳපන් වක්කඩ, මේ සැරෙ නොවැරදි වහින	ව

දෙයියෝ අපි ගැන බලලා වැස්ස වලාහකය එව	ල
පොදේ නොකැඩී වැස්ස වැහැල, පිරෙනව ඇල දොළ	ඉතිරිල

බැඳපන් වක්කඩ හනිකට ඔන්න ඔන්න පොද වැටෙන	ව
පොළව සතුටෙ 'හූම්' ලනව මෙන්න බලාපන් දූනෙන	ව

ඊයෙ දවල් මම ආවේ මෙහේ නිකම් ඇවිදින්න	ට
පොළව පැලිල පිපාසයෙන් ඇරිල තිවුණ ආකාසෙ	ට

අල්ල තියල මම බැලුවම උණුහුම මගෙ අතට දුනු	ණ
'හෝස්' ගාල ඒ මොහොතෙම දෙයියන් ගැන මට	සිහිවුණ

දෙයියො තමයි වැස්ස එව්වෙ, අපෙ ගින්දර ඇහින්   දැකල
වැස්ස වැහැපන් දෙයියනි, ඉවුරු දෙබෑ ගොස් ඉතිරි   ල

වැහි පොද එක දෙක වැටෙනව බලාපන්කො පොළව   උඩට
පොළව ලොවිනවා වැහිපොද දිව දික්කරලා හනික   ට

හෙණ ගහලා ගොරවාලා වැහැපන් දෙවියනි හනික   ට
පොළව අනේ 'හූම්' ලලා බලා හිටියෙ මේ මොහොත   ට

ගැබ් ගැනිලා, කිරි එරිලා මහ පොළවට සැන හෙන්න   ට
වැස්ස වැහැපන් දෙවියනි විළි වැදිලා උපදින්න   ට

කළුකර ගෙන හතර වටින්, වැහි කලුවක් මුදුන් වෙන   ව
හනිකට බැඳපන් වක්කඩ, මේ සැරෙ නොවරදි වහින   ව

**ගුණදාස අමරසේකර**

## පොඩි මල්ලියෙ

කුරුල්ලො අඹලා
සත පනහේ කුලිය ගන්ට
ගල් දුන්නත් අතට අරන්
දවස පුරා වෙලේ රකින
පොඩි මල්ලියෙ,

උඹේ කකුල් රිදෙනව නම්
වෙල අද්දර ගල් ඇන්දේ වාඩි වෙයන්
ගල එතකොට පුටුවක් වෙයි

ලිප් දාහේ ඉර ඇවිලී
දන විට පොඩි මූණ නුඹේ
වෙල අද්දර නුග සෙවනේ ඇඳිගනින්

ළා දළු චාමර සෙලවී
නුඹට පවන් සලයි මලේ
අතු අග හොටවල් සෙලවී
නුඹට ගීත ඇසෙයි මලේ

ඉර රතුවී නිමී යද්දි
දාඩිය කුණු කඳුළු එක්ක
තොටමුණ ළඟ ගඟට බසින්

සීතල රැලි අත් සීයෙන්
උඹ වටකර තුරුළු වෙවී
ගඟ පහළට ගලා යාවී
දිය සුළියේ ඔඩොක්කුවේ
නැළවී ඉඳ - කිමිදී ඉඳ ගොඩට වරෙන්
මලේ මලේ අඳුර එද්දි

හෙල් මැලි සෙවණැලි නලියන
ගුරු පාරෙන් ගෙදර යමන්
වැලිකැට සුදු පලසක් වී
සිඹ ගනීවි දෙපා නුඹේ

ඈත සිටන් කඩුල්ල ළඟ කිකිලී හඬගා කීවේ
නැට්ටක් නැති ගෙඩියක් අද නුඹේ නමට දාපු වගද?

සඳ එළියේ රැලි විසිරෙන චීත්තෙ යට
ගුළි වෙන විට ලනු මැස්සේ
අන්න බලන් උඹෙ තනිවට
අහසෙත් මල් - පොළවෙත් මල්
ගින්දර පාටින් බබලන

මලේ-මලේ නින්දට පෙර
ඩිංගක් මේ ගැන හිතපන්
මේ සේරම තෑගි ලැබුණෙ ලොවින් - නුඹට
මොනවද මල්ලියෙ දෙන්නේ නුඹෙන් ලොවට?

එක පාරට
ටකේ ගසන්නෙපා මලේ,
කුරුල්ලංට
ඉඩක් දියං
එක කරලක් ඇදං යන්ට

**පරාක්‍රම කොඩිතුවක්කු**

## සමුගැනීම

දැන් රාත්‍රී කාලයයි
තාරකා ඇසිපිය නිසල වෙයි
නෙත් අගින් බේරී පිනි වැටෙයි
සුළඟේ සුසුම් රැල් සීතලයි
සෙහොයුරනි, දැන් අප ඉතින්
සමුගත යුතු ව ඇති වෙලාවයි

ආ ගමන හරි දුෂ්කරයි
අප විටෙක ඇද වැටුණා සැබැයි
එහෙත් නතරව එතැන
වැලපිය යුතු නොවෙයි - අප යා යුතුයි

රළක් නම් මුහුදේ
නිදා නොඉඳියි වෙරළකට මුහුණ දෙයි
සඳත් රෑ මුදුනට ඇවිත්
තම නිම් වළල්ලෙන් සමු ගනියි

බලන් අර රණගොස නැගෙන තැන
ඒ ජීවිතේ පෙරමුණයි
ඉතින් සමුගන්නට කාලයයි
වහා අප එහි යා යුතුයි

ඇසක් තටු හකුළා ගුලි වෙමින්
අඬන්නට වාගේ හදයි
නමුත් සොහොයුර අපට අකැපයි
ඔව් - කඳුළු සීතල වැඩියි

එළිය හඳුනන රෑ කුරුල්ලෙක්
උදෑසනකට අඬ ගසයි
මෙතෙක් තුඩ ගෑ තිත්ත පළවැල
හොට ඇරී බිම පතිත වෙයි

හෙට පිපෙන මල්, අද රෑ ම
කට කොනින් හිනැහෙනවා පෙනෙයි
ඉවසන්න ඒවා පිපෙයි
දැන් පෙනෙන්නේ තවමත් ටිකයි

හෙටත් අද වගෙ නම් ඉතින්
අප කොහේ හෝ තැන තැන ඉඳියි
නමුත් ඒ ඇත්තක් නොවෙයි
අප මුණ ගැහෙයි - හෙට මුණ ගැහෙයි
කොහේදී හරි නොවෙයි හෙට අප
එක ම තැනක දි මුණ ගැහෙයි

**රත්න ශ්‍රී විජේසිංහ**

**ගඳයාගේ සුවඳ සිහින**

උඹ බලන්න කාණ්ඩයක් හතේ කොළණියට ආ බව
උඹ නොකියූ හැවොම කියූ කාරණාව පහද ගතිමි
උඹ ආපහු එවල තිබුණු ලියුම් මිටියෙ දැනිච්චි බර
මං උස්සන මුට්ට අතර වත් මට දැනිලා නොතිබුණි

කුණු එළවළු ඇදල ඇදල පට බැඳිච්චි ගඳයා නමට
සෙනේ දිදී සිනාවකින් උඹ විතරයි සුවඳ කැව්වේ
නගා දීග ගිය කාලෙක අම්මප මං හිතා උන්නෙ
කැනල් පාරේ ලැලි මැඳුරට නංගියෙ උඹ වඩම්මන්න

උඹ දකිද්දි රතු ගැහිච්චි මගේ අඟුරු කළු මූණට
උඹේ සෙනේ හිංද තමයි පවුඩර් බිංදුවක් ඉහුණෙ
බතික් කමිසයට හැඩ බව උඹ මට පැවසූ දා සිට
වැඩ අහවර වී නාගෙන නිදාගත්ත ඇඳල රෑට

කැනල් පාර දිගේ උඹේ මංගල පෙරහැර යනකොට
ඇත ඉඳං අත වනන්න අවසරවත් දෙනවද මට
මේ පාරෙම බයිසිකලෙන් එහෙ මෙහෙ ගිය අපේ මතක
නොහැකිය මට මුහු කරන්න ඇලේ පිළී කුණු වතුරට

උඹෙ සැහැල්ලු සිනාවලින් මගේ හිතේ පිරිච්චි බර
තුනී වන තුරා තව තව මුට්ට පෙට්ටි උස්සන්නම්
උඹේ හිතට පුංචි බරක්වත් දැනුණොත් දන්නාපං
ඒ දවසට කොහෙ හිටියත් යාළුකමට මං එන්නං

**මහින්ද ප්‍රසාද් මස්ඉඹුල**

**කපුටන්ට කෝ උත්තර?**

මේ දූනුත් පිටකොටුවෙ
ජෑම්, බෝ, කොට්ටම්බා පැල් තුළ
පිපිරෙමින් ඇති කපුටු බිත්තර
පැටව් එළියට ආවම
උන් අහන පැනවලට
කපුටන්ට කෝ උත්තර?

අම්මා ඉදලත් තුඩින් අරගෙන
පාන්දර කූඩුවෙන් ඉගිලෙයි
මල් උයන් - ලොකු මිදුල් - මංපෙත්
ඉදල් පහරින් මෙල්ල කර එයි
කොතෙක් කෙරුවත් නරුම තුරු පත්
පුරුදු විදිහට හෙටත් ගිලිහෙයි
අම්මෙ අපටත් පුංචි මිදුලක්
තියෙන තැනකට නොයන්නේ ඇයි?

තාත්තා මල්වත්ත පාරේ
සුදු යකඩ මුදු, මාල විකුණයි
කටු ඇනී වණවුණු පියාපත්
දවස ගානෙම බඳෙන් ගිලිහෙයි
බලන් ඉද්දිම වගේ හවසට
තාත්තගෙ යටි පතුල් ඉදිමෙයි
කහ කුරුල්ලන් - නිල් කොබෙයියන්
වගේ අපටත් ඉන්න බැරි ඇයි?

මේ දූනුත් පිටකොටුවෙ
ජෑම්, බෝ, කොට්ටම්බා පැල් තුළ
පිපිරෙමින් ඇති කපුටු බිත්තර
පැටව් එළියට ආවම
උන් අහන පැනවලට
කපුටන්ට කෝ උත්තර?

**රුවන් බන්දුජීව**

**ඇමුණුම 1 - නූතන කාව්‍ය නිර්මාණයක නිර්මාණ පසුබිම - ඒ. වී. සුරවීර**

''මේ හැරුණ විට කවීන්, මා හිතන්නේ අනෙක් සාහිත්‍යකරුවන්, ලේඛකයන් මෙන් ම මානසික අත්දැකීම් ආදිය ඉදිරිපත් කරනවා, විග්‍රහ කරනවා. සමාජයේ නැති නම් මිනිසුන් අතර ඇති වන සම්බන්ධකම්, පුද්ගල සම්බන්ධකම්, ගැටුම් ආදිය විග්‍රහ කරමින් පද්‍ය මාර්ගයෙන් ඉදිරිපත් කරනවා. ඒ අතර කවීන්ගේ සමකාලීන සමාජය, සමාජ ප්‍රශ්න පිළිබඳව, මේවා ගැනත් කිසි යම් හැඟීමක්, කිසි යම් ආකල්පයක් කිවියාට තිබිය යුතුයි. ඉතින් ඒ නිසා හැකිතාක් දුරට සංක්ෂිප්ත ලෙස අදහස් ඉදිරිපත් කිරීමටත්, මානසික හා සාමාජික සම්බන්ධතා විවරණය කිරීමටත් කවියා පෙලඹෙනවා. සමකාලීන සමාජ ප්‍රශ්න පමණක් නොවෙයි ඒවා ගැන යම් අදහසක් දැක්වීම, යම් ආකල්ප සෙවීම යනාදි කරුණුත් වැදගත් බවයි මගේ හැඟීම.

මා මේ කරුණු ටික ඉදිරිපත් කළේ මගේ කව්පංති තුන ගැන කතා කිරීමට ප්‍රවේශයක් වශයෙන්. දැන් මගේ ''මියගිය උවැසිය'' මම එය කියවන්නම්.

පිරුවානා පොත් වහන්සෙ
කනප්පුවෙහි පෙරළී ඇත
මිදුල පුරා වියළුණ කොළ
ඒ මේ අත විසිර තිබේ.
මිදුලෙ පහන් පැලේ නිතර
සැලුණු දැල්ල නිවී ගොස්ය.
ඉඳ හිට ගේ පිළිකන්නේ
බල්ලෙකු උඩු බුරනු ඇසේ'

දැන් මේ කවිපෙළ, මෙය සාර්ථක වුණා ද නැද්ද යනු කීම මට අයිති වැඩක් නොවෙයි. මේ කවිපෙළ ලිවීමේදී මගේ අරමුණ වුණේ කිසි යම් මහලු කාන්තාවක්, මහලු ගැනියක් මිය යාමත් ඒ මිය යාම නිසා මා තුළ ඇති වූ අදහසක් - හැඟීමක් ඉදිරිපත් කිරීමයි. මෙය රචනා කිරීමට යම් අත්දැකීමක් තියෙන්ට ඕනෑ. මා කුඩා කාලෙදි, මා හිතන්නේ වයස අවුරුදු අට නවය විතර කාලෙදි ලැබූ අත්දැකීමක් පදනම් කර ගෙනයි මෙය ලියුවේ. හැබැයි ඒ විතරක් මදි. මේ කාව්‍යය ඉදිරිපත් කිරීමේදී වර්තමානයෙන් - වර්තමානයෙන් පමණක් නො වේ: පාරම්පරික සිරිත්-විරිත්වලිනුත්, ජපන් කාව්‍ය සම්ප්‍රදායෙනුත් ආභාසයක් ලැබුවා. සමහර ජපන් කවීන් කරන්නේ ඉතා මත් කෙටියෙන් අත්දැකීමක් ඉදිරිපත් කිරීමයි. ඒ කවීන් රේඛාවක් දෙකක් ඇඳලා කිසි යම් අදහසක් ඉදිරිපත් කරනවා. මේ අනුව, මෙහිදී ඉතා මත් සංක්ෂිප්ත ලෙස අදහස් ඉදිරිපත් කළා. මේ ජපන් පද්‍ය කලාවේ තවත් ලක්ෂණයක් තිබෙනවා. එනම් නියම මාත්‍රා ගණනක්. මාත්‍රා පහයි, හතයි. ඒ කාව්‍යයේ මේ මාත්‍රා පහ සහ හත නියම විදියට යොදනවා. මගේ කාව්‍යයේ මේ මාත්‍රා යෙදීම නොවෙයි අර සංක්ෂිප්ත ක්‍රමය අනුගමනය කළා.

මේ හැරුණු විට මේ කවිය රචනා කිරීමේදී මට වෙනත් ආභාසයකුත් ලැබුණු බව මතක් වෙනවා. ඒ තමා සත්‍යජිත් රායිගේ චිත්‍රපටයක්. '**අසිත් සංකාර**' නම් චිත්‍රපටිය. මේ සභාවේ ඇති ඒ ඒ චිත්‍රපටිය බැලූ අය. ඒ 'අසිත්' කියන තැනැත්තා නගරයට ගොස් ආපසු එනවා, ගමට. කල්කටාවේ සිටින ඔහු තමාගේ මව මිය ගිය අවස්ථාවේ ගමට එනවා. මේ වැදගත් අවස්ථාව, මවගේ මරණය ඉතා මත් සංක්ෂිප්ත ලෙස එක එල්ලේ ම සිද්ධි හා හැඟීම් ප්‍රකාශ වන විදියට, ප්‍රබල වින්දනයක් ජනිත වන හැටියට සත්‍යජිත් රායි චිත්‍රපටියෙන් ඉදිරිපත් කරනවා. මා හිතන්නේ මේ දර්ශනය මගේ හිතේ තැන්පත් වුණා. එයත් මේ කාව්‍යය ලිවීමේ දී ආදර්ශයක් වූ බව සිතන්ට පුළුවන්. මේ අනුව කිව හැකියි ජපන් පද්‍යයෙන්, කාව්‍ය සම්ප්‍රදායෙන්, **අපූර් සංසාර්** චිත්‍රපටයෙන්, මේ හැම මාර්ගයෙන් ම මා ආභාසය ලැබුවා.

සුරවීර, ඒ. වී. ***නිර්මාණ පසුබිම,*** 2000, 89-91 පි.

# 23. නාට්‍ය අභ්‍යාසකරණය

**නිපුණතාව :** 5.0 නාට්‍ය සාහිත්‍යයේ සුවිශේෂතා හා විචාර සංකල්ප පිළිබඳ අවබෝධයෙන් යුතු ව නාට්‍ය රසවිඳිමින් විචාරය කරයි.

**නිපුණතා මට්ටම :** 5.4 නාට්‍යයක මූලික ලක්ෂණ හඳුනා ගෙන නාට්‍ය පිටපත් රචනා කරයි.

**කාලච්ඡේද :** 08 යි.

**ඉගැනුම් පල :**

- නාට්‍ය නිර්මාණය සඳහා සුදුසු තේමා හා නාට්‍යෝචිත අවස්ථා හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- විවිධ නාට්‍ය පෙළවල ඇතුළත් කලාත්මක ලක්ෂණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- විවිධ නාට්‍ය පෙළ කියවීමට පෙලඹෙයි.
- සාර්ථක නාට්‍ය පෙළක මූලික ලක්ෂණ හා නාට්‍යෝචිත අවස්ථා පාදක කර ගෙන නාට්‍ය පිටපත් රචනා කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**I පෙර සූදානම :**

- නාට්‍ය පිටපත් රචනය පිළිබඳ පොත පත සහ විවිධ නාට්‍යවල මුද්‍රිත පෙළ කියවා දැනුම, අවබෝධය වර්ධනය කර ගන්න.
- නාට්‍ය පිටපත් රචනය පිළිබඳ විචාරක අදහස්, පුරෝගාමී නාට්‍යකරුවන්ගේ අදහස් ඇතුළත් මුද්‍රිත/ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය (CD/DVD) ප්‍රකාශන අසා, නරඹා හෝ කියවා දැනුවත් වන්න.
- ගුණාත්මක යෙදවුම් යටතේ ඉදිරිපත් කර ඇති අතිරේක පරිශීලනීය ග්‍රන්ථ කියවා අවශ්‍ය තොරතුරු රැස් කර ගන්න.
- නාට්‍ය පිටපත් රචනය පිළිබඳ පොතපත කියවා තොරතුරු රැස් කිරීමට ශිෂ්‍ය ශිෂ්‍යාවන් යොමු කරවන්න.
  1. විවිධ නාට්‍ය පිටපත් සහ ඒවා පිළිබඳ ලියැවී ඇති විචාර ලිපි/පොත්
  2. නාට්‍ය පිටපත් රචකයන් පිළිබඳ තොරතුරු

**II ඉගැනුම සංවර්ධනය :**

- සුදුසු ප්‍රවේශයක් යොදා ගෙන පාඩමට ප්‍රවේශ වන්න.

  *උදා :* * උසස් නාට්‍ය පිටපතකින් උපුටාගත් නාටකීය සංවාද ඛණ්ඩයක් ශිෂ්‍යයන් ලවා හෝ ගුරුවරයා විසින් ඉදිරිපත් කිරීම

  * සාර්ථක/ප්‍රකට නාට්‍යයකට පදනම් වූ ජනශ්‍රැතියක්, සම්භාව්‍ය කෘතියක් හෝ එවැනි මූලාශ්‍රයක් හෝ කෙටියෙන් හඳුන්වා දීම

  * ප්‍රවීණ නාට්‍ය රචකයෙකුගේ අද්දැකීම් ඇතුළත් හඬපටයක් හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය පටයක් ඉදිරිපත් කිරීම

- නාට්‍ය රචනාවක් යනු කුමක් දැයි විවිධ රචකයන් හා විචාරකයන් විසින් පළ කරන ලද අර්ථකථන කිහිපයක්, බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ/කළුලෑල්ල/පිටු පෙරළනය/පුවරු ආධාරයෙන් ශිෂ්‍යයන්ට ඉදිරිපත් කර කෙටි අදහස් විමසීමක් සිදු කරන්න.
- ශිෂ්‍යයන් මෙතෙක් පරිශීලනය කර ඇති නාට්‍ය රචනාවක් ආශ්‍රිත දෙබස් කණ්ඩයක් හෝ කිහිපයක් හෝ ඉදිරිපත් කර එම නාට්‍ය රචනා කුමන නාට්‍යවල දැයි හඳුනාගැනීමට අවස්ථාව ලබා දී නාට්‍ය රචනය යනු කුමක් දැයි කෙටි සාකච්ඡාවක් සිදු කරන්න.
- විවිධ මුද්‍රිත නාට්‍ය පිටපත් කිහිපයක් පරිශීලනය කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.

  *උදා:-* රත්තරන්, නරිබෑණා, එලොව ගිහින් මෙලොව ආවා

- නාට්‍ය පිටපත් රචනය පිළිබඳ සාකච්ඡාවක් ගොඩනඟමින් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ දැනුම අවදි කරන්න.
- ශිෂ්‍යයන් එක්රැස් කරගත් තොරතුරු සහ ගුරුවරයාගේ ප්‍රතිපෝෂණ ද ලබා දෙමින් සිංහල නාට්‍ය පිටපත් (පෙළ) රචනය (නිර්මාණකරණය) පිළිබඳ පහත සඳහන් අංශ පිළිබඳ ශිෂ්‍යයන්ට පුළුල් අවබෝධයක් ලබාදීමට කටයුතු කරන්න.
- විවිධ නාට්‍ය ආකෘති හඳුන්වා දෙන්න.
  - i ශෛලිගත
  - ii ස්වාභාවික
  - iii අර්ධ ශෛලිගත/මිශ්‍ර
- විවිධ නාට්‍ය රචනා ප්‍රවර්ග ඇති බව පෙන්වා දෙන්න.
  - i ළමා නාට්‍ය
  - ii යොවුන් නාට්‍ය
  - iii කෙටි නාට්‍ය
  - iv දිගු නාට්‍ය
  - v ගීත නාට්‍ය
  - vi මුද්‍රා නාට්‍ය
  - vii ප්‍රජා නාට්‍ය
  - viii වීදි නාට්‍ය
- නාට්‍යය රචනයේ දී අවධානය යොමු කළ යුතු කරුණු සාකච්ඡා කරන්න.
  - i නාට්‍ය රචකයාගේ මෙවලම්
    - කතා වස්තුව
    - චරිත
    - නාටකීය බස
    - ප්‍රෙක්ෂකයා/ප්‍රේක්ෂාව
  - ii නාට්‍ය පිටපත් රචනය සඳහා යොදාගත හැකි අද්දැකීම් පිළිබඳ ශිෂ්‍ය අවධානය යොමු කරවන්න.
    - පෞද්ගලික අද්දැකීම්
    - පොත පත ඇසුරින්
    - ඓතිහාසික මුලාශ්‍රය හෝ ජනශ්‍රැති
- උචිත අද්දැකීමක් පාදක කර ගෙන නාට්‍ය පිටපතක් රචනා කිරීම සඳහා ශිෂ්‍යයන්ට මඟ පෙන්වන්න.
- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස සිදු කිරීමට යොමු කරවන්න.

**III තක්සේරුව හා ඇගයීම**

- නාට්‍ය පෙළ රචනය පිළිබඳ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ දැනුම සහ අවබෝධය තහවුරු කිරීම සඳහාත්, ශිෂ්‍ය සාධන මට්ටම තක්සේරුව හා ඇගයීම සඳහාත් සුදුසු පැවරුම් ලබා දෙන්න.

  උදා : * තෝරාගත් නාට්‍ය පිටපත් රචනාවක් මුල් කර ගෙන එම පිටපතේ රචනයෙහි රචනා උපක්‍රම ඇතුළු පිටපතේ සාර්ථක අසාර්ථක භාවය පිළිබඳ සාකච්ඡාවක නිරත කරවීම

  * නාට්‍ය පිටපත් රචනයේ දී සැලකිය යුතු විශේෂ කරුණු පිළිබඳ කෙටි අදහස් දැක්වීම් සඳහා ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දීම
  * විවිධ වර්ගයේ ස්වතන්ත්‍ර නාට්‍ය පිටපත් රචනා කිරීමට යොමු කිරීම
  * රචිත නාට්‍ය පිටපත් නිෂ්පාදනය කර පන්ති හෝ පාසල තුළ හෝ ප්‍රදර්ශනයට අවස්ථාව අවස්ථාව ලබා දීම
  * පන්තිය තුළ ශිෂ්‍යයන් විසින් රචිත නාට්‍ය පිටපත් හුවමාරු කර තමන්ට ලැබුණු නාට්‍ය පිටපත පිළිබඳ (නාට්‍ය රචනය පිළිබඳ ලත් දැනුම ආශ්‍රිත ව එම රචනාවේ සාර්ථක අසාර්ථක භාවය සහ ගුණාත්මක ව සංවර්ධනය කිරීමට යෝජනා ද සහිත ව) විස්තරයක් ලිවීමට ලබා දීම

- සුදුසු ඇගයීම් නිර්ණායක පදනම් කර ගනිමින් ශිෂ්‍යයන් ඇගයීමට ලක් කරන්න.
- මෙතෙක් උගත් විෂය කරුණු පිළිබඳ ව, ඉගනුම් - ඉගැන්වීම් උපකරණ භාවිත කරමින් අවසන් සමාලෝචනයක යෙදෙන්න.
- ශිෂ්‍යයන් විසින් රචිත, සාර්ථක නාට්‍ය පිටපත් මුද්‍රණය කිරීමට සුදුසු වැඩ පිළිවෙළක් සකස් කරන්න.
- නාට්‍ය රචනය පිළිබඳ වැඩිදුර ගවේෂණයට හා නාට්‍ය පෙළ රචනයට තවදුරටත් ශිෂ්‍යයන් යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම්** : * විවිධ නාට්‍ය පිටපත්
* නාට්‍ය පිටපත් රචනය පිළිබඳ උපදෙස් සැපයෙන පොතපත

**තක්සේරුකරණය හා ඇගයීම් නිර්ණායක :**
- නාට්‍ය රචනයේ දී සැලකිලිමත් විය යුතු කරුණු ඇතුළත් පුවත්පත් ලිපියක් ලියයි.
- නාට්‍ය රචනා ක්‍රමශිල්ප/මූලධර්ම පිළිබඳ තොරතුරු පෙළ ගස්වයි.
- ස්වතන්ත්‍ර නාට්‍ය පිටපත් කියැවීමට පෙලඹෙයි.
- උචිත තේමා හා ආකෘති ඔස්සේ නාට්‍ය පිටපත් රචනා කරයි.

**පරිශීලනීය ග්‍රන්ථ :**
- ගුණවර්ධන, දයානන්ද - නරිබෑනා
- ජයවර්ධන, බන්දුල - රත්නමාලි නාට්‍යය හා නාට්‍ය පෙළ අධ්‍යයනය
- නිශ්ශංක, පියදාස - මැටිකරත්තය
- ද සිල්වා, සුගතපාල - සොඳුරු ආඥාදායකයා හෙවත් නාට්‍ය නිෂ්පාදක
- සරච්චන්ද්‍ර, එදිරිවීර - එලොව ගිහින් මෙලොව ආවා
- සරච්චන්ද්‍ර, එදිරිවීර - කදා වළලු
- සරච්චන්ද්‍ර, එදිරිවීර - රත්තරන්
- සරච්චන්ද්‍ර, එදිරිවීර - සිංහබාහු

# 24. පුරාතන ගද්‍ය සාහිත්‍යයෙන් ප්‍රකට වන මානව චර්යා

**නිපුණතාව :** 1.0 පුරාතන ගද්‍ය සාහිත්‍යය පරිශීලනයෙන් ලබාගත් මානව ගුණධර්ම හා සංස්කෘතිකාංග මගින් ජීවිත පරිඥානය පුළුල් කර ගනිමින් රස වින්දනයේ හා විචාරයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 1.3 නිර්දිෂ්ට කතා වින්දනාත්මක ව පරිශීලනයෙන් හඳුනා ගත් මානව ගුණධර්ම හා සමාජ හර පද්ධතීන් භාවිතයට ගනියි.

**කාලච්ඡේද :** 15 යි.

**ඉගැනුම් පල :**

- පුරාතන ගද්‍ය සාහිත්‍ය පරිශීලනයෙන් අත්පත් කරගත හැකි මානව ගුණධර්ම විස්තර කරයි.
- මානව ගුණධර්ම හා හර පද්ධති ඇසුරින් චරිත සංවර්ධනය ගොඩ නඟා ගත යුතු බව පැහැදිලි කරයි.
- අත්පත් කර ගත් මානව ගුණධර්ම සුරකිමින් නිර්මාණකරණයේ යෙදෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**I පෙර සූදානම :**

- පුරාතන ගද්‍ය සාහිත්‍යයේ නිර්දිෂ්ට කතාවලින් ඉස්මතු වන මානව චර්යා හා සාරධර්ම හඳුනා ගන්න.
- නිර්දිෂ්ට කතාවල හමුවන චරිතවල චිත්ත චෛතසික ස්වභාවයන් හා චර්යා රටා හඳුනා ගන්න.
- පරිශීලනීය ග්‍රන්ථ ඇසුරින් අවශ්‍ය තොරතුරු සපයා ගන්න.

**II ඉගැනුම සංවර්ධනය :**

- පහත සඳහන් ප්‍රවේශ අතරින් සුදුසු ප්‍රවේශයක් යොදා ගෙන පාඩමට පිවිසෙන්න.

උදා:- * නිර්දිෂ්ට පුරාතන ගද්‍ය නිර්මාණයක මානව ගුණධර්ම මතු වන අවස්ථා ශිෂ්‍යයන්ට ඉදිරිපත් කිරීමෙන්

* වත්මන් සමාජයේ විවිධ මානව චර්යා හා පුරාතන ගද්‍ය නිර්මාණවල ඇතුළත් එවන් අවස්ථාවක් සිහිපත් කිරීමෙන් (මහාකපි ජාතකය, නන්දිවිසාල ජාතකය, තිලමුට්ඨි ජාතකය වැනි)

- පහත සඳහන් කරුණු පදනම් කර ගෙන සාකච්ඡාවක නිරත වන්න.
  * නිර්දිෂ්ට පුරාතන ගද්‍ය කෘතිවල කතුවරුන්ගේ අරමුණු
  * නිර්දිෂ්ට කතාවල හමු වන චරිත
  * එම චරිතවල චිත්ත චෛතසික ස්වභාවයන් හා ගති ලක්ෂණ
  * සමාජ ගැටලු - විවාහය (උපක, කුණ්ඩලකේසී)
  * විවිධ මානව චර්යා (මාතෘ ප්‍රේමය, පතිභක්තිය, පරිත්‍යාගශීලී භාවය, අධිෂ්ඨානශීලී භාවය, මසුරු බව, විචක්ෂණශීලී භාවය, අටලෝ දහමින් කම්පා නොවීම ආදි)
  * නිර්දිෂ්ට කතාවල තේමා ඇසුරින් මානව චර්යා හා සමාජ හර පද්ධති මතු කිරීමට ගත් උත්සාහය
- ඉහත සඳහන් කරුණු පෞරුෂ සංවර්ධනයට ඉවහල් වන ආකාරය පැහැදිලි කරන්න.
- ශිෂ්‍යයන්ගේ අදහස් විමසමින් සාකච්ඡාවක නිරත වන්න.

**III තක්සේරුව හා ඇගයීම**

- වාචික ප්‍රශ්න මඟින් ශිෂ්‍යයන්ගේ දැනුම තහවුරු කරන්න.
- නිර්දිෂ්ට පුරාතන ගද්‍ය නිර්මාණවල මානව ගුණධර්ම මතුවන අවස්ථා සන්නිදර්ශන ව පැහැදිලි කිරීමට විචාර ප්‍රශ්න ලබා දෙන්න.
- නිර්දිෂ්ට කතාවල මානව ගුණධර්ම මතු වන අවස්ථා පදනම් කර ගෙන කවි, කෙටිකතා, භූමිකා රංගන, කෙටි නාට්‍ය නිර්මාණයට ශිෂ්‍යයන් යොමු කරන්න.
- ප්‍රතිපෝෂණය ලබා දෙන්න.
- සුදුසු නිර්ණායක මූලික කර ගෙන ඇගයීමේ යෙදෙන්න.

**ගුණාත්මක යෙදවුම්** : * ජනමාධ්‍යවල ප්‍රචාරය වූ මානව ගුණධර්ම මතු වන සිදුවීම්
* ඇමුණුම 01

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක :**

- නිර්දිෂ්ට කතාවලින් ඉස්මතු වන මානව ගුණධර්ම පැහැදිලි කරයි.
- පුරාතන ගද්‍ය සාහිත්‍ය කෘති රස වින්දනයේ යෙදෙයි.
- නිර්දිෂ්ට පුරාතන ගද්‍ය නිර්මාණ ඇසුරින් නිර්මාණකරණයේ යෙදෙයි.
- විචාර ප්‍රශ්නවලට පිළිතුරු ලියයි.

**පරිශීලනීය ග්‍රන්ථ :**

- පඤ්ඤාකිත්ති හිමි, කොටහේනේ - සාහිත්‍ය කතා
- පඤ්ඤාකිත්ති හිමි, කොටහේනේ - සාහිත්‍ය හා සමාජය
- වික්‍රමසිංහ, මාර්ටින් - බණ කතා සාහිත්‍යය

ඇමුණුම 01

**නිදර්ශක ඇගැයීම් :**

* නිර්දිෂ්ට කතාවල තේමාවන්හි සාර්වත්‍රික අගයක් ඇති බව කතාවස්තු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න.
* 'පැරණි කතාකරුවන්ගේ අරමුණ සමාජයේ යහ පැවැත්මට හා පෞරුෂ සංවර්ධනයට ඉවහල් වන සදුපදේශයන් ඉදිරිපත් කිරීමයි' නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.
* සුදුසු තේමාවක් තෝරාගෙන නාට්‍ය පිටපතක් රචනා කරන්න.

# 25. බැද්දේගම (නවකතාව) සමාලෝචනය

**නිපුණතාව :** 3.0 නවකතා සාහිත්‍යාංගයේ ලක්ෂණ හා මූලිකාංග පිළිබඳ අවබෝධයෙන් යුක්ත ව නවකතා රසවිඳිමින් විචාරයට ලක් කරයි.

**නිපුණතා මට්ටම :** 3.3 නවකතාංග කෙරෙහි අවධානයෙන් යුතු ව නිර්දිෂ්ට නවකතාව රස විඳිමින් විචාරයට ලක් කරයි.

**කාලච්ඡේද :** 12 යි.

**ඉගැනුම් පල :**

- නිර්දිෂ්ට නවකතාවේ ඇතුළත් නවකථාංග හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට නවකතාවේ කලාත්මක ලක්ෂණ පැහැදිලි කරයි.
- නිර්දිෂ්ට නවකතාවෙන් හෙළිවන සමාජ පසුබිම පැහැදිලි කරයි.
- නිර්දිෂ්ට නවකතාව රස විඳිමින් විචාරයට ලක් කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**I පෙර සූදානම :**

- බැද්දේගම නවකතාව නැවත කියවා ප්‍රධාන සිද්ධි සහ අවස්ථා පිළිබඳ ආවර්ජනයක යෙදන ලෙස ශිෂ්‍යයන්ට දැනුම් දෙන්න.
- අදාළ කොටසෙහි අන්තර්ගතය පිළිබඳ වැදගත් තොරතුරු ගොනු කර ගන්න.
- අතිරේක පරිශීලනීය ග්‍රන්ථ ද කියවා දැනුවත් වන්න.

**II ඉගැනුම සංවර්ධනය :**

- බැද්දේගම නවකතාවේ කතා සාරය පිළිබඳ සිහිපත් කර, ශිෂ්‍යයන් සමඟ කෙටි සාකච්ඡාවක් මෙහෙයවන්න.
- බැද්දේගම නවකතාවේ පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් සාකච්ඡාවක් ගොඩනගන්න.
  - * භාෂාව (කථන ක්‍රමය හා රචනා රීතිය, සංවාද හා ආඛ්‍යාන)
  - * චරිත නිරූපණය
  - * අවස්ථා හා සිද්ධි නිරූපණය
  - * යථාර්ථවාදී බව
  - * සමාජ විවරණය
- බැද්දේගම නවකතාවේ කලාත්මක ලක්ෂණ පිළිබඳ ප්‍රබල සංවාදයක් ගොඩනඟන්න.
- බැද්දේගම නවකතාවේ සාර්ථක අසාර්ථක බව පිළිබඳ ශිෂ්‍ය අදහස් විමසන්න.
- සමාලෝචනයක යෙදෙන්න.

**III තක්සේරුව හා ඇගයීම**

- ශිෂ්‍යයන්ගේ දැනුම හා අවබෝධය තහවුරු කිරීම සඳහා සුදුසු පැවරුමක් ලබා දී තක්සේරුවක යෙදෙන්න. එහි දී,
  - * බැද්දේගම නවකතාවේ කලාත්මක ලක්ෂණ විවරණය කරන පුවත්පත් ලිපියක් සකස් කිරීම
  - * බැද්දේගම නවකතාව පිළිබඳ පූර්ණ විස්තර හා විවරණ ඇතුළත් බිත්ති පුවත්පත් කලාපයක් සකස් කිරීම

* බැද්දේගම නවකතාව පිළිබඳ ලියැවුණු විචාර ලිපි එකතුවක් සකස් කිරීම
* බැද්දේගම නවකතාවේ එක් එක් චරිත පිළිබඳ විවරණයක් වාචිකව හෝ ලිඛිතව හෝ ඉදිරිපත් කිරීමට අවස්ථා ලබා දීම

වැනි ඇගයීම් ක්‍රම යොදාගත හැකි ය.

**ගුණාත්මක යෙදවුම් :**

* බැද්දේගම නවකතාව පිළිබඳ ලියැවුණු පොත පත

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක :**

- බැද්දේගම නවකතාවේ සාරය පැහැදිලි කරයි.
- බැද්දේගම නවකතාවේ එක් එක් කොටසෙන් නිරූපිත අවස්ථා සිද්ධි විස්තර කරයි.
- බැද්දේගම කතුවරයා චරිත හැසිරවූ ආකාරය පැහැදිලි කරයි.
- බැද්දේගම නවකතාවේ නිර්මාණාත්මක භාෂා භාවිතය පිළිබඳ නිදසුන් දක්වයි.
- බැද්දේගම නවකතාවේ කලාත්මක ලක්ෂණ පැහැදිලි කරයි.

**පරිශීලනීය ග්‍රන්ථ :**

- ඒකනායක, ධර්මසිරි - සාහිත්‍ය කලාව
- වික්‍රමසූරිය, සරච්චන්ද්‍ර - නවකතා විවරණය
- සුරවීර, ඒ. වී. - නවකතා නිර්මාණය හා අවබෝධය

# 26. කෙටිකතා අභ්‍යාසකරණය

**නිපුණතාව :** 4.0 කෙටිකතා කලාවේ විකාසනය, මූලිකාංග හා විශේෂ ලක්ෂණ හඳුනා ගෙන කෙටිකතා රස විඳිමින් විචාරයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 4.4 කෙටිකතා ලක්ෂණ කෙරෙහි අවබෝධයෙන් යුතු ව කෙටිකතා නිර්මාණකරණයේ යෙදෙයි.

**කාලච්ඡේද :** 05 යි.

**ඉගැනුම් පල :**
- කෙටිකතාවලට පාදක වූ විවිධ අද්දැකීම් හඳුනා ගෙන විස්තර කරයි.
- කෙටිකතා නිර්මාණය සඳහා සුදුසු අද්දැකීම් තෝරා ගනියි.
- සාර්ථක කෙටිකතාවක මූලික ලක්ෂණ සහ අද්දැකීම් පදනම් කොට ගෙන කෙටිකතා නිර්මාණයේ යෙදෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**I පෙර සූදානම :**
- නිර්දිෂ්ට කෙටිකතා හා වෙනත් සුදුසු කෙටිකතා කියවා ඒවාට පාදක වූ අද්දැකීම් සටහන් කරගෙන එන ලෙස ශිෂ්‍යයන්ට කලින් දන්වන්න.
- පරිශීලනීය ග්‍රන්ථ කියවා කෙටිකතා නිර්මාණය පිළිබඳ දැනුම වර්ධනය කර ගන්න.
- නිර්දිෂ්ට කෙටිකතාවලට අමතර ව වෙනත් කෙටිකතා කීපයක් ද එක් රැස් කර ගන්න.

**II ඉගැනුම සංවර්ධනය :**
- පහත සඳහන් ප්‍රවේශ අතරින් එකක් යොදා ගෙන පාඩමට පිවිසිය හැකි ය.
  - * ප්‍රසිද්ධ කෙටිකතාවකට පාදක වූ (රචකයාගේ) අද්දැකීමක් පිළිබඳ පොත පතෙහි පළ වූ විස්තරයක් ඉදිරිපත් කිරීමෙන් (ඇමුණුම 01)
  - * ප්‍රසිද්ධ දෙස් විදෙස් ලේඛකයන් කෙටිකතා නිර්මාණකරණයට පිවිසි ආකාරය විස්තර කිරීමෙන් (ඇමුණුම 02)
- ප්‍රවේශයෙන් මතු වූ කරුණු ද ඉවහල් කර ගනිමින් කෙටිකතා නිර්මාණය පිළිබඳ ශිෂ්‍යයන් සමඟ බුද්ධි කලම්බන සාකච්ඡාවක නිරත වන්න.
- සාකච්ඡා මාර්ගයෙන් ශිෂ්‍යයන් ලබා ඇති විවිධ අද්දැකීම් මතු කර ගන්න. ඒ අතරින් කෙටිකතා නිර්මාණයට උචිත අද්දැකීම් පිළිබඳ සාකච්ඡා කරන්න.
- එක් කණ්ඩායමකට 4ක් වන සේ, ශිෂ්‍යයන් කුඩා කණ්ඩායම් කීපයකට වෙන් කරන්න.
- එක් එක් කණ්ඩායම්වල ශිෂ්‍යයන්ට කෙටිකතා නිර්මාණයට සුදුසු තේමා තෝරා ගැනීමට අවස්ථාව දෙන්න.
- අවශ්‍ය මඟ පෙන්වීම් ලබා දෙන්න.
- කණ්ඩායම් වශයෙන් කෙටිකතා නිර්මාණයට යොමු කරන්න.
- ඒ ඒ කණ්ඩායම්වල කෙටිකතා ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- ප්‍රතිපෝෂණය ලබා දෙන්න.
- තෝරාගත් සාර්ථක කෙටිකතා ඇගයීමට ලක් කරන්න. බිත්ති පුවත්පතට යොමු කරන්න.
- කේවල පැවරුමක් ලෙස කෙටිකතා නිර්මාණයට (තනි තනි ව) ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.

**III තක්සේරුව හා ඇගයීම**

- එක් එක් ශිෂ්‍යයන් කෙටිකතාවක් නිර්මාණය සඳහා සුදුසු තේමා තෝරා ගැනීමට යොමු කර තක්සේරුවෙහි යෙදෙන්න.
- ඒ අනුව කෙටිකතා නිර්මාණය කිරීමට පවරන්න.
- සුදුසු ඇගයීමක යෙදෙන්න.

**ගුණාත්මක යෙදවුම්** : * කෙටිකතා නිර්මාණය පිළිබඳ ලේඛකයන්ගේ අද්දැකීම්
* ඇමුණුම 01 හා 02

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක :**

- කෙටිකතාවලට පාදක වන අද්දැකීම් හඳුනා ගෙන විස්තර කරයි.
- කෙටිකතාවකට සුදුසු අද්දැකීම් තෝරා ගෙන පැහැදිලි කරයි.
- කෙටිකතා නිර්මාණය කරයි.
- විවිධ කෙටිකතා විචාරයට ලක් කරයි.

**පරිශීලනීය ග්‍රන්ථ :**

- ධර්මකීර්ති, රංජිත් - කෙටිකතා නිර්මාණය, අධ්‍යයනය හා මූලධර්ම
- රණවීර, ආරියවංශ - රන්රෝස
- සුරවීර, ඒ. වී. - කෙටිකතා (පුස්තිකා මාලා)
- සුරවීර, ඒ. වී. - නිර්මාණ පසුබිම

**ඇමුණුම 01 - කෙටිකතාවකට පාදක වූ අත්දැකීමක්**

"මගේ 'වහල්ලු' කෙටිකතාව ලියන්ට මගේ කල්පනාව පිබිදුණේ මෙසේයි. අවුරුදු හතළිහකට පමණ පෙර මා ගල්කිස්සේ පදිංචිව සිටි කාලයේ වඩාත් කාලය ගත කෙළේ කෙටිකතා ලියන්ටයි. කෙටිකතාවලට වස්තු සොයන්ට හිසට වද දෙන ඒ කාලයේ දවසක මා හවස් වරුවේ ගෙදර බලා ගමන් කළා. මගේ ගෙදරට අල්ලපු ඉඩම හිස් එකක්. එහි මහලු ගවයකු බිම ලැග විට සපමින් සිටිනු මා දුටුවා. එකෙණෙහි ම මට මතක් වුණා මා කුඩා කල දැන සිටි අල්ලිස් නමැති කරත්තකාරයෙක්. ඔහු ඉරිදා සෙනසුරාදා හැර අනික් දවස්වල කොග්ගල ඔයේ පාලම අසලට තිරික්කලය ගෙන ගොස් මඟීන් තුන් දෙනෙකු පටවා ගෙන ගාලු නගරයට ඇතුළු වන කඩවතට යනවා. ඔහුගේ තිරික්කලය නගරයට දක්කා ගෙන යන්ට ඔහුට ලයිසන් පත්‍රයෙන් ඉඩ දී නැත. නගරයේ කුලී කරත්තයකට ලැයිසන් ගැනීමට රුපියල් විස්සක් තිහක් වැඩිපුර ඕනෑ. අල්ලිස් කියන මිනිහා හවස ගාල්ලේ කඩවත සිට කොග්ගලට හා කතළුවට ආපසු යන මඟීන් තුන් දෙනෙකු තිරික්කලයේ පටවා ගෙන ගමට යනවා. ඔහු ජීවිකාව සපයා ගත්තේ තිරික්කලයේ මඟීන් පටවා ගෙන ගාල්ලට යෑමෙන්.

අල්ලිස් පිළිබඳ මගේ අත්දැකීම එපමණයි. ඒ අත්දැකීම ඇසුරෙන් රචනා කළ 'වහල්ලු' කතාවේ අල්ලිස්ගේ චරිතය ශෝකාන්ත අමුතු නිර්මාණයක්. ඒ නිර්මාණය සඳහා හා ජීවන තොරතුරු සොයා ගත්තේ මගේ අත්දැකීම් කුණුගොඩ ගැරීමෙන්. ඔහු තිරික්කලයෙන් වැටී කොන්ද කැඩීම නිසා හැමදා ලෙඩකු ලෙස ජීවත් වුණා. සනීපයෙන් සිටියදී ඔහු නිදා ගත්තේ ඉස්තෝප්පුවේ වූ ඇඳේ. අසනීප වූ පසුත් ඔහුට ඒ ඇබ්බැහිකම හරින්ට බැරි වුණා. ඔහුගේ ගොනා පින්ගොනකු වුණා. ඒ කාලෙ හැම ගමක ම පින්ගොනුන් සිටියා. වැඩ ගෙන මහලු වූ හරකුන් ගැමියන් මස්කඩකාරයන්ට වික්කේ නෑ. උන් තැනින් තැන පිටිවල ඇවිද තණ කා අගලකින් වතුර බී ජීවත් වුණා.

ගැමියන් සමහර විට මේ පින්ගොනුන් අල්ලා කාගෙන් වත් ණයට ඉල්ලා ගන්නා කරත්තයක බැඳ පොල්ලෙලි හෝ පොල් අද්දනවා. හවසට උංට පුනක්කු ටිකක් බොන්ට දී අත හරිනවා. ගමේ කාටත් අයිති නිසා එවැනි හරකුන් ගැමියන් හැඳින්වූයේ පින්ගොනුන් ලෙස. මගේ 'වහල්ලු' නමැති කතාව ලියන්ට

අරමුණ නොහොත් වස්තුබීජය සොයා ගත් සැටිත් ඒ වස්තුබීජය විකාසනයෙන් එය ශෝකාන්ත නිර්මාණයක් කරනු සඳහා මගේ ගැමි අත්දැකීම්වලින් උචිත දේ ගරා තෝරා ගත් සැටිත් යට කියන ලද කරුණුවලින් හෙළි වෙයි."

***මාර්ටින් වික්‍රමසිංහ***

*උපුටා ගැනීම - සුරවීර, ඒ. වී., **නිර්මාණ පසුබිම**, 2000, 15-16 පිටු*

**ඇමුණුම 02 - ලේඛකයෙකු කෙටිකතා නිර්මාණකරණයට පිවිසි ආකාරය**

"කුඩා කාලෙ ඉඳලා ම මට ලොකු ආසාවක් තිබුණා කතා ලියන්න. මට ඕනෑ වුණේ ලේඛකයෙක් වෙන්ට. හැබැයි ඊට කලින් මා කළේ පොත් කියවීම. මට ලබා ගත හැකි වූ හැම පොතක් ම කියෙව්වා. නවකතා කියෙව්වා. කෙටිකතා කියෙව්වා. දර්ශනය ගැන, විද්‍යාව ගැන, විචාරය ගැන, මෙහෙම පොත් කියවීමෙනුයි මම පටන් ගත්තෙ. අනික් කාරණේ මගේ තිබුණ ආසාව නිසා ඒ කියවන බොහෝ දේ මට මතක හිටියා. මගේ හිතේ රැඳුණා. මං මේ කාටත් කියන්නෙ ලේඛකයෙක් වෙන්ට නම් මුලින් ම කරන්ට ඕනෑ පොත් කියවන එකයි. ලේඛන කලාව මම බොහොම වෙහෙස වෙලා ඉගෙන ගත්තා. ගුරුවරයෙකුගෙන් නොවෙයිඃ පොත්වලින්.

මම පත්තරේට ලිපි ලියුවා. නමුත් මගේ කැමැත්ත මුල ඉඳලා ම ඇති වුණේ කෙටිකතා ලියන්ටයි. යම් අත්දැකීමක් ඇතිව යම් දෙයක් ලියන්ට තෝරා ගත් කල මගේ සිත හැම විට ම යොමු වුණේ කෙටිකතාව පැත්තට. මේකට හේතුව නම් කියන්ට බැහැ. කෙටිකතාවක් ලිවීම නවකතාවක් ලියනවාට වඩා බොහෝ වෙනස්. කෙසේ වෙතත් කෙටිකතා මාර්ගයේ මගේ සිත දිවීම නිසා වෙන්ට ඇති නවකතාවක් ලිවීමට කලක් ගත වන තුරු ම මට බැරි වුණේ. අවුරුදු පණහ පනින කල් ම මම නවකතාවක් ලියුවේ නෑ.

කෙටිකතාව පැත්තෙන් බලන කල, - ඔව් කෙටිකතාවට විතරක් නෙවෙයි නවකතාවටත් එහෙමයි - ලේඛකයාට හොඳ අත්දැකීම් තියෙන්ට ඕනෑ. මේ අත්දැකීම් තුන් ආකාරයකින් ලබන්ට පුළුවනි. පළමු කොට, ලේඛකයා තමන් ම ලබා ගත්, නැති නම් තමන් ම විඳ ගත් අත්දැකීම්. අපට කුඩා කාලෙ ඉඳලා නොයෙක් දේ සිදු වෙනවා. ලේඛකයාට මේවා හොඳට මතකයට එනවා. තවත් විදියේ අත්දැකීම් තමා අනුන්ගේ අත්දැකීම්, මේ දෙවන වර්ගය. ලේඛකයා තමන්ගේ අත්දැකීම් වාගේ ම අනුන්ගේ අත්දැකීම් ද මුල් කර ගන්නවා. ප්‍රයෝජනයට ගන්නවා. අපි හිතමු මිනිහෙක් හොර මුලකට අහු වෙනවා කියලා. ඔහුගේ අතමිට උදුරා ගන්නවා. හොරුන් තළා පෙළා හිරිහැර කරනවා. හැබැයි ඒ තැනැත්තාට මේක ලියන්ට බැහැ. මේක ලියන්නට පුළුවන් වන්නේ ලේඛකයකුට පමණයි. ලේඛකයා මේ සිද්ධිය දැන ගන්නේ අනුන්ගෙන්. ලේඛකයා මේ සිද්ධිය මුල් කර ගෙන කෙටිකතාවක් හෝ නවකතාවක් ලියනවා. හොරුන් අතරට අහුවුණ තැනැත්තා ගැන සිතුවොත්, එහෙම හිතලා මේ සිද්ධිය විස්තර කරන්ට හිතුවොත් අපි ඒ සිද්ධිය තුළට බහින්න ඕනෑ. අපට ම සිදු වූ දෙයක් හැටියට හිතන්ට ඕනෑ. හැබැයි හැම දෙනාට ම මේක කරන්ට බෑ. ලේඛකයකුට පමණයි ඒක කරන්ට පුළුවන්.

මම කලින් කීවා අත්දැකීම් ලබන මාර්ග තුනක් තියෙනවා කියලා. තුන් වැනි මාර්ගය තමා පොත් කියවා ලබා ගන්න අත්දැකීම්. මගේ කතාවලට මේ හැම ආකාරයෙන් ම අත්දැකීම් ලබා ගන්නවා."

ජී. බී. සේනානායක

උපුටා ගැනීම - සුරවීර, ඒ. වී., ***නිර්මාණ පසුබිම***, 2000, 37-38 පිටු

# 27. ප්‍රකෘති කථනය, විකෘති කථනය හා වාක්‍ය රීති පිළිබඳ අභ්‍යාස

**නිපුණතාව :** 8.0 ව්‍යාකරණ රීති හා භාෂා සම්ප්‍රදාය නිවැරදි ව භාවිත කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 8.2 උක්තාඛ්‍යාත යෝගය නිවැරදි ව භාවිත කරමින් වාක්‍ය ලියයි.

**කාලච්ඡේද :** 20 යි.

**ඉගෙනුම් පල :**
- ප්‍රකෘති කථනය හා විකෘති කථනය හඳුනා ගෙන නිවැරදි ව ඉදිරිපත් කරයි.
- ප්‍රකෘති කථනය හා විකෘති කථනය නිවැරදි ව යොදමින් වාක්‍ය ලියයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**I පෙර සූදානම :**

- ප්‍රකෘති කථනය හා විකෘති කථනය පිළිබඳ පුළුල් අවබෝධයක් ඇති කර ගන්න.
- මීට අදාළ පොත පත කියවා අවශ්‍ය තොරතුරු රැස් කර ගන්න.
- ශිෂ්‍යයන්ට ලබා දීම සඳහා සුදුසු නිදර්ශන හා පැවරුම් පත්‍රිකා සකස් කර ගන්න.

**II ඉගෙනුම සංවර්ධනය :**

- සුදුසු නිර්මාණාත්මක ප්‍රවේශයක් භාවිත කරමින් පාඩම ආරම්භ කරන්න.

  *උදා :* * තෝරාගත් පුවත් පත් වාර්තා කීපයක් පන්තියට ඉදිරිපත් කිරීම
  * එක ම සිද්ධියක් ප්‍රකෘති කථනයෙන් හා විකෘති කථනයෙන් ඉදිරිපත් කිරීම
  * ශිෂ්‍යයකු ලවා විශේෂ කතාවක් ඉදිරිපත් කර එහි ඇති 'ප්‍රකෘති කථන' ලක්ෂණ විමසීම
- 'ප්‍රකෘති කථනය හා විකෘති කථනය' යනු විශේෂිත භාෂා ව්‍යවහාරයක් බව අවබෝධ කරවන්න.
- වාර්තාකරණයේ දී මෙම ව්‍යාකරණාංගය වඩාත් වැදගත් බැවින් ඒ පිළිබඳ කරුණු රැස් කරන්න.
- ප්‍රකෘති කථනය හා විකෘති කථනය පිළිබඳ පහත සඳහන් කරුණු අධ්‍යයනය කරන්න.
  * යමෙකුගේ කථාවක් දෙ ආකාරයකින් ඉදිරිපත් කළ හැකි වීම
  * එකක් නම් කථකයාගේ වචනයෙන් ම ඉදිරිපත් කිරීම හෙවත් ප්‍රකෘති කථනය යි.
  * අනෙක නම් කථකයාගේ අදහස වාර්තාකරුවකුගේ ප්‍රකාශයක් ලෙස දැක්වීම හෙවත් විකෘති කථනය යි.
  * ප්‍රකෘති කථනයක්, විකෘති කථනයට හැරවීමේ දී ප්‍රකෘති කථනයේ තිබූ උද්ධෘත ලක්ෂණ ඉවත් කිරීම
  * ආමන්ත්‍රණය සඳහා යොදාගත් පද ඇත්නම් ඉවත් කිරීම
  * ශෝකය, විස්මය ආදිය දැක්වෙන පද ඉවත් කිරීම
  * ආශීර්වාද ආඛ්‍යාත පද වෙනස් වීම
  * ආඛ්‍යාතය 'බව, නියාව' වැනි වචනවලින් සම්බන්ධ කිරීම

  (ඇමුණුම අංක 1 නිදසුන් බලන්න)
- පටිගත කළ විශේෂ කථාවක් හෝ සාකච්ඡාවක් ශ්‍රවණය කිරීමට සලස්වන්න.
- එවැනි කථා 'විකෘති කථන' ක්‍රමයට වාර්තා ලෙස සැකසීමේ ශිල්ප ක්‍රම අධ්‍යයනයට යොමු කරන්න.
- ප්‍රකෘති කථනයේ හා විකෘති කථනයේ විශේෂතා ලේඛනගත කිරීමට සලස්වන්න.
- විකෘති කථනයෙන් ලේඛන ගත කළ වාර්තා, ප්‍රවෘත්ති ප්‍රකාශන ආදිය ප්‍රකෘති කථනයට හැරවීමට සලස්වන්න.
- කණ්ඩායම් ක්‍රමයට හෝ තනි තනි ව හෝ කළ හැකි ය.

**III තක්සේරුව හා ඇගයීම**

- එක් එක් පුද්ගලයන් විවිධ අවස්ථාවල දී කළ කථාවල කොටස්/පිටපත් ලබා දෙන්න.
- විවිධ වාර්තා/ප්‍රවෘත්ති ආදිය ලබා දෙන්න.
- ඒ ඇසුරින් ප්‍රකෘති කථනයෙන් ලියැවුණු කොටස් විකෘති කථනයට හැරවීමටත්, විකෘති කථනයෙන් ලියැවුණු කොටස් ප්‍රකෘති කථනයට හැරවීමටත් සුදුසු පැවරුම් ලබා දෙන්න.
- සිසුන්ගේ විෂය දැනුම හා ප්‍රායෝගික කුසලතා මැන බැලීමට වෙනත් සුදුසු පැවරුම් ලබා දී ඇගයීමක යෙදෙන්න.

**ගුණාත්මක යෙදවුම්** : * පටිගත කරන ලද කතා/දේශන
* ඇමුණුම 01
* පැවරුම් පත්‍රිකා

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක :**

- ප්‍රකෘති කථනයෙහි හා විකෘති කථනයෙහි ලක්ෂණ වෙන වෙන ම විස්තර කරයි.
- ප්‍රකෘති කථනය විකෘති කථනයට හැරවීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.
- ප්‍රකෘති කථනයෙන් යුතු ලේඛනයක් විකෘති කථනයට හරවා පුවත්පත් වාර්තාවක් සකස් කරයි.
- විශේෂ රැස්වීමක දී කළ කථා ඇසුරු කරමින් ගුවන්විදුලි ප්‍රවෘත්ති ප්‍රකාශයක් සකස් කරයි.

**පරිශීලනීය ග්‍රන්ථ** :

- ශුභවික්‍රම, මුනිදාස - භාෂාව හා රචනය

ඇමුණුම් :

ඇමුණුම 1 - පැවරුම

**ප්‍රකෘති කථනය විකෘති කථනයට හැරවීම**

i. ආජීවක කියනුයේ 'මා දන්නා ශාස්ත්‍ර නැත. තොප පස්සේ දැල්කත් පන්කත් හැදගෙන යෙමි. සතුන් මරාලූ කල මස්කත් ගෙන යෙමි. මෙතෙක් ශාස්ත්‍ර මඳ දැ'යි කී ය.

ii. 'අයියණ්ඩිය බිය නොවන්න. මැරෙනා සැටි මම පෙන්වමි' යි මද්දුම බණ්ඩාර වීරයා පැවැසී ය.

iii. 'ඔබට යහපතක් ම වේවා! 'යි ඈ ප්‍රාර්ථනා කළා ය.

iv. ලක්දිවට වැඩම කළ මහින්ද මහරහතන් වහන්සේ 'මහරජ, අපි ධර්මරාජයාණන්ගේ ශ්‍රාවකයෝ වම්හ. ඔබ කෙරෙහි අනුකම්පායෙන් දඹදිව සිට මෙහි පැමිණියෙමු'යි වදාළ සේක.

v. උදෑසන රැස්වීමට පැමිණි විදුහල්පතිතුමා 'සියලු ශිෂ්‍ය ශිෂ්‍යාවන් උදෑසනින් පාසලට පැමිණිය යුතු ය. පිරිසිදු කිරීම් සියල්ල අවසන් කළ යුතු ය. ආගමික වතාවත්වල නිරත විය යුතු යැ'යි පැවැසී ය.

ඉහත කොටස් විකෘති කථනයෙන් ලියන්න.

# 28. වාක්‍ය රචනය

**නිපුණතාව :** 9.0 සංශ්ලේෂණ හා විශ්ලේෂණ පරිචය ප්‍රදර්ශනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 9.1 සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියා ප්‍රදර්ශනය කරමින් විචාරශීලී ව ශාස්ත්‍රීය, විචාරාත්මක හා නිර්මාණාත්මක රචනා ලියයි.

**කාලච්ඡේද :** 06 යි.

**ඉගැනුම් පල :**
- මාතෘකානුකූල රචනා ලිවීම සඳහා අවශ්‍ය තොරතුරු රැස් කරයි.
- මාතෘකාවට අදාළ ව රචනාවේ සැලැස්ම ගොඩ නඟයි.
- රචනා ලිවීමේ දී තර්කානුකූල ව කරුණු සංවිධානය කරයි.
- සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියා ප්‍රදර්ශනය කරමින් රචනා ලියයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**I පෙර සූදානම :**
- රචනාවක් ඇගයීමේ දී සැලකිලිමත් විය යුතු ඇමුණුම 01 හි සඳහන් තොරතුරු හා තවත් තොරතුරු එක් රැස් කර ඒ පිළිබඳ දැනුවත් වන්න.
- සාර්ථක රචනාවක් ලිවීමේ දී සැලකිලිමත් වියයුතු කරුණු පිළිබඳ ශිෂ්‍යයන් දැනුවත් කිරීමට සූදානම් වන්න.

**II ඉගැනුම සංවර්ධනය :**
- පහත සඳහන් ආකාරයේ සුදුසු ප්‍රවේශයකින් පාඩම ආරම්භ කරන්න.
  - * සාර්ථක රචනාවකින් කොටසක් කියවීම
  - * එක ම මාතෘකාව ඔස්සේ (ශිෂ්‍යයන් කිහිපදෙනෙකු විසින්) ලියන ලද විවිධ මට්ටමේ රචනා 03ක මුල් ඡේද ශිෂ්‍යයන්ට ඉදිරිපත් කර ඒ පිළිබඳ අදහස් විමසීම
  - * වචන 250ක පමණ කෙටි රචනාවක් ශිෂ්‍යයන්ට ඉදිරිපත් කර එහි සාර්ථක අසාර්ථක ලක්ෂණ ශිෂ්‍යයන්ගෙන් විමසීම
- ඇමුණුම 01හි සඳහන් කරුණු පිළිබඳ ව ශිෂ්‍යයන් දැනුවත් කරන්න.
- ඒ ඇසුරින් සාර්ථක රචනාවක ලක්ෂණ සාකච්ඡා කරන්න.
- පන්තිය කණ්ඩායම් කිහිපයකට බෙදන්න.
- ඇමුණුම 02හි සඳහන් රචනා මාතෘකා කණ්ඩායම්වලට ලබා දෙන්න.
- තම කණ්ඩායමට ලැබුණු රචනා මාතෘකාවට අනුව රචනා සැකිල්ලක් සැකසීමට කණ්ඩායම්වලට පවරන්න.
- ඒ ඒ කණ්ඩායම් විසින් සකස් කරන ලද සැකිලි කණ්ඩායම් අතර හුවමාරු කර ගන්න.
- රචනා සැකිලි උපයෝගි කර ගෙන තනි තනි ව රචනා ලිවීමට ශිෂ්‍යයන්ට පවරන්න.
- රචනා ඇගයීම ද ශිෂ්‍යයන් අතර හුවමාරු කර ගනිමින් සිදු කරන්න.

**III තක්සේරුව හා ඇගයීම**

- රචනා ලිවීමේ පැවරුමක් ලබා දෙන්න.
- ඇගයීම් නිර්ණායක යොදා ගෙන ශිෂ්‍යයන්ගේ රචනා ඇගයීමට ලක් කර ලකුණු ප්‍රදානය කරන්න.

**ගුණාත්මක යෙදවුම්** : * ආදර්ශ රචනා
* ඇමුණුම 01

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක :**

- සාර්ථක රචනාවක ලක්ෂණ පැහැදිලි කරයි.
- රචනා ලිවීම සඳහා අවශ්‍ය කරුණු රැස් කරයි.
- රචනාවේ ආරම්භය, මධ්‍යය හා අවසානය ගොඩනගයි.
- ශිල්පීය දක්ෂතා ප්‍රදර්ශනය කරමින් රචනා ලියයි.
- කරුණු මනා ව සංවිධානය කරමින් රචනා ලියයි.
- තර්කානුකූල ව කරුණු ඉදිරිපත් කරයි.

**පරිශීලනීය ග්‍රන්ථ :**

- තේනබදු, පී. - සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය
- මුනිදාස, කුමාරතුංග - ප්‍රබන්ධෝපදේශය
- විතාරණ, වි - පදය, වාක්‍යය හා ඡේදය
- ශුභවික්‍රම, මුනිදාස - භාෂාව හා රචනය

ඇමුණුම 1

**වාක්‍ය රචනා ඇගයීමේ දී සැලකිලිමත් වන කරුණු**

1. තෝරා ගත් මාතෘකාවට අදාළ ව ප්‍රමාණවත් ලෙස කරුණු එක් රැස් කිරීම
2. එක් රැස් කර ගත් කරුණු සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීම
3. කරුණු පැහැදිලි ව ඉදිරිපත් කිරීම
4. සම්මත අක්ෂර වින්‍යාස රීති අනුගමනය කිරීම
5. සම්මත ව්‍යාකරණ රීති අනුගමනය කිරීම
6. ව්‍යක්ත ලෙස භාෂාව හැසිරවීම
7. උචිත පරිදි ඡේද වෙන් කිරීම
8. අත් අකුරු පැහැදිලි වීම
9. රචනෝපක්‍රම භාවිතය යහපත් වීම
10. නියමිත වචන සංඛ්‍යාව නොඅඩු ව තිබීම

# 29. ශාස්ත්‍රීය ලිපි සම්පාදනය

**නිපුණතාව :** 9.0 සංශ්ලේෂණ හා විශ්ලේෂණ පරිචය ප්‍රදර්ශනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම :** 9.5 නිර්දිෂ්ට ගද්‍ය පාඨ ඇසුරෙන් විවිධ ලේඛන ශෛලි හඳුනා ගෙන භාෂා කාර්යයේ යෙදෙයි.

**කාලච්ඡේද :** 08 යි.

**ඉගැනුම් පල :**

- විවිධ ලේඛන සඳහා උචිත ආකෘති හා ලේඛන ශෛලි පවතින බව විස්තර කරයි.
- ශාස්ත්‍රීය ලිපි යනු මොනවා දැයි පැහැදිලි කරයි.
- ලේඛනයේ ස්වභාවය අනුව උචිත ආකෘති හා ලේඛන ශෛලිය තෝරා ගනියි.
- නිර්මාණශීලී ලෙසත් නිවැරදි වත් භාෂාව හසුරුවමින් ලේඛනයේ යෙදෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**I පෙර සූදානම :**

- ශාස්ත්‍රීය ලිපියක විශේෂත්වය පිළිබඳ පොත පත ඇසුරෙන් කරුණු රැස් කර ගන්න.
- නිදර්ශන ලෙස යොදා ගත හැකි ශාස්ත්‍රීය ලිපි කිහිපයක්, පුවත්පත්, සඟරා ඇසුරෙන් තෝරා ගන්න.
- පැවරුම් පත්‍රිකා හා අවශ්‍ය අනෙකුත් ඉගැනුම් උපකරණ සූදානම් කර ගන්න.

**II ඉගැනුම සංවර්ධනය :**

- පාඩම සඳහා පහත සඳහන් ආකාරයේ සුදුසු ප්‍රවේශයක් යොදා ගන්න.
  * ශාස්ත්‍රීය ලිපියක කොටසක් ශිෂ්‍යයන්ට ඇසෙන සේ කියවීම
  * උඩිස් ප්‍රක්ෂේපණ හෝ බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ ආශ්‍රයෙන් විවිධ ලිපිවල (තීරු ලිපි, කතුවැකි, වාර්තා, ශාස්ත්‍රීය ලිපි ආදි) කොටස් ශිෂ්‍යයන්ට ප්‍රදර්ශනය කර ඒවා වෙන වෙන ම හඳුනා ගැනීමට සැලැස්වීම
  * පුවත්පත්/සඟරා කිහිපයක් ශිෂ්‍යයන්ට ලබා දී ඒවායේ ඇතුළත් විවිධ ලිපි වර්ග පිළිබඳ විමසීම
- ප්‍රවේශයේ දී මතු වූ කරුණු ද ඉවහල් කරගෙන ශාස්ත්‍රීය ලිපියක් හඳුනා ගැනීම සඳහා සුදුසු සාකච්ඡාවක යෙදෙන්න. එහි දී ඇමුණුම 1හි ඇතුළත් තොරතුරු ද යොදා ගන්න.
- ශාස්ත්‍රීය ලිපි කිහිපයක් ප්‍රදර්ශනය කරන්න.
- එම ලිපි කියවා බලා ඒවායේ ස්වරූපය හඳුනා ගැනීමට අවස්ථාව සලසන්න.
- ශිෂ්‍යයන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- එම කණ්ඩායම්වලට ශාස්ත්‍රීය ලිපිය බැගින් ලබා දී ශාස්ත්‍රීය ලිපියක අන්තර්ගත ලක්ෂණ පෙළ ගැස්වීමට යොමු කරන්න.
- ශිෂ්‍ය කණ්ඩායම් හඳුනාගත් ශාස්ත්‍රීය ලිපියක ලක්ෂණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථා ලබා දෙන්න.
- ශාස්ත්‍රීය ලිපි රචනයේ දී අනුගමනය කළ යුතු විශේෂ ක්‍රම ශිල්ප පිළිබඳ සාකච්ඡා කරන්න.
- එම තොරතුරු ඇසුරු කරගෙන ශාස්ත්‍රීය ලිපියක් සකස් කිරීමේ හැකියාව වර්ධනය කර ගැනීම සඳහා මඟ පෙන්වන්න.

**තක්සේරුව හා ඇගයීම**

- ශාස්ත්‍රීය ලිපි රචනයට සුදුසු මාතෘකා කිහිපයක් ලබා දී ඒ ඔස්සේ ශාස්ත්‍රීය ලිපි රචනයට ශිෂ්‍යයන් යොමු කරන්න.
- තක්සේරුවක/ඇගයීමක යෙදෙන්න.
- සාර්ථක ලිපි, බිත්ති පුවත් පත්, සඟරා හා ජාතික පුවත් පත් වෙත යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම්** : * ඇමුණුම් 01,02
* පුවත් පත්/සඟරා කිහිපයක්
* තෝරා ගත් ශාස්ත්‍රීය ලිපි කිහිපයක්

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක :**

- ශාස්ත්‍රීය ලිපියක තිබිය යුතු ලක්ෂණ ලැයිස්තුගත කරයි.
- ශාස්ත්‍රීය ලිපි වෙනත් ලිපිවලින් වෙනස් වන ආකාරය පැහැදිලි කරයි.
- ශාස්ත්‍රීය ලිපියක් සඳහා උචිත කරුණු ගොනු කරයි.
- ශාස්ත්‍රීය ලිපි නිර්මාණය කරයි.

**පරිශීලනීය ග්‍රන්ථ** :

- සරච්චන්ද්‍ර, එදිරිවීර - සාහිත්‍ය විද්‍යාව
- සිරි සීවලී හිමි, බඹරැන්දේ - සිංහල ශෛලිය

**ඇමුණුම 01 - ශාස්ත්‍රීය ලිපියක ලක්ෂණ**

- එක් විෂය ක්ෂේත්‍රයක් හෝ එහි එක් අංගයක් පිළිබඳ ව පුළුල් විමර්ශනයක් ඇතුළත් වීම
- පාරිභාෂික වචන බහුල ව දක්නට ලැබීම
- ක්‍රමානුකූල ව සැලැස්මකට අනුව කරුණු ඉදිරිපත් කිරීම
- කරුණු විශ්ලේෂණය කරමින් තර්කානුකූල ව ඉදිරිපත් කිරීම සහ කරුණු තහවුරු කිරීම සඳහා විවිධ පොත පත පාදක කර ගැනීම
- වාච්‍යාර්ථවත් භාෂා භාවිතය
- ව්‍යක්ත ලෙස භාෂාව හැසිරවීම
- ව්‍යාකරණානුකූල ව ලේඛනයේ යෙදීම
- තර්කානුකූල ව කරුණු ඉදිරිපත් කිරීම
- අවශ්‍ය ස්ථානයන්හි කරුණු තහවුරු කිරීමට අවශ්‍ය පාදක සටහන් ඇතුළත් කිරීම
- ආශ්‍රිත ග්‍රන්ථ පෙළ ගැස්වීම

**ඇමුණුම 02 - තෝරාගත් ශාස්ත්‍රීය ලිපියක්**

**නාට්‍ය භාෂාව හා සරච්චන්ද්‍ර නිර්මාණ**

**- මහාචාර්ය කේ. එන්. ඕ. ධර්මදාස -**

අද අප නාට්‍යය යනුවෙන් හඳුන්වන කලා ස්වරූපය අතීතයේ භාරතීයයන් විසින් ''දෘශ්‍ය කාව්‍ය'' යනුවෙන් ද හඳුන්වන ලදි. මෙසේ ඇසින් දක්ක මනා කාව්‍යයක් ලෙස නාට්‍යය සලකන ලද්දේ එහි දෘශ්‍යමය අංගය කෙරේ විශේෂ අවධානය යෙදිය යුතු බව සලකමින් විය යුතු ය. ''නාට්‍ය'' යනු නාට්‍ය පෙළ නොවේ. දෙබස්, ගීත ආදි වශයෙන් නාට්‍යයේ විවිධ පාත්‍රයන්ගෙන් ප්‍රකාශ වන වචන සමූහයත් ඔවුන් හැසිරිය යුත්තේ

මෙසේ යැයි කියන රංග නිර්දේශත් ඇතුළත් වූ නාට්‍ය පෙළ වනාහි නාට්‍ය නිර්මාණයක් අපේක්ෂා කරන්නා වූ කලලයක් පමණකි. නාට්‍ය නිර්මාණයක් බිහි වන්නේ එම පෙළ වාචික, සාත්වික, ආංගික හා ආහාර්ය යන චතුර්විධ අභිනය මගින් රංගගත වන අවස්ථාවෙහි ය. ඒ රංගගත වීම සම්පූර්ණ වන්නට නම් ප්‍රේක්ෂක සමූහයක් ද අවශ්‍ය ය. නාට්‍යය නමැති කලා කෘතිය ප්‍රාදුර්භූත වන්නේ ඒ මොහොතේ දී යැයි කිව යුතු ය. ''රූපණයෙහි දක්ෂ වූ නළුනිළි කණ්ඩායමක් හා රසවින්දනයෙහි චිරපරිචයක් ඇති ප්‍රේක්ෂක සමූහයක් එක් වූ විට ඔවුන්ගේ අන්‍යෝන්‍ය සම්බන්ධයෙන් එක්තරා ආශ්චර්යමත් දෙයක් මතු වේ. එනම් නාට්‍ය රසය ය.''[1]

නාට්‍යය රංගගත වන්නේ අභිනය මාධ්‍යයෙනැයි ඉහත සඳහන් විය. ''අභිනය'' යන්නෙහි වාච්‍යාර්ථය නම් ''පැමිණවීම'' හෙවත් ''ගෙන ඒම'' යන්නයි. නාට්‍ය පෙළ පදනම වශයෙන් ගෙන නාට්‍යය රසිකයන් වෙත ගෙන එනු ලබන්නේ අභිනය මගිනි. මෙයින් වාචික, ආංගික සහ සාත්වික යන තුනෙන් දැක්වෙන්නේ නිළියන් පෞද්ගලිකව කරන ක්‍රියාවන් ය. ''වාචිකාභිනය'' යනු මුවෙන් කරන බිණීම් ය; ''ආංගිකාභිනය'' යනු අත් පා ආදි ශරීරාවයවයන්ගෙන් කරන හැසිරීම් ය; ''සාත්විකාභිනය'' යනු මනෝභාවයන් මුහුණෙන් හා අන්‍ය ශරීරාවයවයන්ගෙන් පළ කිරීමයි; අනෙක් අතින් ''ආහාර්යාභිනය'' යන්නට මුහුණු හා ශරීර හැඩ වැඩ ගැන් වීම්, ඇඳුම් පැළඳුම්, වෙස්මුහුණු ආදියෙන් නළු නිළියන් සැරසෙන ආකාරය මෙන්ම නාට්‍යයේ දී භාවිත වන උපකරණ ද ඇතුළත් වේ.

නාට්‍යය දෘශ්‍යකාව්‍යයක් නම් එම කාව්‍යය පසක් කර ගත හැක්කේ වාචිකාදි අභිනය සංයෝජනය වන මොහොතෙහි දී යැයි කිව යුතු ය. එහෙයින් චතුර්විධ අභිනය වනාහි නාට්‍යයේ ප්‍රකාශන මාධ්‍යය යැයි ගිණිය යුතු වේ. මෙ නයින් සලකා බලන කල්හි චතුර්විධ අභිනය වනාහි නාට්‍යයේ ''රංග භාෂාව'' යැයි සැලකිය හැකිය. මේ සමාන අදහසක් බටහිර නාට්‍ය විචාරකයන් ද දක්වා ඇත. **නාට්‍ය භාෂාව** යන නමින් පොතක් ලියූ ජෝන් රසල් බ්‍රවුන් විසින් දක්වා ඇති පරිදි රුඩොල්ෆ් ලබාන් සහ අන්තෝනින් අර්තෝද් යන නාට්‍ය ශිල්පීන්ගෙන් මේ සමාන අදහස් ප්‍රකාශ වී තිබේ. ''නාට්‍යය වනාහි නිරන්තරව කථා කරන චිත්‍රයකි'' යනු ලබාන්ගේ කියමනකි. අර්තෝද් විසින් පළ කොට ඇති අදහස මෙසේ ය: ''වේදිකාව යනු පිරවිය යුතුව තිබෙන භෞතික අවකාශයකි. වේදිකාව විසින් කථා කිරීම සඳහා එයට ම විශේෂ වූ භාෂාවක් සැපයිය යුතුය.... මෙම භාෂාව වචනවලින් වෙනස් විය යුතු බවත් එය ඉන්ද්‍රිය ගෝචර විය යුතු බවත් මගේ අදහසයි. භාෂාවේ කාව්‍යමය භාවයක් ඇතිවාක් මෙන් ඉන්ද්‍රියයන් හා සම්බන්ධ කාව්‍යමය භාවයක් ද ඇතැයි සිතමි.'' ඉන්ද්‍රියයන් යනුවෙන් අර්තෝද් අදහස් කරන්නේ ඇස ප්‍රමුඛ සියලු ඉන්ද්‍රියයන් විය යුතුය.

''නාට්‍ය භාෂාව'' යනු කුමක් දැයි මෙසේ පැහැදිලි කර ගත යුතුව ඇත්තේ ''භාෂාව'' යන වචනයට සාමාන්‍යයෙන් ලැබෙන අරුතින් එය වෙන් කොට සැලකිය යුතු බැවිනි. ''නාට්‍ය භාෂාව'' හුදෙක් වචනවලට සීමා වූවක් නොව ඊට වඩා පුළුල් මාධ්‍යයක් ලෙස හඳුනා ගත යුතු හෙයිනි.

එහෙත් නාට්‍යය රචනා කිරීමේ දී යොදා ගෙන ඇති වචනවල වැදගත් කම සුළු කොට තැකීමක් මෙහි දී අපේක්ෂා නොකෙරේ. නාට්‍ය පෙළ ලිවීමේ දී යොදා ගැනෙන බස්වහර එම නාට්‍යයේ කලාත්මක ගුණයට උපස්තම්භක වන ප්‍රධාන අංගයක් වන්නේ ය. මෙම බස්වහර හසුරුවා ඇති ආකාරය වාචික, සාත්වික හා ආංගික අභිනය කෙරේ බල පානු ඇත. වාචික, සාත්වික හා ආංගිකාභිනය බොහෝ දුරට මෙහෙයවන්නේ නාට්‍යය රචිත බස්වහර විසිනැයි පැවැසිය හැකිය. එහෙයින් නාට්‍යය රචනා කිරීමේ දී යොදා ගැනෙන බස් වහර විශේෂයෙන් සැලකිල්ලට ගත යුතුව ඇත. ඒ කෙසේ වුව ද නාට්‍ය නිර්මාණයක් අගැයීමේ දී වැදගත් වන්නේ එම බස්වහර සමස්ත ''නාට්‍ය භාෂාව'' තුළ පෙනී සිටින ආකාරය ය.

මෙම අදහස් අනුව විමසන කල්හි නාට්‍යකරුවෙකු වශයෙන් එදිරිවීර සරච්චන්ද්‍රයන් කාර්ය සාඵල්‍යය කෙසේ මැනිය හැකි ද?

භරත මුනිවරයා විසින් හඳුන්වා දී ඇති ''ලෝක ධර්මී'' සහ ''නාට්‍ය ධර්මී'' යන නාට්‍ය භාෂා දෙක අනුසාරයෙන් කරුණු විමසා බලන විට ''නාට්‍ය ධර්මී'' නාට්‍ය භාෂාව සිංහල නාට්‍ය ලෝකයෙහි ප්‍රතිෂ්ඨාපනය කරන ලද්දේ සරච්චන්ද්‍රයන් විසින් බව අවිවාදයෙන් පිළිගැනෙන කරුණකි. 1956 වර්ෂයේ **මනමේ** නාටකය බිහි වීමට පෙර සිංහල නාට්‍යකරුවන් යම් යම් ''නාට්‍ය ධර්මී'' ලක්ෂණ යොදා ගෙන තිබුණ නමුත් සම්පූර්ණයෙන් ම නාට්‍ය ධර්මී ස්වරූපයෙන් නාට්‍යයක් ඉදිරිපත් වූයේ **මනමේ** සමඟ ය.

නාට්‍ය කලාවේ ප්‍රාකෘතික ලක්ෂණ ගත් සොකරි, කෝලම් වැනි ජන නාට්‍ය විධි පසෙක තිබිය දී නූතන සිංහල නාගරික නාට්‍යයේ මුල් අඩියර වන ''නූර්ති'' යුගයේ දී මෙන්ම ඉන් පසුව ආ ''ජයමාන්න නාට්‍ය'' යුගයෙහි දී ද ගීතයට සුවිශේෂ තැනක් ලැබීම ''නාට්‍ය ධර්මී'' ලක්ෂණ ඇතුළත් කර ගැනීමක් ලෙස සැලකිය හැකි ය. එබඳු ''නාට්‍ය ධර්මී''ලක්ෂණයන්ගෙන් තොර හුදු '' ලෝක ධර්මී'' ස්වරූපය ගත් නාට්‍යයක් සිංහලෙන් ඉදිරිපත් වූයේ නවසිය හතළිස් ගණන්වල දී විශ්වවිද්‍යාල නාට්‍යකරුවන් අතින් යැයි කිව යුතුය. මීට පැහැදිලි නිදර්ශනයක් ලෙස දැක්විය හැක්කේ එදා ජනප්‍රියව පැවති ජයමාන්න නාට්‍යයේ අස්වාභාවිකත්වය ප්‍රතික්ෂේප කරමින් විශ්වවිද්‍යාලයීය **රංග සභාව** විසින් 1945 දී ඉදිරිපත් කරන ලද ''කපුවා කපෝති'' නාට්‍යයයි. මෙය නිෂ්පාදනය කරන ලද්දේ මෙවකට විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි මහාචාර්යවරයා වූ ඊ. එෆ්. සී. ලුඩොවයික් මහතා විසිනි. [5]

සරච්චන්ද්‍රයන් විසින් 1951 දී ලියා නිෂ්පාදනය කරන ලද ''බහින කලාව'' නාට්‍යය එම ලෝක ධර්මී නාට්‍ය භාෂාවෙන් ම රංග ගත වූයේය. මෙම නාට්‍යය විදග්ධ රුචිකත්වයක් පිළිබිඹු කරන්නා වූ නිර්මාණයක් වූයේ වී නමුත් මේ වන විට සිංහල නාට්‍ය කලාවේ ඉදිරි ගමන සඳහා ඉන් ලැබෙන පිටුවහල අල්ප බව පෙනෙන්නට තිබුණි.

ලංකාව යටත් විජිත තත්ත්වයෙන් මිදී දේශපාලන ස්වාධීනත්වය ලබා වසර කීපයක් ගත වී තිබුණ මේ අවධියෙහි සංස්කෘතික වශයෙන් ජාතික උරුමය පුනරුත්ථාපනය කිරීමේ අවශ්‍යතාව දැනෙමින් තිබුණි. සිංහල නාට්‍යය සම්බන්ධයෙන් මෙම අපේක්ෂාව ප්‍රකාශ වූ ආකාරය 1949 වර්ෂයේදී විල්මට් පී. විජයතුංගයන් විසින් කරන ලද මෙම ප්‍රකාශයෙන් පැහැදිලි වේ: ''සිංහල නාටකය මනා සේ හැඩ ගැසුණා වූ ජාතික නෘත්‍ය කලා ක්ෂේත්‍රයෙහි ප්‍රධානතම අංගය විය යුත්තේ ය. එහි නිර්මාපකයෝ ලංකාමාතාවගේ අධ්‍යාත්මය හඳුනා ගත්තවුන් විය යුත්තාහ. ඔවුහු ඇයගේ භාෂාව, ඇදහිලි, විශ්වාස, ඉතිහාසය, සම්ප්‍රදායයන් හා සංස්කෘතිය සමග සමීපතර සබඳතාවක් ඇතියවුන් විය යුත්තාහ.'' මේ වන විට පාරම්පරික සිංහල සංස්කෘතිය පිළිබඳ උද්‍යෝගයක් විශ්වවිද්‍යාලයේ ජනිත වී තිබුණි. ගැමියන් අතර ප්‍රාකෘතික ස්වරූපයෙන් පැවති නාට්‍ය කලාව පිළිබඳ විධිමත් ගවේෂණයක් කළ සරච්චන්ද්‍ර මහතා එහි ප්‍රතිඵල 1952 දී *The Sinhalese Folk Play* නමැති ග්‍රන්ථයෙන් ප්‍රකාශයට පත් කළේ එම උද්‍යෝගයේ එක් අංශයක් විදහා පාමිනි.

ජාතික සංස්කෘතිය පිළිබඳව මේ අවධියේ පැවති පුළුල් උද්‍යෝගය සිංහල නාට්‍යයේ ස්වරූපය කෙරේ බල පෑ අයුරු පළමුවර දක්නට ලැබුණේ සරච්චන්ද්‍රයන් විසින් 1952 දී ලියා නිෂ්පාදනය කරන ලද ''පබාවතී'' නාට්‍යයෙනි. මෙහි දී සිංහල නාඩගමත් සම්භාව්‍ය සංස්කෘත නාට්‍යයත් ගුරු කොට ගනිමින් නාට්‍ය ධර්මී අංග ඇතුළත් කර ගන්නා ලදි. සූත්‍රධාරී චරිතයක් හා පසුබිම් ගීත ඇතුළත් කරන ලද්දේ දේශීය ලක්ෂණ ආරෝපණය කිරීමේ අටියෙන් බව පැහැදිලි ය. එහෙත් එම සාම්ප්‍රදායික අංග සමස්ත වශයෙන් ලෝකධර්මී නාට්‍ය භාෂාවෙන් ඉදිරිපත් වූ එම නිර්මාණයේ සැලැස්ම හා ඒකාබද්ධ නොවූ සෙයක් පෙනුණි.

''පබාවතී'' නාට්‍යයෙහි පාත්‍රයන් කථාබහ කරන්නේ මීට පෙර සිංහල නාට්‍යයන්හි රාජ රාජ මහාමාත්‍යාදීන්ගේ මුවින් නික්මුණු අන්දමේ සාහිත්‍යික භාෂාවෙන් නොව පොදු ජනතාව අතර ප්‍රචලිත කථා ව්‍යවහාරයට අනුකූල බසකිනි. මෙසේ දෙබස් කටවහරේ ස්වරූපයෙන් ඉදිරිපත් කිරීමත් ආංගිකාභිනය හා සාත්විකාභිනය ස්වාභාවිකත්වයට අනුව යෙදීමත් ලෝක ධර්මී නාට්‍ය භාෂාවට සරිලන පරිදි කරන ලද බව පෙනේ. වාචිකාභිනය සමස්ත වශයෙන් ස්වාභාවික දෙබස් විලසින් ඉදිරිපත් වූ නමුත් කුස කුමරුගේ මුවට නංවන ලද ''තිර නෑ කිසිවක් මෙලොවේ'' ගීතයත් ඔහුගේ විරහ දුක ප්‍රකාශ කිරීම සඳහා පසුබිමින් ගයන ලද ''කොවුලන් කිඳුරු නද මිහිරි'' ගීතයත් නාට්‍ය ධර්මී ලක්ෂණ ඇතුළත් කර ගැනීම් සේ දැක්විය හැකි ය. මේ අතර ආහාර්යාභිනය එනම් අංග රචනා, වේදිකා සැරසිලි ආදිය ලෝකධර්මී ස්වභාවයෙන් ම සිදු විය.

''පබාවතී'' නාට්‍යයෙහි ඇතුළත් කරන ලද දේශීය ලක්ෂණ සමස්ත නිර්මාණය හා ඒකාබද්ධ නොවූ විලසක් දිස් වූයේ නම් එයට පිළියම සමස්ත නිර්මාණයම දේශීය සම්ප්‍රදාය අනුව හැඩ ගසා ගැනීම බව සරච්චන්ද්‍රයන් පසක් කළ බැව් ඔවුන් ඊළඟට බිහි කළ ''මනමේ'' නාටකයෙන් පැහැදිලි විය. පාත්‍රයන්ගේ රංගාවතරණය ඔවුන්ගේ වාචික, ආංගික හා සාත්වික අභිනය නාට්‍යයේ ආහාර්යාභිනය, පෙළ ලියා ඇති බස්වහර ආදී සියලු අංග ප්‍රත්‍යංග ශෛලීගත විලාසයකින් යොදා ගැන්මෙන් සමස්ත වශයෙන් නාට්‍ය ධර්මී නාට්‍ය භාෂාවෙන් ඉදිරිපත් වූ නාට්‍යයක් පළමුවරට සිංහල වේදිකාවෙහි පහළ වූයේ ''මනමේ'' නාට්‍යයෙන් බව ප්‍රකට කරුණකි.

''මනමේ'' නාට්‍යය කෙරේ සිංහල ප්‍රේක්ෂකයන් ක්ෂණික ප්‍රසාදයට පත් වූයේ මන්දැයි පැහැදිලි කරන එක්තරා කරුණක් අපගේ අවධානයට යොමු විය යුතුව ඇත. එනම් සිංහල ප්‍රේක්ෂකයන් චිර සේවනය නිසා නාට්‍ය ධර්මී රංග භාෂාවට අතිශයින් සමීප ව සිටීම ය. සොකරි, කෝලම් ආදි ජන නාට්‍යයන්හි මෙන් ම ගැමි ශාන්තිකර්මයන්හි ඇති නාට්‍යමය අන්තර් ජවනිකාවන්හි ද, අවිදග්ධ ස්වරූපයෙන් වුව පැවැත්ම නිසා නාට්‍ය ධර්මී රංග භාෂාව අපට සාම්ප්‍රදායිකව උරුම වී තිබේ. ''මනමේ'' නාට්‍යයෙන් සිදු වූයේ අපගේ ඒ චිරන්තන සම්ප්‍රදාය පදනම් කොට ගෙන නූතන රසඥතාවට සරිලන කලා නිර්මාණයක් බිහි කිරීම ය.

සිංහල ජනතාවගේ රසිකත්වය හා චිරන්තනව බැඳී පවතින නාට්‍ය ධර්මී රංග භාෂාව පිළිබඳව විවිධ අත්හදා බැලීම් කීපයක් සරච්චන්ද්‍රයන් විසින් තදනන්තරව කරන ලදි. ''මනමේ'' සහ ''සිංහබාහු'' යන නිර්මාණ එක් අතකිනුත් ''වෙල්ලවැහුම්'',''ඒකට මට හිනා හිනා'', ''එලොව ගිහින් මෙලොව ආවා'' ,''මහාසාර'' වැනි නාට්‍ය අනික් අතිනුත් සලකන කල මේ බව පැහැදිලි වේ. ''මනමේ'' සහ ''සිංහබාහු'' වැනි ගැඹුරු අදහස් ගැබ් කර ගත් නාට්‍යයක යෙදෙන අභිනය ස්වරූපය නොවේ, ''වෙල්ලවැහුම්'' වැනි හාස්‍යෝත්පාදක නාට්‍යයක යෙදී ඇත්තේ. ගැඹුරු අදහස් ගැබ් වූ නාට්‍යවල ඇත්තේ වඩා සංස්කෘත නාට්‍ය සම්ප්‍රදායට අයිති අභිනය විලාස ය. හාස්‍යෝත්පාදක නාට්‍යයන්හි අභිනය විලාස සිංහල ජන නාට්‍යවලට වඩා සමීප වේ.

සරච්චන්ද්‍රයන්ගේ නාට්‍යයන්හි රංග භාෂාව අරභයා මෙන්ම ඒවා රචනය වූ බස්වහර පිළිබඳව ද මෙබඳු ප්‍රභේදයක් දැක්ක හැකි ය. ''මනමේ'', ''සිංහබාහු'', ''පෙමතො ජායතී සොකො'', ''වෙස්සන්තර'' වැනි ගැඹුරු අත්දැකීම් ප්‍රකාශ කෙරෙන නාට්‍යයන් රචනා වී ඇත්තේ උදාර භාෂා විලාසයකිනි. අනෙක් අතට

''වෙල්ලවැහුම්'', ''රත්තරන්'', ''ඒකට මට හිනා හිනා'', ''එලොව ගිහින් මෙලොව ආවා'' ආදී හාස්‍යෝත්පාදක නාට්‍යයන්හි දී එදිනෙදා සංවාදය සඳහා යෙදෙන බස්වහර උපයෝගි කර ගෙන ඇත. සරච්චන්ද්‍රයන් සිය නාට්‍ය රචනයෙහි දී බස්වහරේ ඖදාර්යය සාධනය කරන්නේ පැරණි සාහිත්‍ය කෘතීන්හි එන යෙදුම් ද පාලි සහ සංස්කෘත තත්සම වදන් ද උපයෝගි කර ගනිමිනි.

පාත්‍රයන් සිත් කලබලයෙන් හැසිරෙන අවස්ථා දෙකක් නිරූපණය කර ඇති අයුරු සංසන්දනයෙන් මෙය පැහැදිලි කර ගත හැකිය. පළමු නිදසුන ''මහාසාර'' නාටකයෙහිඃ

රජ : මාළිගාවේ ඔක්කොම හොරු!
වට කරගෙන හොර මුළුවක්
කොහොම ද අපි මෙහි වෙසෙන්නෙ ?
මොකද අපට වෙන්න යන්නෙ ?

බිසව : අනිත් පාර ඔබතුමාගෙ
ඔටුන්න හොරකම් කරාවි.

කථා ව්‍යවහාරය පදනම් කරගෙන පබැඳුණු එම ගීතය සමග සම්භාව්‍ය සාහිත්‍යගත භාෂා විලාසය පදනම් කරගත් ''මනමේ'' නාට්‍යයේ මෙම ගීතය සසඳා බැලිය හැකි ය.

කුමරි : වන් මේ අරන්නේ - මන් බිය වන්නේ
නන්දන මා හිමි - වූ නර නින්දේ
තුංගමෙ ගිරි තුළ - සිංහ වලස් රැළ
ළංවේය තැන තැන - රිංගා රුප්පාවල

''මනමේ'' නාට්‍යයෙහි පාත්‍රෝචිත ආකාරයට අන්තරාය හමුවේ වුව සංයමය හා ඖදාර්යය ප්‍රකාශ කිරීම සඳහා බස්වහර හැඩ ගස්වා ඇති අයුරු පැහැදිලි ය.

නාට්‍යයෙහි කථනීය භාෂාවෙහි විශිෂ්ට ලක්ෂණ කවරෙක් වේ ද ඒ හැමෙකක් ම සරච්චන්ද්‍රයන්ගේ නාට්‍යයන්හි නොමඳව දක්නා ලැබේ.

නාට්‍ය රචනයෙහි දී යෙදන බස්වහර රංගනයෙහි දෘශ්‍යමය ස්වරූපයට උපකාරී විය යුතු ය. ''නාට්‍ය රචකයා බස්වහර යෙදිය යුත්තේ දෘශ්‍යමය ලෙසින් ප්‍රකාශනයට තුඩු දෙන අයුරිනි'' යැයි පැවසී ඇත්තේ එබැවිනි.[8] රචකයා කාව්‍යෝක්ති නිර්මාණයෙහි කෙතරම් දක්ෂයෙකු වුව ද නාට්‍ය රචනයෙහි දී යථෝක්ත අවශ්‍යතාව ඉටු කිරීමට ඔහු අසමත් වන්නේ නම් ඔහුගේ කවි ශක්තිය අපතේ ගියා වන්නේ ය. ඉංග්‍රීසි සාහිත්‍යයෙහි ඉතා විශිෂ්ට උදාන කාව්‍යය රචකයෙකු ලෙස සැලකෙන **බයිරන් සාමිවරයා** නාට්‍ය රචනයෙහි දී අසාර්ථක වූයේ නාට්‍ය භාෂාවේ මෙම අවශ්‍යතාව සපුරා ලීමට ඔහු අසමත් වූ බැවිනි. [9]

රංගන ක්‍රියාවට උපස්තම්භක වන අයුරින් බස්වහර යෙදුණු ස්ථානයකට උදාහරණයක් ලෙස ''සිංහබාහු'' නාට්‍යයේ එක් අවස්ථාවක් නිදසුන් කොට දැක්විය හැකිය. සිංහබාහු ගේ අපේක්ෂාවක් ගැන ඇසූ සිංහයා කෝපයෙන් මෙසේ පවසයිඃ

''කිම්ද මෙවදන් වැටහෙන්නෙ ද තතු ලෙද
යන්ට මෙලෙනෙන් දොඩවන්නෙ විකාරද
කන්ට බොන්ට දේ ගෙන දෙන්නෙමි නොමඳව
ගන්ට සිත බිය සැක නොදනිමි කාරණ''

මෙය වේග රිද්ම රංගනයක් හා සමඟ යෙදිය හැකි රචනයකි. සිංහයාගේ කෝපය හා චිත්ත වික්ෂෝභය වාචික, සාත්වික හා ආංගික යන අභිනය තුනේම සංකලනයෙන් ප්‍රකාශ වේ.

මින් අනතුරුව සුප්පා දේවියගේ සැනසිලි වදන් ඉදිරිපත් කෙරේ. එය සඳහා යෙදී ඇත්තේ ලාස්‍ය රිද්මයකි.

දයාබර හිමියනි උතුම් සංසල නොවනු ය මෙලෙසා
පියාදර ඔබ මෙ දරුවෝ හැම කරති ඔබ අණ නො වලසා
සමාකර උන් නොදැනුමෙන් මෙකියන බස් එහි ඇත දොසා
තොසාකර වළඳන් ගෙනා මේ අහර අපවෙත නොව රොසා

සිංහයාගේ මුවින් පිට වූ හලන්ත බහුල වාග්ධාරාවට හාත්පසින් ම වෙනස් වන සේ මෙහි ස්වරාන්ත බහුල වචන මාලාවක් යෙදී ඇත. සිංහයාගේ තාණ්ඩව රංගනයට එකී හලන්ත බහුල වචන මාලාව ගැළපුණා සේ සුප්පා දේවියගේ ශාන්ත රංගනයට මෙම ස්වරාන්ත බහුල වචන මාලාව උචිත වේ.

නාට්‍යයේ යෙදෙන බස්වහර හැමවිට ම ඒ ඒ චරිතයට ගැළපෙන අයුරින් සකස් විය යුතුය. මන් ද? නවකථාව වැනි රසිකයනට නිවී සැනසිල්ලේ සේවනය කළ හැකි කලා කෘතියක් සම්බන්ධයෙන් මෙන් නොව නාට්‍යය නැරඹීමේ දී චරිතයක් සැණින් හඳුනා ගැනීමේ පහසුව සැලසී තිබිය යුතු අතර මෙම පහසුව සලසා දෙන එක් උපක්‍රමයක් ලෙස චරිතයේ වාචිකාභිනය සැලකිය හැකි බැවිනි. ''නාට්‍යයේ භාෂාව හුදෙක් බාහිර අර්ථ ප්‍රකාශ කරනවාට වඩා යමක් කළ යුතුය. පාත්‍ර වර්ගයාගේ වාගුක්ති ලෙස සලකන කල්හි භාෂාව එක් එක් පාත්‍රයා හා සම්බන්ධ වූ චර්යා රටාවෙහි කොටසක් විය යුතු යැයි'' නාට්‍ය විචාරකයන් පවසන්නේ මේ නිසා බව පෙනේ.

මීට නිදසුනක් වශයෙන් ''මනමේ'' නාට්‍යයෙහි එක් අවස්ථාවක පාත්‍රයන් දෙදෙනක් උනුනුන් මුහුණට මුහුණ ලා සිටින තැනක් දැක්විය හැකිය.

මනමේ කුමරු : සේ සුරිඳු - බරණැස් පුර පසිඳු - රාජ කරනා ඒ
රුපුනොද බින්ද තේජසා
පවර ඒ නිරිඳුගේ පුත් කුමරා වෙමි
සතර ඉගෙන තක්සලාව ගොස් එමි
දුලා මෙ කුමරිය විවාහ කරගෙන
බලා පිටත් වෙමි බරණැස් පුරවර

වැදි රජ : මේ අරණේ - හිමගිර සිට දෙරණේ - මාගෙ සරණේ වේ
නැතහොත් වේය මරණේ
මුළු දඹදිවටම තොප මහරජ වුව
මාගෙ විජිතය මෙය මම වෙමි අගරජ
කව්ද තට මෙහි පිවිසෙන්නට කීවේ.
අවසර නොමැතිව බල තට වන දේ

මනමේ කුමරාගේ වදනින් පළ වන්නේ ඔහු රාජ සභා ජීවිතයෙන් ලත් සාම්ප්‍රදායික පුහුණුවය; තක්සලාවේ අධ්‍යාපනයෙන් ලත් විදග්ධතාව ය; සංයමය; යුද හරඹයෙහි පර තෙරට යාමෙන් ලත් ආත්ම විශ්වාසය ය. අනෙක් අතට එබඳු පුහුණුවක් හෝ විදග්ධතාවක් හෝ නැති වැදිරජු ගිය අහංමානය දළදඬු ලෙස ප්‍රකාශ කරයි.

නාට්‍ය රචනයේ දී කාව්‍යමය චින්තාවන් යෙදිය යුත්තේ රංගන මාධ්‍යයෙන් ඒ ප්‍රේක්ෂකයා වෙත පැමිණවීම ගැන සලකමිනි. මහා කාව්‍යයක දී නැතහොත් උදන කාව්‍යයක දී එසේත් නැතහොත් ප්‍රබන්ධ කථාවක දී මෙන් කාව්‍ය චින්තාවන් කාලය ගත කොට අවබෝධ කර ගැනීමට හා රසවිඳීමට නාට්‍ය ප්‍රේක්ෂකයාට ඉඩ නැත. පාත්‍රයන්ගේ මුවින් පිට වන කාව්‍යෝක්ති සැණින් වැටහෙන ස්වභාවයක් ගත යුතුය. නො එසේ නම් දුලබ අරුත් ගත් කවි සිතිවිලි වේදිකාවේ දී අපතේ යනු ඇත. නාට්‍යයේ යෙදෙන කාව්‍ය චින්තා ලක්ෂණ තුනකින් සමන්විත විය යුතු යැයි විචාරකයන් පවසා ඇති සැටි මෙහි දී අප සිහියට නැගේ. එනම් (1) සැණෙකින් වටහා ගත හැකි බව (2) නවකතාව හා සිත් ගන්නා සුළු බව (3) සමස්ත වශයෙන් නාට්‍යයේ යෙදී ඇති බස් වහර හා ගැළපීම යනුවෙනි.

ප්‍රේක්ෂකයන්ට සැණින් වටහා ගත හැකි කාව්‍යෝක්ති නිර්මාණය සඳහා සරච්චන්ද්‍රයන් යොදා ගත් එක් මඟක් නම් පැරණි කවිසමය ඇසුරු කිරීමයි.

''ලප නොම වන් සඳ සේ සොමි ගුණෙනා . . . ''

''උදුල කරවන අවිඳු ගණඳුරු. . .''

''රුසිරු ළඳුනි ඔබ ප්‍රේමයෙනා
ඔද වේ මා හද පද සොමි රැස් කිරි සයුර මෙනා''

"මනමේ" නාට්‍යයේ තැනින් තැන යෙදුණු මෙවැනි පැරණි කවි සමයානුගත කාව්‍යෝක්තීන් කෙරේ ප්‍රේක්ෂක ප්‍රතිචාරය සැණින් සිදු වේ.

ඇතැම් විට පැරණි කවිසමයෙහි එන ඇතැම් කාව්‍යෝක්ති පාදක කොට ගෙන නව කාව්‍ය සංකල්පයක් නිර්මාණය කිරීමෙන් රසිකයා විසිතුරු ලොවකට ගෙන යාමට ද සරච්චන්ද්‍රයෝ සමත් වෙති.

මා නිසා නෙත් මිණි පහන් තුළ
දල්වනුය පෙම් දැල්ල නොනිවා
එකලු කරනුය මහද මැදුරත
අරක් ගෙන ඇති අඳුර දුරලා

(පෙමතො ජායතී සොකො)

උද්දාල බමුණා සිය මුළු දිවිය ශාස්ත්‍රයට කැප කළ අයෙකි. කාන්තා සේවනයෙන් ලද හැකි ආස්වාදය ගැන ඔහු දන සිටියේ පොත පතේ නිරූපිත අන්දමින් පමණි. එහෙත් එය තමා ම ආස්වාදය කළ සැණින් ඔහු කෙතරම් චිත්ත විපර්යාසයකට පත් වී ද යත් එතෙක් කල් ගෙවූ දිවිය සම්පූර්ණයෙන්ම නිසරු දෝමනස්ස එකක් සේ ඔහුට පෙනිණි. ඔහු ස්වර්ණතිලකාට ප්‍රේමායාචනයක යෙදෙන්නේ සදා කල් තමා සමග හිඳ තම දිවිය ආලෝකවත් කරන ලෙසට ය.

සමස්ත නාට්‍යයේ යෙදෙන බස්වහර ගැන සිතන කල්හි ඇතැම් කාව්‍යෝක්තියක් එම බස්වහරින්ම යෙදිය නොහැකි වන්නට ඉඩ තිබේ. මන්ද ? කාව්‍යෝක්තියෙන් ප්‍රකාශ කළ යුතු වන්නේ එදිනෙදා භාවිත වන භාෂා ස්වරූපයෙන් පළ කළ නොහැකි අදහස් වන බැවිනි. සාමාන්‍ය භාෂා ව්‍යවහාරයේ සීමාවෙන් ඉක්මවා අදහස් පළ කළ යුතු තන්හි ය, කාව්‍යෝක්තිය යෙදිය යුතු වන්නේ.

දුලා නෙතු පුලා දිසි ස්වර්ණලතා සේ මේ ලඳා
ලත් හිරු රැස් ලෙස පද්ම විකසිත
සිත් මා ගෙ පත්වේය තෘප්ත විලසට

තම සිත් බැඳි කුමාරිකාවගෙන් වියෝවීම අනිවාර්ය යැයි දුර්මුඛව සිටින මනමේ කුමරු කැඳවන කුමරියගේ පියා වන දිසාපාමොක් ආචාර්යතුමා ඔහුට ඇය සරණපාවා දීමට තමා අදහස් කරන බව පවසා ඊට ඔහු කැමැත්තේ දැයි විමසයි. මේ මොහොතේ කුමාරයා තුළ ජනිත වන ප්‍රීති ප්‍රාමෝද්‍යය උදාන ගීතයකින් හැර අන් කවර ලෙසකින් පළ කළ හැකි ද?

මෙවන් මොහොතක නාට්‍යයේ අන් තැන්හි එනම් ගද්‍ය සංවාදයන්හි එන බස්වහරට මඳක් වෙනස් අයුරක් උදාන ගීතයේ බස්වහරට අයත් වන්නට පුළුවන; කාව්‍යෝක්තිය සාමාන්‍ය කතාබහෙන් වෙනස් වන බැවිනි. එහෙත් සමස්ත වශයෙන් බලන කල්හි එබඳු ගීතයක භාෂාව හා නාට්‍යයේ අන් තැන්හි යෙදෙන භාෂාව හා අතර සාම්‍යයක් පැවතීම මැනවි. ''මනමේ'',''සිංහබාහු'', ''පෙමතො ජායතී සොකො'' වැනි නාට්‍යයන්හි ගද්‍යඛණ්ඩ හා ගීතයන් අතර පවතින භාෂා සාම්‍යය මීට උදාහරණය ය. එසේ ම සරච්චන්ද්‍රයන්ගේ හාස්‍යෝත්පාදක නාට්‍යයන්හි යෙදෙන දෙබස් හා ගීත අතර ද එබඳුම භාෂාමය සාම්‍යයක් දක්නා ලැබේ. උදාහරණ වශයෙන් ''මහාසාර'' නාට්‍යයෙන් කොටසක් දැක්විය හැකිය.

රජ : තෝ ගත්ත පලඳනාව කොහේද? තියපු තැනකින් වහා ගෙනවිත් දිය.

ගායක කණ්ඩායම: බොරුව තමයි ජයගන්නේ
අබුද්දස්ස කාලෙ අපේ කවුද අදහන්නේ
බොරුව වැඩිය රසවත්නේ
ඇත්ත කියල මේ කාලේ
කාට ද බොල හරියන්නේ

භාරතීය සම්ප්‍රදායෙහි නාට්‍යය ''දෘශ්‍ය කාව්‍යයක්'' ලෙස නම් වී තිබීම ගැන ඉහත සඳහන් කළෙමු. රුඩොල්ෆ් ලබාන් නමැති බටහිර නාට්‍ය ශිල්පියා ''නාට්‍යය නිරන්තරව කථා කරන්නා වූ චිත්‍රයකි'' යි කියා ඇත්තේ මෙබඳු අදහසකින් විය යුතුය. මේ ''කථා කිරීම'' වාග්මය ප්‍රකාශන මගින් පමණක් නොවේ. සිදුවන්නේ. ඊට අමතරව වේදිකාවේ ඇති සැරසිලි, එහි සිටින පාත්‍රයන්, ඔවුන්ගේ වෙස් ගැනීම්, ඇඳුම් පැලඳුම්, ඔවුන් කරන දේ, පසුබිම් ශබ්ද, සංගීතය ආදී හේතු ප්‍රත්‍යය ද එකට සංකලනය වීමෙන් මෙම ''කථා කිරීම'' සිදු වෙයි.

අඹු දරුවන් නැති වීමේ ශෝකයෙන් මුසපත් ව සිටින තමන් ඉදිරියට අවි දරා පැමිණි තරුණයා,

''. . . සිංහයෙකුගේ මෙන් බල ඇති බාහු යුවලකින් යුත් මට සිංහබාහු යැයි නම් තබා ඇත.'' යයි පවසත්ම සිංහයාගේ සිත ඉමහත් කම්පනයකට පත් වේ.

''සිංහබා - නම් මේ මපුතා නොවෙදෝ
දැසට පෙනෙනා අදහමි කෙලෙසා
සොයමින මා ආවාද වන පෙතටා
කැටුවද මව හා සුරතල් නැගණිය
මා මරනට ආ නරයෙකි සිතුයෙමි
බිය නොව සිප ගන්නට දෙන් අවසර''

එහෙත් පුත්‍රයාගේ ප්‍රතික්‍රියාව වන්නේ :

මේ මුළු වගුරට වෙසෙනා දනහට
දුක් දෙන මෘග රාජය නුඹ නොවෙදෝ
සොයමින් නුඹ ආවෙමි වන පෙතටා
අවසන් කරනට කුරිරු ක්‍රියා ඒ
නෙක බළ ඇණි හා යෝධපුරුෂයන්
පැරදුණ මුත් මම ආවෙමි එකලා
මුදවන අටියෙන් මා රට වැසියන්
පැමිණ තිබෙන මේ ගොරතර විපතින්

මෙම අවස්ථාවෙහි ගායක පිරිස ඉදිරිපත් වී මෙසේ පවසති:

වියොවින් වියරු වැටුණු ඒ රුදු කෙසරින්දා
දැක පුතුගෙ වත
තුරු හිසින් නැගි
සේ තරින්දා
පිබිදුණි මන කොඳ හටගත් පෙමින අමන්දා
වැටුණි සර බිම
මෙත් බෙලෙන් ඇඟ
මස නොසින්දා

පුතු සෙනේ මස් නහර හම සිඳ
ඇට සොයා ගොස් ඇට තුළට වැද
ඇට මිදුලු මත රඳා සිට දුක්
දෙයි නිබන්දා

මෙහි දී නාට්‍යකරුවා ඉදිරිපත් කරන්නේ දාරක ප්‍රේමය එක් අතකිනුත්, ලෝකාර්ථ චර්යාවෙහි තිර අදිටන හා තම කායික ශක්තිය ගැන ඇති ආත්ම විශ්වාසය අනික් අතිනුත් පිළිමල් වූ අවස්ථාවකි. සිංහයා හා සිංහබාහු මුහුණට මුහුණලා සිටින මෙම අවස්ථාවේදී ගායක පිරිස ඉදිරියට එන්නේ දාරක ප්‍රේමය නමැති සර්ව සත්ව සාධාරණ අතිගම්භීර මනෝභාවය පිළිබඳව කථා කිරීමට ය.

''නාට්‍යමය කාව්‍යය (dramatic poetry) යනුවෙන් බටහිර විචාරකයන් හඳුන්වන්නේ මෙබඳු රංගන හේතු ප්‍රත්‍ය ගණනාවක සංකලනයෙන් ජනිත වන චමත්කාරය යැයි හැඟේ. එය නාට්‍ය රචනයේ දී කතුවරයා විසින් කිසියම් තැනක ඇතුළු කරන ලද තනිකර කවි සිතිවිල්ලක් පමණක් නොවේ. මේ පිළිබඳව ටී. එස්. එලියට්ගේ ප්‍රකාශයක් උපුටා දක්වනු කැමැත්තෙමි.

''ශේක්ස්පියරයන් තම පරිණත නාට්‍යයක කිසියම් අවස්ථාවක දී හුදු කාව්‍යමය ඡේදයක් ඇතුළත් කරන විට එයින් ක්‍රියාවලියට බාධා සිදු වන්නේ නැත. අවස්ථානුගත චරිතයට එය ප්‍රතිකූල වන්නේ ද නැත. එසේ නොව ක්‍රියාවත් චරිතයත් හුවා දැක්වීමට ඒ කාව්‍යමය කොටස අද්භූත අන්දමින් උපකාරී වන්නේ ය. (උදාහරණ වශයෙන්) ඔතෙලෝ රාත්‍රියේ දී කෝපාග්නියෙන් දැවෙන තම මාමණ්ඩිය හා ඔහුගේ මිතුරන්ට මුහුණ දී කියන,

ඔබේ දිළිසෙන අසිපත් කෙළින් ඔසවාගෙන සිටින්න
පින්නෙන් ඒවා මළ බැඳෙනු ඇති.

මෙහි දී ශේක්ස්පියර් සුන්දර කාව්‍ය සංකල්පනයක් පළමුවෙන් සිතේ පහළ කර ගෙන පසුව එය කෙසේ හෝ නාට්‍යයට ඇතුළත් කළේ ය කියා හෝ නො එසේ නම් තම නාට්‍ය විෂයක චින්තනය සිඳී ගිය හෙයින් අඩුවක් පිරවීම සඳහා කාව්‍යමය කොටසක් ඇතුළු කළේ ය කියා හෝ අපට නොහැඟේ. මේ වැකිය අප තුළ විස්මයක් ඇති කරයි. එහෙත් එය ප්‍රස්තුත චරිතයට අනුරූප වන බව ද පෙනේ. ඔතෙලෝ පවසන දෙයින් උත්ප්‍රාසය, උදාරත්වය හා නිර්භීතභාවය ප්‍රකාශ වේ. ඒ අතරම මෙම සිද්ධිය සිදු වන්නේ රාත්‍රියේ කුමන යාමයක ද යන්නත් මින් ආනුෂංගික වශයෙන් ප්‍රකාශ වේ. මෙබඳු දෑ කළ හැක්කේ කාව්‍යය විසින් පමණි. එහෙත් එය නාට්‍යමය කාව්‍යයයි; එනම් එයින් නාට්‍යමය අවස්ථාව බාධා කෙරෙනවා නොව එය උද්දීපනය කෙරෙන්නේ ය". කාව්‍යෝක්තිය නාට්‍ය අවස්ථාව හා අවියෝජනීය ලෙස බැඳී තිබිය යුතු අයුරු එලියට්ගේ මෙම ප්‍රකාශයෙන් පැහැදිලි වේ.

කිසියම් නාට්‍යමය අවස්ථාවක් නිරූපණය කරන කල්හි එම අවස්ථාවෙහි භාවමය පරිමාණයන් ගවේෂණය කිරීමට නාට්‍යකරුවා සමත් විය යුතුය. මෙය සාර්ථකව කළ හැක්කේ පුළුල් පරිකල්පනා ශක්තියකින් හෙබි කලා කරුවෙකුට ම ය. රසික චිත්තය චමත්කාරයට පත් කරන කිසිවක් මවා ලිය හැක්කේ එබන්දකු විසින් පමණි. වයසින් හා නුවණින් වැඩෙන සිය පුත්‍රයාට සුප්පා දේවිය විසින් සිංහයා හා තමා පිළිබඳ ඇති තතු පවසන අවස්ථාව සරච්චන්ද්‍රයන් අතින් නිරූපණය වී ඇති අයුරු මෙහි දී නිදසුනක් ලෙස දැක්විය හැකිය:

සුප්පා දේවි :

. . . .
මැණිය නුඹ දෙදෙනගෙ වේ
කුමරියක් මනා
පසිඳු මහරු වංග දේසෙ
නරවරා හට දා

මීට සිංහබාහු දක්වන ප්‍රතික්‍රියාව කතුවරයා නිරූපණය කරන්නේ මේ අයුරිනි:

කිම්ද මැණියනි ඔබ මේ
පවසන වදනා
ඇස් කන් ඇදහිය නොහේය
ඇසෙන මේ අරුමා
ඔබ පාමුල හිඳුවා මා
වැඩෙන වයසෙදී
රාජ කතා කී විසිතුරු
දැන් සිහිවන්නේ.

බහ තෝරන වියේ සිටින තම දරුවන් දෙදෙනා සමග ගල්ලෙනේ හුදකලා වූ සුප්පා දේවිය වෙත කතුවරයා සිය පරිකල්පනය විහිද වූ අයුරු මෙහි දී අපට පෙනේ. මවුවරු දරුවන්ට කථාන්තර කියති. රජ සැප හැරදා පැමිණි සුප්පා දේවිය තම අතීතය ගැන සාංකා මිශ්‍ර සිතකින් දරුවන්ට රාජ කතා කියා දුන්හයි සිතීම අතිශය පාත්‍රෝචිත නොවන්නේ ද?

ඒ කියා දුන් දේ අතුරින් සිංහසීවලියට මතක ඇත්තේ කාන්තාවන්ගේ සිත් ඇදී යන දේ ය.

රාජ කුමරියෝ පලඳිති
රන් මිණි බරණා
සිනිඳු වස්ත්‍ර හැඳලා රන්
මිරිවැඩි සඟලා
පින්පිඬ වන් මා මැණිය
කියනු නොවළහා
ඇයි ද වල්කලා පොරවා
ලෙන තුළ ඉන්නේ

සිංහබාහු හා සිංහසීවලී යන දෙදෙනාගේ කුහුල නිතැතින් යොමු වන්නේ,

ඇයිද පියාණන් සමඟින්
ලෙනෙහි වෙසෙන්නේ
හැර දමා එ රාජ ඉසුරු
උවදුරු අතරේ
රිසි නොවීද මා පියාට
වාසෙ මාලිගේ
සියුමැලි ඔබ කැටුව ඉන්ට
මේ වනන්තරේ

මෙහිදී ද අන් බොහෝ දේ දී මෙන් මැණියන් දරුවන්ට පූර්වාචාර්යයන් වන අයුරු සරච්චන්ද්‍රයන් නිරූපණය කරන ආකාරය කෙතරම් චමත්කාර ජනක ද?

අසිරිමත් වූ දේකි මෙලොව
ප්‍රේමය නමිනා
වැනූ පොරණ කිවිඳුන් නෙක
රසමුසු බසිනා
සියලු භෝග වස්තු ඉසුරු
හරිති නෙක් දනෝ
සව් සැප දෙන සිතුමිණ වන්
ප්‍රේමය සන්දා

චරිතයන්හි අභ්‍යන්තරය මෙසේ සියුම් ලෙස හෙළිදරව් කළ හැක්කේ නාට්‍යමය කාව්‍යයෙන් පමණකැයි කිව හැකිය. එලියට් විසින් නාට්‍යමය කාව්‍යයේ හැකියාවන් පිළිබඳව දක්වා ඇති අදහසක් මෙහි දී සිහියට නැගේ:

''අප සවිඥානක ජීවිතයේ දී ක්‍රියාවන්හි යෙදෙන කල්හි පැන නැගෙන, නම් කළ හැකි, හඳුනා ගත හැකි ආවේගයන්ට හා චේතනාවන්ට ඔබ්බෙන් එක්තරා අවිනිශ්චිත ප්‍රදේශයක් පිහිටා තිබේ. එකී හඳුනා ගත හැකි, නම් කළ හැකි ප්‍රදේශය නිරූපණය කිරීම සඳහා ගද්‍යමය නාට්‍යය සම්පූර්ණයෙන්ම ප්‍රමාණවත් ය. එහෙත් අප නෙත්වලට කෙළින් ම නොපෙනෙන, අපේ දෘෂ්ටිය කෙළින් ම එල්ල කළ නොහැකි, අපේ නෙත් කොණින් පමණක් දිස් වන අවිනිශ්චිත හැඟීම් ප්‍රදේශයක් තිබේ. මෙම හැඟීම් ගැන අපට වැටහෙන්නේ ක්‍රියාවන්ගෙන් තාවකාලික ව වියුක්තව සිටින අවස්ථාවන්හි පමණි. ...මෙම විශේෂ හැඟීම් ප්‍රදේශය නිරූපණය කළ හැක්කේ උත්සන්නභාවයට පත් නාට්‍යමය කාව්‍යයෙන් පමණි."

ගල්ලෙන වාසයෙන් මිදී සිය ''උරුමය'' සොයා යාමට අදිටන් කරගත් පුත්‍රයා තමා හා එන ලෙස ඉල්ලා සිටි මොහොතෙහි සුප්පා දේවියගේ සිත්හි පහළ වූයේ කෙබඳු සිතිවිල්ලක් ද?

වේ රුදු දෝසා කළ මේ දේ
මා පුතු නොතකා විපාකේ
මුවපත් වූයේ
නියත විනාසේ
මේ මොහොතේ කිම් කරනෙම් දෝ
මුළා වී මඟ නොපෙනේ.

විනාශයක පෙර නිමිති ඇයට ඉවෙන් මෙන් දැනේ. චංචල වූ සිතැති ඇ තීරණයක් ගත නොහැකි ව ළත වෙයි.

එහෙත් අනාගතය ගැන සිතිය යුතුව ඇත. තම යුතුකම රඳා ඇත්තේ දරුවන්ගේ ශුභසිද්ධිය සමග බැව් ඇ තීරණය කරයි.

යන්නට වේ දූන් සැමියා හැරා
වනවාසෙන් මේ පුතු සමගා
දරුවන් දෙදෙනා
හට සෙත් ලැබෙනා
මඟ ඔස්සේ යා යුතු වන්නේ
නො සැලී කිසි මේ වේලේ

එම තීරණය ගැන්මෙන් පසුව සැමියා ගැන ඇ තුළ ඉමහත් ශෝකයක් පැන නගින්නේ නිතැතිනි.

දෙවියන් බාරයි මා සමිඳා
මා වෙත නොවනු ය කෝපා
දරුවන් සන්දා
කරනෙම් මෙබන්දා
සිහි වේ සැම කල් හද සෝකෙන්
සමා වනු ඇත වරදා

මෙම පේළි හයෙහි අති පෘථුල හැඟුම් සමුදායක් කැටි වී තිබේ. තනි වන සැමියාට සුවයෙන් වෙසෙන්නට ලැබේවා යි ඇ පතන්නී ය. තමා මේ පියවර ගන්නේ දරුවන්ගේ ශුභ සිද්ධිය සඳහා වන හෙයින් තමා වෙත සැමියා කෝප නොවනු ඇතැයි ද ඇ සිත සනසා ගන්නට තැත්කරයි. කෙසේ වුවද සැමියා මතක් වන මොහොතක් මොහොතක් පාසා තමා සිතින් වේදනා විඳිනු ඇති බව ඇ දන්නීය. ඇ ඔහු කෙරේ දක්වන ස්නේහාන්විත ආකල්පය මෙම පේළි හයෙහි අපූර්ව ලෙස ගැබ් වී තිබේ. මෙයින් නැගෙන ධ්වනිතාර්ථ ඒ ඒ පාත්‍රයන්ගේ අතීතය, වර්තමානය හා අනාගතය යන තුන් කල් කෙරෙහි ම විහිදී යයි.

**පාදක සටහන්:**

1. එදිරිවීර සරච්චන්ද්‍ර "කොයිබ තිබෙන්නක් ද නාට්‍යය ?" රූපණ 1, 1, 1969, 1 - 6 පිටු
2. V. Raghavan " Sanskrit Drama in Performance", Rachel Van. M. Baumer and James R. Brandon ed., *Sanskrit Drama in Performance*, Honolulu: University Press of Hawai; 1981, pp. 9 - 44
3 'John Russel Brown, *Theatre Language*, London, The Penguin Press, 1972 pp. 58, 73 - 4
4. සාමාන්‍යයෙන් මේ දෙවිධිය "ශෛලී" දෙකක් ලෙස හැඳින්වේ. බලන්න : එදිරිවීර සරච්චන්ද්‍ර **වෙස්මුහුණු ද? සැබෑ මුහුණු ද?** කොළඹ, ප්‍රදීප, ප්‍රකාශකයෝ 1971, 48 වන පිටුව.
5. මේ පිළිබඳ විස්තර සඳහා බලන්න. Ediriweera Sarathchandra, "Ludowyk and the Sinhala Theatre " *Honouring E.F.C.Ludowyk Felicitation Essays* ed., Percy Colin Thome and Ashley Halpe, Dehiwala, Tisara, 1984, pp. 54 - 59
6. Wilmot P. Wijetunga, " The Future of Sinhala Drama" , *Souvenir of the Festival of Arts* ed., Ananda Tissa De Alwis, 1949, pp. 12 - 16
7. තවත් විස්තර සඳහා බලන්න: කේ. එන්. ඕ. ධර්මදාස "විශ්වවිද්‍යාලය හා සිංහල නාට්‍යයේ සංවර්ධනය" සාහිත්‍යය: **නාට්‍ය සාහිත්‍ය විශේෂ කලාපය**, 1984, 24, 27 පිටු
8 Kenneth M. Cameron and Thodore J.C. Hoffman, *The Theatrical Response*, London, Mc Millan, 1969, p. 231
9' එම., 230 වන පිටුව
10. එම., 230 වන පිටුව
11. එම., 233 වන පිටුව
12. මෙම ගීතය සම්ප්‍රදායෙහි පිහිටන අතර එය මඳ වශයෙන් වෙනස් කරන සුළු ද යෙදුමක් බව පළමුවරට පෙන්වා දෙන ලද්දේ ගුණදාස අමරසේකර මහතා විසින් මීට අවුරුදු 25කට පමණ පෙර පුවත්පතකට ලියන ලද ලිපියකිනි.
13. T. S. Eliot, " Poetry and Drama" quoted in Toby Cole ed., *Playwrights on Playwriting*, New York, Hill and Wang, 1965, pp. 255 - 6
14 එම 259 වන පිටුව

මල්ලවාරච්චි, උදය සහ තවත් අය, **එදිරිවීර සරච්චන්ද්‍ර විමංසා උපහාර අංකය,** 1987, 227-242 පිටු.